# ස්ත්‍රී පුරුෂ සමාජ්භාවය සහ ස්ත්‍රීවාදය

FRIEDRICH EBERT STIFTUNG



396

කමලා ලියනගේ
සුමුදු වළාකුළුගේ

එෆ්. ඊ. එස්. ප්‍රකාශන අංක 68

# ස්ත්‍රී - පුරුෂ සමාජභාවය සහ ස්ත්‍රීවාදය


**කර්තෘ** : **කමලා ලියනගේ**
**සමිදු වලාකුළුගේ**

**කවර සැකසුම** : **බන්දුල පීරිස්**



ප්‍රකාශන අයිතිය ෆෙඩ්රික් ඊබර්ට් පදනම 2006

*මෙම ප්‍රකාශනයෙහි ප්‍රකාශිත මත සහ අදහස් කර්තෘගේ ඒවා වන අතර එමගින් ෆෙඩ්රික් - ඊබර්ට් පදනමේ මත හෝ අදහස් කිසිම ආකාරයකින් පිළිබිඹු නොවේ.*



ISBN 955 - 607 - 046 - X

ප්‍රකාශන : FRIEDRICH EBERT STIFTUNG අංක 4, ඇඩම්ස් පටුමග, කොළඹ 4, ශ්‍රී ලංකාව


# පෙරවදන

ස්ත්‍රී-පුරුෂ සම සාධාරණත්වය සහිත තෘප්තිමත් සමාජයක් සහ සත්‍ය සහභාගී ප්‍රජාතන්ත්‍රවාදයක් නිර්මාණය කිරීම සඳහාත්, තිරසාර සංවර්ධනයක් ළඟාකරගැනීම සඳහාත්, ශ්‍රී ලාංකික ජනගහනයෙන් අඩක් වූ ස්ත්‍රීන් අනිවාර්යයෙන්ම සමාජ, දේශපාලන හා ආර්ථික ප්‍රවාහයන්ට සක්‍රීය අයුරින් සහභාගී විය යුතුය. මේ සඳහා ප්‍රමාණවත් නීතිමය අයිතිවාසිකම් ජාත්‍යන්තර මෙන්ම දේශීය වශයෙන්ද ශ්‍රී ලාංකික ස්ත්‍රියට හිමි වී ඇතත්, ප්‍රායෝගික වශයෙන් පුරුෂයින්ට සාපේක්ෂව ඒවාට සහභාගී වීමේ ඉඩප්‍රස්ථා හිමි වී ඇත්තේ අඩුවෙනි. නීතිමය තත්ත්වය සහ ප්‍රායෝගික ලෝකය අතර පවතින මෙම හිඩැස පියවීම සඳහා විවිධ පියවර ගත හැකිය. අදාළ කරුණු පිළිබඳ සමාජය දැනුවත් කරවීම ඒ අතුරින් ඉතාම වැදගත් වේ. කෙතරම් නීතිමය අයිතිවාසිකම් හිමි වූවත්, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, පීතෘමූලිකත්වය හා ස්ත්‍රීවාදය වැනි සංකල්ප පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොමැති නම් සමාජීය වශයෙන් ආකල්පමය වෙනසක් ඇති කිරීම දුෂ්කරය. ශ්‍රී ලාංකික සමාජය හමුවේ පවතින මෙම සංකීර්ණ ගැටළුව, සත්‍ය ස්ත්‍රී-පුරුෂ සම සාධාරණත්වයක් ඇති කිරීමේ ලා විශාල බාධකයක් වී ඇත.

ස්ත්‍රීන්ට සමාජයේ හිමි අප්‍රධාන තත්ත්වය පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොවේ නම්, ඔවුන් සිය නීතිමය අයිතිවාසිකම් භුක්ති විඳීම සඳහා උචිත පරිසරයක් ගොඩනගා ගැනීමට උත්සුක වන්නේ නැත. එම දැනුම නොමැතිව, ස්ත්‍රීන්ගේ තත්ත්වය නගා සිටුවීම සඳහා, අභියෝගවලට මුහුණදෙමින් ශක්තිමත්ව ඔවුන් සංවිධානය වන්නේද නැත. සත්‍ය සහභාගී ප්‍රජාතන්ත්‍රවාදයක්, සාමකාමී හා සහජීවන සමාජයක් සඳහා සමස්ත සිවිල් සමාජයම සංවිධානාත්මකව ඉදිරියට ආ යුතු පසුබිමක් අද ශ්‍රී ලංකාව තුළ උද්ගත වී ඇත. එවැනි අවශ්‍යතාවකදී ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයම පොදු ක්ෂේත්‍රයේ කටයුතුවලට සක්‍රීයව සහභාගී වීම වැදගත් වේ. මේ සඳහාද ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ අවබෝධය ප්‍රයෝජනවත් වන්නේ ය.

සමාජීය ආකල්ප වෙනස් කිරීමේදී සමාජ, ආර්ථික, දේශපාලන, පරිපාලන, අධ්‍යාපන, ජනමාධ්‍ය, නීතිමය, වෛද්‍ය හා ආගමික යනාදී සෑම ක්ෂේත්‍රයකම පුද්ගලයන් වෙත එම දැනුම ගලා ආ යුතුය. සමාජානුයෝජන ක්‍රියාවලියේ

ඒජන්ත ආයතන ලෙස දැනුම හා ආකල්ප වර්ධනයට මෙම අංශවලින් විශාල මෙහෙයක් ඉටුවේ. එහෙයින් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, පීතෘමූලිකත්වය හා ස්ත්‍රීවාදය වැනි සංකල්ප පිළිබඳ සරල හා පැහැදිලි අවබෝධයක් එම අංශද සතු විය යුතුය. එසේම සංවර්ධන ක්‍රියාවලියට ස්ත්‍රී පුරුෂ සහභාගීත්වය ප්‍රමාණවත්ව ලබා ගැනීම සඳහා එකී සැලසුම් සම්පාදනය කරන්නන් හා ක්‍රියාත්මක කරන්නන්ටද මෙම දැනුම ප්‍රයෝජනවත්ය.

සමාජීය ආකල්ප, විශ්වාස හා සාරධර්ම වෙනස් කළ හැක්කේ ඒ සඳහා බහුතරයකගෙන් බලවත් ඉල්ලීමක් ඉදිරිපත් වූ විට පමණි. මේ සඳහා සමාජයට ශක්තිමත් බලපෑමක් කිරීමට නම්, එකී සමාජයේ ස්ත්‍රීන්ට මෙන්ම පුරුෂයින්ටද අදාළ සංකල්ප සම්බන්ධයෙන් නිවැරදි අවබෝධයක් තිබිය යුතුය. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා ස්ත්‍රීවාදය පිළිබඳ දැනුම විශ්ව විද්‍යාල පංති කාමරවලට, අධ්‍යයන සම්මන්ත්‍රණවලට හා උගත්, මැද පංතියේ ස්ත්‍රීන් සුළු සංඛ්‍යාවකට සීමා වී ඇතිතාක් කල් පුළුල්, ශක්තිමත්, ජනතාවාදී ස්ත්‍රීවාදී ව්‍යාපාරයක් බිහිවන්නේ නැත. ඒ සඳහා අනිවාර්යයෙන්ම උගත් හා දැනුවත් ස්ත්‍රීන්ට නායකත්වය ගැනීමේ වගකීම පැවරේ. එහෙත් පවතින පීතෘමූලික සමාජ ව්‍යුහය යම් තරමකට හෝ වෙනස් කිරීම සඳහා ශක්තිමත් දේශපාලන බලවේගයක් ලෙස ස්ත්‍රීවාදී ව්‍යාපාරය ඉදිරියට ආ යුතුය. එය නිර්මාණය කිරීමට නම්, සමස්ත ශ්‍රී ලාංකික ස්ත්‍රීන්ටම ඔවුන්ගේ සත්‍ය තත්ත්වය පිළිබඳ හා ඔවුන් යා යුතු මග සම්බන්ධයෙන් පැහැදිලි හා නිවැරදි අවබෝධයක් අත්‍යවශ්‍ය වේ.

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණුකරුවෙකු ලෙස, ජාත්‍යන්තර, දේශීය මෙන්ම ප්‍රාදේශීය වැඩමුළු සියයකට අධික සංඛ්‍යාවකට, 1991 වසරේ සිට මම සහභාගී වී ඇත්තෙමි. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ දේශීය සමාජය සතු අඩු අවබෝධය හෝ වැරදි අවබෝධය, එම අවස්ථාවලදී මට වැටහිණි. එහෙයින් එබඳු වැඩමුළු පැවැත්වීමේ ප්‍රයත්නයට වඩා මෙබඳු සරල, දේශීය බසින් ලියැවුනු පොත් පිංචකින් සමස්ත සමාජයේම දැනුම යම් තරමකට හෝ වර්ධනය කිරීමට හැකිවේ යැයි අදහස් කළෙමි.

භූමිකා රූපසේ මැද, ජීවත්වන අතරතුර මෙම අදහස වසර කිහිපයක් සිත්හි දරාගෙන සිටියද, එය ප්‍රායෝගික යථාර්ථයක් බවට පත්කරන ලද්දේ සුමිදු වලාකුළගේ විසිනි. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ දැනුවත් කිරීමේ



වැඩමුළුවකින් ලත් සෘණාත්මක අත්දැකීමෙන් පසු, සැබැවින්ම, මෙබඳු පොත් පිංචක අවශ්‍යතාව ඔහු විසින් අවධාරණය කරන ලදී. එම අභිලාෂය මුදුන්පත් කරගැනීමේලා ඔහු මුලපිරූ මෙම කාර්යය අවසන් කිරීමේ වගකීම මා සතු වුවද, නැවතත් එය පසුපසට ඇදුණේ අවිවේකී දිවිය නිසාමය. සුමිදුගේ එම ප්‍රයත්නයට තුති පිදීමටත්, මෙම කර්තව්‍යයේ හිමිකමෙන් අඩක් සතුටින් ඔහුට පවරමි. පුල්බ්‍රයිට් ශිෂ්‍යත්වය ලබා, සත්ත වාර්ෂික නිවාඩු මත ඇමෙරිකානු විශ්ව විද්‍යාලයට සම්බන්ධ කටයුතු සඳහා යාමට ලැබීම එම කාර්යයට පහසුවක් විය. එම වරම ලබා දුන් පුල්බ්‍රයිට් කොමිසමට හා නිවාඩු අනුමත කරදුන්, පේරාදෙණිය විශ්ව විද්‍යාලයටද ගෞරවය පුද කරමි.

මෙම පොත් පිංච ප්‍රකාශයට පත්කිරීමේ අවශ්‍යතාව පළ කළ සැණින්, ෆෙඩ්රිච් ඒබට් පදනමේ නේවාසික අධ්‍යක්ෂක ඇස්ට්‍රිඩ් බෙකර් මහත්මිය හා ව්‍යාපෘති සම්බන්ධීකාරක රෝහිණී පීරිස් මහත්මිය එයට එකඟත්වය පළ කොට, එම කාර්යය ඉක්මන් කරන ලෙස දන්වා සිටියහ. එම දෙපළ හා ෆෙඩ්රිච් ඒබට් පදනමේ සහය නොවන්නට මෙම ප්‍රයත්නය සාර්ථක කරගැනීම අසීරුවනු ඇත. එම මහත්මියනට සහ ෆෙඩ්රිච් ඒබට් පදනමට ඒ වෙනුවෙන්, ස්තූතිය පුද කරමි. ස්ත්‍රී අධ්‍යයන කටයුතු සඳහා 1984 වර්ෂයේදී ප්‍රථමයෙන් මා යොමුකළ මහාචාර්ය එස්. ඩබ්. ආර්. ඩී. ඒ. සමරසිංහ සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවල පුහුණුකරුවකු ලෙස 1991 වර්ෂයේදී මා හඳුන්වාදුන් එස්. එම් අබේරත්න යන විද්වතුන්වද ස්තූති පූර්වකව සිහිපත්කරමි. මෙම කෘතියෙහි සෝදුපත් කියවා දුන් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දර්ශනී ගුණතිලක මහත්මියටද බෙහෙවින් ස්තූතිවන්ත වෙමි.

අධ්‍යයන දිවියේ අභියෝග ජයගන්නට නිබඳව දිරිය දෙන මහචාර්ය සිරිමා කිරිබමුණේ, මහාචාර්ය විද්‍යා සමරසිංහ, මහාචාර්ය තිලකා මෙත්තානන්ද, මහාචාර්ය සුසිලා කොෂික් හා මහාචාර්ය කැරොලින් එලියට්ටද හදපත්ලෙන්ම ස්තූති කරමි.

මා සහභාගී වූ වැඩමුළුවලට එක්වී, මෙබඳු පොත් පිංචක අවශ්‍යතාව අවධාරණය කළ පුහුණුවන්නන්ගේ අත්දැකීම් ද මෙහිදී බෙහෙවින් ප්‍රයෝජනවත් විය. මේ පොත් පිංච වඩාත් සරල අයුරින් සැකසුනේ ඔවුන් මට ලබාදුන් අත්දැකීම් නිසාමය. එහෙයින්, ඒ සැම දෙනාද සෙනෙහෙබර සිතින් සමරමි.

නිරන්තරයෙන් මගේ අධ්‍යයන කටයුතුවලට දිරිය දෙන මැණියන්ද, දූවරුන් උසස් අධ්‍යාපනයට යොමුකළ එහෙත් එහි අවසන නොදුටු පියාණන්ද සිහිපත් කරන්නේ හද පිරි ගෞරවයෙනි. අවිවේකී දිවියට තත් අයුරින් උදව් දෙන "නන්දා සෙවන" සහ "සඳසිරි" පවුල්වල සොයුරු සොයුරියන්ගේ සැබෑ සෙනෙහසද අගය කරමි. අවිවේකී, විධාබර අධ්‍යයන දිවියෙන් මොහොතකට ඇත්කොට, මගේ ලොව පහන්කරන ජනේත්‍රි දියණිය හා එම දිවියේ බර අඩකින් සැහැල්ලු කරන අශෝක ද අදරින් සිහිපත් කරමි.

මහාචාර්ය කමලා ලියනගේ
අංශාධිපති
දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය,
පේරාදෙණිය
ජුනි 30, 2006



# ෆෙඩ්රිච් ඊබට් පදනමේ නේවාසික අධ්‍යක්ෂක ඇස්ට්රිඩ් බෙකර් මහත්මියගේ පණිවිඩය

ස්ත්‍රී - පුරුෂ සමානාත්මතාවය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අංගයක් බවට පත්කරමින්, ලොව බොහෝ රටවල් විසින් නීත්‍යානුකූලව පිළිගනු ලැබ තිබේ. ස්ත්‍රී - පුරුෂ සම අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන්, එබඳු නීතිමය යාන්ත්‍රණ පවතින තත්ත්වයකදී පවා, ප්‍රායෝගික වශයෙන් ස්ත්‍රීන් හා පුරුෂයන් ආර්ථික, දේශපාලන හා සමාජ කටයුතුවලට සමාන අයුරින් සහභාගිවන රටක් ලොව සොයාගත නොහැකි තරම්ය. බොහෝ ස්ත්‍රීන් බලගැන්වීමේ වැඩ සටහන්වලින් සිදුවන්නේ, තවදුරටත් ස්ත්‍රීන් මත පැටවෙන වගකීම් හා කාර්යභාරය වැඩි කිරීමකි.

සැබෑ ස්ත්‍රී - පුරුෂ සම සාධාරණත්වය, හුදෙක් ස්ත්‍රීන්ගේ කාර්යභාරය වෙනස් කිරීමෙන් පමණක් දිනාගත නොහැකිය. ඒ සඳහා, ස්ත්‍රී වගකීම් හා භූමිකා සම්බන්ධයෙන් සමාජයේ පවතින පිළිගැනීම්, ආකල්ප හා අපේක්ෂාද වෙනසකට ලක් කළ යුතුය. ස්ත්‍රී - පුරුෂ දෙපක්ෂයේම නැතිනම් සමස්ත සමාජයේම ආකල්ප වෙනස් වුවහොත් පමණක්, සැබෑ ස්ත්‍රී - පුරුෂ සමානාත්මතාවය දිනාගත හැකිවේ. ස්ත්‍රී - පුරුෂ සමාජභාවීය දෘෂ්ටියේ පොදු අදහස මෙය වන අතර, එයින් ස්ත්‍රී - පුරුෂ සබඳතා පිළිබඳ සැලකිල්ල යොමුවේ.

ෆෙඩ්රිච් ඊබට් පදනම විසින්, ජර්මනිය සහ තවත් සියයකට අධික රටවලදී ක්‍රියාත්මක කරන ලද වැඩ සටහන්වල කේන්ද්‍රය බවට මෙම ස්ත්‍රී - පුරුෂ සමාජභාවය පත්ව ඇත. ආර්ථික, දේශපාලන සහ සමාජ ප්‍රගතියේ වගකීම් මෙන්ම ප්‍රතිලාභත්, ස්ත්‍රීන් හා පුරුෂයන් අතර සමාන අයුරින් බෙදෙන තත්වයකදී පමණක්, සාධාරණ, සාමකාමී හා ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් දෙසට ගමන් කරන්නා වූ වැදගත් පියවරයන් ගත හැකිවේ.

එබඳු අරමුණක් සාක්ෂාත් කරගැනීම සඳහා ශ්‍රී ලාංකික සමාජය තුළ උද්‍යෝගයක් ජනිත කිරීම කාලීන අවශ්‍යතාවකි. මහාචාර්ය කමලා ලියනගේ හා සුමුදු වලාකුළුගේ විසින් රචනා කරන ලද මෙම කෘතියෙන් ඒ සඳහා යම් තරමක පසුබිමක් සැපයේ යයි විශ්වාස කරමි. ස්ත්‍රී - පුරුෂ සමාජභාවීය සංකල්පය, එහි ප්‍රායෝගික ස්වභාවය සහ ස්ත්‍රීවාදය හා බැඳුනු මූලික

අදහස් කීපයක් පිළිබඳ සරල හා පැහැදිලි විස්තරයක් මෙම කෘතියෙන් සැපයේ. ශ්‍රී ලාංකික සමාජය තුළ, විශේෂයෙන්ම පොදු ජනතාව තුළ, මෙම සංකල්ප පිළිබඳ පුළුල් සංවාදයක් නිර්මාණය වීමට අවශ්‍ය අවබෝධය හා උද්යෝගය වර්ධනය කිරීමට මෙම කෘතියෙන් දායකත්වයක් ලැබේය යන්න අපගේ විශ්වාසයයි.

ඇස්ට්‍රිඩ් බෙකර්
නේවාසික අධ්‍යක්ෂක
ෆ්‍රෙඩ්රිච් එබර්ට් පදනම
ශ්‍රී ලංකාව

ජූනි 30, 2006



## හැඳින්වීම

මානව ජීවියා ජීවවිද්‍යාත්මකව ස්ත්‍රී හා පුරුෂ වශයෙන් කොටස් දෙකකට බෙදේ. මෙම ලිංගික වෙනස නිසා ස්ත්‍රීන් හා පුරුෂයින් කායික හා මානසික මෙන්ම අභ්‍යන්තර හා බාහිර වශයෙන් ද යම් යම් වෙනස් ලක්ෂණවලින් යුක්තවේ. එහෙත් එම වෙනසට වඩා ඉතා පුළුල් වෙනසක් සමාජය විසින් මෙම ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂය අතර නිර්මාණය කර තිබේ. එයට අනුව පුරුෂයාට වඩා වෙනස් වූ අප්‍රධාන තත්වයක් ස්ත්‍රියට පවුල තුළ මෙන්ම සමාජය තුළත් හිමිකර දී තිබේ. මෙම දෙපක්ෂයට සමාජය විසින් පවරනු ලැබ ඇති කාර්යභාරයන් එකිනෙකට වෙනස් ය. එසේම ස්ත්‍රීන් හා පුරුෂයන් සම්බන්ධයෙන් පවතින ආකල්ප, සම්ප්‍රදායන් හා විශ්වාසයන්ද එකිනෙකට වෙනස්ය. එපමණක් නොව සමහර අවස්ථාවලදී ස්ත්‍රීන් හා පුරුෂයන් සඳහා වන නීතිරීතිද වෙනස්වේ. එහි ප්‍රතිඵලයක් ලෙස සම්ප්‍රදායික සමාජයේ පමණක් නොව නූතන සමාජය තුළත් ස්ත්‍රිය දෙවැනි ශ්‍රේණියේ පුරවැසියෙකුගේ තත්වයට පත් වී ඇත.

මෙම ස්ත්‍රී-පුරුෂ අසමාන සමාජ තත්වය බුද්ධිමය වශයෙන් ලෝක මට්ටමේ අවධානයට ලක්වීම නිසා ස්ත්‍රී බව හෝ පුරුෂ බව මත කිසිම පුද්ගලයකු වෙනස්කමකට භාජනය නොවිය යුතුය යන නීතිමය පිළිගැනීම අන්තර්ජාතික මට්ටමින් ප්‍රකාශයට පත්වී තිබේ. ලොව බොහොමයක් රටවල් එබඳු පිළිගැනීමක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම හෝ වෙනත් නීති මගින් ප්‍රකාශයට පත්කොට ඇත. එහෙත් පීතෘමූලික සමාජ ක්‍රමය තුළ තවමත් පුරුෂයා හා සසඳන විට ස්ත්‍රියගේ තත්වය අප්‍රධාන මට්ටමක පවතී. විශේෂයෙන් පොදු කටයුතුවලදී පුරුෂයාට මෙන් සක්‍රිය අයුරින් සහභාගි වීමේ හැකියාවක් තවමත් ස්ත්‍රියට හිමි වී නැත.

මෙම වෙනස ස්ත්‍රිය හා පුරුෂයා යන පුද්ගලයින් දෙදෙනා සඳහා බලපාන පෞද්ගලික කාරණයක් පමණක් නොවන අතර පවුලටත්, සමස්ත සමාජයටත් අසාධාරණ අයුරින් බලපාන්නක් බව ස්ත්‍රීවාදීන්ගේ මතයයි. ආර්ථික, සමාජයීය, සංස්කෘතික, දේශපාලනික, මතවාදීමය හා මානසික වශයෙන් ස්ත්‍රියගේ අප්‍රධාන සමාජ තත්වය හා එය සමාජයට අහිතකර ලෙස බලපාන ආකාරය පිළිබඳ නිවැරදි අවබෝධයක් ගොඩ නැගීම ස්ත්‍රීවාදී

දෘෂ්ටියේ ප්‍රධාන අරමුණකි. සත්‍ය ප්‍රජාතන්ත්‍රවාදය, යහපත් පාලනය සහ තිරසාර සංවර්ධනය උදෙසා ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයේම සක්‍රීය සහභාගිත්වය අත්‍යවශ්‍ය කරුණක් වන බව ස්ත්‍රීවාදීන්ගේ තර්කයයි. මෙකී අදහස් ව්‍යාප්ත කිරීම, මෙම අවබෝධය ඇතියවුන් නිර්මාණය කිරීම, ඒකරාශි කිරීම සහ ස්ත්‍රිය අප්‍රධාන තත්වයෙන් මුදවාලීම සඳහා ඔවුන් සංවිධානය කිරීම ස්ත්‍රීවාදයේ මූලික ඉලක්ක වේ.

වර්තමානය වන විට ස්ත්‍රී අයිතිවාසිකම් සහ ස්ත්‍රීවාදී මතවාදමය ප්‍රකාශන හා ක්‍රියාකාරකම්වල ව්‍යාප්ත වීමක් දක්නට ලැබේ. එම නිසා ලොව පුරා බොහොමයක් රටවල් ස්ත්‍රීවාදී අදහස් පිළිබඳ පුළුල් අවධානයක් යොමු කර තිබේ. ශ්‍රී ලංකාව තුළද විශේෂයෙන් උසස් අධ්‍යාපන ආයතන, රාජ්‍ය නොවන සංවිධාන හා අන්තර්ජාතික සංවිධාන හරහා ස්ත්‍රීවාදී අදහස් යම්තරමකින් ව්‍යාප්ත වීමක් සිදුවෙමින් පවතී. එහෙත් එම ව්‍යාප්තිය හා ස්ත්‍රීවාදී මතවාදීමය සාකච්ඡාව බොහෝ සෙයින් අධ්‍යයනවේදීන්, සමීක්ෂකයින් හා රාජ්‍ය නොවන ස්ත්‍රී සංවිධානවල ක්‍රියාකාරීන්ට සීමාවී තිබීම විශාල අඩුපාඩුවකි. ස්ත්‍රිය අප්‍රධාන තත්වයෙන් මුදවාලීමට නම් සමස්ත සමාජයටම මේ අසාධාරණ වෙනස පිළිබඳ නිවැරදි අවබෝධයක් තිබිය යුතුය. එම අවබෝධය තුළින්, පවතින වෙනස තුරන් කිරීමට ඇති ශක්තියක් හා සංවිධානාත්මක භාවයක් ස්ත්‍රීන් තුළ ගොඩ නැගිය යුතුය. ඒ සඳහා හඬක් නැගිය හැකි, බලපෑම් කළ හැකි ශක්තිමත් ස්ත්‍රීවාදී ව්‍යාපාරයක අවශ්‍යතාව ශ්‍රී ලංකාවට අද තදින් දැනේ. පුරුෂයින් හා සමාන පුරවැසි කණ්ඩායමක් බවට පත්වීමට නම් ස්ත්‍රීන්ටත් සමාජ, ආර්ථික හා දේශපාලනමය වශයෙන් සමාන නීතිමය අයිතිවාසිකම් හිමිවිය යුතුය. අදාළ නීති කාර්යක්ෂම අයුරින් ක්‍රියාත්මක කිරීම සඳහා මනාව සංවිධානය වූ ආයතන ව්‍යුහයක් ගොඩනැගිය යුතුය. ආර්ථික ක්‍රියාවලියට හා තීරණ ගන්නා මට්ටම්වලට ස්ත්‍රීන්ට සක්‍රියවම සහභාගිවීමේ අවස්ථාව හිමිවිය යුතුය. මෙම අභියෝග ජයගැනීමට නම් මූලික වශයෙන් ස්ත්‍රියට හිමි අප්‍රධාන තත්ත්වය, ඇයට සිදුවන විෂම සැලකීම, ඇය සමාජ ආර්ථික හා දේශපාලන කටයුතුවලට සහභාගිවීමේ අවශ්‍යතාව සහ එහි සාධාරණ බව පිළිබඳ නිවැරදි අවබෝධයක් සමස්ත සමාජයටම ලබාදිය යුතුය.

මෙබඳු සංකල්ප හා කාරණා පිළිබඳ ඉංග්‍රීසි බසින් ලියැවුණ පොත පත යම්තරමකට අප සතු වුවද දේශීය භාෂාවන්ගෙන් ලියැවුණ පොතපත ඉතා දුර්ලභය. අදාළ නිවැරදි අවබෝධය තවමත් ශ්‍රී ලංකාවේ බොහොමයක්



දෙනාට නොමැතිවීමට එම කරුණ බලපා ඇත. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා ස්ත්‍රීවාදය වැනි පද සඳහා නිශ්චිත හා පැහැදිලි යෙදුම් පවා ශ්‍රී ලාංකික දේශීය භාෂාවන්හි සොයා ගැනීම අසීරුය. එවැනි තත්ත්වයකදී ස්ත්‍රීවාදී මතවාදයන් පිළිබඳ වැරදි අර්ථකථන සැපයීම හා ආසියාතික සමාජවලට නොගැලපෙන දෑ ලෙස ඒවා ඉවත දැමීම පවා සිදුවේ. මෙම තත්ත්වය වළක්වා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා ස්ත්‍රීවාදය යන මූලික සංකල්ප දෙක පිළිබඳ නිතර පැන නැගෙන සරල ප්‍රශ්න කීපයකට පැහැදිලි හා විස්තරාත්මකව පිළිතුරු සැපයීම මෙහිදී අරමුණු කෙරේ. ස්ත්‍රී-පුරුෂ සහජීවනය හා සහයෝගීතාව මත වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී, සියල්ලන්ගේම මානව අයිතිවාසිකම් මනාව සුරකෙන, යහපත් සමාජයක් ගොඩනැගීම සඳහා ද මින් ලැබෙන නිවැරදි අවබෝධය ප්‍රයෝජනවත් වනු ඇත. තවද ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයේම සහභාගිත්වය මත වඩාත් සාමකාමී සංවර්ධිත ශ්‍රී ලංකාවක් ගොඩනැගීමේ අරමුණු කරා යන ගමනේදීත් මෙම අවබෝධය ඉතා වැදගත් වේ. මෙවැනි සරල පොත් පිංචකින් සමස්ත සමාජයටම ලැබෙන අන්‍යෝන්‍ය අවබෝධය මානව ජීවීන් අතර වඩාත් සමතුලිත සබඳතාවක් ගොඩනඟා ගැනීමට මහා පදනමක් සපයනු ඇත.

ස්ත්‍රීවාදී සංකල්ප පිළිබඳ විද්වතුන් ඉදිරිපත් කර ඇති මතවාදීමය හා අධ්‍යයන කතිකාවත් පිළිබඳ ගැඹුරු විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීම මෙහි අරමුණ නොවේ. ස්ත්‍රීන් හා පුරුෂයින් අතර පවතින සමාජ අසමානතාවයේ අසාධාරණ බව පිළිබඳ, එදිනෙදා ජීවිත හා අත්දැකීම් ඇසුරින් ඉතා සරලව සාමාන්‍ය ජනතාවට පැහැදිලි කරදීම මෙහි මූලික අරමුණ වේ. එහෙයින් මෙම පොත් පිංචෙන් අප උත්සාහ ගන්නේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා ස්ත්‍රීවාදය යන මූලික සංකල්ප දෙක ඇසුරින් නිතර පැන නගින ගැටලු කිහිපයක් ඉතා සරලව අවබෝධ කර ගැනීමට පහසුකම් සැලසීම පමණකි.

# පටුන


1. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යන්නෙන් අදහස් වන්නේ කුමක්ද? 1

2. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හරහා ස්ත්‍රිය පුරුෂයාට වඩා අප්‍රධාන තත්වයකට පත් කර ඇත්තේ කෙසේ ද? 2

3. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය නිසා පවුල තුළ ස්ත්‍රියට අවාසි සහගත තත්වයක් හිමිවේ ද? 3

4. ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සබඳතා පොදු ක්ෂේත්‍රයේ කටයුතුවලට බලපාන්නේ කෙසේද? 15

5. ස්ත්‍රියට හිමි මෙම අප්‍රධාන තත්වයට හේතුවන මූලික කරුණු මොනවාද? 18

6. ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමාජානුයෝජනය යනු කුමක්ද? 21

7. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය වෙනසකට ලක්කළ නොහැකිද? 25

8. පිතෘමූලිකත්වය යනු කුමක්ද? 30

9. ස්ත්‍රීවාදය යන්න කෙසේ විස්තර කළ හැකිද? 37

10. ස්ත්‍රීවාදය යනුවෙන් ඒකීය අදහස් මාලාවක් තිබේද? 41

11. ස්ත්‍රීවාදයේ විවිධ ප්‍රවේශ විස්තර කරන්නේ කෙසේද? 45





12. ස්ත්‍රීවාදය බටහිර සංකල්පයක්ද? එය ශ්‍රී ලංකාව වැනි ආසියාතික රටකට ගැලපේද? 73

13. සියලුම ස්ත්‍රීන් ස්ත්‍රීවාදීන්ද? 82

14. ස්ත්‍රීවාදී අදහස් ව්‍යාප්ත කළ යුත්තේ ඇයි? 83

# 1

# ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?

ස්ත්‍රී-පුරුෂ ලිංගභේදය, ස්ත්‍රීත්වය හා පුරුෂත්වය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යන පද සමාන අර්ථ ඇති පද ලෙස සමාජය විසින් බොහෝ අවස්ථාවලදී භාවිත කරනු ලැබේ. නමුත් ස්ත්‍රී-පුරුෂ ලිංගභේදය (Sex) යන පදයට වඩා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය (Gender) යන පදය සමාජීය මෙන්ම මනෝභාවාත්මක වශයෙන් ද වෙනස් වූ අර්ථයක් ගෙන දෙයි (Lindsey, 1990).

ස්ත්‍රී-පුරුෂ ලිංගභේදය යනුවෙන් සරලව අදහස් වන්නේ උපතින්ම තීරණය වන මානවයාගේ ලිංගික බවේ වෙනසයි. ජීව විද්‍යාත්මකව ස්වභාවයෙන් ම සියලුම ජීවීහු ස්ත්‍රී පුරුෂ යන බෙදුමට ලක්ව උපත ලබති. මිනිසුන් පමණක් නොව තිරිසන් සතුන් සහ සමහරවිට ගහකොළ පවා මේ බෙදුමට ලක්වේ. ඒ අනුව ස්ත්‍රී හා පුරුෂ ජීවීහු ලිංගික වශයෙන් වෙනත් බාහිර හා අභ්‍යන්තර වෙනස්කම් ඇතිව උපත ලබති. ලොව කිසිම ජීවියෙකුට සිය උපතට පෙර මෙම ලිංගික බව පිළිබඳ තීරණය ගැනීමේ හැකියාවක් නොමැත. එසේම ඉතාම කලාතුරකින් නූතන සියුම් වෛද්‍ය විද්‍යාත්මක ක්‍රමවලින් මෙම ලිංගික බව වෙනසකට ලක් කළද එය ඉතාම සංකීර්ණ ක්‍රියාවලියකි.

පුරුෂයා හා ස්ත්‍රිය අතර ඇති මෙම ජීව විද්‍යාත්මක ලිංගික වෙනස නිසා ඔවුනොවුන්ගේ අඟ පසඟ, ඉන්ද්‍රියයන් හා ශරීර වර්ධනයද වෙනස් අයුරින් සිදුවේ. ස්ත්‍රීන්ගේ හා පුරුෂයින්ගේ ශරීර වර්ධනයේදී ඉන්ද්‍රියයන්ගේ බාහිර මෙන්ම අභ්‍යන්තර වෙනස්කම් ද සිදුවන අතර, කටහඬ වැනි දෑ පවා වෙනස්කම්වලට ලක්වේ. උදාහරණයක් ලෙස ස්ත්‍රියකගේ ශරීරයේ ලිංගේන්ද්‍රිය හා එහි ක්‍රියාකාරීත්වය ද ප්‍රජනන කාර්යයට අවශ්‍ය අයුරින් ශරීර වර්ධනයත් සමග වෙනස් වේ.

මෙම ලිංගික වෙනස ස්වභාවිකවම නිර්මාණය වූ ජීව විද්‍යාත්මක වෙනසකි. සමස්ත ලෝකයටම මෙම වෙනස පොදුය. කවර රටක, කවර සමාජයක වුවද වසර දහස් ගණනකට පෙරාතුව වුවද, නූතන යුගයේදී වුවද

මෙම ස්ත්‍රී-පුරුෂ ලිංගික බෙදුම නොවෙනස්ව පවතී. ඕනෑම ජාතියක, මානව වර්ගයක, කුලයක හෝ පංතියක මිනිසුන් අනිවාර්යයෙන් මෙම පොදු ලිංගික බෙදුමට ලක්වේ. මෙම ස්ත්‍රී-පුරුෂ ලිංගික බෙදුම, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, ස්ත්‍රීන් හා පුරුෂයින්ගේ භූමිකා සහ ඔවුනොවුන්ගේ මනෝභාවාත්මක හැඟීම් වැනි දෑ සමඟ ඉතා සමීපව බැඳී ඇතැයි පොදු විශ්වාසයක් පවතී (Spence and Helmreich, 1978). මෙම විශ්වාසය ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාව (Gender Identity) සම්බන්ධයෙන් නිවැරදි විය හැකි වුවත්, ස්ත්‍රී-පුරුෂ භූමිකා (Gender Roles) සම්බන්ධයෙන් නිවැරදි නොවේ. එය අවබෝධ කරගැනීම සඳහා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යන පදය පිළිබඳව ඉතා පුළුල්ව විමසා බැලිය යුතු වේ.

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යන පදය මුල්වරට භාවිත කොට ඇත්තේ මනෝවෛද්‍ය විද්‍යාවේදීය. රොබට් ස්ටෝලර් (Robert Stoller) 1968 දී කළ මනෝ විශ්ලේෂණය පිළිබඳ අධ්‍යයනයේදී Gender යන පදය ස්ත්‍රී-පුරුෂ භේදය නොසලකා, මානව හැසිරීම් හා හැඟීම් විස්තර කිරීමට භාවිත කළේ ය. එහෙත් නූතන අර්ථයෙන් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, (Gender) යන පදය ඉතා පුළුල්ව හා නිවැරදිව භාවිත කිරීම ආරම්භ ලබන්නේ ස්ත්‍රීවාදීන් විසිනි. 1970 හා 1980 දශකවල සම්භාව්‍ය ස්ත්‍රීවාදී රචනාවලදී වර්තමාන අදහසින් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යන පදය භාවිතා කොට ඇත. ඉන්පසු ස්ත්‍රීවාදීන් විසින් සිය සමාජ, දේශපාලන විග්‍රහයන්හිදී ස්ත්‍රිය අප්‍රධාන තත්ත්වයට පත්කොට ඇති මෙම සමාජ නිර්මිතය පිළිබඳ විවේචනාත්මක දෘෂ්ටියක් ගොඩනගනු ලැබ ඇත.

ජීව විද්‍යාත්මකව ස්ත්‍රියට හා පුරුෂයාට ලැබී ඇති ලිංගික වෙනස මත සමාජය විසින් දීර්ඝ කාලයක් තිස්සේ වෙනස් වූ සමාජ තත්ත්වයන් මෙම දෙපක්ෂය සඳහා නිර්මාණය කර දෙනු ලැබ තිබේ. සමාජය හා සංස්කෘතිය විසින් ස්ත්‍රී හා පුරුෂ වශයෙන් කරනු ලැබ ඇති මෙම බෙදීම සමාජයේ සෑම ඒකකයකදීම හා ස්ථරයකදීම දක්නට ලැබේ. ස්ත්‍රීන්ට හා පුරුෂයින්ට එකිනෙකට වෙනස් වූ ගති ලක්ෂණ, අනන්‍යතා, හැසිරීම් රටා, භූමිකා සහ වෘත්තීන් පවා සමාජය විසින් නිර්මාණය කරනු ලැබ ඇත. ස්ත්‍රීන් හා පුරුෂයින්ට පවරා දී ඇති එම සමාජ සංස්කෘතික තත්ත්වය, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ලෙස සරලව හැඳින්විය හැකිය. මෙය අනිවාර්යයෙන්ම සමාජය විසින් දෙන ලද තත්ත්වයකි. ලිංගික බව මෙන් සොබා දහමින් ලද්දක් නොවේ.



වොලච් ස්කොට් (Scott, 1988 : 42) දක්වන ආකාරයට "ස්ත්‍රී-පුරුෂ ජීව විද්‍යාත්මක වෙනස මත, සමාජය එම දෙපක්ෂය දකින ආකාරයට අනුව වෙනස් වූ සමාජ තත්ත්වයන් ඔවුනොවුන් වෙත නිර්මාණය කරදී තිබේ. මෙම සමාජ නිර්මාණය (Gender) සමාජ සබඳතාවල පදනම වන අතර ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යන සාධකය බල සබඳතා විස්තර කිරීමේදී හෝ හඳුනා ගැනීමේදී ද මූලික වේ".

මෙසේ සමාජය විසින් ස්ත්‍රීන් හා පුරුෂයින්ට කාලාන්තරයක් තිස්සේ, විධිමත්ව නිර්මාණය කර දෙනු ලැබ ඇති සමාජ සබඳතාව ස්ත්‍රී-පුරුෂ සමාජභාවය (Gender), ලෙස සරලව හැඳින්විය හැකිය. (Acker, 1988 and 1990). සංස්කෘතිය, ආගම, විශ්වාස, ඇදහිලි හා සිරිත් විරිත් මගින් මෙම සමාජ තත්ත්වය ස්ථාපිත කර තිබේ. මෙම සමාජ නිර්මිතය සමාජයෙන් සමාජයට මෙන්ම කාලයෙන් කාලයටද වෙනස් ය. එකම රටක වුවද නාගරික ස්ත්‍රියකට සමාජයෙන් හිමිවී ඇති තත්ත්වය, නිදහස හා වරප්‍රසාද ග්‍රාමීය ස්ත්‍රියකට හිමිවී ඇති තත්ත්වයට වඩා වෙනස්ය. එසේම සමාජ පංති අතරද ස්ත්‍රීන් හා පුරුෂයින්ගේ සමාජ තත්ත්වයන් වෙනස් වේ. මානව වර්ග, ජාති, කුල, ප්‍රදේශ අතර ද මෙම සමාජ තත්ත්වයන් සමාජ හා සංස්කෘතික වෙනස්වීම් අනුව වෙනස් වේ. එහෙයින් ස්ත්‍රී පුරුෂ ලිංගභේදය මෙන් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ස්ථිතික දෙයක් නොව, වෙනස්වන සුලු දෙයකි. නැතිනම් ගතිකය.

ලිංගික වශයෙන් ස්ත්‍රීන් හා පුරුෂයින් අතර වෙනස්කම් ඇතත් ඔවුන් දෙපක්ෂයම සමාන මානව ජීවීන් වන බව විවිධ විද්‍යාත්මක සොයා ගැනීම්වලින් ඔප්පු කර ඇත. එහෙත් ලොව සෑම සමාජයක්ම ස්ත්‍රීන් හා පුරුෂයින් අතර වන අසමාන සමාජ තත්ත්වය හා බල සබඳතාව දිගින් දිගටම පවත්වාගෙන යනු ලැබේ. (Epstein, 1988 and Hess, 1990). මෙම වෙනස් වූ සමාජ තත්ත්වය ස්ත්‍රිය හා පුරුෂයා යන පුද්ගලයින් දෙදෙනාට පමණක් සීමා වුවක් නොවේ. පවුල, ආගමික ආයතන, පාසල, රැකියා ස්ථානය හා වෙනත් සමාජ සංවිධාන තුළත් අනිවාර්යයෙන්ම සංවිධාන ව්‍යුහයන් ගොඩනැගී ඇත්තේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය බල සබඳතා පදනම්කරගෙනය (Reskin , 1988). ඒ නිසා සමස්ත සමාජ ව්‍යුහයම සැකසී ඇත්තේ, මෙම ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සබඳතාව මත යයි පැවසීම නිවැරදිය (West and Zimmerman, 1987).

ලොව සෑම සමාජයකම ස්ත්‍රීන් හා පුරුෂයින් වෙනස් ආකාරයෙන් දැකීම පමණක් නොව, ඔවුන්ට දී ඇති විශේෂ චරිත ලක්ෂණ, භූමිකා,

හැකියාවන් සහ ඔවුන්ව අගය කිරීම සිදුවන්නේත් වෙනස් ආකාරයකිනි. පුරුෂයින් ශාරීරික හා මානසික වශයෙන් ශක්තිමත්, එඩිතර, ඉක්මන් තීරණ ගතහැකි, නායකත්වයක් සහිත, බුද්ධිමත් හා තාර්කික කොටසක් ලෙස බොහෝවිට විශ්වාස කෙරේ. නමුත් ස්ත්‍රීන් ළාමක, සුන්දර, පුරුෂයකු මත යැපෙන, කාරුණික, ඉක්මනින් සසල වන සිතක් ඇති කොටසක් ලෙස සැලකේ. මෙම මූලික ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාව පුරුෂයින්ට මෙන්ම ස්ත්‍රීන්ටද පොදුවන අතර දරුවෙකු වයස අවුරුදු දෙක පමණ වන විට මෙම අනන්‍යතාව තමන් තුළ ස්ථාපිත කරගනී (Money and Ehrhardt, 1972). මෙම බෙදුම මත ස්ත්‍රීන්ට හා පුරුෂයින්ට සමාජය විසින් දී ඇති භූමිකා ද වෙනස් වේ. ස්වභාව ධර්මයෙන් හිමි වී ඇති ප්‍රජනන කාර්යය මෙන්ම ගෘහාශ්‍රිත සියලු කාර්යයන්ද සමාජය විසින් ස්ත්‍රියට පවරා දී ඇත.

දරුවන් පෝෂණය කිරීම, රැකබලාගැනීම, ගේ දොර කටයුතු, දරුවන්ගේ අධ්‍යාපන කටයුතු හා වැඩිමහල්ලන් රැකබලාගැනීම වැනි ගෘහාශ්‍රිත කටයුතු සමාජය විසින් ස්ත්‍රියට පවරා දෙනු ලැබෙයි. මේ නිසා ඇය පෞද්ගලික නැතිනම්, ගෘහාශ්‍රිත ක්ෂේත්‍රයට (Private Sphere) අයත් වූවකු ලෙස සලකයි. එයට වෙනස් ලෙස ගෘහයෙන් පිටත ආදායම් ඉපයීමේ කාර්යය, වෙළඳාම, ගොවිතැන හෝ වෙනත් රැකියා, සමාජ වැඩකටයුතු මෙන්ම ස්ත්‍රීන්ට හා දරුවන්ට ආරක්ෂාව සැලසීමේ කාර්යය පුරුෂයින්ට පවරා දී ඇත. ඒ අනුව ඔහු පොදු ක්ෂේත්‍රයට (Public Sphere) අයත් වූවකු ලෙස සැලකේ. දරුවෙකු කුඩාකල සිට සමාජානුයෝජනය කිරීම තුළින් දිගුකලක් තිස්සේ මෙම අනන්‍යතාවන් ඇය හෝ ඔහුගේ මනස තුළ ස්ථාපිත කෙරේ (Kagan, 1964, Smith and Lloyd, 1978).

මෙම විශ්වාස හා භූමිකා මත ස්ත්‍රියක් මේ අයුරින් හැසිරිය යුතුය, කථා කළයුතුය, ඇඳුම් පැළඳුම් ඇඳීම පැළඳීම කළ යුතුය, පුරුෂයෙක් එයට වෙනස් ආකාරයෙන් ඒ දේ කළ යුතුය යන විශ්වාසය සමාජය තුළ ස්ථාපිත වී තිබේ. එහෙයින් ස්ත්‍රියකගෙන් හෝ පුරුෂයකුගෙන් සමාජය අපේක්ෂා කරන ආකාරයට ඒ දේ සිදුනොවුනොත්, උදාහරණයක් ලෙස පුරුෂයෙක් ඉතා සංවේදීව, ළාමකව හා මෘදු අයුරින් කටයුතු කළොත් එවිට සමාජය එය අසාමාන්‍ය දෙයක් ලෙස සලකයි (Broverman et.al, 1972).

මෙම ස්ත්‍රී-පුරුෂ අනන්‍යතා හා භූමිකා වෙනස පෙරදිග සමාජවල පමණක් නොව, බටහිර දියුණු යයි සම්මත සමාජවලත් දක්නට ලැබේ. ඒ වෙනස මත ස්ත්‍රීන්ට හා පුරුෂයින්ට පැවරෙන කාර්යයන්, ඔවුන්ගේ යුතුකම්, අයිතිවාසිකම්, ඔවුන් සම්බන්ධ සිරිත්-සම්ප්‍රදායයන්, නීති-රීති, වරප්‍රසාද හා



ඔවුන් එකිනෙකාට හිමි සම්පත් ද වෙනස් වේ. ස්ත්‍රීන් හා පුරුෂයින්ගේ චරිත ලක්ෂණ, විශේෂ හැකියාවන් හා මනෝභාවාත්මක තත්ත්වයන්ගේ වෙනස නිසා මෙබඳු වෙනසක් වන බව බොහෝ දෙනා විශ්වාස කරති. නමුත් මාග්‍රට් මීඩ් (Margaret Mead) 1935 දී කරන ලද "Sex and Temperament in Three Primitive Societies" යන අධ්‍යයනයෙන් එබඳු වෙනසක් ස්ත්‍රීන් හා පුරුෂයින් අතර නොමැති බව පෙන්වා දී තිබේ. ඇයට අනුව ජීව විද්‍යාත්මකව ලිංගභේදය අනුව ස්ත්‍රීන්ගේ හා පුරුෂයින්ගේ ගති ලක්ෂණ හා හැකියාවන්හි වෙනසක් විය නොහැකිය. ඇය ප්‍රකාශ කරන ආකාරයකට එබඳු වෙනස්කම් ස්ත්‍රීන් හා පුරුෂයින් අතර ස්ථාපිත කරන්නේ සමාජානුයෝජන ක්‍රියාවලිය මඟිනි. මේ අදහස පිළිබඳ පසුකාලයේදී විවිධ මත මතාන්තර හා අධ්‍යයන ප්‍රකාශයට පත්වූවත් ස්ත්‍රීන් හා පුරුෂයින් අතර ලිංගික වෙනස හැර වෙනත් ස්වාභාවික වෙනසක් ඇතැයි පැහැදිලි නිගමනයකට මෙතෙක් එළඹී නොමැත (Maccoby and Jacklin, 1974).

1950 හා 1960 ගණන්වලදී චර්යාවාදීන් විසින් මේ ස්ත්‍රී-පුරුෂ හැසිරීමේ වෙනස පිළිබඳ අධ්‍යයන ගණනාවක් කරනු ලැබිය. ඔවුන්ගේ නිගමනය වූයේත්, ස්ත්‍රී-පුරුෂ හැසිරීමේ වෙනසට මූලික හේතුවක් වන්නේ ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂය ලක්වන සමාජානුයෝජනයේ වෙනස බවයි. සමාජ විද්‍යාඥයින්ගේ අදහස වන්නේ සමාජය විසින් පුද්ගලයින් හා ඔවුන්ගේ භූමිකා විවිධ අයුරින් සංවිධානය කිරීම හා හැඩගැන්වීම කරනු ලබන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ස්ත්‍රී-පුරුෂ හැසිරීම් හා ගති ලක්ෂණ වෙනස්වන බවයි (Encyclopedia of Sociology, Vol. 2, 1992).

විද්‍යාත්මක නිගමන මෙබඳු වුවද ඕනෑම සමාජයක ස්ත්‍රීන්ට හා පුරුෂයින්ට අසමාන වූ තත්ත්වයන් හිමිකර දී ඇති අතර ඒ මත පදනම් වූ විශ්වාස හා අගය කිරීම් එම සමාජවල දැඩිව මුල්බැසගෙන ඇත. මේ අනුව බොහෝ රටවල ඇඳුම් පැළඳුම් සහ භූමිකා පමණක් නොව භාවිත කරන භාෂාවේ පවා ස්ත්‍රී-පුරුෂ වශයෙන් බෙදුනු පද, ව්‍යාකරණ විධි, ස්ත්‍රීන්ට හා පුරුෂයින්ට විශේෂිත වූ යෙදුම් හා ව්‍යවහාර දක්නට ලැබේ. රැකියා ක්ෂේත්‍රයන්හිද හෙදි, ගුරු හා ලඝුලේඛක වැනි වෘත්තීන් ස්ත්‍රීන්ට හිමි ක්ෂේත්‍ර ලෙසත්, බරවාහන පැදවීම, ඉංජිනේරු හා තාක්ෂණ රැකියා සහ කළමනාකරණය වැනි වෘත්තීන් පුරුෂයින්ට වෙන්වූ ක්ෂේත්‍ර ලෙසත් බොහෝ විට සැලකේ.

එපමණක් නොව, නිෂ්පාදන, ප්‍රජනන කාර්යයන් හා සමාජ කටයුතු වලදීත් ස්ත්‍රීන්ට හා පුරුෂයින්ට වෙන් වූ භූමිකා පවරා දී තිබේ. බොහෝ

නිෂ්පාදන කාර්යයන්හිදී ස්ත්‍රීන්ට පුරුෂයින්ට වඩා අඩු වැදගත්කමක් ඇතැයි සැලකෙන කාර්යයන් පැවරේ. උදාහරණ ලෙස ඇඟලුම් කර්මාන්ත ශාලාවක් ගතහොත් එහි රෙදි කැපීම, මැසීම වැනි කාර්යයන්ට වැඩි කාලයක් ගතවන නමුත් අඩු වැදගත්කමින් සලකන කාර්යයන් නිරන්තරයෙන් පැවරෙන්නේ ස්ත්‍රීන්ටය. කළමනාකරණ හා කර්මාන්ත ශාලා පිළිබඳ ඉහළ පෙළේ තීරණ ගැනීම වැනි විධායක වගකීන් හිමිවන්නේ පුරුෂයින්ටය. කර්මාන්ත ශාලාවේ පැවැත්මට මේ අංශ දෙකම එකසේ වැදගත් වන නමුත් වැඩි ආර්ථික වටිනාකමක් ලබාදෙන්නේ පුරුෂයින් ඉටුකරන කාර්යයන්ටය. කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ වුවද මෙම අසමාන භූමිකා හා සම්පත් බෙදීම දකගත හැකිය. පවුලක් කිසියම් කෘෂිකර්මාන්තයක යෙදී ඇත්නම් ඒ පිළිබඳ තීරණ ගැනීම, අස්වැන්න විකිණීම, ආදායම් ලැබීම හා එහි පාලනය අනිවාර්යයෙන්ම හිමිවන්නේ පුරුෂයාටය. එහෙත් ස්ත්‍රිය ද කෘෂිකාර්මික කටයුතුවලට සෘජුවම දායක වේ. ගොවිතැන් කටයුතුවලට සහාය දීම, ආහාර පාන පිළියෙල කිරීම හා උදව් ලබාදෙන පවුල්වලට තම දායකත්වය සැපයීම ආදිය මගින් ඇයද අදාළ කෘෂිකර්මාන්තයට සහභාගී වේ. එහෙත් ඇගේ දායකත්වයට පුරුෂයාගේ දායකත්වයට මෙන් ආර්ථික වටිනාකමක් බොහෝ විට ලබා නොදේ. එසේ ලබාදුන්නද එය මිල කරන්නේ ඊට වඩා අඩු වටිනාකමකිනි. එසේම ලැබෙන ආදායමද ස්ත්‍රියට හිමි නොවේ. මේ නිසා ස්ත්‍රීන්ගේ කාර්යභාරය පුරුෂයාගේ කාර්යභාරය තරම් වැදගත් නොවන බවට වන විශ්වාසය ගොඩනැගී ඇත.

ප්‍රජනන කාර්යය ස්ත්‍රිය හා පුරුෂයා එක්වීම මත රඳා පැවතියත්, දරුවා හා සම්බන්ධ සියලු කටයුතු මව හා පියාට පවරා ඇත්තේ අසමාන අයුරිනි. දරුවකු කුස තුළ දරා සිටීම, ප්‍රසූතිය හා මවුකිරි දීම හැර අනෙකුත් සෑම කටයුත්තක්ම පියෙකුටද ඉටුකළ හැකියි. නමුත් දරුවා සම්බන්ධ සියලු කාර්යයන් පාහේ මවට පවරා ඇති අතර දරුවාගේ නීත්‍යානුකූල භාරකාරත්වය හා ආරක්ෂාව සැලසීම පියාට පවරා තිබේ. මෙලෙස සමාජය විසින් ස්ත්‍රීන්ට හා පුරුෂයින්ට ප්‍රජනන කාර්යයේ යුතුකම්, වගකීම් හා අයිතිවාසිකම් අසමාන ලෙස බෙදා දෙනු ලැබීමක් දැකිය හැකිය.


සමාජ කටයුතුවලදීත් තීරණ ගැනීම, නායකත්වය, සංවිධානය හා අධිකාරී බලය නිරන්තරයෙන් පුරුෂයා සතු දෑ ලෙස සලකයි. ඉතිහාසය පුරාම ස්ත්‍රිය ද ඇය ජීවත් වන සමාජය තුළ විවිධ පොදු කටයුතුවලට සහභාගී වී ඇත. ඇගේ දායකත්වය නොමැතිව, බොහෝ විට පොදු කටයුතු සාර්ථක කරගත හැකි නොවේ. එහෙත් එහිදී නායකත්වය හා තීරණ ගැනීමේ බලය පැවරෙන්නේද සම්ප්‍රදායිකව පුරුෂයාට ය.



සියවස් ගණනාවක් පුරා ස්ත්‍රිය හා පුරුෂයා අතර වෙනස් සමාජ භූමිකා සහ සමාජ තත්ත්වයන් නිර්මාණය කොට, ස්ත්‍රිය පුරුෂයාට වඩා අප්‍රධාන තත්ත්වයක ස්ථාපිත කිරීමට මෙම ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සබඳතා භාවිත කොට තිබේ. කාලය, ස්ථානය, ජාතිය, මානව වර්ගය, කුලය, ආගම හා පංතිය අනුව මෙසේ වෙනස් කොට සැලකීමේ ස්වභාවය වෙනස් විය හැකිය. එහෙත් පුරුෂයාට සාපේක්ෂව ස්ත්‍රියට පහත් නැතිනම් අප්‍රධාන තත්ත්වයක් හිමිකරදී තිබීම මෙම සෑම සමාජ ස්තරයකටම පොදු දෙයකි. මෙම වෙනස්කොට සැලකීම නිසා පුරුෂයා ආධිපත්‍යය හා බලය හිමි තීරණ ගන්නා බවටත් ස්ත්‍රිය පුරුෂයා විසින් නිර්මාණය කරන ලද තීරණ අනුව හැසිරෙන්නියක බවටත් පත්කර ඇත.

ස්ත්‍රීත්වයට හා පුරුෂත්වයට සමාජය විසින් දෙන ලද තත්ත්වයන් මත එම දෙපක්ෂයත්, සමාජයත් ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාව ගොඩ-නගාගෙන ඇත. දරුවෙක් වසර දෙකක් වයස් ගතවන විට තමා ස්ත්‍රියක්ද පුරුෂයෙක්ද යන දැනුම ලබාගන්නා අතර ඒ වෙනස හඳුනාගැනීම මූලික ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාව (Basic Gender Identification) ලෙස හඳුන්වයි (Money and Ehrhardt, 1972). ඉන්පසු ස්ත්‍රියක හෝ පුරුෂයකු තමා දෙස සමාජය බලන ආකාරය හඳුනාගන්නා අතර ඒ අනුව කටයුතු කිරීමට පෙළඹේ. මෙම තත්ත්වය ස්ත්‍රී පුරුෂ සමාජභාවීය භූමිකා අනන්‍යතාව (Gender Role Identity) ලෙස හඳුන්වන අතර දරුවකුගේ සමාජානුයෝජනය තුළින් දීර්ඝ කාලයක් තිස්සේ එය වර්ධනය වේ (Kagan, 1964). ගැහැණු හා පිරිමි දරුවන් සමාජය දෙස බලා අනිකුත් සාමාජිකයින් හැසිරෙන ආකාරයට හෝ සමාජය අපේක්ෂා කරන ආකාරයට හැසිරීමට පෙළඹේ (Smith and Lloyd, 1978). සම්ප්‍රදායිකව ඕනෑම සමාජයක් පාහේ පුරුෂයෙක් එඩිතරව, නිර්භීතව, තාර්කිකව, තරඟකාරීත්වයකට මුහුණ දෙන අයුරින් කටයුතු කරාවි යයි විශ්වාස කරයි. එසේම ස්ත්‍රියක් මෘදු, කාරුණික, ඉවසීමෙන් යුක්ත, ළාමක ආකාරයෙන් හැසිරේයැයි, විශ්වාස කරයි (Broverman et.al, 1972). සමාජය අපේක්ෂිත ආකාරයට වෙනස් අයුරින් ස්ත්‍රියක මෙන්ම පුරුෂයෙකු ද ඇඳුම් පැළඳුම් අඳියි නම්, හැසිරෙයි නම්, කථාබහ කරයි නම්, සමාජය එය අසාමාන්‍ය තත්වයක් ලෙස සලකයි. පුද්ගලයන් දෙදෙනෙක් ප්‍රථමවරට හමුවූ විට ඔවුනොවුන් හඳුනාගන්නේ ඒ තැනැත්තා ස්ත්‍රියක් ද පුරුෂයෙක් ද යන තත්ත්වය මතය. ඉන්පසු එම දෙදෙනා අතර අනිකුත් සබඳතා ගොඩනැගීමේදී අනිවාර්යයෙන්ම ස්ත්‍රී-පුරුෂ සමාජභාවය බලපෑම් කරයි. මානව ජීවීන් අතර මෙන්ම සමාජය තුළත් ඉවත් කළ නොහැකි ආකාරයෙන් මෙම ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය නිර්මිතය මුල්බැසගෙන තිබේ (Devor,1990).

### සමාජය තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සබඳතා නිර්මාණය වී ඇති ආකාරය




# 2

## ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හරහා ස්ත්‍රිය පුරුෂයාට වඩා අප්‍රධාන තත්ත්වයකට පත් කර ඇත්තේ කෙසේ ද?

ස්ත්‍රියට ප්‍රජනන කාර්යය පැවරී ඇත්තේ ස්වභාවයෙන්ම ය. මේ නිසා ඈත අතීතයේ සිටම දරුවන් ප්‍රසූත කිරීම පමණක් නොව, දරුවන් පෝෂණය කිරීම මෙන්ම ඔවුනට අධ්‍යාපනය ලබාදීම හා ඔවුන්ව රැක බලාගැනීම ද ඇයට පැවරිණි. දරුවන් සමග ගෘහය තුළ සිටිමින් ගෘහයේ අනෙකුත් කාර්යයන් ඉටු කිරීමේ වගකීමද ගේ දොර පවිත්‍ර කිරීම, කෑම පිසීම, රෝගීන් හා පවුලේ වයස්ගතවූවන් රැක බලා ගැනීමේ කටයුතු ද ස්ත්‍රියට අයත් දෑ ලෙස සැලකිණි. එසේම ප්‍රජනන කාර්යයට යෝග්‍ය අයුරින් නම්‍යශීලි සිරුරක් සහිතව ස්ත්‍රිය නිර්මාණය වීම නිසා ඇය පුරුෂයාට වඩා දුර්වල, නම්‍යශීලි අයෙකු ලෙසද සැලකිණි. එයට සාපේක්ෂව පුරුෂයා සතු දැඩි මාංශපේශි හා වෙනත් ශාරීරික ලක්ෂණ නිසා ඔහු ශක්තිමත්, එඩිතර, නිර්භීත අයෙකු ලෙස සලකන ලදී. මෙම ලක්ෂණ අනිවාර්යයෙන් ස්ත්‍රිය සතු දෑ හෝ පුරුෂයා සතු දෑ ලෙසට සමාජය විසින් මිනිස් සිත් තුළ පැළපදියම් කර ඇත. එහෙත් ස්ත්‍රියක් නියත වශයෙන් දුර්වල, ලාමක, නම්‍යශීලි සිරුරක් ඇත්තියක ලෙස හෝ ඇයට ඉටුකළ හැක්කේ ගෘහාශ්‍රිත කාර්යයන් හා දරුවන් සම්බන්ධ කාර්යයන් පමණක් ය යනුවෙන් විද්‍යාත්මකව මෙතෙක් පැහැදිලිව ඔප්පුකොට නැත. එසේම ලොව සිටින සියලුම පුරුෂයින් ශක්තිමත්ය, එඩිතරය, තාර්කිකය යන වශයෙන්ද පිළිගත නොහැකිය. ඕනෑම සමාජයක ශක්තිමත්, එඩිතර, තද සිත් ඇති පුරුෂයින් මෙන්ම ස්ත්‍රීන් ද සිටින බව අප කවුරුත් අත්දැකීමෙන් අවබෝධ කරගෙන ඇත. එසේම ලාමක, නම්‍යශීලි, කාරුණික, ඉවසීමෙන් කටයුතු කරන ස්ත්‍රීන් මෙන්ම පුරුෂයින් ද අප අතර සිටී. එහෙයින් සමාජය විසින් සිදුකරනු ලබන සිතාගැනීම්වලට අනුව ස්ත්‍රීන්ගේ හා පුරුෂයින්ගේ ගති ලක්ෂණ, භූමිකා සහ හැසිරීම් මේ අයුරින් පැහැදිලි බෙදුම්කට ලක්කර තිබීම කිසිසේත්ම තර්කානුකූල නැත. එවැනි දෑ ස්ත්‍රී පුරුෂ ලිංගික බව මත වෙනස් වනවාට වඩා පුද්ගල හැකියාවන් හා චරිත ලක්ෂණ ආදිය මත වෙනස්වීමට ඇති ඉඩකඩ බොහෝ වැඩිය. නිදසුනක් ලෙස ගතහොත්, ශ්‍රී ලංකාවේ වේගයෙන්ම දිවීමේ හැකියාව ඇති ඔලිම්පික් ශූරිය වූ සුසන්තිකා ජයසිංහ ශක්තිය හා වේගය අතින් බොහෝ පුරුෂයින්ට

වඩා ඉහළින් සිටී. ඇගේ හැකියාවන්ට ස්ත්‍රී බවේ සම්බන්ධතාවක් නැත. ලිංගික බව එයට බාධාවක් ද වී නොමැත.

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත ඔවුනොවුන්ගේ භූමිකා බෙදීමද තර්කානුකූල නොවේ. ස්ත්‍රිය දුර්වල තැනැත්තියකි; ඇගේ ලිංගිකත්වය පහසුවෙන් පුරුෂයින්ගේ අතවරයට ලක්වේ; ඇයට ගර්භණී සමයේදී දඩයම් කිරීම වැනි කාර්යයන්හි නියැලීමට නොහැකිය; දරුවන් රැකබලා ගැනීම ඇයට පමණක් සීමාවූ කාර්යයකි; වැනි ආකල්ප සම්ප්‍රදායික සමාජය තුළ තදින් මුල්බැසගෙන තිබිණි. එහෙයින් ගෘහයෙන් පිටත කටයුතුවලට ස්ත්‍රිය සාමාන්‍යයෙන් යොමු නොවූවාය. පුරුෂයා ගෘහයෙන් පිටතට ගොස් සතුන් දඩයම් කිරීම, ආහාර ද්‍රව්‍ය සැපයීම වැනි දේ ඉටුකළ අතර ඔහු දරුවන් හා බිරිඳට ආරක්ෂාව සැපයිය යුතුය යන විශ්වාසය ද සම්ප්‍රදායික සමාජය තුළ මුල්බැසගෙන තිබුණි. ඒ විශ්වාස මත නූතන සමාජය තුළ පවා ඉවුම්-පිහුම්, දරුවන් පෝෂණය කිරීම, රෝගීන් රැකබලාගැනීම හා ගේදොර පවිත්‍ර කිරීම වැනි දෑ ස්ත්‍රියකගේ කාර්යයන් ලෙස බොහෝ විට පිළිගැනේ. ගෘහයෙන් පිටත කාර්යයන් සමාජය වෙනස්වීමත් සමගම වෙනස් වුවද තවමත් පොදු කටයුතු, කුඹුරු සීසෑම, ට්‍රැක්ටර් භාවිතය, ගස් නැගීම, බර වාහන පැදවීම, කළමනාකරණය හා තාක්ෂණය භාවිතය වැනි, කාර්යයන් ඉටුකළ හැක්කේ පුරුෂයාටය යන සම්මතයක් පවතී. කෙසේ වෙතත් මෙම බෙදීම නූතන සමාජ හා ආර්ථික වෙනස්වීම් සමග බොහෝ දුරට වෙනස් වෙමින් පවතී.

බොහෝ සමාජවල සම්ප්‍රදායිකව පුරුෂයින්ට පැවරී තිබූ කාර්යයන් රාශියක් අද ස්ත්‍රීන් විසින් ද ඉටුකරනු ලැබේ. එසේම ඇඳුම් මැසීම, කෑම පිළියෙල කිරීම වැනි ස්ත්‍රී කාර්යයන් යයි සම්මත දෑ ඉතා දක්ෂ ලෙස ඉටුකරන පුරුෂයින් ද දුර්ලභ නැත. සම්ප්‍රදායික ස්ත්‍රී භූමිකා හා පුරුෂ භූමිකා නූතන සමාජ තුළ වෙනස් වෙමින් පැවතියත්, අදාළ විශ්වාස හා මති මතාන්තර තවමත් සමාජය තුළ බොහෝදුරට ඉතිරිව පවතී. එහෙයින් හුරු වෘත්තිය, හෙද සේවය හා ලිපිකරු වැනි රැකියා යෝග්‍ය වන්නේ ස්ත්‍රීන්ටය යන මතය ද තවම සමාජය තුළ පවතී. එසේම තීරණ ගන්නා මට්ටම්වල රැකියාවලට හා තාක්ෂණය භාවිත කරන රැකියා ආදියට සුදුසු වන්නේ පුරුෂයින්ය යන හැඟීමද සමාජයේ පවතී. ආදායම් උපයන රැකියාවක නිරත වුවත් ගෘහිය හා දරුවන්ගේ කටයුතුවලට ස්ත්‍රිය ප්‍රමුඛත්වයක් දිය යුතුය යන හැඟීමද ප්‍රබලය. මෙම විශ්වාස හා සැලකීම් මත ගෘහය තුළදී පමණක් නොව සමාජයේ අනෙකුත් සෑම සංවිධානයක් තුළදීමත් ස්ත්‍රිය පුරුෂයාට වඩා පහත්ය, අප්‍රධානය යන හැඟීම් මත කටයුතු කෙරේ. ස්ත්‍රිය පුරුෂයාට වඩා ශක්තියෙන් අඩුය; එසිතර බවෙන් අඩුය, තාර්කික



බවෙන් අඩුය. පුරුෂයාට මෙන් ඇයට තරගකාරී තත්ත්වයක් තුළ කටයුතු කළ නොහැකිය. ඇයට පවුලේ හා දරුවන්ගේ වගකීම පැවරෙන නිසා ස්වාධීනව කටයුතු කළ නොහැකිය. ඇගේ ලිංගිකත්වය පහසුවෙන් අතවරයකට ලක්විය හැකි නිසා පුරුෂයාට මෙන් ඇය පොදු ක්ෂේත්‍රයේ කටයුතුවලට යොමු නොවිය යුතු ය; ඇය පුරුෂයින්ගේ ආරක්ෂාව මත යැපිය යුතුය; පුරුෂයා පවුලේ උපයන්නා හෝ යැපෙන්නා වන අතර ස්ත්‍රිය ඔහුගෙන් යැපෙන්නිය විය යුතුය; ආධිපත්‍යය බලය හා ශක්තිය ඇති පුරුෂයා තීරණ ගන්නා වන අතර එම තීරණවලට ස්ත්‍රිය අවනත විය යුතුය; ස්ත්‍රිය කුඩා වයසේදී පියා හා වැඩිමහල් සොයුරන්ටත් තරුණ වියේදී ස්වාමිපුරුෂයාටත්, මහලු වියේදී වැඩිමහල් පිරිමි දරුවන්ටත් අවනත විය යුතුය; යනාදී වශයෙන් සමාජය තුළ ස්ථාපිත වී තිබූ විශ්වාස රාශියක් තවමත් විශාල වෙනසකට ලක් නොවී පවතී. මේ නිසා සම්ප්‍රදායික භූමිකාවලින් ඉවත්ව, ස්ත්‍රියක් කටයුතු කළත් ඇය පුරුෂයාට වඩා අප්‍රධානය යන හැඟීම නිරන්තරයෙන්ම පවතී.

# 3

## ස්ත්‍රී-පුරුෂ සමාජභාවය නිසා පවුල තුළ ස්ත්‍රියට අවාසි සහගත තත්ත්වයක් හිමිවේ ද?

සම්ප්‍රදායික සමාජ තුළ පමණක් නොව, නූතන සංවර්ධිත බටහිර සමාජවල පවා පවුල තුළ පුරුෂයාට වඩා පහත් තත්ත්වයක් ස්ත්‍රියට හිමිවන අවස්ථා දක්නට ලැබේ. තවමත් පවුලකට පිරිමි දරුවෙකු ඉපදීම බොහෝ විට සුභ දෙයක් ලෙස සලකයි. පවුල් නාමය, කීර්තිය හා පවුලේ දේපළ ඉදිරියට ගෙනයා හැක්කේ පිරිමි දරුවෙකුටය යන පිළිගැනීම පවතී. පවුල් නාමය පරපුරෙන් පරපුරට උරුම කිරීමේ වරම හිමිවන්නේද පිරිමි දරුවන්ටය. ගැහැණු දරුවකු පවුලකට හිමිවීම බරක් ලෙස සලකන අවස්ථා ද ඇත. ඇයට ආරක්ෂාව සැලසීම, දාවැද්ද සැපයීම, කන්‍යාභාවය සුරකෙන ලෙස ඇය කොටුකර තබාගැනීම වැනි අමතර වගකීම් රාශියක් පවුලට පැවරී තිබීම මෙයට මූලික හේතුව වේ. පෝෂණය, අධ්‍යාපනය, දේපළ හා වෙනත් සම්පත් ලබා දීමේදීත් මෙම ස්ත්‍රී-පුරුෂ වෙනස පවුල තුළ සලකා බැලේ. නිදසුනක් ලෙස බොහෝ සම්ප්‍රදායික පවුල්වල පියා සහ පිරිමි සාමාජිකයින්ට ආහාරවලින් මුල්ම සහ හොඳම කොටස වෙන් කෙරෙන අතර මව සහ ගැහැණු සාමාජිකාවන් අතර බෙදී යන්නේ ඉතිරි කොටසය. ක්‍රීඩා කිරීම හා වෙනත් කටයුතුවල දරුවන් නිරතවීමේදීත් ගැහැනු දරුවාට හිමි වන්නේ පිරිමි දරුවාට වඩා බෙහෙවින් අඩු නිදහසකි. ශ්‍රී ලංකාවේ සමහර ගැමි ප්‍රදේශවල ගැහැණු දරුවන්ට වැඩිවිය පත්වූ පසුව ගේදොර කටයුතු හෝ කුඩා දරුවන් රැකබලා ගැනීමේ කාර්යය පවරා දෙනු ලැබෙයි. ඉන්පසු පාසල් අධ්‍යාපනය අවසන් වන අවස්ථාද කොතෙකුත් ඇත. වැඩිවියට පත් ගැහැණු දරුවන්ගෙන් නිදහස් වීම සඳහා හැකි ඉක්මනින් ඔවුන් විවාහ කරදෙන අවස්ථා ද ඇත. සමහර දියුණු රටවල පවා පිරිමි දරුවන්ට විශාල වියදමක් දරා උසස් අධ්‍යාපනය ලබාදෙන අතර ගැහැණු දරුවන්ට සාමාන්‍ය මට්ටමේ අධ්‍යාපනයක් ප්‍රමාණවත්ය යන හැඟීම පවතී.

විවාහයේදීත් ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය වෙනස දැඩිව සලකා බැලෙයි. උගත්, ධනවත් පුරුෂයකුට ගැහැණු දරුවෙකු විවාහ කරදීමට නම් බොහෝවිට මුදලින්, ඉඩකඩම්වලින් හෝ වෙනත් සම්පත්වලින් දායාද සැපයිය යුතුය. විවාහ උත්සවයට පසුදින කන්‍යාභාවය පරීක්ෂා කිරීම වැනි සම්ප්‍රදායික



පීඩාවලටද ස්ත්‍රිය ලක්වේ. යම් පවුලක අඹු-සැමියන්ගේ කිසියම් ශාරීරික හේතුවක් නිසා දරුවන් නොලැබේ නම් "වඳ ගැහැනිය" යන නමින් අවඥාවට බඳුන් වන්නේද ස්ත්‍රියයි. ස්වාමි පුරුෂයා මියගියහොත් "කණවැන්දුම් ගැහැණිය" ලෙස සමාජය වපර ඇසින් බලන්නේද ඇය දෙසය.

පවුලේ දේපළ හෝ වෙනත් සම්පත් බෙදා දීමේදී ද ගැහැණු දරුවන්ට ලැබෙන්නේ අඩු සැලකිල්ලකි. පාරම්පරික දේපළ හෝ දෙමව්පියන් පදිංචි නිවස බොහෝ විට ගැහැණු දරුවන්ට හිමි නොවේ. එහි පාරම්පරික උරුමය උපතින්ම පිරිමි දරුවන්ට හිමි වේ.

බොහෝ අවස්ථාවලදී පවුලේ වැදගත් තීරණ ගන්නේ පියා හෝ වැඩිමහල් සොයුරාය. පවුලේ ගැහැණු සාමාජිකයින් ඔවුන්ගේ අනුමැතිය මත කටයුතු කළ යුතුය. විවාහ වීමට සහකරු තෝරාගැනීම වැනි පුද්ගලික කරුණකදී පවා බොහෝ විට ඔවුන්ගේ අනුමැතිය අත්‍යවශ්‍ය වේ. එපමණක් නොව ස්ත්‍රී සාමාජිකයින්ගේ ලිංගිකත්වය හා ප්‍රජනන කාර්යය පාලනයද පුරුෂයින් අතින් සිදුවේ. පුරුෂයාට මෙන් ස්ත්‍රියට ලිංගික කටයුතු සඳහා නිදහසක් නැත. පවුල තුළ ස්ත්‍රීත්වය පාලනය කිරීම සඳහා හිංසනය, අඩන්තේට්ටම් කිරීම, පහරදීම වැනි ප්‍රචණ්ඩකාරී ක්‍රියා පුරුෂයින් විසින් භාවිත කරනු ලැබේ. ස්ත්‍රී දූෂණය හා ගෘහීය ප්‍රචණ්ඩත්වය, ස්ත්‍රීත්වය පාලනය කිරීම සඳහා පුරුෂයින් නීත්‍යානුකූල නොවන අයුරින් භාවිතා කරන සමාජ පාලන ක්‍රම ලෙස කොනෙල් හා මැකිනොන් පෙන්වා දී ඇත (Connell, 1987; Mackinnon, 1989).

පවුල තුළ භූමිකා බෙදීමද අනිවාර්යයෙන්ම ස්ත්‍රී-පුරුෂ බෙදුම මත සිදුවේ. මව ගෘහයෙන් පිටත ආදායම් උපයන රැකියාවක නිරතවුවත්, පවුලේ උපයන්නා පියාය. ගෘහමූලිකයා ලෙස සලකන්නේ ද පවුලේ වැඩිමහල් පුරුෂයා වන අතර ඒ මගින් ඔහුට පවුල තුළ නීත්‍යානුකූල ආධිපත්‍යයක් හිමිකර දී ඇත. මව පවුලට වැඩි ආදායමක් උපයා දෙන අවස්ථාවලදී වුවද, සම්ප්‍රදායිකව හිමි ගෘහාශ්‍රිත කාර්යභාරය අනිවාර්යයෙන් ඇය අතින් ඉටුවිය යුතුය යන පිළිගැනීම තවමත් බොහෝ පවුල් තුළ පවතී. හොඳ මවක් වීම, කාර්යශූර ගෘහණියක් වීම හා සෙනෙහෙබර බිරිඳක් වීම අන් සැමදෙයකටම වඩා ස්ත්‍රියකගෙන් අපේක්ෂාකරන දෑ ලෙස තවමත් සලකන බොහෝ පවුල් ඇත. මේ නිසා වැටුප් ලබන රැකියාවල නිරත ස්ත්‍රීන්ට එකවර කාර්යයන් රාශියක් ඉටුකිරීමට සිදුවී තිබේ. එය ඇයට පැවරී ඇති "ද්විත්ව භූමිකාවේ", සිට "බහුවිධ භූමිකාව", දක්වා වර්ධනය වී ඇත.

පවුල තුළ පියා සහ මව ඉටුකරන කාර්යයන් දෙවර්ගයම පවුලේ පැවැත්මට අනිවාර්යයෙන් දායකවේ. එහෙත් බොහෝ අවස්ථාවලදී මව අතින් ඉටුවන කාර්යයට ආර්ථික වටිනාකමක් ලබා නොදෙන අතර ඒවා වැදගත් කාර්යයන් ලෙසද නොසලකයි. පවුල තුළ නිෂ්පාදන කාර්යයන්ට ස්ත්‍රිය විවිධ අයුරින් දායක වුවත්, එයට ලැබෙන්නේද අඩු වටිනාකමකි. නොඑසේ නම් එය පවුල වෙනුවෙන් ඉටුකරන නොමිලේ සේවයක් ලෙස සැලකේ.

මේ අනුව ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය විඥානය නිසා පවුල් තුළ බොහෝ අවස්ථාවලදී ස්ත්‍රියට අප්‍රධාන තත්ත්වයක් හිමිවේ. පුරුෂයා පවුලේ ආධිපත්‍යය, බලය හිමි තැනැත්තා ලෙස සැලකේ. කවර සමාජයක වුවද, කවර ජාතියකට මානව වර්ගයකට, කුලයකට හෝ පංතියකට අයත් වුව ද ස්ත්‍රීන්ට හිමි මෙම අප්‍රධාන තත්ත්වය පොදු ලක්ෂණයක් වී ඇත. පවුලක් තුළ අඩු නිදහසක්, අඩු වරප්‍රසාද, අඩු අයිතිවාසිකම්, අඩු දේපළ, අඩු කීර්තිය හෝ අඩු බලය බොහෝ විට හිමිවන්නේ ස්ත්‍රියට වන අතර වැඩි බලය හෝ ආධිපත්‍යය බෙහෙවින්ම හිමි වන්නේ පුරුෂයාටය (Almquist, 1987). මෙම අසමාන බල බෙදීම පදනම්ව ඇත්තේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත වන අතර, එය විසින් පුරුෂයාට වඩා ස්ත්‍රිය පවුල තුළ අවාසි සහගත සහ අප්‍රධාන තත්ත්වයකට පත් කරනු ලැබ ඇත. එහෙයින් පවුල තුළදී ස්ත්‍රිය අඩු වරප්‍රසාදලත්, වැඩි පීඩනය හා සූරාකෑමකට ලක්වන්නියක් බවට පත් වී ඇත.

# 4

# ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සබඳතා පොදු ක්ෂේත්‍රයේ කටයුතුවලට බලපාන්නේ කෙසේ ද?

ගෘහය තුළ පමණක් නොව සමාජයේ අනෙක් සෑම සංවිධානයක් තුළදීමත් බල සබඳතා තීරණය කිරීමේදී ස්ත්‍රී-පුරුෂ සමාජභාවය විශාල බලපෑමක් කරයි. අධ්‍යාපන ආයතන, රැකියා ස්ථාන, ආගමික සංවිධාන, දේශපාලන සංවිධාන යනාදී සෑම සමාජ, සංස්කෘතික, ආර්ථික හා දේශපාලන අංශයකදීම මෙම වෙනස දැකගත හැකිය. ඒ නිසා බොහෝ අවස්ථාවලදී පොදු ආයතන තුළත් තීරණ ගැනීමේ බලය හා පාලන ආධිපත්‍යය හිමිවන්නේ පුරුෂයාටය. පුරුෂයා විසින් නිර්මාණය කරදෙනු ලබන වපසරිය තුළ ස්ත්‍රිය පාලනය වන තත්ත්වයට පත්කරනු ලැබ තිබේ. එහෙයින් ගෘහය තුළ මෙන්ම පොදු ක්ෂේත්‍රය තුළදීත්, එයට සමාන අයුරින් හෝ එයට වඩා වැඩියෙන් පුරුෂයාට යටත්වන තත්ත්වයට, අඩු වරප්‍රසාද ලත් සූරාකන තත්ත්වයට ස්ත්‍රිය සාපේක්ෂ වශයෙන් පත්කොට ඇත.

නිදසුනක් ලෙස ආගමික සංවිධාන තුළ ස්ත්‍රීන් දරන තත්ත්වය සලකා බැලිය හැකිය. ශ්‍රී ලංකාවේ ඕනෑම ආගමික සංවිධානයක් තුළ ප්‍රමුඛත්වය ගන්නේ පුරුෂයාය. බුදුරජාණන්වහන්සේ සමානාත්මතාවය පිළිබඳ දේශනා කළද භූතන ප්‍රායෝගිකත්වය තුළ යම් යම් ආගමික කටයුතුවලදී ස්ත්‍රියට පුරුෂයාට වඩා අඩු සැලකීමක් හිමිවේ. පෙර භවයේ කරන ලද පාප කර්ම නිසා ස්ත්‍රියක ලෙස උපන් බැව් විශ්වාස කෙරේ. බුද්ධත්වය ලබාගැනීම ද ස්ත්‍රියකට කළ නොහැකි දෙයක් ලෙස පොදුවේ සැලකේ. දළදා සමිඳුන් හා ශ්‍රී මහා බෝ සමිඳුන් ශ්‍රී ලංකාවට වැඩම කරවන ලද්දේ ස්ත්‍රීන් විසින් වුවද, එම ස්ථානවලට පිවිසීමේදී මෙන්ම ආගමික වතාවත් කිරීමේදීත් ස්ත්‍රීන්ට සීමාකම් පවරා ඇත. දළදා මාළිගාවේ දියවඩන නිලමේවරයා තෝරාගැනීමේ කාර්යය සඳහා ස්ත්‍රී ප්‍රාදේශීය ලේකම්වරුන් තවමත් සහභාගි කරවාගන්නේ නැත. මහනුවර දිස්ත්‍රික්කයේ දිසා ලේකම් තනතුර සඳහා ස්ත්‍රියක් පත්කරන්නේ ද නැත. හින්දු, ක්‍රිස්තියානි හා මුස්ලිම් ආගම් විසින් ද මේ අයුරින්ම ස්ත්‍රීන් කෙරේ විවිධ ආගමික සීමාවන් පනවනු ලැබ ඇත.

රැකියා සම්බන්ධ ආයතන හා අධ්‍යාපන ආයතන වැනි සමාජ සංවිධානවලටත් මෙම තත්ත්වය පොදුය. බොහෝ විට කළමනාකරණ,

පරිපාලන, තාක්ෂණික, සැලසුම් සම්පාදන අංශවල බහුතර නියෝජනය පුරුෂයින්ගෙන් සමන්විත වේ. අර්ධ වෘත්තිමය, උපස්ථායක හෝ පහළ මට්ටමේ නිෂ්පාදන ශ්‍රමික අංශවල බහුතරය ස්ත්‍රීන් විසින් නියෝජනය කරනු ලබයි. මෙම දෙපක්ෂය ලබන වැටුප් ද අසමාන වන අතර පුරුෂයින් ඉටුකරන කාර්යයන්ට වැඩි ආර්ථික වටිනාකමක් ලැබේ. ස්ත්‍රීන් ඉටුකරන කාර්යයන් සම්බන්ධයෙන් පවා තීරණ ගැනීමේ හැකියාවක් ස්ත්‍රීන්ට නැත. ආර්ථික වශයෙන් ඉහළ නිෂ්පාදන හෝ පරිපාලනමය වෘත්තින් වෙත ළඟාවීමට පුරුෂයින්ට තරම් ඉඩකඩක් සමාජය විසින් ස්ත්‍රීන්ට සපයා දෙනු නොලැබේ. කලාතුරකින් හෝ එවැනි අවස්ථාවක් ලබාගන්නා ස්ත්‍රීන්ට පුරුෂයන්ට මෙන් පහසුවෙන් එය ලබාගැනීමේ හැකියාවද නොමැත. ඒ සඳහා ඇය අති විශාල කැපවීමක් කළ යුතුවේ. පුරුෂයාට වඩා අභියෝග රැසකට මුහුණ දීමටද ඇයට සිදුවේ. එබඳු වෙනසක් සිදුවන්නේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සබඳතාවන්හි ස්වරූපය නිසාය.

දේශපාලනික අංශයෙන් සලකා බැලූ විට ස්ත්‍රීන්ගේ අප්‍රධාන තත්ත්වය මැනෙවින් පැහැදිලි වේ. ස්ත්‍රීන් ඡන්දදායකයින් ලෙස ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ රටවල ක්‍රියාශීලීව දේශපාලනයට සහභාගි වේ. නමුත් දේශපාලනික වශයෙන් තීරණ ගන්නා ස්ථානයන් හි ස්ත්‍රී නියෝජනය සාපේක්ෂව ඉතා අවම මට්ටමක පවතී. පාර්ලිමේන්තුව, විධායකය, වැනි ආයතනවලත් දේශපාලන පක්ෂ හා වෘත්තීය සමිති වැනි සංවිධානවලත් ස්ත්‍රී නියෝජනය ලෝක මට්ටමින් අවම වේ. ශ්‍රී ලංකාවේ වසර 54 ක පාර්ලිමේන්තු ඉතිහාසය තුළ ස්ත්‍රී නියෝජනය 5.8% ඉක්ම වූ කිසිදු අවස්ථාවක් වාර්තා නොවේ. ස්වීඩනය, ෆින්ලන්තය හා නෝර්වේ වැනි ස්කැන්ඩිනේවියානු රටවල් අතළොස්සකදී හැර ලෝකයේම පාර්ලිමේන්තුවල තත්ත්වය මීට වඩා වෙනස් වන්නේ නැත. ලොව ජනගහනයෙන් හරි අඩක් ස්ත්‍රීන් නියෝජනය කළ ද ලෝක පාර්ලිමේන්තුවල ස්ත්‍රී නියෝජනය 14.0% කි. විධායක මට්ටමේ අමාත්‍යධුර පිළිබඳ තත්ත්වය මීටත් වඩා අයහපත් වේ. දේශපාලන සමාජානුයෝජනයේදී ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය විඥානය අනිවාර්යයෙන් බලපාන අතර විධායක මට්ටමට ළඟාවීමට අවශ්‍ය සමාජමය සම්පත් සාපේක්ෂ වශයෙන් ස්ත්‍රියට ලැබෙන්නේ අවම වශයෙනි.

ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ සහ වෘත්තීය සමිතිවල බොහෝ විට ස්ත්‍රී සාමාජිකත්වය 25%-30% අතර ප්‍රමාණයක් වුවත් තීරණ ගන්නා මට්ටම්වලදී ඇය නියෝජනය වන්නේ 3%-4% ක ප්‍රතිශතයකිනි. පහළ මට්ටමේ ප්‍රචාරණ සහ සහභාගිත්ව අංශවලදී, අරමුදල් එකතු කිරීමේදී හා සුභසාධන කටයුතුවලදී ස්ත්‍රීන් ක්‍රියාශීලීව සහභාගි වුවත් පක්ෂ සැකැස්මේ



ඉහළට ගමන් කිරීමේ ඇති ඉඩකඩ පීතෘමූලික සමාජය විසින් අවම කරනු ලැබ තිබේ. පක්ෂ විධායක කමිටු, මධ්‍යම කාරක සභා හෝ නායකයින් කිපදෙනෙකුගෙන් සමන්විත පක්ෂ අභ්‍යන්තර කමිටු විසින් ගනු ලබන තීරණවලට අනුව කටයුතු කිරීමට ප්‍රායෝගික වශයෙන් ස්ත්‍රීන්ට සිදුවේ.

මෙසේ සලකන විට පවුල් සංස්ථාව තුළ පමණක් නොව, ඉන් පිටත පුළුල් සමාජ තලයන්හිදී ද ස්ත්‍රීන්ට හිමිවන්නේ අප්‍රධාන තත්ත්වයකි. බොහෝ අවස්ථාවලදී තීරණ ගැනීමේ බලය, ආධිපත්‍යය, පාලනය, කළමනාකරණය, සැලසුම් සම්පාදනය හා ඉහළ තාක්ෂණ මට්ටමේ ස්තරවලට අයත්වන්නේ පුරුෂයින්ය. ආගමික ආයතන, අධ්‍යාපනික ආයතන, රැකියා ස්ථාන හා දේශපාලන සංවිධාන යන කවරක හෝ වේවා පහළ මට්ටමේ කාර්යයන් බොහෝ විට පැවරෙන්නේ ස්ත්‍රීන්ටය. එම ආයතන පවත්වාගෙන යාමට ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයේම දායකත්වය අවශ්‍ය වේ. නමුත් වැඩි අගය කිරීමක් හා වැඩි ආර්ථික වටිනාකමක් නිතර ලැබෙන්නේ තීරණ ගන්නා මට්ටමේ තනතුරු දරන්නන්ටය. නිදසුනක් ලෙස ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය ගතහොත්. තේ දළු අතින් නෙලීම, එහිදී සිදුවන ප්‍රධාන කාර්යයකි. ඒ සඳහා විශාල වශයෙන් කාලය හා ශ්‍රමය වැයවේ. එම කාර්යය ඉටු කිරීමට සාමාන්‍යයෙන් 80% ටත් වඩා ස්ත්‍රීන් යොදවා ගනී. එහෙත් ඔවුන් ලබන වැටුප කළමනාකරණ අංශවල වැටුපට වඩා ඉතා අඩුය. තීරණ ගන්නා මට්ටම්වල අනිවාර්යයෙන්ම බහුතරය වන්නේ පුරුෂයින්ය. ස්ත්‍රීන් ඉටුකරන සේවය, ඔවුන්ගේ වැටුප්, නිවාඩු හා වෙනත් අවශ්‍යතා ආදී සියලු දෑ පිළිබඳව තීරණ ගන්නේද මෙම පුරුෂයින්ය. තේ කර්මාන්තයේ පැවැත්මට මේ දෙපක්ෂයේම සේවය අත්‍යවශ්‍ය වන නමුත් පහළ මට්ටමේ යැයි සැලකෙන ස්ත්‍රීන් ඉටුකරන වැඩකොටසට ලැබෙන්නේ අඩු වටිනාකමකි. ස්ත්‍රීන්ගේ අවශ්‍යතා පිළිබඳ හඬක් නැගීමට ඔවුන්ට අවස්ථාවක් නොමැත. මේ අනුව සමස්ත සමාජය තුළම පුරුෂයාට සාපේක්ෂව ස්ත්‍රිය අප්‍රධාන තත්ත්වයකට පත්කොට ඇත.

# 5

# ස්ත්‍රියට හිමි මෙම අප්‍රධාන තත්වයට හේතුවන මූලික කරුණු මොනවාද?

ඉහතින් සඳහන් කළ පරිදි ස්ත්‍රිය අප්‍රධාන හා අවාසි සහගත තත්ත්වයකට පත් වී ඇත්තේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සබඳතා මත නිර්මාණය වී ඇති විශ්වාස, ආකල්ප, සිරිත්, පිළිගැනීම් හෝ සම්ප්‍රදායයන්, නීතිරීති, මිථ්‍යාමත සහ සමාජීය අපේක්ෂාවන් ආදියේ ප්‍රතිඵලයක් ලෙසිනි. මානව සමාජය කාලාන්තරයක් තිස්සේ සැකසී ඇත්තේ, පීතෘමූලිකත්වය ඉස්මතු කෙරෙන ආකාරයෙනි. සමාජයේ මූලිකත්වය පුරුෂයා වෙත පිරිනැමී ඇති අතර ඉහත සඳහන් ආකල්ප, පිළිගැනීම් හා විශ්වාස ආදිය නිර්මාණය වී ඇත්තේ පුරුෂ ඇසකිනි. පුරුෂයා විසින් ස්ත්‍රිය විස්තර කරනු ලබන ආකාරය මත ඒවා සමාජය තුළ ස්ථාපිත වී තිබේ. ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සබඳතා පීතෘමූලික සමාජ පිළිගැනීම්වල ලක්ෂණයකි.

පීතෘමූලික සමාජය විසින් ස්ත්‍රිය වූකලී නිදහස් තීරණ ගැනීමේ හැකියාවක් නැති, දුර්වල තැනැත්තියක ලෙස සලකනු ලැබීම නිසා තීරණ ගන්නා මට්ටම් වලට ඇය අනුයුක්ත කිරීමට මැලිකමක් දක්වයි. ඇයව සමාජානුයෝජනයට ලක්කර ඇත්තේ, වෙනස් ආකාරයකින් නිසා එවැනි තත්ත්වයකට අවතීර්ණ වීමට අවශ්‍ය අත්දැකීම් මෙන්ම මානසික ශක්තිය ඇයට ඇත්තේ පුරුෂයින්ට වඩා අඩුවෙන් විය හැකිය. සමස්ත සමාජ පිළිගැනීම්වලට පිටින් යාමේ අභියෝගය භාරගන්නා ස්ත්‍රීහු බොහෝදෙනා නූතන සමාජය තුළ සමහර පුරුෂයින්ටත් වඩා දක්ෂ හා කාර්යක්ෂම අයුරින් තීරණ ගන්නා මට්ටම්වල කටයුතු කරති. එහෙත් ඔවුන්ගේ සංඛ්‍යාව අතළොස්සකි.

පුරුෂයින්ට සාපේක්ෂව ස්ත්‍රීන්ට හිමි නිදහස සීමිතය. සමාජීය කටයුතුවලදී පුරුෂයින් මෙන් ශ්‍රමය හා කාලය කැපකිරීමට ඉඩකඩක් සමාජය හා පවුල විසින් ඇයට ලබාදී නැත. දරුවන්ගේ හා ගෘහයේ කටයුතුවලට ප්‍රමුඛත්වය දීමට සිදුවන හෙයින් පුරුෂයින්ට සමාන ආකාරයෙන් ස්වාධීනව කටයුතු කිරීමේ කාලය හා ඉඩ ප්‍රස්ථාවන්ද ස්ත්‍රියකට නොමැත. මේ තත්ත්වය තුළ ඇය විසින්ම තමාට පුරුෂයින් මෙන් කටයුතු කළ නොහැකිය යන



හැඟීමද බොහෝවිට ස්ථාපිත කරගෙන තිබේ. එසේම හොඳින් ගෘහය හා දරුවන් රැකබලා නොගතහොත් සමාජයෙන් ලැබෙන අපවාද පිළිබඳව ද ඇය සැලකිලිමත් වේ. තමාට පැවරුණු කාර්යය හරිහැටි ඉටු නොවිය යන මානසික කම්පනය එවිට ඇය තුළ හටගනී. එහෙයින් ස්ත්‍රිය විසින්ම ඇය කොටුකර ඇති රාමුවෙන් හා සමාජ වගකීමෙන් ඉවත් වීමට අකමැති වන අවස්ථාද නිර්මාණය වේ.

ඕනෑම සමාජයක් සංවිධානය වී ඇති ආකාරය මූලික වශයෙන් එහි සංස්කෘතියෙන් ප්‍රකාශවේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතා හා සබඳතා සංස්කෘතියක අත්‍යවශ්‍ය අංග වේ. පවුල තුළ පමණක් නොව සමාජය තුළත් ස්ත්‍රිය හා පුරුෂයා ජීවත්විය යුතු ආකාරය මූලික වශයෙන් තීරණය කරනු ලබන්නේ සංස්කෘතිය විසිනි. එම තත්ත්වය යටතේ පුරුෂයාට හා ස්ත්‍රියට වෙනස් භූමිකා, වගකීම්, ඉඩ ප්‍රස්ථා, අවශ්‍යතා මෙන්ම බාධකත් සංස්කෘතිය විසින්ම නිර්මාණය කරනු ලැබ තිබේ. ඒ නිසා පවුල, සමාජය පමණක් නොව සමස්ත ජාතියේම ස්වරූපය හැඩගැසීමේදී ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ඉතා සක්‍රීය සාධකයක් වේ. එහෙයින් පවුල, සමාජය, දේශපාලන හා ආර්ථික යනාදී සෑම සංවිධානයකම සැකැස්මට හා ක්‍රියාකාරීත්වයට ස්ත්‍රී-පුරුෂ සමාජභාවය බලපෑම් කරයි. ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය ආකල්ප හා අපේක්ෂා දිගු කලක් තිස්සේ පරපුරෙන් පරපුරට දායාද වෙමින් ඉදිරියට එයි. එහිදී ඕනෑම සමාජයක සංස්කෘතික, ආගමික, සමාජීය, ආර්ථික, දේශපාලනික මෙන්ම පාරිසරික සාධකත් ඒවායේ වර්තමානයට හා වෙනස්වීම්වලට බලපෑම් කරයි.

පවරන ලද මෙම සමාජීය තත්ත්වය තුළ ස්ත්‍රීන්ගේ හා පුරුෂයින්ගේ සමාජ භූමිකා පිළිබඳ වෙනස් වූ ආකල්ප ස්ථාපිත වී තිබේ. යම් යම් වෙනස්කම්වලට ලක්වෙමින් තිබුණද තවමත් බහුතරයක් සමාජවල පියා ගෘහමූලිකයා හා පවුලේ උපයන්නා ලෙසත්, මව පවුලේ සාමාජිකයින් පෝෂණය කොට රැකබලා ගන්නා තැනැත්තිය ලෙසත් පිළිගෙන තිබේ. ස්ත්‍රීන් හා පුරුෂයින්ට ලබාදෙන අධ්‍යාපන ඉඩප්‍රස්ථා බොහෝ විට වෙනස් වේ. ඔවුනොවුන්ගේ අධ්‍යාපන අපේක්ෂා ද වෙනස්වන අවස්ථා වැඩිය. පිරිමි දරුවන් වඩාත් අභියෝග ජයගතහැකි ක්ෂේත්‍රවලට බොහෝ පවුල් විසින් යොමුකරනු ලබයි. ගැහැණු දරුවා ස්ත්‍රී භූමිකා ලෙස සැලකෙන අංශවලට බොහෝවිට යොමු කෙරේ. මේ නිසාද දෙපක්ෂයේ අධ්‍යාපන පුහුණුව, ආකල්ප මෙන්ම හැකියාවන් ද වෙනස් වේ. ආර්ථික කටයුතු හෝ රැකියා ස්ථානවලදී තාක්ෂණය, මුදල් හැසිරවීම, ණය ගැනීම, දේපළ හා සංවිධාන පාලනය වැනි කාර්යයන්ට පුරුෂයින් පෙළඹෙන අතර ස්ත්‍රීන්

සඳහා ඒවා භාරදූර වැඩිය යන පිළිගැනීමක් පවතී. දීර්ඝ කාලයක් තිස්සේ බලය, ආධිපත්‍යය දැරීමේ අත්දැකීම් පුරුෂයා ලබා ඇත. එහෙයින් දේශපාලන ක්ෂේත්‍රය තුළත් ඔහු බලය හසුරුවන්නේ ස්ත්‍රියකට වෙනස් අයුරිනි. එසේම බලය ලබාගැනීම, නායකත්වය, සංවිධානය හා බලය ආරක්ෂා කරගැනීම ආදිය සම්බන්ධයෙන් ද ස්ත්‍රියට වඩා වෙනස් වූ අත්දැකීම් පුරුෂයාට තිබේ. ඒ නිසා ස්ත්‍රියට වඩා පුරුෂයාට ස්වයං අධිෂ්ඨානය හා ශක්තිය තිබේ. එසේම පුරුෂයා එය ස්ත්‍රියට වඩා හොඳින් ඉටුකරාවිය යන හැඟීමද සමාජය තුළ පවතී. මෙබඳු සමාජ තත්ත්වයකදී නිරායාසයෙන්ම පුරුෂයා වඩාත් වාසි සහගත සහ ස්ත්‍රිය වඩාත් අවාසි සහගත තත්ත්වයකට පත් කරනු ලැබ තිබේ.

එම තත්වය මත, ස්ත්‍රිය ආරක්ෂා කළයුතුය, ඇයගේ ප්‍රජනන කාර්යට මූලිකත්වය දිය යුතුය, වැනි පිළිගැනීම්ද සමාජය තුළ ස්ථාපිත වී තිබේ. ඒ අනුව ස්ත්‍රීන් හා පුරුෂයන් සඳහා අසමානවූ නීති, හා ප්‍රතිපත්ති ද රාජ්‍ය විසින් නිර්මාණය කරනු ලැබ තිබේ. එබඳු ද නිසා බොහෝ සමාජ වලදී ස්ත්‍රීන්ට අඩු ඉඩප්‍රස්ථා හා අඩු සම්පත් පුරුෂයන්ට සාපේක්ෂව හිමිවේ. ස්ත්‍රීන්ගේ පෞද්ගලික මෙන්ම පොදු කටයුතු, ස්වාධීන බව, නිදහස මෙන්ම අපේක්ෂාද මේ නිසා සීමා කළයුතු තත්වයකට පත්වේ. එහෙයින් ආයතනාත්මක නැතිනම් ව්‍යුහාත්මක සහ ප්‍රතිපත්තිමය කරුණුත් ස්ත්‍රිය අප්‍රධාන තත්වයකට පත්කිරීමේ ලා බලපාන බැව් පෙන්වා දිය හැකිය.

ආකල්ප, අපේක්ෂා හා හැසිරීම් නිරතුරුවම වැඩිමහල්ලන්ගෙන් බාල පරපුර ඉගෙන ගනී. ඒවා කොතෙක් දුරට ස්ත්‍රීන් හා පුරුෂයින්ගේ සිත් තුළට කාවැදී ඇත්දැයි කිවහොත් බොහෝ අවස්ථාවලදී අප විසින් නොදැනුවත්වම අපගේ දරුවන් මෙම ආකල්ප, හැසිරීම් හා භූමිකා ආදියට අනුව හැඩගස්වනු ලැබේ. එහෙයින් මෙම වෙනසට මූලික හේතුව ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමාජානුයෝජනය ලෙස දැක්වීම නිවැරදිය.

# 6

# ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමාජානුයෝජනය යනු කුමක්ද?

සමාජානුයෝජනය යනු යම් පුද්ගලයෙකු සමාජයට අනුගත කිරීමයි. නොඑසේනම් සමාජ සිරිත් විරිත්, සම්ප්‍රදායයන්, හොඳ නරක, හැසිරිය යුතු ආකාරය, සමාජය අපෙන් හා අප සමාජයෙන් අපේක්ෂා කරන දෑ, අපේ යුතුකම්, වගකීම් හා අයිතිවාසිකම් යනාදී විවිධ දෑ ගැන අප සමාජයෙන් ඉගෙන ගැනීමයි. එම ඉගෙනීම හා අවබෝධය අනුව අපගේ හැසිරීම් හා ජීවිත හැඩ ගැසේ. මේ අනුව සමාජානුයෝජනය යන්නෙන් සරලව හැඟෙන්නේ විශේෂයෙන්ම කුඩා අවස්ථාවේ සිට සමාජයේ ජීවත් විය යුතු ආකාරය ගැන විවිධ ආකාරයෙන් සමාජයෙන් ඉගෙන ගැනීමයි. ඒ ඉගෙනීම් අනුව අප සමාජයේ ජීවත් විය යුතුය යන හැඟීම බොහෝ දෙනා තුළ ඇතිවේ. දීර්ඝ කාලයක් තිස්සේ මෙම ඉගැන්වීම් හා පුරුදු-පුහුණු කිරීම් සමාජය තුළ ස්ත්‍රී-පුරුෂ ලිංගභේදය අනුව අසමාන ආකාරයකින් සිදුවෙමින් පවතී. ස්ත්‍රීන්ට ස්වභාව ධර්මයෙන්ම ප්‍රජනන කාර්යයට හැකියාවක් දී ඇතත්, සෙසු සියලුම භූමිකා, චරිත ලක්ෂණ, ඔවුන් කෙරේ ඇති ආකල්ප ආදිය සමාජය තුළ ස්ථාපිත කර ඇත්තේ මෙම ඉගැන්වීම් මාර්ගයෙන් සමාජය විසිනි. ගෘහාශ්‍රිත ක්ෂේත්‍රය තුළ වඩා අසමාන වගකීමක් ස්ත්‍රීන්ටත්, පවුලේ උපයන්නා හා ආරක්ෂකයා වැනි ආකල්ප හා භූමිකා ආදී දේ පුරුෂයින්ටත් පරපුරෙන් පරපුරට පවරා දෙන්නේ ද මෙම පුහුණුකිරීම් මගිනි. ස්ත්‍රීන්ට ප්‍රජනන කාර්යය පැවරී ඇති නිසා ඇය ආරක්ෂා කළ යුතුය. ඇගේ ශරීරිය ශ්‍රාමකය, කමනශීලීය, ඇය හා ඇගේ ලිංගිකත්වය පහසුවෙන් පීඩාවට ලක්විය හැකිය. එහෙයින් ඇය පුරුෂයින්ගේ ආරක්ෂාව මත ගෘහය තුළ ජීවත් විය යුතුය යන මූලික ආකල්ප ද මෙම ඉගැන්වීම් තුළ ගැබ්ව තිබේ. මේ තත්ත්වය මත සමාජය විසින් ස්ත්‍රියට දරුවන්ගේ කටයුතු හා ගෘහීය කටයුතු පවරා ඇති අතර ඇය පුරුෂයාට අවනතව ජීවත් විය යුතු අයෙක් බවටද පත්කර තිබේ. එයට අසමාන අයුරින් පුරුෂයා ශක්තිමත් ශරීරයක් ඇත්තෙකු ලෙස සලකා ඔහු ගෘහයෙන් පිටත පොදු කටයුතුවල හා නිෂ්පාදන කාර්යයෙහි නියැලිය යුතු අයෙකු බවට පත්කර තිබේ. දිගු කලක් තිස්සේ පවුල, පාසල හා ,වෙනත් අධ්‍යාපනික ආයතන, ආගමික ආයතන, ජනමාධ්‍ය, රාජ්‍යය හා ආණ්ඩුව, අසල් වැසියන්, මිතුරන්, නෑදෑයින්,

රැකියා ස්ථාන, වෘත්තීය සමිති හා දේශපාලන පක්ෂ ආදී සෑම සමාජ සංවිධානයක් මගින්ම පාහේ මිනිස් මනස තුළට මේ ඉගැන්වීම් හා පුරුදු පුහුණු කිරීම් කාවද්දනු ලබමින් තිබේ. ඒ නිසා බොහෝ ස්ත්‍රීන් හා පුරුෂයින්ගේ ජානවලට බද්ධ වන තරමට ස්ත්‍රී-පුරුෂ භූමිකා, ආකල්ප හා අපේක්ෂා ආදිය පිළිබඳ විශ්වාස, සාරධර්ම හා පිළිගැනීම් මනස් තුළට කිදා බැස තිබේ. මෙසේ අසමාන වූ ආකාරයෙන් ස්ත්‍රීන් හා පුරුෂයින් සමාජයට හුරු කිරීම, ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමාජානුයෝජනය ලෙස සරලව හැඳින්විය හැකිය. එම ක්‍රියාකලාපය සුළු සුළු වෙනස්කම්වලට ලක්වෙමින් තිබුණ ද තවමත් මූලික අභියෝගයකට ලක්ව් නොමැත.

සමාජානුයෝජන ක්‍රියාවලියට දායක වන කාරක රැසක් මීට පෙර හඳුන්වා දී ඇත. එම කාරක මගින් දරුවකු සමාජයට අනුගත වන්නේ කෙසේදැයි සැකෙවින් විස්තර කළ හැකිය. නිදසුන් ලෙස බොහෝ පවුල්වල ගැහැණු දරුවකුට හා පිරිමි දරුවෙකුට ඇඳුම්, ආහාර-පාන හා සෙල්ලම්බඩු ලබාදීමේදී වැඩිමහල්ලෝ අසමාන අයුරින් කටයුතු කරති. පවුල තුළ වීනය, දරුවන්ට ලබා දෙන නිදහස, අධ්‍යාපනය වැනි දෑ වලදීත් ගැහැණු දරුවන්ට වඩා වෙනස් ආකාරයකින් පිරිමි දරුවන්ට සලකයි. බොහෝ මව්වරු ඉවුම් පිහුම් හා ගේ දොර පවිත්‍ර කිරීමේ කටයුතු ආදියට පුරුදු පුහුණු කරන්නේ ගැහැණු දරුවන් වන අතර ගෘහයෙන් පිටත කටයුතුවලට පිරිමි දරුවන් යොමු කරවති. එසේම පියාගේ ආධිපත්‍යයට හා වැඩිමහල් සොහොයුරන්ගේ ආධිපත්‍යයට අවනතවීම පිළිබඳ ඉගෙන ගන්නේද පවුලේ වැඩිමහල් සාමාජිකයින්ගෙනි. පවුලේ දේපළ බෙදා දීමේදීත් බොහෝ විට වැඩි සැලකිල්ලක් දක්වන්නේ පිරිමි දරුවන් කෙරෙහිය. පිරිමි දරුවන් පවුල් නාමය හා පරපුර ඉදිරියට රැගෙන යන්නන් ලෙස සැලකීම එයට මූලික හේතුවයි. මෙම වෙනස් ආකල්ප, සැලකීම් හා භූමිකා ආදිය නිසා අනිවාර්යයෙන්ම ගැහැණු දරුවා හා පිරිමි දරුවා හැඩගැසෙන්නේ වෙනස් ආකාරයකිනි. වැඩිමහල්ලන් ඉගැන්වූ ආකාරයට පිටතින් කටයුතු කිරීමට බොහෝ දරුවන් පැකිලෙන අතර එසේ කළහොත් එය පවුලට, සමාජයට හා අදාළ පුද්ගලයාට නොගැළපෙන දෙයක් ලෙසද සමාජය සලකයි.

අධ්‍යාපන ආයතන විසින් ද මෙබඳුම ආකාරයෙන් ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය වෙනස්කම් අවධාරණය කරයි. මෑතක් වනතුරු බොහෝ පාසල්වල ගෘහ විද්‍යාව, හා මැහුම් වැනි විෂයයන් ගැහැණු දරුවන්ට හා වඩු කර්මාන්තය වැනි විෂයයන් පිරිමි දරුවන්ට වෙන්කර තිබිණි. පාසැල් පෙළ පොත් මගින්ද බොහෝ විට ස්ත්‍රී-පුරුෂ චරිත ලක්ෂණ, භූමිකා හා අපේක්ෂා යනාදිය සම්බන්ධයෙන් පවතින සම්ප්‍රදායික පිළිගැනීම් තවදුරටත්



ස්ථාපිත කෙරේ. එසේම විෂයයන්ගෙන් පරිබාහිර අධ්‍යයන කටයුතුවලදී හා ක්‍රීඩාවලදී ද පිරිමි හා ගැහැණු දරුවන් වෙනස්වූ ආකාරයේ කුසලතාවලට යොමු කෙරේ.

ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබන සිසුන් අතරින් සමාජ විද්‍යා හා වෛද්‍ය විද්‍යා විෂයයන් හදාරන සිසුවියන්ගේ ප්‍රතිශතය 52%-70% පමණ වන අතර දශක ගණනාවක් තිස්සේම ඉංජිනේරු විද්‍යාව හදාරන සිසුවියන්ගේ ප්‍රතිශතය 12%-13% ක් පමණ වේ. ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය ආකල්ප මෙම වෙනසට අනිවාර්යයෙන්ම බලපෑම් කරයි. විශ්වවිද්‍යාල සිසුන්ගේ පොදු කටයුතුවලදී ස්ත්‍රීන්ගේ හා පුරුෂයින්ගේ සහභාගිත්වයේ විශාල වෙනසක් දැකිය හැකිය. විශේෂයෙන් ශිෂ්‍ය සංගම්වල කටයුතුවලට ගැහැණු සිසුන් අඩු ප්‍රමාණයක් සහභාගි වන අතර, ශිෂ්‍ය සංගම් හා වෙනත් හිල සංගම්වල තීරණ ගන්නා තනතුරු මුළුමනින්ම පාහේ දරනු ලබන්නේ පිරිමි සිසුන් විසිනි. සිසුවියන්ගේ ප්‍රතිශතය 50% ඉක්මවූවද, රටේ දේශපාලනයේදී මෙන්ම සරසවි දේශපාලනයේදීත් තීරණ ගැනීම පිරිමි සිසුන්ට උරුම දෙයක් ලෙස සලකනු ලැබේ.

ශ්‍රී ලාංකිකයින් විසින් අදහනු ලබන සෑම ආගමකින්ම මෙම ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය වෙනස මිනිස් මනස් තුළ ස්ථාපිත කරනු ලැබෙයි. ආගමික ඉගැන්වීම්වලින් හෝ අර්ථකථනවලින් පුරුෂයාට වඩා වෙනස් තත්ත්වයක් ස්ත්‍රියට ලබා දී ඇත. ආගමික ස්ථානවලදී, උත්සවවලදී හෝ වෙනත් ආගමික කටයුතුවලදී ස්ත්‍රීන්ට සීමාකම් නියම කරයි. පූජකවරය සම්බන්ධයෙන් පුරුෂයින්ට ඇති නිදහස කිසිම ආගමකින් ස්ත්‍රියට හිමිකර නැත. සෑම ආගමකින්ම පාහේ, දරුමල්ලන් හොඳින් රැක බලා ගැනීම, ස්වාමියාගේ හා ගෘහයේ කටයුතු නිසිලෙස ඉටුකිරීම ස්ත්‍රීන්ගේ වගකීම් ලෙස අවධාරණය කරන අතර, එම වගකීම් පැහැර හරින ස්ත්‍රීන් හොඳ මව්වරුන්, හොඳ ගෘහිණියන් හෝ හොඳ බිරින්දෑවරුන් නොවන බවද අවධාරණය කෙරේ. ඒ අනුව ආගම්වලින්ද ස්ත්‍රීන් හා පුරුෂයින් පිළිබඳ වෙනස්වූ ආකල්ප, භූමිකා හා ප්‍රාර්ථනා සමාජයට කාවද්දයි.

සාහිත්‍යය මෙන්ම විද්‍යුත් හා වෙනත් මාධ්‍ය විසින්ද, බොහෝ අවස්ථාවලදී ස්ත්‍රීන් ලාමක, සුන්දර, වහා වෙනස්වනසුළු, දුර්වල, පුරුෂයින් මත යැපෙන කොටසක් ලෙස අවධාරණය කෙරේ.ශක්තිමත්, ධෛර්යවන්ත, නිර්භීත ස්ත්‍රීන් කොහෙතුත් අප සමාජය තුළ සිටියත් එබඳු චරිත මාධ්‍ය විසින් උලුප්පා දක්වනු ලබන්නේ ඉතාමත් කලාතුරකිනි. නාට්‍ය, කවි, කෙටිකතා, නවකතා හා රූපවාහිනී ටෙලිනාට්‍ය වැනි අංශවලින්ද සම්ප්‍රදායික

ස්ත්‍රියගේ හා පුරුෂයාගේ ප්‍රතිරූප, නිතර ඉදිරිපත් කෙරේ. වෙළෙඳ දැන්වීම් හා වෙනත් ප්‍රචාරණ මඟින්ද නිර්මාණය කෙරෙන්නේ එබඳු තත්ත්වයකි. රෙදි සේදීම, ඉවීම, වළං-පිඟන් සේදීම, දරුවන්ට කිරි පෙවීම, ලෙඩුන් හා වයෝවෘද්ධ පුද්ගලයින් රැකබලා ගැනීම වැනි කාර්යයන් නිරන්තරයෙන් සම්බන්ධ කරන්නේ ස්ත්‍රී චරිත සමඟ වන අතර, කළමනාකරණය, තීරණ ගැනීම, හා තාක්ෂණය යන දෑ සම්බන්ධ කරන්නේ පුරුෂ චරිත සමඟය. එබඳු නිර්මාණවලින් සම්ප්‍රදායික ස්ත්‍රී හා පුරුෂ ප්‍රතිරූප, ස්වභාවික දේ ලෙස තවදුරටත් මිනිස් මනස් තුළට කාවද්දයි.

රාජ්‍යය විසින්ද අසමාන නීතිරීති හා ඒවා ක්‍රියාත්මක කිරීමට ආයතනද නිර්මාණය කරමින් ස්ත්‍රී පුරුෂ වෙනස පවත්වාගෙන යාමට ආධාර දෙනු ලැබේ. බොහෝ රටවල ගෘහ මූලිකයා ලෙස රාජ්‍ය සලකන්නේ පවුලේ වැඩිමහල් පුරුෂයාය. දරුවන්ගේ භාරකරුවාද පියා ලෙස සැලකේ. පවුලේ දේපළ, විවාහය, දික්කසාදය, ස්ත්‍රී දූෂණ හා ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැනි දෑ සම්බන්ධ නීතිරීතිද පුරුෂයන්ට වාසි වන අයුරින් නිර්මාණය කර තිබේ. මෑතකාලයේ මෙම නීතිවලින් සමහරක් වෙනසකට භාජනය වුවද රාජ්‍ය පරිපාලකයන්ගේ ආකල්පමය වෙනසක් ඒ හා සමගාමීව සිදුවී නොමැත. ඒනිසා නීති ක්‍රියාත්මක වීමේදී අපේක්ෂිත වෙනස සිදුවන්නේ ඉතා සෙමිනි.

ඉහත සඳහන් කරන ලද සෑම කාරකයක් මෙන්ම හිතමිතුරන්, ක්‍රීඩා සමාජ, වෘත්තීය සමිති, දේශපාලන සංවිධාන, බලපෑම් කණ්ඩායම් හා වෙනත් සමාජ සංවිධාන විසින්ද මේ අයුරින් ස්ත්‍රියට හා පුරුෂයාට අසමාන සමාජ තත්ත්වයන් සහ භූමිකා නිර්මාණය කර දෙනු ලැබේ. එහෙයින් විශාල වෙනසකට ලක් නොවී දිගු කලක් තිස්සේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය ආකල්ප පරපුරෙන් පරපුරට ඉගැන්වේ.

# 7

# ස්ත්‍රී-පුරුෂ සමාජභාවය වෙනසකට ලක්කළ නොහැකිද?

ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනිවාර්යයෙන්ම වෙනසකට ලක්කළ හැකිය. එය ගතික සංකල්පයක් වන අතර පසුගිය දශක කීපයක ඉතිහාසය ගත්විට එහි වෙනස්වනසුළු බව මැනවින් පැහැදිලි කරගත හැකිය. බොහෝ රටවල, වසර 50 කට පෙර ස්ත්‍රීන් හා පුරුෂයන්ට සමාජයේ පැවති තත්ත්වය අද වෙනසකට ලක් වෙමින් තිබේ. විශේෂයෙන්ම අධ්‍යාපන, දේශපාලන, ආර්ථික අංශවලදී ස්ත්‍රියට ගෘහයෙන් පිටත කටයුතුවල නිරතවීමට එදා නිදහසක් නොතිබිනි. නමුත් නූතන ස්ත්‍රියට පුරුෂයාට සමාන අයුරින් බොහෝ අවස්ථාවලදී අධ්‍යාපනය ලැබීමට, රැකියාවක් කිරීමට, ඡන්දය ප්‍රකාශ කිරීමට හා සිය ජීවිතය සම්බන්ධ යම් යම් තීරණ ගැනීමට නිදහසක් ඇත. උසස් අධ්‍යාපනයේ නිරත ස්ත්‍රීන් සංඛ්‍යාවද අද වැඩිවෙමින් පවතී. බොහෝ පුරුෂයෝද පෙරට වඩා ගෘහීය කටයුතු, දරුවන් පෝෂණය හා ඔවුන්ගේ අධ්‍යාපනය වැනි දෑ සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කරති. එසේම තාක්ෂණ දියුණුව වැනි දෑ නිසා ගෘහීය කටයුතුවලට ස්ත්‍රීන් කැපකළ කාලයද ක්‍රමයෙන් අඩුවෙමින් පවතී. ස්ත්‍රීන්ගේ නායකත්වය මත ආර්ථික ව්‍යාපාර, දේශපාලන හා සමාජ සංවිධාන ආදියද පෙරට වඩා ක්‍රියාත්මක වේ. ස්ත්‍රී නායකත්වය යටතේ කටයුතු කරන පුරුෂයන්ද බොහෝවිට දක්නට ලැබේ. පවුල් සැලසුම් ක්‍රමවල ව්‍යාප්තිය හා ඒ පිළිබඳ දැනුම වර්ධනය වීමේ හේතුවෙන් බොහෝ ස්ත්‍රීහු පවුලේ දරුවන් සංඛ්‍යාව පිළිබඳ තීරණය කිරීමේදී මූලිකත්වය ගනිති. උසස් අධ්‍යාපන කටයුතුවල නිරතවීම හා වගකීම් වැඩි විධායක මට්ටමේ රැකියාවල නිරතවීම වැනි හේතු නිසා ස්ත්‍රීන් විවාහවීම ප්‍රමාද කිරීමද අද සිදුවේ. පුරුෂයන් හා සාකච්ඡාකොට දරුවන් ලැබීම ප්‍රමාද කෙරෙන අවස්ථාද ඇත. මෙබඳු වෙනස්කම් නිසා ස්ත්‍රිය කෙරේ පැවති සමාජ ආකල්පද යම්තරමකින් හෝ වෙනසකට භාජනය වෙමින් පවතී. එයට සාපේක්ෂව පුරුෂයා පවුලේ යැපෙන්නා ලෙස පැවති මූලික වගකීමේ යම් ලිහිල් වීමක්ද දක්නට ලැබේ.

මෙම වෙනස අවබෝධ කර ගැනීම සඳහා ඉතා හොඳ නිදසුනක් ඉදිරිපත් කළ හැකිය. වසර 96 ක් පමණ ජීවත් වී, මෙයට වසර 41 කට පෙර

මියගිය අප පවුලේ මිත්තණිය මධ්‍යම පංතික පවුලක වැඩිමහල් දියණියයි. ඇය කිසිදිනක පාසල් අධ්‍යාපනයක් ලබා නොතිබූ අතර අකුරු ලිවීමට හෝ කියවීමටද නොදත්තාය. ඇයට 14 වසර සපිරෙද්දී, ඇගේ පියා ගෙන ආ යෝජනාවකට අනුව එක් දිනක් පමණක් ගෙදරදී මුණ ගැහුණු මුත්තා සමඟ විවාහ වීමට සිදුවිය. ඉන්පසු දරුවන් නව දෙනෙකු ඇතිදැඩි කරගෙන, ගෙදර දොර හා කුඹුරුපිට්ටිවල කටයුතුද ඇය ඉටු කළාය. ඇගේ වැඩිමහල් දියණිය, මගේ අත්තම්මා ද කිසිදිනක පාසලකට නොයැවිණි. එහෙත් එම පවුලේ පිරිමි දරුවන්ට පාසල් අධ්‍යාපනය ලබාදී ඇති අතර ඇයට ගමේ ගුරුවරයෙකු ගෙදරට ගෙන්වා අකුරු උගන්වා තිබිණි. ගැහැනු දරුවන් පාසලට හෝ ගෙදරින් පිටත යැවීමෙන් නොමඟ යා හැකිය යන මතය පැවති නිසා අත්තම්මාට පාසල් වරම නොලැබිණි. ඇයටද වසර 18 දී ඇගේ පියා ගෙනා යෝජනාවකට අනුව විවාහවීමට සිදුවිය. ඇගේ ස්වාමිපුරුෂයා ඉතා නිදහසින් හා විනෝදයෙන් කල් ගතකළ අයෙකුවූ අතර ඒ පිළිබඳ අත්තම්මා වරක් ප්‍රශ්න කිරීමකදී ඔහු දී තිබුණ පිළිතුර මෙසේය. "කන්න, බොන්න ගෙදරට ගෙනත් දෙනවා; උදව්වටත් ගෙදර අය ඉන්නවා; දරුමල්ලන් හා ගෙදර දොර බලාගෙන ඉන්න එකයි ගැහැණියක් කළ යුත්තේ. මම කරන දේ ගැන සොයන්න වුවමනා නැහැ." සම්ප්‍රදායික සමාජය තුළ අත්තම්මා කොතරම් පියාගේ හා ස්වාමියාගේ තීරණවලට අවනතව ජීවත්වූවාද යන්න ඉන් පැහැදිලි වේ. ඇය දෙමව්පියන් බැලීමට, ඥාතියකුගේ මංගල්‍යයකට හෝ අවමංගල්‍යයකට ආත්තා සමඟ කරත්තයෙන් ගියා හැරුණුවිට, කිසිදු දිනක තනිව ගෙදරින් බැහැරව නොගියාය.

තෙවැනි පරපුරට අයත් මගේ මවට පාසැල් අධ්‍යාපනය ලැබිණි. නමුත් නිතර ඇගේ පියා "පාසල් ගිහින් හොඳින් ඉගෙන ගන්න, කොල්ලො යාළුකර ගත්තොත් බලාගෙනයි" යන තර්ජනාත්මක අවවාදය ලබාදුනි. ඇය ජ්‍යෙෂ්ඨ විභාගය සමත්වී මාස කිපයක් පාසලක ඉගැන්වූවාය. ඒ අතර දිනක් පාසලට පැමිණි ඇගේ පියා "වහාම ගෙදර යන්න රෙදි පෙට්ටිය සූදානම් කරගන්නැයි" පවසා ඇත. එයට හේතුව ඇය වරක් විමසුවද පිළිතුරු ලැබී නැත. ඇය පියා හා නිවසට යද්දී ඇගේ විවාහ මංගල්‍යයට ගෙදරදොර සූදානම් කරනු දුක තමා එතරම් ඉක්මනින් විවාහ වීමට අකැමැති බැව් ප්‍රකාශ කර ඇත. එහෙත් එයට ආත්තා දුන් තර්ජනාත්මක පිළිතුර වූයේ, "පුතේ, උඹ මේ කටයුත්තට කැමති වෙන්න ඕනා. නැතිනම් මම මේ ගෙදර ඉන්නෙ නැහැ. මේ මිනිහා හොඳින් යමක් කමක් සොයාගෙන ඉන්න මිනිහෙක්" යන්න පමණි. මවගේ විවාහයෙන් පසු ඇයද දරුවන් සත්දෙනෙකු ලැබ, ඔවුන් රැකබලාගෙන, ගේදොර කටයුතු මෙන්ම පියාගේ ව්‍යාපාර කටයුතුවලටද අතදෙමින් ඔහු මහ යැපෙන්නියක වූවාය. එහෙත් ඇය ලද අධ්‍යාපනය



දරුවන්ට ලබාදීමට විශේෂයෙන් ගැහැණු දරුවන්ට ලබාදීමට ඇය නිතර අධිෂ්ඨානයෙන් යුක්තව කටයුතු කළාය. පියා දේපළ මිලදී ගනිද්දී, දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳ තීරණ ගනිද්දී, ඇයද බලපෑම් කළාය. පියාගේ අකල් වියෝවෙන් පසු වසර 43 ක් වයසැති මව දිරිය මවක වී දරුවන් හා ගෘහීය කටයුතුවලට අමතරව දේපළ හා ව්‍යාපාර පාලනයටද මුල පිරුවාය, එහි ප්‍රතිඵලයක් ලෙස සියලුම දරුවන්ට ඉතා හොඳ අධ්‍යාපනයක් ලබාදීමට ද ඇය සමත්වූවාය.

එම දියණිවරු විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබා ආදායම් උපයන රැකියාවල නිරත වී සිටින අතර රැකියාව, විවාහය හා පවුලේ වැදගත් තීරණ වලදී මුල් පරපුර තුනට සාපේක්ෂව, ඔවුන්ට බෙහෙවින් ස්වාධීන තීරණ ගැනීමට ද හැකියාවක් ලැබී ඇත. එහෙත් සමාජයේ පවතින සම්ප්‍රදායික ආකල්පවලින් මුළුමනින්ම නිදහස් වීමට මෙම දියණිවරුන්ටද හැකියාවක් ලැබී නැත. මෙම පරපුරවල් හතරේ ස්ත්‍රීන් දෙස බැලීමෙන් එදා ස්ත්‍රිය මත පැවති සමාජ තත්ත්වය හා අද තත්ත්වය බොහෝ දුරට වෙනස් වී ඇති බව පැහැදිලි කර ගත හැකිය. අධ්‍යාපනය ලැබීම තුළින්, ආර්ථික අංශයෙන් පමණක් නොව, සමාජීය තත්ත්වය හා මනෝභාවාත්මක අතින්ද ස්ත්‍රීන් ශක්තිමත්වීම හා ස්වාධීනවීම පිළිබඳ මෙම පරපුර ලබාදෙන නිදසුන ඉතා වැදගත්ය.

ඉහතින් විස්තර කළ ආකාරයට දශක කිපයකට පෙර ස්ත්‍රීන් බොහොමයක් දෙනාට අධ්‍යාපනය ලැබීමේ වරම, නිවසින් පිටත යාමේ වරම, විවාහයට සුදුසු පුද්ගලයා තෝරා ගැනීමේ වරම, දරුවන් සංඛ්‍යාව තීරණය කිරීමේ හෝ ප්‍රජනන කාර්ය පාලනය කිරීමේ හැකියාව, පියා හෝ ස්වාමි පුරුෂයාගේ තීරණ පිළිබඳ ප්‍රශ්න කිරීමේ හැකියාව නොතිබිණි. සම්ප්‍රදායික ආකල්ප, විශ්වාස හා අගය කිරීම් මත ඇය නිවසට සීමාවූ, පුරුෂයාගේ තීරණවලට අනුව ජීවත්වන, ආර්ථික හැකියාවක් නැති තැනැත්තියක වූවාය. එහෙත් නූතන යුගයේ ජීවත්වන අප හා අපගේ දියණිවරුන් මීට හාත්පසින්ම වෙනස්ය. විශේෂයෙන් අප පරපුරටත් වඩා අප දියණිවරුන්ට අධ්‍යාපනය ලැබීමට, කැමැති ඕනෑම ක්‍රීඩාවක යෙදීමට, කැමති රැකියාවක නිරතවීමට, නවීන ඇඳුම්-පැළඳුම් ඇඳීමට හා පැළඳීමට, සහකරුවකු තෝරා ගැනීමට, පවුලේ දරුවන් සංඛ්‍යාව තීරණය කිරීමට, නිවාස, ඉඩකඩම් මිලදී ගැනීම ආදී බොහෝ දේ සම්බන්ධව පෙරට වඩා වැඩි නිදහසක් ඇත. එයින් පැහැදිලි වන්නේ, සමාජ, ආර්ථික, සංස්කෘතික හා දේශපාලනික වෙනස්කම්, තුළින් වසර ගණනාවක් තුළදී ශ්‍රී ලාංකික ස්ත්‍රියගේ හා පුරුෂයාගේ තත්ත්වයද සැහෙන ප්‍රමාණයකින් වෙනස්වී ඇති

බවය. සමස්ත ශ්‍රී ලාංකික සමාජයටම මෙම තත්ත්වය පොදු යයි පැවසිය නොහැකිය. මන්ද මානව වර්ග, ආගමික කණ්ඩායම්, ප්‍රදේශ, පංති, ගැමි හා නාගරික වැනි විවිධ සමාජ ස්ථරවලදී ස්ත්‍රී-පුරුෂ සමාජභාවයේ සිදුවන මෙම වෙනස අසමාන වන හෙයිනි. නිදසුන් ලෙස උසස් අධ්‍යාපනයක් ලත් නාගරික, ඉහළ මැද පංතියේ පරිසරයක ජීවත්වන ස්ත්‍රීන් හා පුරුෂයින්ගේ සමාජ තත්ත්වයට වඩා බෙහෙවින් වෙනස් තත්ත්වයක් ඉතා දිළිඳු, ගැමි, එතරම් අධ්‍යාපනයක් නොලද පුද්ගලයන්ගෙන් යුත් පරිසරයක තිබිය හැකිය. එසේම බටහිර සංවර්ධිත සමාජවල බොහෝ ස්ත්‍රීන්ට හා පුරුෂයින්ට අධ්‍යාපනය හා ආර්ථික දායකත්වය නිසා හිමිවන සමාජ තත්ත්වයක් දියුණුවෙමින් පවත්නා දකුණු ආසියාතික රටකින් දකිය නොහැකිය. එහෙත් ඒ ඕනෑම සමාජයක සිදුවන සමාජ, ආර්ථික හා දේශපාලනික වෙනස්වීම් අනුව කාලයෙන් කාලයට මෙන්ම සමාජ ස්ථරයෙන් ස්ථරයටත් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය වෙනස්වනවා පමණක් නොව, වෙනස් කිරීම්වලට ලක්කිරීමේ හැකියාවද ඉතිහාසයේ අත්දැකීම්වලින් පැහැදිලිවේ.

සමාජානුයෝජනයට දායක වන පවුලේ වැඩිමහල් සමාජිකයින්, අධ්‍යාපන, ආගමික ආයතන, රාජ්‍යය, ආණ්ඩුව, දේශපාලන පක්ෂ, වෘත්තීය සමිති හා වෙනත් සමාජ සංවිධාන, සම වයස් කණ්ඩායම් හා ජන මාධ්‍ය වැනි සෑම කාරකයක්ම ස්ත්‍රීන් හා පුරුෂයින් ලිංගික වෙනස මත නොබෙදා ඔවුන්ට සමාන සමාජ තත්ත්වයන් ලබාදෙයි නම්, මෙම බෙදුණු ආකල්ප, සමාජ භූමිකා හා විශ්වාස ආදිය බොහෝ දුරට වෙනස් කළ හැකිය. ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම සමාන වැදගත්කමකින් යුක්ත, සමාන හැකියාවන් ඇති මිනිස් ජීවීන් ලෙස සැලකිය යුතුය. විශේෂයෙන් සමාජය තුළ මුල් බැසගෙන ඇති ආකල්ප වෙනස් කිරීමේලා ඉහත සඳහන් කළ කාරකයන්ට විශාල මෙහෙයක් ඉටු කළ හැකිය.

ස්ත්‍රීන් දුර්වල හා තීරණ ගැනීමේ දක්ෂතාවක් නැති කොටසක් ලෙස නොසලකා ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම සමාන අයිතිවාසිකම් හා ඉඩ ප්‍රස්ථා සැලසෙන පරිදි ආයතනික වෙනස්කම්ද ඇතිකළ යුතුය. දේපළ, පවුල, විවාහය, දික්කසාදය, දරුවන්ගේ භාරකාරත්වය ආදිය සම්බන්ධ නීති-රීති එක් පක්ෂයකට වාසි නොවන ආකාරයෙන් සැකසිය යුතුය. ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය වෙනස නැතිකොට, සම සාධාරණත්වය ඇතිකිරීම සඳහා රැකියා අවස්ථා, උසස්වීම්, පුහුණුවීම්, දේශපාලන හා වෙනත් පොදු කටයුතු සඳහා වන අයිතිවාසිකම්, ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා ලිංගික අතවර ආදියට එරෙහි නීති-රීතිද ස්ථාපිත කිරීම අත්‍යවශ්‍ය වේ. ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය වෙනස නිසා ලොව බොහෝ රටවල අඩු අධ්‍යාපනයක්



ලබන්නේත්, අඩු දේපළ හා වෙනත් සම්පත් හිමිවන්නේත්, විරැකියාවට වැඩිපුර ලක්වන්නේත්, දිළිඳුකමෙන් වැඩිපුර පීඩාවට පත්වන්නේත් පුරුෂයින්ට වඩා ස්ත්‍රීන්ය. විශේෂයෙන් දියුණු වෙමින් පවතින රටවල නිවාස හිගය, දරුවන්ට අධ්‍යාපනය සඳහා වන අඩු පහසුකම්, ජල හිගය හා ප්‍රවාහන අපහසුතා ආදියෙන් පුරුෂයින්ට වඩා පීඩාවට පත්වන්නේද ස්ත්‍රීන්ය. එහෙයින් එම වෙනස අවම කිරීමට අවශ්‍ය. ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයේම වර්ධනය ඉලක්ක කරගත් සංවර්ධන ක්‍රියාදාමයන් කඩිනම් කළ යුතුය. එසේම දේශපාලන හා වෙනත් වැදගත් තීරණ ගන්නා ආයතනවලට ස්ත්‍රීන් සහභාගී කරගැනීමද ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය හිඩැස පිරවීම සඳහා අත්‍යවශ්‍ය වේ. ස්ත්‍රීන්, පුරුෂයින්ට වඩා සෑම අංශයකින්ම පාහේ අවාසි සහගත තත්ත්වයකට පත්ව ඇත්තේ, ඔවුන්ට බලය හා සම්පත් අඩුවෙන් හිමිවීම හා ඔවුන්ගේ අවශ්‍යතා නියෝජනය කිරීමට හෝ ඒ වෙනුවෙන් හඬක් නැගීමට අවස්ථාවක් නොමැති බැවිනි. එම අවස්ථාව ඔවුන්ට ලබාදීමෙන් ස්ත්‍රීන්ද පුරුෂයන්ට සමාන පුරවැසියන් කොටසක් බවට පත්කළ හැකිය. විශේෂයෙන්ම පොදු කටයුතුවලට පුරුෂයින්ට සමාන අයුරින් සක්‍රිය ලෙස සහභාගීවීමේ වරම ස්ත්‍රීන්ටද හිමි විය යුතුය.

ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය වෙනස අවම කිරීමෙන් පුරුෂයින්ට අවාසියක් සිදුවේ යැයි සමහරුන් විශ්වාස කරතත් එය සාවද්‍ය අදහසකි. මෙම වෙනස නිසා සමාජයේ දැඩි ආකල්ප හමුවේ පුරුෂයින්ද අපහසුතාවට පත්වේ. සම්ප්‍රදායික සමාජය පවුලේ උපයන්නා හා ආරක්ෂකයා ලෙස පුරුෂයින්ට දී ඇති වගකීම හා බොහෝ රැකියා ස්ථානවලදී පවරා ඇති තීරණ ගැනීමේ වගකීම සමහර පුරුෂයින්ට දැරීමට අපහසු අවස්ථා ද ඇත. මැදි වයසේ ඇතැම් පුරුෂයින් හදිසියේ හෘදයාබාධවලින් මිය යාමට මූලික හේතුවක් ලෙස මෙම පීඩනයද බලපාන බව මෑතකාලීන අධ්‍යයනවලින් හෙළි වී තිබේ. ස්ත්‍රීන් හා පුරුෂයින් අතර මෙම වගකීම් හා භූමිකා සමව බෙදී යයි නම් මෙවැනි තත්ත්වයකට පුරුෂයින්ද පත් නොවේ. පවුලේ සාමාජිකයින් අන්‍යෝන්‍ය අවබෝධයකින් හා සහජීවනයෙන් කටයුතු කරයි නම් සමාජයේ කුඩාම ඒකකය වූ පවුලෙන් ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සම සාධාරණත්වය ඇරඹිය හැකිය. ඒ සඳහා අවශ්‍ය නීතිමය හා ආයතනික පසුබිම රාජ්‍යය විසිනුත්, ඒවා ක්‍රියාත්මක කිරීම ආණ්ඩුව විසිනුත්, ඒ පිළිබඳ දැනුවත් කිරීම අධ්‍යාපන, ජනමාධ්‍ය, ආගමික ආයතන හා වෙනත් සමාජ සංවිධාන, දේශපාලන සංවිධාන හා රාජ්‍ය නොවන ආයතන ආදිය විසිනුත් සිදු කළහොත්, ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සංකල්පය අනිවාර්යයෙන්ම මීට වඩා වැඩි වෙනසකට ලක්කළ හැකිය.

## 8

# පීතෘමූලිකත්වය යනු කුමක්ද?

පීතෘමූලිකත්වය හෙවත් Patria (පවුල) Archy (පාලනය) Patriarchy යන පදය ග්‍රීක බසින් බිඳී ආවකි (Brown: 1991). විස්තෘත පවුලක (Extended Family) වැඩිමහල් පුරුෂයා එම පවුලේ වයසින් අඩු පිරිමින් හා ස්ත්‍රීන්ව පාලනය කිරීම යන්න එයින් අර්ථ ගැන්වේ. සාහිත්‍යමය අර්ථයෙන් පීතෘමූලිකත්වය යනු "පුරුෂ මූලිකත්වය සහිත පවුල" යන්න විස්තර කෙරෙන පදයකි. පීතෘමූලිකත්වය මානව ශිෂ්ටාචාරයේ වර්ධනයත් සමඟම වර්ධනය වූවකි. ක්‍රිස්තු පූර්ව යුගවලදී පැවති මානව ශිෂ්ටාචාරවල පවා පුරුෂයින්ගේ ආධිපත්‍යයට නතුව ස්ත්‍රීන්ට කටයුතු කිරීමට සිදුවී තිබේ. මෙසපොතේමියානු ශිෂ්ටාචාරයේ සමහර දිළිඳු පවුල්වල ආර්ථිකය නගාසිටුවීම සඳහා පියවරුන් සිය දියණිවරුන් වෙසගනා වෘත්තියට, ශ්‍රමයට හෝ විවාහය සඳහා විකිණූ බැව් සඳහන් වේ. කෙසේ හෝ වේවා පීතෘමූලිකත්වය, එහි ආරම්භය හා වර්ධනය පිළිබඳ දේශපාලන හා සමාජ විද්‍යාත්මක ප්‍රවේශයන්ගෙන් කෙරෙන විස්තර කිරීම් එකිනෙකට වෙනස්ය.

පුරෝගාමී සමාජ විද්‍යාඥයකු වූ මැක්ස් වෙබර් (Max Weber) පවසන ආකාරයට පීතෘමූලිකත්වය යන සංකල්පයෙන් පවුලේ වැඩිමහල් පුරුෂයා, වයසින් අඩු පිරිමි සාමාජිකයින්, ස්ත්‍රීන් හා දූසි දස්සන් මත පතුරුවන ආධිපත්‍යය විස්තර කෙරේ (The Penguin Dictionary of Sociology : 1984). එහෙත් ස්ත්‍රීවාදී අර්ථකථනයට අනුව පීතෘමූලිකත්වය යන්නෙන් විස්තර කෙරෙන්නේ ස්ත්‍රීන් මත පැටවෙන පුරුෂයින්ගේ ආධිපත්‍යය, පුරුෂයින් විසින් ස්ත්‍රීන් පාලනය කරනු ලබන ආකාරය හා ස්ත්‍රීන්ට සමාජය සලකන ආකාරය මෙන්ම කාලාන්තරයක් තිස්සේ එය වර්ධනය වූ ආකාරයන්ය. බොහොමයක් ස්ත්‍රීවාදීන් වෙබර්ගේ අදහස තුළ ඇති "වැඩිමහල් පුරුෂයකු විසින් පාලනය කරනු ලැබීම" යන්න නොසලකා හැර, සමස්තයක් ලෙස සියලුම පුරුෂයින් විසින් සෑම ක්ෂේත්‍රයක් තුළදීම ස්ත්‍රීන්ව පාලනය කරනු ලැබීම හා පුරුෂයා ස්ත්‍රියට වඩා ඉහළ ස්ථරයක ස්ථානගත කිරීම පීතෘමූලිකත්වය ලෙස විස්තර කරන අතර එය විශ්වීය දෙයක් ලෙසද පෙන්වා දී ඇත. පීතෘමූලික සමාජයේ පවුල තුළදී මෙන්ම එයින් පිටතදීත්, ස්ත්‍රිය සූරාකෑමට ලක්වන බවත්, සම්ප්‍රදායික විරුද්ධ ලිංගික විවාහය හා



ප්‍රචණ්ඩත්වය වැනිදෑ පුරුෂයා විසින් ස්ත්‍රීන්ව සූරාකෑමට හා පාලනය කිරීමට යොදාගනු ලබන දෑ බවත් ස්ත්‍රීවාදීහු පෙන්වා දෙති.

ස්ත්‍රීවාදීන් අතරින් රැඩිකල්වාදී අදහස් දරන්නන් මේ සංකල්පය පිළිබඳ විස්තරාත්මක හා විවේචනාත්මක අදහස් සමූහයක් ඉදිරිපත් කර ඇත. සිල්වියා වෝල්බි (Sylvia Walby : 1990) එම ස්ත්‍රීවාදීන් අතුරින් ප්‍රමුඛවේ. විරුද්ධ ලිංගිකයින් අතර වන සමාජ සබඳතා තීරණය කරනු ලබන්නේ පීතෘමූලික සමාජ පිළිගැනීම් විසින් බැව් රැඩිකල් ස්ත්‍රීවාදීන්ගේ මතයයි. ඔවුන්ට අනුව ස්ත්‍රීන් හා පුරුෂයින් අතර වන සියලුම සමාජ අසමානකම් නිර්මාණය වීම සඳහා මූලික වන්නේ පීතෘමූලිකත්වයයි. මේ අනුව පවුල තුළ පමණක් නොව, අනිකුත් සෑම සමාජ, ආර්ථික, ආගමික හා දේශපාලන සංවිධානයක් තුළදීම පීතෘමූලිකත්වය නිසා ස්ත්‍රිය පුරුෂයාට වඩා අප්‍රධාන තත්ත්වයකට පත්වේ. එසේම ඇය පුරුෂයාගේ පාලනයට හා ආධිපත්‍යයට හසුවේ. ස්ත්‍රියගේ ලිංගිකත්වය හා ප්‍රජනන හැකියාවද පුරුෂයින් විසින් පාලනය කරනු ලැබේ. ස්ත්‍රීන්ට විමුක්තිය ළඟාකර ගැනීමට නම්, පීතෘ-මූලිකත්වය මුලිනුපුටා දැමිය යුතුය යන්න රැඩිකල් ස්ත්‍රීවාදීන්ගේ විශ්වාසයයි.

සමාජවාදී සමාජ විද්‍යාඥයින් විස්තර කරන ආකාරයට පීතෘමූලික සමාජ සබඳතා නිර්මාණය කර ඇත්තේ ධනවාදය විසිනි. ධනපතියන්ගේ අවශ්‍යතා සපුරාගැනීමේ අරමුණින් ස්ත්‍රීන්ව සූරාකෑමට ලක්කරයි. සමාජ පරිණාමය පිළිබඳ ෆෙඩ්රිච් එංගල්ස් හා පංති බෙදුම පිළිබඳ කාල්මාක්ස් ඉදිරිපත් කළ මූලික අදහස්වලින් සමාජවාදී ස්ත්‍රීවාදීන් පෝෂණය ලබා ඇත. ඔවුන්ගේ මතය වන්නේ ධනවාදී සමාජය තුළ වන පීතෘමූලික සබඳතා උපයෝගී කරගෙන ස්ත්‍රීන් සූරාකෑමට ලක්වන බවයි. එහෙයින් ස්ත්‍රීන්ට විමුක්තිය දිනාගැනීම සඳහා අනිවාර්යයෙන්ම ධනවාදී සමාජ ක්‍රමය මුලිනුපුටා දැමිය යුතු බව ඔවුහු විශ්වාස කරති. පීතෘමූලිකත්වය පිළිබඳ මෙම අදහස් එකිනෙකට සමාන නොවූවත් ස්ත්‍රීවාදීන් පොදුවේ පිළිගන්නා දෙයක් නම් ස්ත්‍රීන් හා පුරුෂයින් අතර අසමාන සමාජ තත්ත්වයන් නිර්මාණය කිරීමට පීතෘමූලිකත්වය අනිවාර්යයෙන්ම හේතුවන බවයි. ජීව විද්‍යාත්මක හෝ ස්වාභාවික හේතු මත නොව, පීතෘමූලික සමාජය විසින් ස්ත්‍රිය පහත්, අප්‍රධාන, පුරුෂයාට අවනත විය යුතු සහ ඔහු මත යැපිය යුතු තත්ත්වයකට පත්කරනු ලැබ ඇති බව ඔවුන්ගේ මතයයි. මේ නිසා පවුල තුළදී මෙන්ම අනෙකුත් සෑම සමාජ සංවිධානයක් තුළදීමත්, ස්ත්‍රිය වෙනස්කොට සැලකීම, නොසලකා හැරීම, පාලනය කිරීම, සූරාකෑම, පීඩාවට පත්කිරීම, හා අතවරයට ලක්කිරීම සිදුවන බැව් ඔවුන්ගේ විශ්වාසයයි.

එවැනි වෙනස් කොට සැලකීම් පුරුෂයින් මෙන්ම ස්ත්‍රීන් ද සාමාන්‍ය දෙයක් ලෙස සලකන තරමට පීතෘමූලික සමාජය විසින් සමාජගතකර තිබේ. පවුල හා වෙනත් සමාජ සංවිධාන තුළදී පුරුෂාධිපත්‍යය ස්වාභාවික දෙයක් ලෙස දැනෙන තරමට ස්ථාපිත කිරීම සඳහා සමාජානුයෝජන ක්‍රියාවලියේදී පුරුෂයින් පමණක් නොව, ස්ත්‍රීන්ද කටයුතු කරනු දැකිය හැකි වේ.

පීතෘමූලික ක්‍රමය තුළ සෑම සමාජ ඒකකයකදීම ස්ත්‍රියට ඉහලින් පුරුෂයාගේ පාලනය ක්‍රියාත්මක වේ. පවුල තුළ ස්ත්‍රියකගේ කාර්ය භාරය ආර්ථිකමය වශයෙන් තක්සේරුවක් නොකෙරේ. පවුලේ සියලු වැදගත් තීරණ ගැනීම ගෘහමූලික පුරුෂයා විසින් සිදු කරනු ලැබේ. ඔව ආදායම් උපයන රැකියාවක නිරතවූවත්, ඇය "උපයන්නා" ලෙස නොසැලකේ. පවුල තුළ පිරිමි සාමාජිකයින් සතුවන නිදහස බොහෝවිට ගැහැණු සමාජිකයින්ට හිමි නොවේ.

ආර්ථික ක්ෂේත්‍රයේදී පුරුෂ ශ්‍රමය හා ස්ත්‍රී ශ්‍රමය තක්සේරු කරන ආකාරයේ වෙනස්කම් පවතී. ආදායම් උපයන රැකියාවක නිරතවීමට අයිතිය පවා බොහෝ ස්ත්‍රීන් සතු නොවේ. පියා, සැමියා හෝ වැඩිමහල් සොහොයුරා යනාදී පවුලේ ආධිපත්‍යය හිමි පුරුෂයාගේ අවසරය බොහෝ විට තීරණාත්මක වේ. රැකියා ස්ථානයේ දී පුරුෂයාට සාපේක්ෂව සමාන හෝ වැඩි පැය ගණනක්, ශ්‍රමය වැය කළ ද ඇයට ලැබෙන වේතනය අවම වන අවස්ථා බොහෝ විට දැකිය හැකිය. උසස්වීම් සහ පුහුණුවීම් සඳහාත් ස්ත්‍රියට ලැබෙන අවස්ථා අඩුය. බොහෝවිට රැකියා ක්ෂේත්‍රයන් හි පහළ හෝ මැද මට්ටම්වල තනතුරු ස්ත්‍රීන්ට සුලභ වශයෙන් වෙන්වන අතර ඉහළ තීරණ ගන්නා මට්ටම්වල තනතුරු සුලභ වශයෙන් දරන්නේ පුරුෂයින් විසිනි. ලිංගික වශයෙන්ද සමහර රැකියා ආයතන තුළ ස්ත්‍රීන් වෙත පීඩනයන් කෙරෙනු දක්නට ලැබේ. ගෘහණියක හා මවක ලෙස ඇගේ කාර්යභාරය ද, ගර්භණී සමය තුළ ඇය සඳහා නිවාඩු ප්‍රදානය කිරීමට සිදුවීමද, බොහෝවිට විධායක මට්ටම් දක්වා ස්ත්‍රියට ගමන් කිරීමේ බාධකයන් බවට පත් කොට තිබේ.

ප්‍රජනන කාර්යය හා ලිංගිකත්වය පවා පුරුෂාධිපත්‍යයේ පාලනයට හසුවීම දක්නට ලැබෙන්නකි. ආගමික නියමයන් සහ රාජ්‍ය නීතිවලින් පවා එකී ජීව විද්‍යාත්මක තත්ත්වයන් පාලනය කෙරේ. බොහොමයක් නූතන රාජ්‍යයන් විසින් ස්ත්‍රී-පුරුෂ සමාන අයිතිවාසිකම් නීත්‍යානුකූලව පිළිගනු ලැබ ඇත. එහෙත් එම නීති ක්‍රියාත්මක කිරීමේදී පීතෘමූලික සමාජ ඇගයීම්වලට



අනුව සිදුකිරීම හේතුවෙන් ප්‍රායෝගිකව ස්ත්‍රී අයිතිවාසිකම් කඩවීම් ද දක්නට ලැබේ.

සංස්කෘතික සහ ආගමික වශයෙන් වන ගතානුගතික සිරිත්-විරිත්, ආකල්ප, විශ්වාස හා පිළිගැනීම් මගින් පැණවෙන සීමාවන් වඩාත් තදින් බලපාන්නේ ස්ත්‍රිය විෂයයෙහිය. නිදසුනක් ලෙස පවුල තුළ දේපළ බෙදී යාමේදී බොහෝවිට පුරුෂ පක්ෂය වෙත වාසිසහගත තත්ත්වයක් හිමිවීම දැක්විය හැකිය. විශේෂයෙන් ව්‍යාපාර, ආර්ථික සංවිධාන සහ දේශපාලන උරුමය පුරුෂ මූලිකව ගලා යයි. එක්සත් ජාතීන්ගේ සංගමය ඉදිරිපත් කරන දත්ත අනුව ලෝකයේ මුළු වැඩ පැය ගණනින් 60% සඳහා ස්ත්‍රීන් ශ්‍රමය යෙදවූවත් ඇයට හිමිවන්නේ මුළු ලෝක අදායමින් 10% ක් පමණි. ලෝක ජනගහයෙන් 51% ක් ස්ත්‍රීන් වුවත් ජාතික මට්ටමේ ව්‍යවස්ථාදායකයන්හි ස්ත්‍රී නියෝජනයේ සාමාන්‍ය ප්‍රතිශතය 14% කි.

මෙලෙස සියලුම සමාජ ඒකක තුළ, සංවිධාන තුළ ස්ත්‍රිය පුරුෂයාට වඩා බලය අතින්, සම්පත් හිමිකම අතින් පසුගාමී තත්ත්වයකට පත්කර ඇති ආකාරය දැකගත හැකිය. මේ පොදු ලක්ෂණය සඳහා මූලිකවම හේතුව වන්නේ පීතෘමූලික සමාජ සම්ප්‍රදායන්ය.

සමාජ පංති, කුල, මානව වර්ග, ජාති, විවිධ ප්‍රදේශ, රටවල් හා කාලවකවානුවලට අනුව පීතෘමූලිකත්වය ද ක්‍රියාත්මක වන ආකාරය වෙනස් විය හැකිය. අතීතයේදී ස්ත්‍රියට හිමි වූ නිදහස හා සමාජ තත්ත්වයට වඩා වෙනස් තත්ත්වයක් වර්තමානයේදී හිමි වී ඇති අතර අනාගතයේදී එය ඊටත් වඩා වෙනස් විය හැකිය. අතීතයේ ශ්‍රී ලාංකික ස්ත්‍රියට ආගමික, සම්ප්‍රදායික, සමාජ හා සංස්කෘතික තහංචි ගණනාවකට යටත්වීමට සිදුවිය. එහෙත් එයට සාපේක්ෂව වත්මන් ස්ත්‍රියට වැඩි නිදහසක් හිමි වී ඇත. එබඳු වෙනස්කම් පීතෘමූලික ක්‍රමය තුළ දකිය හැකි වුවත්, සෑම ක්ෂේත්‍රයකදීම, සෑම කාලයකදීම දකිය හැකි පොදු ලක්ෂණයක් වේ. එනම් ඒ සෑම අවස්ථාවකදීම පුරුෂයාට සාපේක්ෂව ස්ත්‍රිය අප්‍රධාන තත්ත්වයකට පත්කොට තිබීමයි. පීතෘමූලිකත්වය තුළ දකිය හැකි අනිවාර්ය ලක්ෂණයද එයයි.

කෙසේ වෙතත්, මේ සියලු සාධකවලින් පැහැදිලි වන්නේ, පීතෘමූලික සමාජ ක්‍රමය තුළ ස්ත්‍රිය සහමුලින්ම අයිතින්, බලය හා සම්පත් අහිමි වර්ගයක් බවට පත්කොට ඇති බවක් නොවේ. ඕනෑම ආයතනයක් අඛණ්ඩව ක්‍රියාත්මක වීම සඳහා බලය හසුරුවන සහ එම බලයට අනුව හැසිරවෙන කොටසක්ද අවශ්‍ය වේ. ඉතිහාසය පුරාම පුරුෂයින් ලිංගික වෙනස පදනම්

කරගෙන වඩාත් වාසි සහගත ආකාරයෙන් වැඩි බලය ඔවුන් වෙත කේන්ද්‍රගත කොටගෙන, ස්ත්‍රීන්ව ඔවුන්ට අවනත කොටසක් ලෙස තබා ගැනීම සිදුකෙරේ.

ආර්ථික, සමාජ හා දේශපාලන ආයතන තුළ ඉහළම හිණිපෙත දක්වා ස්ත්‍රීන් ළඟා වූ අවස්ථාවලට නිදසුන් ඉතිහාසයෙන් ඕනෑතරම් සොයාගත හැකිය. එහෙත් එවැනි අවස්ථාවලදී පවා සමාජය තුළ දිගු කලක් තිස්සේ මුල් බැස ගත් පීතෘමූලිකත්වය ඉවත් නොවේ. එය අභියෝගයට ලක් කිරීමද අසීරු කාර්යයකි. පවුලක ගෘහමූලිකත්වයට ස්ත්‍රියක පත්වුවද, සම්ප්‍රදායික ආකල්ප, ස්ත්‍රී-පුරුෂ ගති ලක්‍ෂණ, භූමිකා හා ස්ත්‍රීන්ව වෙනස්කොට සැලකීම් කලින් පැවති ආකාරයෙන්ම බොහෝවිට ක්‍රියාත්මක වේ. මන්ද ඕනෑම තත්ත්වයක් තුළ ස්ත්‍රියගේ සමාජානුයෝජනය අනුව ඒවා සාමාන්‍ය දෑ ලෙස ඇය විසින්ද සලකනු ලබන බැවිනි. එහෙයින්, පවුල තුළ අනෙක් ස්ත්‍රීන්ට මෙන්ම ගෘහමූලික ස්ත්‍රියටත් හිමි තත්ත්වය විශාල වශයෙන් වෙනසකට ලක් නොවේ. විශේෂයෙන්ම පවුල තුළ දරුවන් සමාජ ජීවිතයට හුරු කරවීම මව අතින් සිදුවන අවස්ථා වැඩිය. ඇය නොදැනුවත්වම පීතෘමූලික ආකල්ප, විශ්වාස හා අගය කිරීම් ඊළඟ පරපුරට දායාද කරයි. එහෙයින් පීතෘමූලිකත්වයේ අඛණ්ඩ පැවැත්ම අරබයා ස්ත්‍රීන්ද අනිවාර්යයෙන්ම දායක වන බැව් පැහැදිලි වේ.

ආර්ථික, සමාජ හා දේශපාලන ආයතන තුළත් ස්ත්‍රීන් නායකත්වයට පත්වන අවස්ථා තිබේ. එහෙත් ඔවුන්ද පැවති තත්ත්වය "ස්වාභාවික" දෙයක් යයි පිළිගෙන ඒ ක්‍රමයම ඉදිරියට පවත්වා ගෙන යන අවස්ථා බෙහෙවින් දැකිය හැකිය. මන්ද, පීතෘමූලිකත්වය ස්ත්‍රී-පුරුෂ ජීවිතවලට එතරම්ම බද්ධ වන ආකාරයට පීතෘමූලික සමාජක්‍රමය වර්ධනය වී ඇති බැවිනි.

පීතෘමූලිකත්වයේ ප්‍රතිවිරුද්ධ අර්ථය මාතෘමූලිකත්වයයි. මාතෘමූලික සමාජ පිළිබඳ යම් යම් තොරතුරු ඉතිහාසයෙන් හමු වී ඇත. වීනයේ ඇත පිටිසර ගම්මාන කීපයක දැනටත් පවතින මාතෘමූලික සමාජ, කේරළයේ "නායර්" ගෝත්‍රික ජනතාව අතර ස්ත්‍රී පාර්ශවය හරහා දේපළ උරුමවීම වැනි තොරතුරු එයට නිදසුන්ය. එහෙත් සමස්ත මානව සමාජය තුළම පීතෘමූලිකත්වය ආයතනගතවීම පොදු දෙයක් ලෙස සැලකිය හැකිය.

ස්ත්‍රීන් හා පුරුෂයින් අතර විවිධ සමාජ අසමානකම් නිර්මාණය වීමට මේ අනුව මූලික වන්නේ පීතෘමූලිකත්වයයි. එහෙත් පීතෘමූලික සමාජ ආකල්ප, පිළිගැනීම්, සම්ප්‍රදායයන්, විශ්වාස හා අගය කිරීම් අනිවාර්යයෙන්ම වෙනසකට ලක් කළ හැකිය. ඒ සඳහා පවුල ඇතුළු සියලුම සමාජ සංස්ථා දායක විය යුතුය.



ස්ත්‍රීන් පෞද්ගලිකවත්, කණ්ඩායමක් වශයෙනුත් පුරුෂයාට වඩා අප්‍රධාන තත්ත්වයක සිටීම, ස්ත්‍රීන්ව වෙනස්කොට සැලකීම හා ඔවුන්ට බලය නැතිනම් ආධිපත්‍යය අහිමිවීම යන කරුණු ඕනෑම පීතෘමූලික සමාජයක පොදු ලක්‍ෂණ වේ. මේ තත්ත්වය වෙනස් කළහැකි බැව් විවිධ සාක්‍ෂි මගින් ඔප්පු කළ හැකිය. මීට පෙරදී සඳහන් කළ ආකාරයට බොහොමයක් ස්ත්‍රීන් උසස් අධ්‍යාපනය ලබා, රැකියාවක නිරත වීමෙන් ඇයට පවුල හා සමාජය තුළ හිමිව තිබූ අප්‍රධාන තත්ත්වය වෙනසකට ලක්කළ හැකිය. ආර්ථික වශයෙන් ස්වාධීන වීම, තීරණ ගැනීම සඳහා සහභාගී වීම, දේපළ හා වෙනත් සම්පත්වල හිමිකරු වීම, සමාජ ගෞරවයට පාත්‍රවීම, සිය කටයුතු නිසා ස්වයං තෘප්තියක් ලැබීම, වෙනත් ස්ත්‍රීන් ඒ පිළිබඳව දැනුවත් කිරීම, ඔවුන්ට සිය අත්දැකීම් තුළින් නායකත්වය දීම හා සිය ජීවිතය පිළිබඳ වැදගත් තීරණ ගැනීමේ හැකියාව ලැබීම වැනි දෑ ද එබඳු ස්ත්‍රීන්ට බොහෝ අවස්ථාවලදී දිනා ගත හැකි වේ. එවැනි තත්ත්වයකදී ඇයට හිමිව තිබූ අප්‍රධාන තත්ත්වය මෙන්ම ඇයට කරන ලද වෙනස් කොට සැලකීම් ද බොහෝ දුරකට වෙනස්වන නිසා ඇයට බලය හා තීරණ ගැනීමේ හැකියාව ඇත යන හැඟීමද පහළ වේ. එහෙත් එබඳු ස්ත්‍රීන්ට පවුල තුළ හිමි සම්ප්‍රදායික ක්‍රියාකලාපයේ වගකීමෙන් මිදෙන්නට අපහසුවන අවස්ථා සුලබය. එසේම පොදු කටයුතුවලදී නැතිනම් රැකියා ස්ථානවලදී, පීතෘමූලික ආකල්ප නිසා ස්ත්‍රීන් අසාධාරණයට ලක්වන අවස්ථා පිළිබඳ මීට පෙර සඳහන් කළෙමු. පීතෘමූලික සමාජ ආකල්ප වෙනස් කරමින්, ස්ත්‍රියක පවුල තුළ පෞද්ගලික වශයෙන් බල ගැන්වීම එතරම් අසීරු කාර්යයක් නොවේ. එහෙත් පොදු ක්ෂේත්‍රය තුළ පීතෘමූලික ආකල්ප වෙනස් කිරීම හා කණ්ඩායමක් වශයෙන් ස්ත්‍රීන් බල ගැන්වීම එයට වඩා තරමක් දුෂ්කර, එමෙන්ම සැහෙන කාලයක් ගතවන ක්‍රියාදාමයකි. එහෙත් ශ්‍රී ලංකාවේත්, වෙනත් සංවර්ධනය වන්නා වූ රටවලත්, බොහෝ අවස්ථාවලදී බාහිර මැදිහත්කරුවන්ගේ සහභාගීත්වයෙන් එබඳු සමාජ වෙනස්කම්වලට ලක්වූ අවස්ථා ඕනෑ තරම් තිබේ. ශ්‍රී ලංකාවේ අභංගම ස්වයං සංවර්ධන බැංකුව හා ඉන්දියාවේ සේවා සංවිධානය වැනි දෑ එයට හොඳ නිදසුන්ය මේ සංවිධානවලදී ස්ත්‍රීන් ඉතා කුඩා කණ්ඩායම් ලෙස රැස්වී, බාහිර මැදිහත්කරුවකුගේ උපදෙස් මත ස්වයං රැකියා ආරම්භ කර, ඉන්පසු ඔවුන්ගේම සංවර්ධන ව්‍යාපෘති, මූල්‍ය බැංකුවක් හා වෙනත් සමාජ හා සංස්කෘතික සේවා රැසක් දියත් කර ඇත. ස්ත්‍රීන්ගේ ශ්‍රමය, ධනය, කාලය, බලය හා ශක්තිය තුළින් පවුල් දහස් ගණනක ජීවිත ආර්ථික, සමාජ හා සංස්කෘතික යන සෑම අංශයකින්ම පැවති තත්ත්වයට වඩා ඉහළ තත්ත්වයකට මේ ව්‍යාපෘති නිසා පත් වී ඇත. සමාජයේ බල රහිත, අප්‍රධාන කොටසක් ලෙස සිටි ස්ත්‍රීන් මෙබඳු බලය සහිත තත්ත්වයකට පත්වීම නිසා

පීතෘමූලික සමාජ ආකල්ප මෙන්ම එම ව්‍යුහයද යම්තරමක වෙනසකට ලක් වී ඇත. එසේම ස්ත්‍රීන්ගේ ජීවිත පමණක් නොව, එම පවුල්වල සියලුම සමාජිකයින්ගේ ජීවිතවල වෙනසක් හා සමාජ සංවර්ධනයක්ද සිදුවී ඇත. පීතෘමූලික සමාජයේ පුරුෂයින් සතු බලය, ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයටම සමාන අයුරින් හිමිකර දිය හැකි නම් එයින් සමස්ත සමාජයටම යහපතක් සිදු වේ. සහජීවනයෙන් යුත්, සාමකාමී, තෘප්තිමත් මානව ජීවිත් සහිත සමාජයක් බිහිකරලීම සඳහාද එම බල සමතුලිතතාව අනිවාර්යයෙන්ම ඉවහල් වේ.

පීතෘමූලික සමාජය වෙනස්වීම තුළ පුරුෂයා බල රහිත හෝ නොවැදගත් තත්ත්වයට පත්වේය යන පොදු බියක් පවතී. මෙය ඇත්තෙන්ම ස්වාභාවිකය. මන්ද, කාලාන්තරයක් තිස්සේ, පවුල හා සමාජය තුළ පුරුෂයා වාසිසහගත හෝ විශේෂ වරප්‍රසාද සහිත තත්ත්වයකට පත්වී තිබීම හා සමාජානුයෝජන ක්‍රියාවලිය තුළින් එය සාමාන්‍ය දෙයක් බවට පත්කර තිබීම එයට හේතුවයි. එහෙයින් පුරුෂයා සතුව තිබූ බලය ස්ත්‍රිය වෙතටද හේත්දුගතවීමේ මුල් අවස්ථාවේදී අනිවාර්යයෙන්ම බොහෝ පුරුෂයින් එයට එරෙහිව ප්‍රතිචාර දැක්වීමේ ඉඩකඩ වැඩිය. එහෙත් බලය ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයට හිමි වීමෙන් පුරුෂයාට, පවුලට හා සමාජයටද එහි වාසි අත්වන විට මෙම තත්ත්වය වෙනසකට ලක්වනු ඇත. බොහෝ සමාජවල ස්ත්‍රීන්ගේ කණ්ඩායම් බාහිර මැදිහත්කරුවන්ගේ උපදෙස් පිට, ස්වයං සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීමේදී, පුරුෂයින්ගෙන් එයට බාධක එල්ලවීම් පිළිබඳ ඕනෑතරම් සාක්ෂි තිබේ. එහෙත් මෙම ව්‍යාපාර සාර්ථක වී, සමාජයට එහි ඵල ලැබෙන විට පුරුෂයින්ද එය භුක්ති විඳිනවා පමණක් නොව, ස්ත්‍රීන්ට උපකාර කිරීම හා සෘජුව ඒ කටයුතුවලට සහභාගීවීමද දක්නට ලැබේ.

පීතෘමූලික සමාජයේ පවුල්වල තත්ත්වයද මෙයට සමානය. තවමත් සමහර ශ්‍රී ලාංකික ස්ත්‍රීන්ට වැටුප් ලබන රැකියාවක් සඳහා නිවසින් පිටත යාමට පවුලේ වැඩිමහල් පුරුෂයාගෙන් අවසරය ලබාගත යුතුය. ඒ සඳහා අවසර පතන විට මුල්ම අවස්ථාවේ ඔහු එයට එරෙහි වීම මෙම පුරුෂාධිපත්‍යය සහිත සමාජ ආකල්පවල විශේෂ ලක්ෂණයයි. එහෙත් ස්ත්‍රිය එම ආධිපත්‍යය නොසලකා, බාධක ජයගෙන වැටුප් ලබන රැකියාවක නිරත වීමට තීරණය කළහොත්, එයින් ලැබෙන ආර්ථික හා සමාජ වාසි මත අනිවාර්යයෙන්ම පුරුෂයාගේ තත්ත්වයේ හා ආකල්පවල වෙනසක් ඇති වේ. එනිසා කෙටි කාලීන වශයෙන් පුරුෂයින්ගෙන් එල්ලවිය හැකි බාධක, දිගු කාලීනව වෙනස්වීමට ඇති ඉඩකඩ බොහෝය. එම වෙනස ලඟාකර ගැනීමට මෙබඳු සංකල්ප පිළිබඳ ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයේම නිවැරදි අවබෝධය නිසැකයෙන්ම වැදගත් වන්නේය.

# 9

# ස්ත්‍රීවාදය යන්න කෙසේ විස්තර කළ හැකිද?

ස්ත්‍රීවාදය (Feminism) යන පදය ඉංග්‍රීසි භාෂාවේදී භාවිත කිරීම 19 වැනි සියවස අගදී ආරම්භ විය. නූතන අර්ථයෙන් ගත්විට ස්ත්‍රීවාදය න්‍යායාත්මක අදහස් මාලාවක්, විග්‍රහාත්මක දෘෂ්ටිවාදයක්, විචාරාත්මක හා විවාදාත්මක අදහස් හෝ මතවාද සමූහයක් මෙන්ම සමාජ හා දේශපාලන ව්‍යාපාරයක් වශයෙන් ද හැඳින්විය හැකිය. ස්ත්‍රීවාදය සමාජ න්‍යායයක් ලෙස මූලික වශයෙන් ස්ත්‍රීන්ගේ අත්දැකීම් මත පදනම් වී ඇත. සමාජයේ ස්ත්‍රී-පුරුෂ අසමානත්වය හා එහි ස්වභාවය, පීතෘමූලිකත්වය, ස්ත්‍රී-පුරුෂ බල සබඳතාව හා ලිංගිකත්වය පිළිබඳ නිවැරදි හා විස්තරාත්මක අර්ථකථනයක් සැපයීම ස්ත්‍රීවාදී න්‍යායන්හි මූලික අරමුණයි. ස්ත්‍රීවාදී න්‍යායෙන් පවුල තුළත්, ලිංගික වශයෙනුත්, සමාජ, දේශපාලන හා ආර්ථික ක්ෂේත්‍ර තුළත් පුරුෂයාට සාපේක්ෂව ස්ත්‍රියට හිමි අසමාන තත්ත්වය පිළිබඳ විචාරාත්මකව පරීක්ෂා කෙරේ. දෘෂ්ටිවාදයක් ලෙස, ස්ත්‍රීවාදයෙන් පවුල හා සමාජය තුළ ස්ත්‍රීන්ට හිමි අප්‍රධාන තත්ත්වය හා ඔවුන්ගේ ක්‍රියාකලාපයන්ට නිසි අගයක් නොදීම හෝ අවතක්සේරු කිරීම පිළිබඳව අවධාරණය කෙරෙන අතර, එම තත්ත්වය තුරන් කිරීමට ප්‍රායෝගික වශයෙන් ක්‍රියා කිරීම එහි අරමුණ වේ (Encyclopedia of Women in American Politics: 1999).

පුරුෂ ආධිපත්‍යය නිසා ස්ත්‍රීන් මත වන පීඩනය හා එම පීඩනයේ රළ අත්දැකීම් පිළිබඳ අදහස් හා මතවාද 19 වැනි සියවසට පෙරත් විවිධ අවස්ථාවලදී ප්‍රකාශ වුණි. මාරි වොලස්ටන්ක්‍රාෆ්ට් (Mary Wollestonecraft) ප්‍රංශ සමාජය තුළ ස්ත්‍රීන්ගේ අවාසිසහගත තත්ත්වය පිළිබඳ ප්‍රශ්න කරමින්, 1792 දී ලියන ලද A Vindication of the Rights of Women කෘතිය එයට නිදසුනකි. මෙබඳු අදහස් කාලාන්තරයක් තිස්සේ වර්ධනය වෙමින්, පුළුල් වෙමින්, විකාශනය වීම හේතුවෙන් එම අදහස් මාලාව න්‍යායාත්මක ධාරාවක් බවට පත් වී ඇත. විචාරාත්මක අදහස් සමූහයක් ලෙස ස්ත්‍රීවාදයෙන් උත්සාහ ගන්නේ, සමාජ ව්‍යුහය හැඩගැසී ඇති ආකාරය, විවාහය, පවුල, රැකියා ස්ථානය, ආගමික හා දේශපාලන සංවිධාන වැනි දෑ පිළිබඳව ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය දේශපාලන දෘෂ්ටියෙන් පරීක්ෂා කිරීමය.

ස්ත්‍රීවාදී අදහස් කලක් තිස්සේ ව්‍යාප්ත වීම නිසා එම අදහස් ගැන නිවැරදි අවබෝධයක් ඇති, ඒවා අගය කරන පුද්ගලයන් ද, ඒ වටා පුද්ගල කණ්ඩායම් ද, එම කණ්ඩායම් වඩාත් දැනුවත් කරවන හා උනන්දු කරවන නායකයින් ද, එම නායකයින් අනුගමනය කරන්නන් ද බිහිව තිබේ. ඔවුන් වටා, ස්ත්‍රී-පුරුෂ සමාජ අසමානත්වය තුරන් කිරීමේ, හා ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම් දිනා ගැනීමේ හා පුවර්ධනය කිරීමේ අරමුණු සහිත සමාජ හා දේශපාලන ව්‍යාපාරද බිහිවුණි.

මේ ස්ත්‍රීවාදී දේශපාලන ව්‍යාපාරවලින් මූලික වශයෙන් ඉල්ලා සිටින්නේ සමාජ, ආර්ථික, දේශපාලන යන සෑම ක්ෂේත්‍රයකදීම ස්ත්‍රී-පුරුෂ යන දෙපක්ෂයට සම-සාධාරණ තත්ත්වයක් හා සම අවස්ථා ලාභයන් හිමිකර දිය යුතු බවයි. 19 වැනි සියවසේ ස්ත්‍රීවාදී ව්‍යාපාරවල මූලික අරමුණු වූයේ ස්ත්‍රීන්ටත් පුරුෂයින්ට සමාන අකාරයෙන් ඡන්ද අයිතිය, අධ්‍යාපනය ලැබීමේ අයිතිය හා වැටුප් ලබන රැකියාවක නිරතවීමේ අයිතිය දිනාගැනීමත්, නීතිමය වශයෙන් සමාන අයිතිවාසිකම් හිමිකර ගැනීමත්ය. 20 වැනි සියවසේ ස්ත්‍රීවාදී ව්‍යාපාර එයින් ඔබ්බට ගොස් ප්‍රජනනය හා සම්බන්ධ අයිතිවාසිකම්, විවාහය හා දික්කසාදය සම්බන්ධ අයිතිවාසිකම්, ප්‍රසූත නිවාඩු, සමාන වැටුප්, ස්ත්‍රීන්ට එරෙහිව සිදුවන වෙනස්කම් තුරන් කිරීමේ නීති, ලිංගික අතවර, ගෘහීය ප්‍රචණ්ඩත්වයට එරෙහි නීති හා ලිංගික ක්‍රියාකාරකම් සම්බන්ධ අයිතිවාසිකම් දිනාගැනීම අරමුණ කරගති. නූතන ස්ත්‍රීවාදී ව්‍යාපාර වඩාත් පුළුල් ආකාරයෙන්, සංවර්ධන, දේශපාලන හා අනෙකුත් සියලුම කටයුතුවල තීරණ ගන්නා මට්ටම්වලදී ස්ත්‍රී-පුරුෂ සම සහභාගීත්වය හා සම නියෝජනය දිනාගැනීමේ අරමුණ මත කටයුතු කරයි.

න්‍යායාත්මක ලෙස ස්ත්‍රීවාදය යනු මානව ජීවිතය හා අත්දැකීම් පිළිබඳ ස්ත්‍රිය කේන්ද්‍ර කරගත් දෘෂ්ටියකින් සංවර්ධනය කරන ලද අදහස් පද්ධතියකි. මෙහිදී "ස්ත්‍රිය කේන්ද්‍ර කරගනු ලැබීම" යන්න කිහිප ආකාරයකින් විස්තර කළ හැකිය.

* ස්ත්‍රීවාදී දෘෂ්ටිය තුළ ගවේෂණයන්හි අරමුණ වන්නේත්, එම ගවේෂණවල ආරම්භක ස්ථානය බවට පත්කර ගනු ලබන්නේත්, සමාජ ජීවියෙකු ලෙස ස්ත්‍රිය හා ඇය පිළිබඳ සාධකත්, ඇගේ අත්දැකීම් සම්භාරයත්ය.

* ස්ත්‍රීවාදී ගවේෂණවල ප්‍රධාන විෂය පථය වන්නේත් ස්ත්‍රියයි. සමාජය තුළ ස්ත්‍රියගේ තත්ත්වය පිළිබඳ ධනාත්මක සංවේදීතාවක් එයින් ගොඩ නැගීමට උත්සාහ කෙරේ.



* ස්ත්‍රීවාදය, ස්ත්‍රීන් සඳහා වඩාත් සුභදායී ලෝකයක් නිර්මාණය කිරීමේ අරමුණ පෙරදැරි කොටගෙන වඩාත් විචාරශීලීව ක්‍රියාකාරී වේ.

මේ අනුව ස්ත්‍රීවාදයෙන්, පවුල හා සමාජය තුළ ස්ත්‍රිය මත වන පීඩනය හා ඇයට හිමි අප්‍රධාන තත්ත්වය පිළිබඳ විස්තර කෙරේ. එම තත්ත්වයෙන් ඇය මුදවා ගැනීම ස්ත්‍රීවාදයේ අරමුණයි. ස්ත්‍රීන්ට හා පුරුෂයින්ට සමාන අයිතිවාසිකම්, සමාන සම්පත් හා ඉඩප්‍රස්ථාවන් හිමිකර දීමේ අරමුණින්, එබඳු සමාජ වෙනසක් සඳහා ක්‍රියාත්මක වීම ස්ත්‍රීවාදියෙකුගේ මූලික ලක්ෂණයකි. විශේෂයෙන්ම පෞද්ගලික ක්ෂේත්‍රයට සීමා කොට සිටි ස්ත්‍රියට, පොදු කටයුතුවලදී, පුරුෂයින් හා සමාන අයුරින්, බාධාවකින් තොරව, ක්‍රියාශීලීව සහභාගී වීමේ අයිතිය හා අවස්ථාව හිමි කරදීම ස්ත්‍රීවාදයෙන් අවධාරණය කෙරේ.

## මේ අනුව ස්ත්‍රීවාදය යනු,

* සමාජයේ සෑම ක්ෂේත්‍රයකදීම ස්ත්‍රිය වෙත හිමිකොට ඇති අප්‍රධාන බව, සාපේක්ෂ අසමානත්වය හෙවත් වෙනස්කොට සැලකීම හා ඇයව පීඩනයට හා සූරාකෑමට ලක්කිරීම පිළිබඳව සංවේදීතාවක්, සවිඥානිකත්වයක් සහිත වූත්,

* එකී අසමානත්වයත්, අප්‍රධාන බව, පීඩනය සහ සූරාකෑම දුරුකොට, සමාජයේ සෑම අංශයකදීම, පුරුෂයින්ට හා සමාන සම සාධාරණත්වයක් නිර්මාණය කිරීමේ මූලික අරමුණ සහිතවූත්,

* එම අරමුණු, අදහස් දරන්නන් ඒකරාශී කරගෙන, ස්ත්‍රීන්ගේ නිදහස හා විමුක්තිය සඳහා ප්‍රතිපත්ති හා පොදු ක්‍රියාකාරීත්වයන් සැලසුම් කරන්නාවූත්,

* එම සැලසුම් හා ක්‍රියාකාරකම් මෙහෙයවන සමාජ හා දේශපාලන ව්‍යාපාරයක් සහිතවූත්,

දෘෂ්ටිවාදයක් (Ideology) ලෙස හැඳින්විය හැකිය.

මේ අනුව ස්ත්‍රීවාදයේ මූලික ඉලක්කය වන්නේ, ලිංගික වෙනස මත නිර්මාණය කර ඇති ස්ත්‍රී-පුරුෂ සමාජමය වෙනස්කම් තුරන්කොට, එම දෙපක්ෂයටම සමාන නිදහසක්, සම්පත්, ඉඩ ප්‍රස්ථාවන් හා ගෞරවණීය තත්ත්වයක් හිමිවන ආකාරයේ පුළුල් සමාජ වෙනසක් ඇතිකිරීමය. විවිධ

සමාජ ස්ථර අනුව ස්ත්‍රීන්ගේ තත්ත්වය හා අත්දැකීම් විවිධ වුවද, ඒ මත වන බෙදීම් සමනය කරමින්, ඔවුන් අතර වන ඒකීයත්වයක අවශ්‍යතාව එනම් පීඩනය, යුරාකෑම හා අප්‍රධාන තත්ත්වයෙන් මිදීමේ අවශ්‍යතාව ස්ත්‍රීවාදයෙන් ආවධාරණය කෙරේ. එසේම, ලිංගික වෙනස මත සමාජ ගත කර ඇති ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ අවබෝධය පුළුල් කිරීමත්, පිතෘ මූලික සමාජය තුළ ස්ත්‍රියගේ තත්ත්වය පිළිබඳව විචාරාත්මකව පරීක්‍ෂා කිරීමත් ස්ත්‍රීවාදයෙන් සිදුකෙරේ. එමගින් සමාජය තුළ ස්ත්‍රී-පුරුෂ පැවැත්ම හා සම්බන්ධතා "මානව ජීවියා" (Humanbeing) යන මූලික සංකල්පය තුළ පිහිටමින් විස්තර කරයි.

## 10

## ස්ත්‍රීවාදය යනුවෙන් ඒකීය අදහස් මාලාවක් තිබේද?

ස්ත්‍රීවාදය යන සංකල්පයෙන් හැඟෙන්නේ එක් දෘෂ්ටිවාදයකි. නමුත්, ප්‍රායෝගික වශයෙන් ස්ත්‍රීවාදී ව්‍යාපාරය තුළ උප කණ්ඩායම් රාශියක් දකිය හැකිය. ඓතිහාසික පූර්වාදර්ශයන්, යම් යම් රටවල ස්ත්‍රීන්ගේ තත්ත්වයන්, නීත්‍යානුකූල අයිතිවාසිකම්, අත්දැකීම් හා ස්ත්‍රීන්ට බලපාන වෙනත් කරුණුවල විවිධත්වය නිසා ස්ත්‍රීවාදී දෘෂ්ටිය විවිධ දිශාවන්ට ගමන් කර තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස, එකිනෙකට වෙනස් වූ විවිධ ස්ත්‍රීවාදී ප්‍රවේශයන් රාශියක් බිහි වී ඇත. සෙසු දෘෂ්ටිවාද මෙන්ම ස්ත්‍රීවාදය ද විවිධ සමාජ පසුබිම්වලදී, විවිධ චින්තකයන් හා මත කණ්ඩායම් විසින්, විවිධ කාල සීමාවන්හි දී මතු කළ අදහස් හා ක්‍රියාකාරකම් පද්ධතියකි. මේ නිසාම ස්ත්‍රීවාදය විවිධ වූ මාර්ග අනුගමනය කරන, විවිධ ආකල්ප සහිත හා විවිධ ක්‍රමවේද යෝජනා කරන්නන් විශාල සංඛ්‍යාවකගේ එකතුවක් ද වේ.

ස්ත්‍රීවාදී ව්‍යාපාරයේ ආරම්භය 19 සියවස දක්වා ගමන් කරයි. පුරුෂ මූලික සමාජය තුළ ස්ත්‍රීන් පීඩනයට පත්ව ඇති ආකාරය පිළිබඳව විධිමත් න්‍යායාත්මක විමර්ශනයක් හා පොදු දක්මක් සහිත සමාජ ව්‍යාපාරයක් ලෙස එය ව්‍යාප්ත වූයේ එතැන් සිටය. එහෙත් ස්ත්‍රීන් හා පුරුෂයින් අතර වන සමාජ අසමානත්වය පිළිබඳ මෙයට පෙරද විවිධ අදහස් හා අධ්‍යයන ප්‍රකාශයට පත්ව තිබිණි. දාර්ශනිකයකු වූ හෙයින්රිච් කෝනෙලියස් අග්‍රිප්පා (Heinrich Cornelius Agrippa) විසින් 1529 දී රචනා කරන ලද Declamation on the Nobility and Preeminence of the Female Sex හා මාරි වොලස්ටන්ක්‍රාෆ්ට් විසින් 1792 දී රචනා කරන ලද A Vindication of the Rights of Women වැනි ප්‍රකාශන මෙයට කදිම නිදසුන් වේ. එහෙත් නූතන ස්ත්‍රීවාදයේ වර්ධනයට බෙහෙවින් ආධාරකාරී වූ අධ්‍යයනයක් ලෙස, මානව විද්‍යාඥයකු වූ මාග්‍රට් මීඩ්ගේ (Margaret Mead) Sex and Temperament in Three Primitive Societies (1935) සැලකිය හැකිය. එමගින්, ඇය ප්‍රාථමික සමාජ පිළිබඳ අධ්‍යයනය කොට චම්බුලි ගෝත්‍රය (Tchambuli Tribe) තුළ කිසිදු ගැටුමකින් තොරව පැවති ස්ත්‍රීන්ගේ ආධිපත්‍යය පිළිබඳව කරුණු හෙළි කළාය. ස්ත්‍රී-පුරුෂ සමාජ තත්ත්වය, ස්වභාවයෙන් නිර්මාණය වූවක් නොව, සමාජ හා සංස්කෘතික සාධක විසින් නිර්මාණය කරන ලද්දක්ය යන

විශ්වාසය වඩාත් තහවුරු කරගැනීමක් මෙන්ම ඒ පිළිබඳ විමර්ශනය කිරීමට විවිධ විෂය ක්ෂේත්‍රවල අධ්‍යයනවේදීන් පෙලඹවීමක්ද මේ මගින් සිදුවිය.

සියවස් එකහමාරක පමණ කාලයක් තිස්සේ, ස්ත්‍රීවාදීන් විසින් විවිධ ප්‍රවේශ හරහා, සමාජීය ලෙස ස්ත්‍රීන්ට වෙනස් කොට සැලකීම පිළිබඳව කරුණු විමර්ශනය කොට, මති මතාන්තර සමූහයක් ඉදිරිපත් කරනු ලැබ ඇත. ඒවායේ වර්ධනය නූතන ස්ත්‍රීවාදය බවට පත්ව තිබේ. මුල්ම යුගයේ ස්ත්‍රීවාදීන් හා ස්ත්‍රීවාදී ව්‍යාපාරය පළමු රැල්ල ලෙසත්, 1960 ගණන්වලින් පසු ව්‍යාප්ත වූ ස්ත්‍රීවාදී ව්‍යාපාරය දෙවන රැල්ල ලෙසත් සලකනු ලැබේ. නූතන ස්ත්‍රීවාදය තුන්වන රැල්ල නමින් හඳුන්වන අතර, සමහර ස්ත්‍රීවාදීහු එසේ හැඳින්වීමේ අවශ්‍යතාවක් නොමැති බවටද තර්ක කරති. මුහුදු රැල්ලට සමාන අයුරින් එක් රැල්ලක් මැකී යාමට පෙර, ඒ මත අනින් රැල්ල බිහිවීම නිසා මේ අයුරින් "රැල්ල" යන පදය ස්ත්‍රීවාදය හා එම ව්‍යාපාරයේ වර්ධන අවස්ථා හැඳින්වීමට යොදා ගැනුණි.

ස්ත්‍රීවාදයට විශේෂ වූ ලක්ෂණ කීපයක් හඳුනා ගත හැකි අතර එය විවිධ විෂයයන් හා සම්බන්ධ වූ ධාරාවක් වීම එහි ප්‍රධාන ලක්ෂණයකි. සමාජ විද්‍යාඥයින්, මානව විද්‍යාඥයින්, ඉතිහාසඥයින්, දේශපාලන විද්‍යාඥයින්, දාර්ශනිකයින්, මනෝ විද්‍යාඥයින්, ආර්ථික විද්‍යාඥයින්, අධ්‍යාපන විද්‍යාඥයින්, පරිසර විද්‍යාඥයින්, සංගීතඥයින්, කලාකරුවන් හා වාග් විද්‍යාඥයින් වැනි විවිධ ක්ෂේත්‍රවල විශේෂඥයින් සමාජය විසින් ස්ත්‍රියට හිමිකර දෙනු ලැබ ඇති තත්ත්වය පිළිබඳව විධිමත් විස්තර කිරීම් හා අර්ථකථනයන් එකිනෙකට වෙනස් වූ ආකාරයෙන් ඉදිරිපත් කර ඇත. නිදසුන් ලෙස සමාජ විද්‍යාඥයින්, පීතෘමූලික සමාජ ව්‍යුහය තුළ, ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයට හිමි සමාජ අසමානත්වය, සහ විවිධ සමාජ ස්තර තුළ මානව හැසිරීම, එම තත්ත්වය අතර ඇති සබඳතාව, ආදිය පිළිබඳව සමාජ විද්‍යාත්මක ප්‍රවේශයන් භාවිත කරමින් අර්ථකථන සපයා ඇත. ඔවුන් අතින් විස්තර නොවුනු, එහෙත් මෙම ස්ත්‍රී-පුරුෂ සමාජ අසමානත්වයට බලපාන මනෝමූලික සාධක මනෝවිද්‍යාඥයින් විසින් විස්තර කරනු ලැබ ඇත. එසේම එයට බලපාන ලද ඓතිහාසික සාධක හා ඉතිහාසය තුළ ස්ත්‍රීන්ගේ තත්ත්වය ක්‍රමයෙන් විකාශනය වූ ආකාරය ඉතිහාසඥයින් විසින් විස්තර කරනු ලැබ ඇත. මේ අයුරින් ස්ත්‍රීවාදයේ වර්ධනයට විවිධ විෂය ක්ෂේත්‍රවලින් දායකත්වයක් ලැබී ඇත. එහෙත් එම එක ප්‍රවේශයකින් පමණක් ස්ත්‍රීවාදී විග්‍රහය සම්පූර්ණයෙන්ම විස්තර කෙරේ යැයි පැවසිය නොහැකිය. මන්ද එහි විවිධ පැතිකඩ, විවිධ විෂයික ප්‍රවේශයන්ට අනුව විස්තර කරනු ලැබ ඇති හෙයිනි.



එහෙයින් ස්ත්‍රීවාදීන් අතර සමාජ විද්‍යාඥයින්, ආර්ථික විද්‍යාඥයින්, දේශපාලන විද්‍යාඥයින්, පරිසරවේදීන්, කලා කරුවන්, සමාජ සේවකයින් හා අයිතිවාසිකම් පිළිබඳ ක්‍රියාකාරීන් යනාදී පුළුල් අරමුණු සඳහා ක්‍රියාත්මක වන්නන් සිටිය හැකිය. ඔවුන් සිය ස්ත්‍රීවාදී අදහස්, එනම් ස්ත්‍රීන් පිළිබඳ ගැටළු, අමතන්නේ හා නිර්වචනය කරන්නේ තම ක්ෂේත්‍රය මත පිහිටමිනි. ඒ නිසා ස්ත්‍රීවාදය දෘෂ්ටිවාදයක් හා ක්‍රියාකාරකම් සමූහයක් ලෙස පෝෂණය වීම හා වර්ධනය වීමද සිදුවන්නේ ඒකීය ස්වභාවයකින් නොවේ. මෙය වෙනත් බොහෝ දෘෂ්ටීන් සම්බන්ධයෙන්ද දැකිය හැක්කකි. ලිබරල්වාදය හා මාක්ස්වාදය වැනි වෙනත් දෘෂ්ටිවාද ද මෙබඳු වෙනස් අදහස් දරන පුද්ගලයින් හා කණ්ඩායම්, කාලය, දේශය, වාර්ගිකත්වය හා අත්දැකීම් බඳු පසුබිම් මත වෙනස්වීම පොදු වන්නකි. එලෙසම ස්ත්‍රීවාදය තුළද ලිබරල් අදහස් දරන්නන්, සමාජවාදී අදහස් දරන්නන්, මාක්ස්වාදී අදහස් දරන්නන්, විප්ලවීය හා දැඩි රැඩිකල්වාදී අදහස් දරන්නන්, පාරිසරිකවාදී අදහස් දරන්නන්, හා මනෝ විශ්ලේෂණය සිය න්‍යාය බවට පත් කරගත්තවුන් යනාදී පුළුල් ප්‍රවේශ ගණනාවක් දැකිය හැකිය. එහෙයින් ස්ත්‍රීවාදය විවිධ ප්‍රවේශයන් රාශියක් සහිත විග්‍රහයක් ලෙස හැඳින්විය හැකිවේ.

ස්ත්‍රීවාදී න්‍යායයේ තවත් විශේෂ ලක්ෂණයක් නම් එහි පදනම නූතන ස්ත්‍රීවාදී ව්‍යාපාරය තුළ රාශිගත වී තිබීමය. ඒ නිසා අනිවාර්යයෙන්ම මෙම න්‍යාය තුළට නූතන සමාජ හා දේශපාලන අදහස් කාවැදී ඇත. ස්ත්‍රීවාදී ව්‍යාපාර, බටහිර රටවලදී ප්‍රතිසංස්කරණ ව්‍යාපාර, ජාතික ව්‍යාපාර, නිදහස් සටන් ව්‍යාපාර හා සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාර වැනි දෑ සමඟත්, තවත් රාජ්‍යවලදී ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ව්‍යාපාර හා ස්වාධීනතා ව්‍යාපාර වැනි දෑ සමඟත් බද්ධවී ඇත. බොහෝ අවස්ථාවලදී ස්ත්‍රීවාදී ව්‍යාපාර ආරම්භ වී ඇත්තේ මෙම සමාජ ව්‍යාපාර ආශ්‍රයෙනි.

සමාජ හා දේශපාලන අදහස් සමූහයක් තුළ ස්ත්‍රීවාදී න්‍යාය හුදෙක් විද්‍යමාන වීම පමණක් නොව, එම න්‍යාය එබඳු අදහස්වලින් දැනුවත් වීමක් හා පෝෂණය වීමත් ද සිදුවේ. මෙයද ස්ත්‍රීවාදයේ විශේෂ ලක්ෂණයකි. එහෙයින් ස්ත්‍රීවාදීන්ට පසුබිම් වූ විවිධ පරිසරයන්, භෞතික තත්ත්වයන්, අත්දැකීම් හා විවිධ සංස්කෘතික තත්ත්වයන් ඔවුන්ගේ න්‍යායික අදහස් සඳහා විවිධ ආකාරයෙන් බලපෑම් කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස මතවාදීමය වශයෙන්, විවිධ ස්ත්‍රීවාදී කණ්ඩායම්වල ආකල්ප හා ක්‍රමවේදයන් වෙනස් විය හැකිය. නිදසුනක් ලෙස, එක් කණ්ඩායමක් විස්තර කරන ආකාරයට වෙනස් වූ ආකාරයකින් තවත් කණ්ඩායමක්, ස්ත්‍රියට සමාජයේ හිමි අප්‍රධාන තත්ත්වය, එයට බලපාන සාධක, හා එම තත්ත්වය වෙනස්

කළ යුතු ආකාරය ආදිය පිළිබඳ කරුණු දැක්විය හැකිය. එසේම ඔවුන් අතර තියුණු මත ගැටුම් ද පැවතිය හැකිය. එහෙත් සමස්තයක් ලෙස ස්ත්‍රීවාදයට පොදුවන කරුණු ගණනාවක් ද ඇත. ඒවා නම්;

* ස්ත්‍රී-පුරුෂ ජීවවිද්‍යාත්මක වෙනස මත, සමාජය විසින් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය නිර්මාණය කර ඇති අතර, එම තත්ත්වය තුළදී ස්ත්‍රිය වෙනස්කම්වලට ලක්වන බව හා පවුල මෙන්ම සමාජය තුළත් අප්‍රධාන තත්ත්වයකට පත්වන බව පිළිගැනීම.
* එම අප්‍රධාන තත්ත්වයට හේතුවන සාධක විස්තරාත්මකව හා විචාරාත්මකව පරීක්‍ෂා කිරීම.
* පීතෘමූලික සමාජය තුළ ස්ත්‍රීන් හා ඔවුන්ගේ දායකත්වය අවතක්සේරු කිරීම අසාධාරණය යන මතයේ පිහිටා එම සමාජ අසමානත්වයට අභියෝග එල්ල කිරීම.
* ස්ත්‍රීන් හා ඔවුන්ගෙන් පවුල සහ සමාජයට ඉටුවන දායකත්වය අගය කිරීම.
* ස්ත්‍රී-පුරුෂ සම සාධාරණත්වය සහිත සමාජයක් බිහි කිරීම. පෞද්ගලික ක්ෂේත්‍රයේ දී පමණක් නොව, පොදු ක්ෂේත්‍රයේ සියලුම සමාජ, ආර්ථික හා දේශපාලන කටයුතුවලදීත්, පුරුෂයින්ට සමාන අයුරින් ස්ත්‍රීන්ටත්, ප්‍රථම පෙළ පුරවැසියන් ලෙස සහභාගී විය හැකි තත්ත්වයක් උදා කිරීම. අරමුණු කරගෙන සිටීම.
* එබඳු සමාජ වෙනසක් සඳහා සැලසුම් සකස් කිරීම.
* ස්ත්‍රීන්ට සම සාධාරණත්වය හිමිවිය යුතුය යන අදහස දරන්නන් ඒකරාශී කිරීම හා අවසාන අරමුණ වූ ස්ත්‍රීන්ගේ විමුක්තිය සඳහා ඔවුන් මෙහෙයවීම.

මෙවැනි කරුණු මත ස්ත්‍රීවාදී විඥානයේ පොදු හෝ ඒකීය බවක් ඇතද, ස්ත්‍රියගේ අප්‍රධාන තත්ත්වය විස්තර කරන ආකාරය, එයට බලපෑ සාධක හඳුනා ගන්නා ආකාරය, එම තත්ත්වයෙන් ඇය මුදවා ගැනීමට භාවිත කරන ක්‍රමවේද හා ස්ත්‍රී විමුක්තිය අර්ථ නිරූපණය කරන ආකාරය ආදී දෑ සම්බන්ධයෙන් විවිධ ස්ත්‍රීවාදී ප්‍රවේශ අතර වෙනස්කම් ඇති බවද අමතක කළ යුතු නොවේ.

# II
# ස්ත්‍රීවාදයේ විවිධ ප්‍රවේශ විස්තර කරන්නේ කෙසේද?

ඉහත සඳහන් කළ ආකාරයට ස්ත්‍රීවාදයේ විවිධ ප්‍රවේශ රැසක් දැකිය හැකිය. ලිබරල් ස්ත්‍රීවාදය, මාක්ස්වාදී ස්ත්‍රීවාදය, සමාජවාදී ස්ත්‍රීවාදය, රැඩිකල් (ආන්තිකවාදී) ස්ත්‍රීවාදය හා පශ්චාත් නූතනවාදී ස්ත්‍රීවාදය (Post - Modernist Feminism) මේ අතරින් ප්‍රධාන වේ. එයට අමතරව, අනධිකාරිවාදී ස්ත්‍රීවාදය (Anarcha Faminism), මනෝවිශ්ලේෂණීය ස්ත්‍රීවාදය (Psycho-analytic Feminism) පරිසරවාදී ස්ත්‍රීවාදය (Eco-feminism), සංස්කෘතික ස්ත්‍රීවාදය (Cultural Feminism), කළුජාතික ස්ත්‍රීවාදය (Black Feminism) හා තෙවන ලෝකයේ ස්ත්‍රීවාදය (Third - World Feminism) වැනි උප කණ්ඩායම් රැසක් ද නූතන ස්ත්‍රීවාදීන් අතර වේ. භූගෝලීය ප්‍රදේශ හෝ රටවල් අනුව ව්‍යාප්ත වූ ලතින් ඇමරිකානු ස්ත්‍රීවාදය, අප්‍රිකානු ස්ත්‍රීවාදය, ආසියානු ස්ත්‍රීවාදය හා ප්‍රංශ ස්ත්‍රීවාදය වැනි කණ්ඩායම් ද උප කණ්ඩායම් ලෙස සැලකේ.

## ලිබරල් ස්ත්‍රීවාදය (Liberal Feminism)

ප්‍රායෝගික වශයෙන් නූතන සමාජය තුළ වඩාත් පුළුල් ලෙස පිළිගැනීමකට ලක්වූ ස්ත්‍රීවාදී ප්‍රවේශය ලිබරල් ස්ත්‍රීවාදයයි. එහි මූලාරම්භය සම්භාව්‍ය ලිබරල් වාදයේ පුද්ගලවාදය, නිදහස, ස්වයං නිර්ණය, අයිතිවාසිකම් හා සමානාත්මතාව වැනි මූලධර්ම මත පදනම් වේ. මෙම සිද්ධාන්ත හා පුද්ගල අයිතීන් පුරුෂයින් මෙන්ම ස්ත්‍රීන් සම්බන්ධයෙනුත් අහිමි කළ නොහැකි අයිතීන් ලෙස ලිබරල් ස්ත්‍රීවාදීන් අවධාරණය කළ අතර, ඒවා ස්ත්‍රී විමුක්තිය දක්වා ව්‍යාප්ත කිරීමක් ඔවුන් විසින් කරනු ලැබිණි.

17 වැනි සියවසේ බ්‍රිතාන්‍ය ලිබරල් වාදය හා ප්‍රංශ පුනර්ජීවනීය නිදහස් මතවාදය ලිබරල් ස්ත්‍රීවාදයේ ආරම්භයයි. ස්ත්‍රීන්ටත් පුරුෂයින්ට සමාන අයුරින් අධ්‍යාපනය ලැබීමේ, රැකියාවක් කිරීමේ, දේශපාලනික හා සමාජයේ වෙනත් කටයුතුවලට සහභාගී වීමේ, ඡන්දය දීමේ හා නියෝජනයේ අයිතිය හිමිවිය යුතු බවට ලිබරල් ස්ත්‍රීවාදීහු තර්ක කරති. නීතිය ඉදිරියේ සමානාත්මතාව හා සමාන පුරවැසි බවද ස්ත්‍රීන්ට හිමිවිය යුතු බවට ඔවුහු අවධාරණය කරති. ඒ නිසා නීතිමය වශයෙන් පුරුෂයින්ට වඩා අප්‍රධාන

තත්ත්වයක ස්ත්‍රීත්ව ස්ථානගත කිරීමට ඔවුහු එරෙහි වෙති. පවුල තුළද, පියාට හෝ සැමියාට යටත් අයෙකු ලෙස ස්ත්‍රිය තබා ගැනීම පිළිබඳ ඔවුහු විවේචනය කරති.

ලිබරල් චින්තනයෙන් සමානාත්මතාව හා පුද්ගල අයිතිවාසිකම් වැනි දෑ පිළිබඳ අවධාරණය කෙරුණද පුරුෂයින්ට වඩා ස්ත්‍රීන් ස්වභාවයෙන් වෙනස් නිසා ඔවුන් අප්‍රධානය යන අදහස 20 වැනි සියවස දක්වාම ඒ තුළ ගැබ්ව තිබුණි. සමහර ලිබරල් චින්තකයින් ස්ත්‍රීන්ට අධ්‍යාපනය ලැබීමේ අයිතිය වැනි දෑ හිමිවිය යුතු බවට තර්ක කළත්, ප්‍රායෝගික වශයෙන් පුරුෂයින්ට සමාන නිදහසක් ස්ත්‍රීන්ට හිමිවිය යුතුය යන මතය ඒ තුළ නොවිය. නමුත් ලිබරල් ස්ත්‍රීවාදය ව්‍යාප්ත වීමට ප්‍රථම, ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව උදෙසා වන විවිධ අදහස් ලිබරල්වාදීන් විසින් වරින්වර ප්‍රකාශ කරනු ලැබ තිබුණි. ප්‍රංශ විප්ලව සමයේදී මාක්විස් ඩි කොන්ඩොර්සෙ (Marquis de Condorcet) විසින් ස්ත්‍රීන්ටත් පුරුෂයින්ටත් සමාන අයුරින් පුරවැසි අයිතිවාසිකම් හිමිවිය යුතු බවට තර්ක කරනු ලැබිණි. වික්ටෝරියානු එංගලන්ත සමාජය, ස්ත්‍රීන්ට වෙනස් කොට සැලකීම පිළිබඳව විවේචනය කළ ජෝන් ස්ටුවර්ට් මිල් (John Stuart Mill) ස්ත්‍රීන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය හිමිවිය යුතු බවට තර්ක කළේය. ඔවුන් පුරුෂයින් වුවත් ස්ත්‍රීවාදී අදහස් රැගත් චින්තකයින් ලෙස අගය කළ හැකිය. 17 වන සියවස අග භාගයේදී මේරි ඇස්ටෙල් (Marry Astell) වැනි ලිබරල් ස්ත්‍රීවාදීන් විසින් මූලික ලිබරල් සංකල්ප වූ පුද්ගල නිදහස හා අයිතිවාසිකම් වැනි දෑ ස්වාභාවික දෑ ලෙසට අවධාරණය කරනු ලැබීය. ඇය ජෝන් ලොක්ගේ සමාජ සම්මුති න්‍යාය (The Social Contract Theory) සහ ස්වාභාවික අයිතිවාසිකම් පිළිබඳ න්‍යාය (Natural Rights Theory) භාවිත කරමින් පවුලේ ස්වාධිපත්‍යය යන්නට පහර නැසීය. "සියලුම පුරුෂයින් නිදහස් මිනිසුන් ලෙස ඉපදුනා නම්, සියලුම ස්ත්‍රීන් වහලුන් ලෙස ඉපදුනේ කෙසේදැයි" ඇය "Reflections on Marriage" යන අධ්‍යයනයේදී ප්‍රශ්න කිරීමට ලක් කළාය. ස්වාමි පුරුෂයින්ගේ බලය ශක්තියෙන් බිඳී ආ දෙයක් මිස ස්වාභාවික නීතියෙන් බිඳී ආවක් නොවන බවට ඇය එහිදී තර්ක කළාය.

මාරි වොලස්ටන්ක්‍රාෆ්ට් ද, සිය ("A Vindication of the Rights of Women") යන කෘතියෙන්, ස්ත්‍රීන්ට හිමිවිය යුතු අධ්‍යාපනය ලැබීමේ අයිතිය පිළිබඳව අවධාරණය කළාය. එම අයිතීන් ලබා නොදීම ස්ත්‍රීන්ගේ මනුෂ්‍යත්වය හා බුද්ධිය නොසලකා හැරීමක් බව ඇය පෙන්වා දුන්නාය. ස්ත්‍රියගේ ලිංගික වෙනස හා ඇයට පැවරී ඇති ගෘහාශ්‍රිත භූමිකාව නිසා, පුරුෂයින්ට වඩා වෙනස් වූ ආකාරයේ පුහුණුවක් සහ අධ්‍යාපනයක් ඇයට ලබා දීම අනවශ්‍ය බවට වොලස්ටන්ක්‍රාෆ්ට් තර්ක කළාය. ස්ත්‍රීන්ටත් පුරුෂයින්ට සමාන අයුරින් අධ්‍යාපනය හා වෙනත් ඉඩ ප්‍රස්ථාවන් ලබාදී, සමාජය විසින් උනන්දු කරවනු ලැබුව හොත්, ඔවුනුත් පුරුෂයින් මෙන් සමාජයේ හැසිරෙන දක්ෂ පුද්ගලයින් වන බව ඇය පෙන්වා දුන්නාය. ස්ත්‍රීන්ට සිවිල් නීති මගින් ආරක්ෂාව සැලසිය යුතු බවත්, ආදායම් උපයන රැකියාවල නිරත වීමට නිදහස තිබිය යුතු බවටත් ඇය තර්ක කළාය. විවාහ වීමෙන් පසුවද, ස්ත්‍රියකට රැකියාවක් කිරීමේ නිදහස හිමිවිය යුතු බවත්, එයින් ඇයට ආර්ථික ස්වාධීනතාව හිමිවන බවත්, වොලස්ටන්ක්‍රාෆ්ට් පෙන්වා දුන්නාය. පුරුෂයින්ට සමාන අයුරින් දේශපාලන අයිතිවාසිකම්, විශේෂයෙන්ම නියෝජනයේ අයිතිය ස්ත්‍රීන්ට හිමිවිය යුතු බවටද ඇය තර්ක කළාය.



ජෝන් ස්ටුවර්ට් මිල්ගේ බිරිඳ හැරියට් ටේලර් (Harriet Taylor) ඇගේ "Enfranchisement of Women" (1853) යන රචනාවෙන්, ස්ත්‍රීන්ට හිමිවිය යුතු ඡන්ද බල අයිතිය, පාර්ලිමේන්තුව තුළ නියෝජනය වීමේ අයිතිය හා අධිකරණයේ සහ ජූරිසභාවේ අසුන් ගැනීමට ඇති අයිතිය පිළිබඳ තදින් අවධාරණය කළාය. වැටුප් උපයන වෘත්තියක නිරතවීමේ අයිතිය, ස්ත්‍රියට විවාහයෙන් පසුවද හිමිවිය යුතු බවත්, එසේ නොවුනහොත්, ඇයට තීරණ ගැනීමට ඇති සත්‍ය නිදහස ප්‍රතික්ෂේප වීමක් සිදුවන බවටත් ටේලර් තර්ක කළාය. ස්ත්‍රිය ආර්ථික වශයෙන් පවුලට දායකත්වය දක්වද්දී, ඇගේ තත්ත්වය උසස් වන බව පෙන්වා දුන් ටේලර්, වොලස්ටන්ක්‍රාෆ්ට්ට වඩා ඔබ්බට යමින් පොදු කටයුතුවලදී ස්ත්‍රියට හිමිවිය යුතු අයිතිවාසිකම් පිළිබඳ දැඩිව අවධාරණය කළාය. ස්ත්‍රීන්ට ගෘහයෙන් පිටත රැකියාවක නිරතවීමේ අයිතිය හිමිවිය යුතු බවට ජෝන් ස්ටුවර්ට් මිල්, ඔහුගේ "Subjection of Women" (1913) කෘතියෙන් තර්ක කළද විවාහයෙන් පසුව ස්ත්‍රියගේ වෘත්තිය කුටුම්භයට හා මවගේ භූමිකාවට සීමාවිය යුතු බවට අදහස් දැක්විය. ටේලර්, එයින් ඉදිරියට ගොස් විවාහයෙන් පසුව ස්ත්‍රීන්ට ස්වාමිපුරුෂයින්ගෙන් යැපෙන්නන් වීමට නොහැකි නිසා රැකියාවක් කිරීමේ අයිතිය හිමිවිය යුතු බවට තර්ක කළාය.

මෙබඳු අදහස් මාලාවක් මත පදනම් වූ ලිබරල් ස්ත්‍රීවාදයේ මූලික තර්කය වූයේ, මිනිසාට තෘප්තිමත් විය හැක්කේ සියලුම දෙනාට සමාන නිදහස හා සමාන ඉඩ ප්‍රස්ථාවන් හිමිකර දුනහොත් පමණි යන්නය. එහි මූලික අරමුණ වූයේ, ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයට සමාන අවස්ථා ලාභයත්, විශේෂයෙන්ම අධ්‍යාපනය හා රැකියා සම්බන්ධයෙන් නිර්මාණය කරදීමයි. ලිබරල්වාදයේ මූලික අභිප්‍රාය වූයේ නිදහස් වෙළඳපොළට පිවිසීමට ඇති බාධක ඉවත් කොට, උපරිම පෞද්ගලික නිදහස ස්ථාපිත කිරීමයි. එසේම

මුල්කාලීන ලිබරල් ස්ත්‍රීවාදීන්ගේ අරමුණ වූයේද, පොදු ක්ෂේත්‍රයට පිවිසීමට ස්ත්‍රියට වූ බාධක ඉවත් කිරීමයි.

ස්ත්‍රිය උපතින්ම බුද්ධියෙන් අඩු සහ ශාරීරික වශයෙන් දුර්වල මිනිස් ජීවියෙකු බවට නිරන්තරව ඉස්මතු කෙරුණු පීතෘමූලික විශ්වාසයන් හා අභය කිරීම මේ අනුව ලිබරල් ස්ත්‍රීවාදයේ විවේචනයට ලක්විය. මෙම අතාර්කික වූ පිළිගැනීම් හා මිථ්‍යා විශ්වාස නිසා ස්ත්‍රීන්ගේ නියම හැකියාවන් යටපත් කෙරෙන බවද ලිබරල් ස්ත්‍රීවාදීහු පෙන්වා දුන්හ. ආර්ථික හා දේශපාලන ක්ෂේත්‍රයට පිවිසීමට ඇයට ඇති හැකියාව සම්ප්‍රදායික විශ්වාස හා නීතිමය බාධාවන් මගින් අවහිර කර ඇති බවටද ඔවුහු අවධාරණය කළහ. සියලුම මිනිස් ජීවීන් සමානව ඉපදී ඇති හෙයින්, ඔවුන්ට සමාන අයිතිවාසිකම් හිමිවිය යුතුබවත්, ඔවුහු ප්‍රකාශ කළහ. පීතෘමූලික සමාජය තුළ, පුරුෂයින්ට වාසිවන ආකාරයෙන් නීති සම්පාදනය කොට, ස්ත්‍රීන්ගේ නිදහස අවහිර කොට ඇති බවත්, ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂය සමාජානුයෝජනය වන ආකාරය නිසා ස්ත්‍රීන් අප්‍රධාන හා පීඩිත තත්ත්වයට පත්වී ඇති බවත් ලිබරල් ස්ත්‍රීවාදීන්ගේ විශ්වාසයයි. පුරුෂයින් විසින් තීරණය කරන ලද ජීවිතය පිළිගැනීම නොව, ස්ත්‍රීන්ගේ කැමැත්තට අනුව තෝරා ගත් ලෙස ජීවත් වීමට ඔවුන්ට අයිතියක් හිමිවිය යුතු බවටද ඔවුහු තර්ක කළහ. මෙම අදහස් වර්ධනය කිරීමට ඉහත සඳහන් කළ චින්තකයින් හා බෙටී ප්‍රිඩන් (Betty Friedan) වැන්නන්ද, සම අයිතිවාසිකම් පිළිබඳව එංගලන්ත කොමිසම හා අමෙරිකානු ජාතික කාන්තා සංවිධානය වැනි ව්‍යාපාරද දායකත්වය සපයා දෙනු ලැබිණි.

ලිබරල් ස්ත්‍රීවාදීන් අධ්‍යාපන අයිතිය හා ඡන්දබල අයිතියේ සිට සම අයිතිවාසිකම් ව්‍යාපාරය දක්වා, පසුගිය දශක කීපය තුළදී සිය ඉල්ලීම් ව්‍යාප්ත කර ඇත. දහඅට වැනි සියවසේදී ඔවුන්ගේ ප්‍රධාන තර්කය වූයේ ස්ත්‍රීන්ට හා පුරුෂයින්ට සමාන අධ්‍යාපන අයිතියක් ලබාදිය යුතුය යන්නයි. දහනම වැනි සියවස වන විට ඔවුහු සමාන ආර්ථික, දේශපාලන හා සිවිල් අයිතිවාසිකම් ඉල්ලා සිටියහ. එහෙයින් මූලික හා ද්විතීයික පාසල්, විශ්ව විද්‍යාල, වෛද්‍ය විද්‍යාල, නීති විද්‍යාල සහ දේව ධාර්මික පාසල් ආදියෙහි අධ්‍යාපනයට ඇති සම අයිතිය, නිෂ්පාදන ක්ෂේත්‍රයේ නියැලීමට, සම වැටුප් හා සේවා කාල දැරීමට ඇති අයිතිය, ඡන්ද අයිතිය, දේශපාලන හා පරිපාලනමය ආයතනවල ප්‍රමාණවත් නියෝජනයක් දැරීමට ඇති අයිතිය වැනි දෑ පිළිබඳ ඔවුහු අවධානය යොමු කළහ. විසිවන සියවසේ ලිබරල් ස්ත්‍රීවාදීන්ගේ මූලික අවධානය යොමු වූයේ ස්ත්‍රිය හා පුරුෂයා සමාන කොට සැලකීමේදී මතු වූ ගැටලු පිළිබඳවය. ලිංගික හා කායික වශයෙන්



මේ ජීවීන් දෙපක්ෂය අතර වන වෙනස්කම් පිළිගන්නා අතරම, සමාජීය ක්ෂේත්‍රයෙහි සමාන අයිතිවාසිකම් හා ඉඩප්‍රස්ථා ලබාදීම පිළිබඳ ඔවුහු අවධාරණය කළහ. නූතන ලිබරල් ස්ත්‍රීවාදීහු සමාජ, ආර්ථික හා දේශපාලන ක්ෂේත්‍ර තුළ පමණක් නොව ගෘහය හා පවුල තුළද ස්ත්‍රියගේ තත්ත්වය පුරුෂයාට සාපේක්ෂව අප්‍රධාන නොවිය යුතු බවට තර්ක කරති.

මේ අනුව සමස්තයක් ලෙස ගත්කල ලිබරල් ස්ත්‍රීවාදයේ හරය වන්නේ ස්ත්‍රීන්ට හා පුරුෂයින්ට සමාන අයිතිවාසිකම්, සම්පත් හා ඉඩ ප්‍රස්ථාවන් හිමි සම සාධාරණ සමාජයක් බිහි කිරීමේ අරමුණයි. ඔවුහු ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සම්බන්ධයෙන්, විධිමත් හා පැහැදිලි න්‍යායයක් ඉදිරිපත් නොකළත්, ස්ත්‍රීන්ට වෙනස්කොට සැලකීම විවේචනය කළහ. ලිංගික හා කායික වශයෙන් ස්ත්‍රීන් වෙනස් වුවත්, මානසික වශයෙන් පුරුෂයින්ට සමාන නිසා පුරුෂයින් මෙන් ස්ත්‍රීන්ද හැසිරිය යුතු යැයි ඔවුහු විශ්වාස කළහ. පවතින ධනවාදී ආර්ථික ක්‍රමය, පීතෘමූලික සමාජය හා ප්‍රතිවිරුද්ධ ලිංගික විවාහය වැනි තත්ත්වයන්ට අභියෝග නොකළ ද, සමාජ ප්‍රතිසංස්කරණ මගින් ස්ත්‍රීන්ගේ තත්ත්වය වෙනස් කොට, සමාන අයිතීන් හිමි කරගත යුතු බවට ඔවුහු විශ්වාස කළහ. සමාජය විප්ලවීය වෙනසකට නොව, නීතිමය හා ප්‍රතිපත්තිමය වශයෙන් ක්‍රමික වෙනසකට ලක් කොට, ඒ තුළින් ස්ත්‍රීන් කෙරේ පවතින සෘණාත්මක ආකල්ප වෙනසකට ලක් කළ හැකිය යන මතය ඔවුන්ගේ මූලික තර්කය විය. ස්ත්‍රියද පුරුෂයාට සමාන නිසා සමාන අධ්‍යාපනයක්, රැකියාවක් හා වෙනත් ඉඩප්‍රස්ථා ලබා දුනහොත් ඇයද පුරුෂයා මෙන් දක්ෂ අයුරින් කටයුතු කරයි. එවිට ඇගේ තත්ත්වය පවුල හා සමාජය තුළ වෙනස් වීමත් සමගම ඇය කෙරේ පවතින ආකල්පද වෙනසකට ලක්වේ යැයි ලිබරල් ස්ත්‍රීවාදීහු පෙන්වා දුන්හ.

මෙම අරමුණ ඉටු කරගැනීම සඳහා ලිබරල් ස්ත්‍රීවාදීන් ඉදිරිපත් කරන ක්‍රමවේදය වන්නේ, ස්ත්‍රීන් හා පුරුෂයින්ට සමාන අයිතීන් සඳහා වන නීතිමය හා ප්‍රතිපත්තිමය වෙනස්කම් ඇතිකිරීමට බලපෑම් කිරීමයි. මුල් කාලවලදී අධ්‍යාපනයේ අයිතිය හා ඡන්ද බල අයිතිය දිනාගැනීමට ඔවුහු සටන් කළහ. රැකියාවක් කිරීමේ අයිතිය, සමාන වැටුප් හා සමාන වැඩ පැය සඳහා වූ අයිතිය, රැකියා ස්ථානයේදී වෙනස්කම්වලට එරෙහි වීමේ අයිතිය හා තීරණ ගන්නා මට්ටම්වලදී නියෝජනයේ අයිතිය ආදිය ඉන්පසු ඔවුන්ගේ අවධානයට යොමු විය. නූතන ලිබරල් ස්ත්‍රීවාදීහු ප්‍රජනනය සම්බන්ධ අයිතීන් හා ස්ත්‍රීන්ට හිමි ගෘහාශ්‍රිත භූමිකාව ලිහිල් කිරීමට අදාළ වන විධියේ සමාජ ප්‍රතිපත්ති සඳහා ඉල්ලීම් ඉදිරිපත් කරති. ධනවාදී ආර්ථික ක්‍රමය තුළ ස්ත්‍රීන් හා පුරුෂයින්ට සමාන අයුරින් කරන කළහැකි තත්ත්වයක්

ලිබරල් රාජ්‍යය ආධාරයෙන් නිර්මාණය කිරීම ඔවුන්ගේ අවසාන ඉලක්කයයි. ඒ නිසා මුල්කාලීනව ස්ත්‍රීන්ට හිමි අප්‍රධාන තත්ත්වය ඔවුන් අභියෝගයට ලක්කළද, එයට සාපේක්ෂව ලිංගික බව, ප්‍රජනන කාර්යය හා ගෘහස්ථ ශ්‍රමය අභියෝගයට ලක්කළේ නැත. පොදු කටයුතු සඳහා සක්‍රිය වශයෙන් සහභාගීවීමේ දී ස්ත්‍රීන්ට පවතින බාධක විශේෂයෙන්ම නීත්‍යානුකූල බාධක තුරන් කිරීම ඔවුන්ගේ මූලික අභිප්‍රායයක් විය.

ලිබරල් ස්ත්‍රීවාදීන් සමාජ වෙනසක් ඇති කිරීමට ප්‍රමාණවත් වන විධියේ රැඩිකල් අදහස් නොදරන බවත්, ධනවාදය හා සම්ප්‍රදායික පවුල් සංස්ථාව අභියෝගයට ලක් නොකරන බවටත්, විවේචන එල්ල වී ඇත. විශේෂයෙන්ම 18 හා 19 වැනි සියවස්වල ලිබරල් ස්ත්‍රීවාදීන් වැඩ කරන පන්තියේ ස්ත්‍රීන් පිළිබඳව නොව, මධ්‍යම හා ප්‍රභූ පංතික ස්ත්‍රීන්ගේ සමාජ තත්ත්වය නගා සිටුවීමට අවධානය යොමු කළ බවටද දොස් පැවරේ. එහෙයින් ඔවුන් "ධනේශ්වර ස්ත්‍රීවාදීන්" ලෙසටද සමහරු නම් කරති. පීතෘමූලික සමාජය පිළිබඳව ගැඹුරු හා විස්තරාත්මක විග්‍රහයක් ඉදිරිපත් නොකිරීම හා වර්ණය, මානව වර්ගය හා පංතිය යන ස්ථරායන සාධක පිළිබඳව නොසලකා හැරීම පිළිබඳව ද ඔවුන්ට විවේචන එල්ල කෙරේ. අසීමිත ලෙස ලිබරල් රාජ්‍යය කෙරේ ඔවුන් අපේක්ෂා තබා ගෙන ඇතැයි ද චෝදනා නැගේ.

මෙවැනි දුර්වලතා සහිත වුවත් ලිබරල් ස්ත්‍රීවාදීන් විසින් ස්ත්‍රීන්ගේ තත්ත්වය නගාසිටුවීමට, විශේෂයෙන්ම නීත්‍යානුකූල අයිතිවාසිකම් හිමිකරදීමට කරන ලද දායකත්වය සුළුකොට තැකිය නොහැකිය. සියවස් තුනකට පමණ පෙර ජීවත් වූ ස්ත්‍රීන්ට හිමි නොවුන අධ්‍යාපන, සමාජ, සිවිල්, ආර්ථික හා දේශපාලන අයිතිවාසිකම් රාශියක් නීත්‍යානුකූලව නූතන ස්ත්‍රීන්ට හිමිකර දීමේ ගෞරවය අනිවාර්යයෙන්ම ලිබරල් ස්ත්‍රීවාදීන්ට හිමිවිය යුතුය. වෙනම කණ්ඩායමක් ලෙස නොව, පුරුෂයින්ද සහභාගී කරගෙන, ඔවුන්වද දැනුවත් කරමින්, දැනටත් ලිබරල් ස්ත්‍රීවාදීහු විධිමත් බලපෑම් කණ්ඩායමක් ලෙස රාජ්‍යයට හා සමාජයට බලපෑම් කරති. ලිබරල් ස්ත්‍රීවාදීන් නීතිමය හා ප්‍රතිපත්තිමය වශයෙන් දිනාගෙන ඇති දෑ සැබවින්ම ස්ත්‍රීන්ගේ තත්ත්වය නගාසිටුවීමටත්, ඔවුන් කෙරේ පැවති සම්ප්‍රදායික ආකල්ප හා විශ්වාස යම් තරමකට වෙනස් කිරීමටත් විශාල බලපෑමක් කර ඇත.

## මාක්ස්වාදී ස්ත්‍රීවාදය (Marxist Feminism)

කාල් මාක්ස්ගේ (Karl Marx) හා ෆෙඩ්රික් එංගල්ස්ගේ (Friedrich Engels) විද්‍යාත්මක සමාජවාදී අදහස් මත පිහිටමින්, ස්ත්‍රිය සම්බන්ධ



ගැටළුව අවධානයට ලක් කිරීම මාක්ස්වාදී ස්ත්‍රීවාදී ප්‍රවේශයෙන් සිදු කෙරේ. මෙය ලිබරල් ස්ත්‍රීවාදයට විකල්පයක් ලෙස බිහිවූවකි. ස්ත්‍රීන් මත වන පීඩනය හා සූරාකෑම විස්තර කිරීමට හා අවබෝධ කර ගැනීමට මාක්ස්වාදී න්‍යාය භාවිත කිරීමට, මාක්ස්වාදී ස්ත්‍රීවාදීහු උත්සාහ ගත්හ. මාක්ස්වාදයේ හරය වන්නේ, මානව ඉතිහාසය හා සමාජ විකාශනය නිෂ්පාදන ශිල්ප ක්‍රමයේ වෙනස්වීම් මත රඳා පවතින බව පිළිගැනීමයි. ආර්ථික වර්ධන යුගවල ප්‍රතිඵලයක් ලෙස පවුල, සමාජ සංවිධාන හා සමාජ සම්බන්ධතාද වෙනස් වේ. එහෙයින් ආර්ථික සහ සමාජ ක්‍රමයන්හි වෙනසක් නොකර, එම සමාජ සංස්ථාවල වෙනසක් ඇතිකළ නොහැකිය. පංති අරගලය හා විප්ලවය මඟින් පවතින ධනවාදී ආර්ථික ක්‍රමය වෙනස් කොට, පංති රහිත, කොමියුනිස්ට් සමාජයක් බිහිකිරීම තුළින් මෙම සමාජ වෙනස ඇතිකළ හැකි බව මාක්ස්වාදයෙන් ප්‍රකාශවේ.

ෆෙඩ්රික් එංගල්ස් මෙම අදහස වර්ධනය කළ අතර, "The Origin of the Family, Private Property and the State" (1884) යන කෘතියේදී ස්ත්‍රීන්ව මර්දනය කිරීම හා සූරාකෑම පිළිබඳව අදහස් දැක්විය. ඔහුට අනුව ස්ත්‍රී පීඩනය ඉතිහාසය පුරා අඛණ්ඩව පැවතුන දෙයක් නොවේ. පුද්ගලික දේපළ ක්‍රමය හා පංති අරගලයේ ආරම්භයත් සමඟ එය ඇරඹුණි. ධනවාදයේ විනාශයත් සමඟ ස්ත්‍රී පීඩනය හා සූරාකෑම ද අවසන් වේ. පුරුෂයින්ට සමාන අයුරින් ස්ත්‍රීන්ට ආර්ථික ශක්තිය හිමි වූ විට ඔවුනට පුරුෂයින් මත යැපෙන්නට සිදුනොවේ. එවිට, ස්ත්‍රීන්ට හිමිව තිබූ ගෘහාශ්‍රිත කටයුතු හා දරුවන්ගේ වගකීම්, සමාජ වගකීම් බවට පත්වී, ඔවුන් ඒවායින් නිදහස් වේ. මෙම විමුක්තිය උදාකර ගැනීම සඳහා ස්ත්‍රීන් වෙනම කණ්ඩායමක් ලෙස නොව, වැඩ කරන පංතියේ පුරුෂයින් සමඟ එක්වී, විප්ලවීය වෙනසකින් ධනවාදී සමාජය විනාශ කිරීමට ක්‍රියාකළ යුතු බවට එංගල්ස් තර්ක කළේය. මාක්ස්වාදී අර්ථකථනයට අනුව ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය හෝ පීතෘ-මූලිකත්වයට වඩා ස්ත්‍රී පීඩනයට මූලික වන්නේ ධනවාදී නිෂ්පාදන රටාව හා පංතියයි. මෙම අදහස් මත පදනම්ව ස්ත්‍රී විමුක්ති අරගලය පංති අරගලයට සම්බන්ධ කිරීමක් මාක්ස්වාදී ස්ත්‍රීවාදීන් විසින් කරනු ලැබිණි.

ධනවාදී සමාජය තුළ කිසිවිටෙකත්, ලිබරල් ස්ත්‍රීවාදීන් අපේක්ෂා කරන විධියේ, සමාන ඉඩ ප්‍රස්ථාවන් ඇතිවිය නොහැකි බව මාක්ස්වාදී ස්ත්‍රීවාදීන්ගේ අදහසයි. පවුල හා පෞද්ගලික දේපළ අයිතිය වැනි ධනවාදී සමාජ ආයතන ස්ත්‍රිය මත වන පීඩනය නිර්මාණය කරයි. ඒ නිසා මෙම සියලු පීඩනයන්ට එකම විසඳුම පෞද්ගලික දේපළ ක්‍රමය මත පදනම් වූ සමාජ ක්‍රමය වෙනුවට සාමූහික අයිතියක් සහිත සමාජ ක්‍රමයක් බිහිකිරීමයි. ස්ත්‍රී පීඩනය හා

සූරාකෑම තුරන් කිරීම සඳහා, ස්ත්‍රිය සමාජ ප්‍රාග්ධනයේ හා නිෂ්පාදනයේ කොටස්-කරුවන් බවට පත්කළයුතු බවට මාක්ස්වාදී ස්ත්‍රීවාදීහු තර්ක කරති.

මානව ස්වභාවය පිළිබඳ මාක්ස්වාදී තර්කය වූයේ, මිනිසා විසින්ම සිය ක්‍රියාකාරීත්වය හරහා තමාව නිර්මාණය කරනු ලබන බවයි. එනම් මිනිසා සහ පරිසරය මානව ක්‍රියාවන්හි පරිණාමයේ ප්‍රතිඵලයකි. ස්ත්‍රී කාර්යයන්හි ස්වභාවය මත ස්ත්‍රියගේ තත්ත්වය නිර්මාණය වන බව මාක්ස්වාදී ස්ත්‍රීවාදීහු පෙන්වා දුන්හ. පංති වශයෙන් බෙදුනු සමාජය තුළ, ආර්ථික බලය හා නිෂ්පාදන සාධක හිමි අතළොස්සක් වෙනුවෙන් බහුතරය විසින් නිෂ්පාදනය සිදු කරනු ලැබේ. එවන් සමාජයක, ස්ත්‍රිය වෙත කිසිවිටෙකත් සමාන අයිතීන් හෝ ඉඩ ප්‍රස්ථා හිමි නොවේ. මන්දයත්, ඇය සමාජයේ පීඩිත පංතියේම කොටසක් වන බැවිනි. මාක්ස්වාදී ස්ත්‍රීවාදීන්ට අනුව පවුල, ආර්ථික, දේශපාලන, ආගමික ආදී සෑම සමාජ සංස්ථාවකම ස්ත්‍රිය මත වන පීඩනය නිර්මාණය වේ. මෙයින් සදාකාලික විමුක්තිය හිමිවන්නේ, විප්ලවයක් මගින්, ධනේශ්වර සමාජය විනාශකොට, පංති රහිත සමාජවාදී සමාජයක් බිහිකළවිට පමණි.

ස්ත්‍රී නිදහසට බාධා කරන්නේ හුදෙක් පීතෘමූලිකත්වය පමණක් නොවේ. පීතෘමූලිකත්වය වෙන්කළ නොහැකි අයුරින් ධනවාදය හා බද්ධ වී තිබේ. මෙම එකතුව වෙන්කිරීම ඉතාම සංකීර්ණ කාර්යයකි. එහෙයින් පීතෘමූලිකත්වය පදනම්ව ඇති ධනේශ්වර ආර්ථික ක්‍රමය වෙනස් කිරීමෙන්, එයද අනිවාර්යයෙන්ම වෙනසකට ලක්වේ යයි මාක්ස්වාදී ස්ත්‍රීවාදීහු පෙන්වා දුන්හ. ශීලා රෝබොතම් (Sheila Rowbotham: 1972) වැනි මාක්ස්වාදී ස්ත්‍රීවාදීහු පීතෘමූලිකත්වය පිළිබඳව සංකල්පය ප්‍රතික්ෂේප කළ අතර, ස්ත්‍රීවාදයේ අරමුණු සමාජ ප්‍රතිසංස්කරණයකින් ඇතිකළ නොහැකි බවට තර්ක කළහ. ජුලියට් මිචෙල් (Juliet Mitchell: 1971) වැනි ස්ත්‍රීවාදීන් විසින් මාක්ස්වාදී ස්ත්‍රීවාදී අදහස් භාවිත කර, ස්ත්‍රියට පොදු ක්ෂේත්‍රයේ කටයුතු වලට සහභාගී වීමේ අයිතිය අවධාරණය කරනු ලැබිය. ධනේශ්වර නිෂ්පාදන ක්‍රමය සමඟ ස්ත්‍රීන් මත වන පීඩනය සම්බන්ධ කිරීම නිවැරදි දෙයක් ලෙස ඇය අගය කළත්, මාක්ස්වාදී ස්ත්‍රීවාදීන් පවුල තුළ ස්ත්‍රිය මත වන පීඩනය නොසලකා හැර ඇති බවට චෝදනා කළාය.

හෙයිඩි හාර්ට්මන් (Heidi Hartmann) විසින් රචනා කරන ලද "The Unhappy Marriage of Marxism and Feminism" (1981) යන කෘතියෙන්ද මාක්ස්වාදී ස්ත්‍රීවාදී අදහස් විවේචනයට ලක්කොට තිබේ. ඇයට අනුව පංති අරගලය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අරගලය ඉතිහාසයේ වෙනස් වන



බලවේග දෙකකි. එය අවබෝධ කරගැනීමට ධනවාදය හා පීතෘමූලිකත්වය යන සාධක දෙකම මනාව අවබෝධ කරගත යුතු වේ. මෙම සාධක දෙකින් එකක වැදගත්කම අනෙක වෙනුවෙන් යටපත් කළ නොහැකි වන අතර මේ දෙක අතරමත් අරගල ඇතිවිය හැකිය. ධනේශ්වර ක්‍රමය තුළින්, ධනවාදීන් මෙන්ම, පුරුෂයින්ද ප්‍රයෝජන ගන්නා බව මාක්ස්වාදී ස්ත්‍රීවාදීන් අමතක කරදමා ඇතැයි රෝබොතම් ද පෙන්වා දෙයි.

මාක්ස්වාදයේ පංති අරගලයට ස්ත්‍රී විමුක්තිය සම්බන්ධ කිරීම තර්කානුකූල නැතැයි ද චෝදනා ඉදිරිපත් කෙරේ. ස්ත්‍රියට ආර්ථික ශක්තිය ලබා දුන් පමණින් ඇයට නිදහස් පුද්ගලයෙකු විය හැකිද යන ප්‍රශ්නය ද මෙයට සමාන්තරව පැන නැගේ. සමාජවාදී ආර්ථික ක්‍රමය අනුගමනය කරන රටවල ස්ත්‍රීන්ට, ආර්ථික හා දේශපාලන ක්ෂේත්‍රවල සමාන ඉඩ ප්‍රස්ථා නොලැබෙන බවත්, ඒ අංශවල පහළ මට්ටමේ ස්ත්‍රීන් ඒකරාශී වී ඇති බවත් තවත් සමහරු පෙන්වා දෙති.

විවිධ වර්ණ, මානව වර්ග, හා පංති අතර බෙදී සිටින ස්ත්‍රීන්ගේ පීඩනයේ විවිධත්වය නොසලකා හැර, සියලුම ස්ත්‍රීන් පොදු පීඩිත පංතියකට ඇතුළත් කිරීම සම්බන්ධයෙන්ද මාක්ස්වාදී ස්ත්‍රීවාදීන්ට චෝදනා එල්ල කෙරේ. සමාජ වෙනසක් පතා විප්ලව දියත් කළ බොහෝ රටවලදී, ස්ත්‍රීන්ද ක්‍රියාශීලී අයුරින් ඒවාට දායකත්වය දක්වා තිබේ. එහෙත් විප්ලවය අවසානයේ බිහිවන බොහෝ නව සමාජ තුළ ස්ත්‍රීන්ට නැවත වතාවක් සම්ප්‍රදායික තත්ත්වය හා භූමිකා හිමිකර දීම පොදු කරුණක් බැව් විවිධ අත්දැකීම්වලින් පැහැදිලි වේ. එහෙයින් ස්ත්‍රී විමුක්තිය සඳහා වන මාක්ස්වාදී ක්‍රමවේදය කොතරම් දුරට ප්‍රායෝගිකද යන ප්‍රශ්නයද එයට එරෙහිව නැගේ.

කෙසේ වෙතත්, ස්ත්‍රියට හිමි අප්‍රධාන තත්ත්වයට බලපාන මූලික සාධකයක් වූ ආර්ථික සාධකය පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීමෙන් හා ඓතිහාසික විකාශනය තුළ ස්ත්‍රී-පුරුෂ සමාජ තත්ත්වයන්හි වෙනස්වීම පිළිබඳ කරුණු දැක්වීමෙන්, මාක්ස්වාදී ස්ත්‍රීවාදීන් විසින් කරන ලද දායකත්වය නොසලකා හැරිය නොහැකිය. මන්ද, ස්ත්‍රීවාදය දෘෂ්ටිවාදයක් වශයෙන් වර්ධනය වීමට ඉන් ලැබුනු පෝෂණය ද වැදගත්වන බැවිනි.

## රැඩිකල් ස්ත්‍රීවාදය (Radical Feminism)

ස්ත්‍රීන්ට හිමි අප්‍රධාන තත්ත්වය පිළිබඳ ගැටළුව ආමන්ත්‍රණය කිරීමේදී රැඩිකල් ස්ත්‍රීවාදීන් විසින් ලිබරල් හෝ මාක්ස්වාදී ස්ත්‍රීවාදීන් අවධානය

යොමු නොකළ, සියුම් ක්ෂේත්‍ර වෙත අවධානය යොමු කරනු ලැබේ. විශේෂයෙන් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා පීතෘමූලිකත්වය යන සංකල්ප පිළිබඳ ඔවුහු විස්තරාත්මක අර්ථකථන සපයති. ජීව විද්‍යාත්මක වශයෙන් ස්ත්‍රී-පුරුෂ ජීවීන් අතර පවත්නා වෙනසට වඩා ඉතා පුළුල් වෙනසක් පීතෘමූලික සමාජය විසින් නිර්මාණය කරනු ලැබ ඇති අතර, එය ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ලෙසත් සමස්ත සමාජ සබඳතා පිළිබඳ එයින් විස්තර කෙරෙන බවත්, ස්ත්‍රීන් මත වන පීඩනයේ ආරම්භය එය බවත්, රැඩිකල් ස්ත්‍රීවාදීහු පෙන්වා දෙති. ඔවුන්ට අනුව, ස්ත්‍රීන් මත වන පීඩනය හා අප්‍රධාන තත්ත්වයට මූලිකම හේතුව පීතෘමූලික සමාජයේ පුරුෂාධිපත්‍යය මිස අසමාන සිවිල්, ආර්ථික හා දේශපාලන අයිතිවාසිකම් නොවේ. පීතෘමූලික ක්‍රමය යනු බලය, ආධිපත්‍යය, ධුරාවලිය සහ තරගය යන ලක්ෂණ තුළින් ස්ත්‍රිය පීඩනයට පත්කරන මූලිකම ව්‍යුහය වේ. මේ ක්‍රමය ප්‍රතිසංස්කරණය කළ නොහැකිය. පීතෘමූලිකත්වය ක්‍රියාත්මක වන්නේ පවුල තුළ පමණක් නොවේ. සමාජ, සංස්කෘතික, ආගමික, දේශපාලන හා ආර්ථික යනාදී සෑම ආයතනයක් තුළින්ම එය ක්‍රියාත්මකවී ස්ත්‍රිය පීඩනයට ලක් කරයි. පුරුෂමූලික සමාජය විසින්, ස්ත්‍රිය දුර්වලයි, ළාමකයි, චපලයි හා පුරුෂයින් මත යැපෙයි යනාදී ආකල්ප නිර්මාණය කරනු ලැබ ඇත්තේ, ස්ත්‍රීන් බලය රහිත කොටසක් බවට පත්කොට, මර්දනයට පහසු තත්ත්වයක් ගොඩනගා ගැනීමටය. එබඳු අදහස් ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයේම සිත් තුළට කාවද්දා ඇති නිසා, බොහෝ දෙනා, ස්ත්‍රීන්ගේ අප්‍රධාන තත්ත්වය ස්වාභාවික දෙයක් ලෙස පිළිගනිති.

රැඩිකල් ස්ත්‍රීවාදීන්ට අනුව, ජාති, මානව වර්ග, කුල හා පංති ආදී සෑම සමාජ ස්ථරයකම බල සබඳතාව තීරණය වන්නේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත වන අතර, එය එබඳු ස්ථර විනිවිදිමින් ව්‍යාප්ත වේ. පංති, මානව වර්ග හෝ කුල වැනි සමාජ බෙදීම් නිසා යම් යම් ජන කණ්ඩායම් පීඩාවට ලක්වුවද ඒවාට සාපේක්ෂව, ලෝකයේ පැරණිතම හා දරුණුම පීඩනයට ලක්වන්නේ ස්ත්‍රීන් බව රැඩිකල් ස්ත්‍රීවාදීන්ගේ මතයයි. පංති අසමානත්වය තුළ, දිළිඳු පංතියේ පුරුෂයින්, ධනවත් පංතියේ පීඩනයට පමණක් ලක්වුවත්, එම ස්ත්‍රීන් ධනවත් පංතියේ මෙන්ම, සිය පංතියේ පුරුෂයින්ගේ පීඩනයටත් ලක්වන නිසා එය වඩාත් දරුණු බව, රැඩිකල් ස්ත්‍රීවාදීහු පෙන්වා දෙති. ලිබරල් ස්ත්‍රීවාදීන් ප්‍රකාශ කරන ආකාරයට ස්ත්‍රීන්ටත්, පුරුෂයින්ට සමාන නීත්‍යානුකූල අයිතිවාසිකම් හා ආර්ථික සහ සමාජීය ක්ෂේත්‍රවල ඉඩප්‍රස්ථා ලබාදීමෙන් මෙම පීඩනය තුරන් කළ නොහැකි බව රැඩිකල් ස්ත්‍රීවාදී මතයයි. ස්ත්‍රී විමුක්තිය සඳහා එම ක්‍රියාමාර්ග ප්‍රමාණවත් නොවන බව ඔවුහු අවධාරණය කරති. ස්ත්‍රීන්ට සත්‍ය නිදහස හෝ විමුක්තිය ලබා දීමට නම්, පීතෘමූලික සමාජ ක්‍රමය සහමුලින්ම වෙනස් කොට, ඒ මත නිර්මාණය වී



ඇති පවුල, පල්ලිය වැනි ආයතනත්, දේශපාලන හා ආර්ථික ආයතනත් මුලිනුපුටා දමා, සමස්ත සමාජ ව්‍යුහයේම වෙනසක් කළ යුතු බව රැඩිකල් ස්ත්‍රීවාදීහු පෙන්වා දෙති.

පීතෘමූලික සමාජයේ පවුල, අධ්‍යාපන, ආගමික, සංස්කෘතික, දේශපාලන, පරිපාලන හා ආර්ථික ආදී සෑම ආයතනයකම මූලිකත්වය දරන්නේ පුරුෂයින්ය. එමනිසා එම ආයතනවල න්‍යායපත්‍ර සකසන්නේද, ඒවා ක්‍රියාත්මක වන්නේද පුරුෂයින් අතිනි. මෙම සෑම ආයතනයක්ම දීර්ඝ කාලයක් තිස්සේ, පුරුෂයින්ගේ අවශ්‍යතා අනුව ස්ත්‍රිය අප්‍රධාන තත්ත්වයක තබාගෙන කටයුතු කිරීමට අවශ්‍ය පරිසරයක් ගොඩනගාගෙන ඇත. එපමණක් නොව, මේ සෑම ආයතනයක් මගින්ම එම තත්ත්වය පරපුරෙන් පරපුරට දායාද කිරීමේ කාර්යයද ඉතා දක්ෂ ලෙස ඉටුකරයි. එහෙයින් එම සමස්ත ක්‍රමයම වෙනසකට ලක්කළ යුතු බවට රැඩිකල් ස්ත්‍රීවාදීහු තර්ක කරති. පහළම සමාජ ඒකකය වූ පවුල තුළින් මේ සමාජ වෙනස ආරම්භ කොට, පොදු ක්ෂේත්‍රයට ව්‍යාප්ත කළයුතු බවද ඔවුහු පෙන්වා දෙති.

ලිබරල් හා මාක්ස්වාදී ස්ත්‍රීවාදීන්ට වෙනස්ව යමින්, ස්ත්‍රීන් හා පුරුෂයින් අතර වන වෙනස අවධාරණය කිරීම, රැඩිකල් ස්ත්‍රීවාදීන්ගේ තවත් විශේෂ ලක්ෂණයකි. සම්ප්‍රදායික, දෘඪ, ස්ත්‍රී-පුරුෂ භූමිකාවලින්, දෙපක්ෂයම ඉවත් විය යුතු බවට ඔවුහු තර්ක කරන අතර, පුද්ගල හැඟීම්, අත්දැකීම් හා සබඳතාවලට වැඩි අගයක් දෙති. ලිංගික බව, ප්‍රජනන කාර්යය, ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය, ලිංගික අතවර, ස්ත්‍රී දූෂණ, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, වෛශ්‍යා වෘත්තිය සඳහා ස්ත්‍රීන් වෙළෙඳාම, සංචාරකයින් සඳහා ස්ත්‍රීන්ගේ ලිංගිකත්වය යොදා ගැනීම සහ නිරුවත් දැන්වීම් හා පත්‍රිකා යනාදී ස්ත්‍රී පීඩනයට හා හිරිහැරයට සම්බන්ධ අංග ගණනාවක් පිළිබඳවද රැඩිකල් ස්ත්‍රීවාදීන් කරුණු දක්වා ඇත. මෙබඳු කරුණු, "පෞද්ගලික" හෝ "රහස්‍ය" දෑ ලෙස මීට පෙරදී සලකනු ලැබුවත්, ස්ත්‍රී පීඩනය සඳහා පුරුෂයින් යොදාගන්නා උපක්‍රම ලෙස රැඩිකල් ස්ත්‍රීවාදීන් විසින් ඒවා හඳුන්වනු ලැබීමත් සමඟ සමාජයේ අවධානය ඒවා කෙරෙහි යොමුවීම වැඩි විය. මේ නිසා රැඩිකල් ස්ත්‍රීවාදීන් අන්තවාදීන් කොටසක් ලෙසද සමහරු සලකති.

ලිංගික බව, ප්‍රතිවිරුද්ධ ලිංගික විවාහය හා ප්‍රජනන කාර්යය පාලනය, පුරුෂාධිපත්‍යය සහිත ආයතන විසින් ස්ත්‍රීන් මර්දනයට යොදාගන්නා දෑ ලෙස රැඩිකල් ස්ත්‍රීවාදීහු පෙන්වා දෙති. ප්‍රචණ්ඩත්වයෙන් පුරුෂාධිපත්‍යය සත්‍ය අයුරින් ප්‍රකාශ වන අතර, එය පුරුෂාධිපත්‍යයේ අවසාන සංකේතය වන බවත්, එයින් මිදීමට නම් පුරුෂයින්ගෙන් සහමුලින්ම වෙන්ව ස්ත්‍රී

සමාජ පිහිටුවිය යුතු බවත් ඔවුහු අවධාරණය කරති. ප්‍රතිවිරුද්ධ ලිංගික විවාහය ප්‍රතික්ෂේප කරන රැඩිකල් ස්ත්‍රීවාදීහු, සමලිංගික බැඳීම් තුළින් පුරුෂාධිපත්‍යය තුරන්කර ස්ත්‍රී විමුක්තිය ළඟාකර ගතහැකි බවටද තර්ක කරති.

බලය හා දේශපාලනය යන සංකල්ප පෞද්ගලික ක්ෂේත්‍රයට සම්බන්ධ කරමින්, සම්ප්‍රදායික දේශපාලනයක්, පවුල හා සමාජය තුළ එදිනෙදා කටයුතු වලට සම්බන්ධ දේශපාලනයක් යන දෙකම අනිවාර්යයෙන්ම බලය හා ආධිපත්‍යයට සම්බන්ධ දෑ ලෙස අවධාරණය කිරීමේ ගෞරවය හිමිවන්නේද රැඩිකල් ස්ත්‍රීවාදීන්ටය. පෞද්ගලිකත්වය යනු දේශපාලනයයි. "Personal is Political" යන සටන් පාඨය ව්‍යාප්ත කරමින්, පවුල, පාසල, ආගමික ආයතන හා රැකියා ස්ථාන යනාදී සෑම සමාජ ආයතනයකම බලය සහිත පුද්ගලයා හෝ පුද්ගල කණ්ඩායම තීරණ ගන්නා බවත්, ස්ත්‍රීන් එම තීරණවලට අවනත වන්නන් බවත් රැඩිකල් ස්ත්‍රීවාදීහු පෙන්වා දෙති. මෙම ආධිපත්‍යය දරන්නන් නිරන්තරයෙන්ම පුරුෂයින් වන අතර, රාජ්‍යය, ආණ්ඩුව, ව්‍යවස්ථාදායකය හා දේශපාලන පක්ෂ වැනි සම්ප්‍රදායික දේශපාලන ආයතන තුළ පමණක් නොව, සෑම සමාජ සංවිධානයකම පුරුෂාධිපත්‍යය පවතින බවට ද ඔවුහු තර්ක කරති. එසේම ස්ත්‍රී ජීවිතවලට සම්බන්ධ නිවාස, ජලය, අධ්‍යාපනය, සෞඛ්‍යය, පරිසරය හා ආරක්ෂාව වැනි දෑ අනිවාර්යයෙන්ම රටේ දේශපාලනයට සෘජුවම සම්බන්ධ දෑ නිසා ඒවා පිළිබඳ තීරණ ගැනීමට ප්‍රමාණවත් ස්ත්‍රී නියෝජනයක් සම්ප්‍රදායික දේශපාලන ආයතන තුළ තිබිය යුතු බවද ඔවුහු පෙන්වා දෙති. මේ අනුව බලය හා සම්බන්ධ දේශපාලනය පොදු මෙන්ම පෞද්ගලික ක්ෂේත්‍රය තුළත් පවතින බවට තර්ක කරන, රැඩිකල් ස්ත්‍රීවාදීහු මානවයාගේ සෑම ක්‍රියාකාරකමක් පිටුපසම දේශපාලනය පවතින බව පෙන්වා දෙති. ඒ නිසා පෞද්ගලික හා පොදු වශයෙන් සමාජීය කාර්යයන් බෙදීමට ඔවුහු විරුද්ධ වෙති.

රැඩිකල් ස්ත්‍රීවාදය, රැඩිකල් - නිදහස්වාදී ස්ත්‍රීවාදය (Radical - Libertarian Feminism) හා රැඩිකල් සංස්කෘතික ස්ත්‍රීවාදය (Radical - Cultural Feminism) ලෙස උප කණ්ඩායම් දෙකකට බෙදේ. ලිංගික බව හා ප්‍රජනන කාර්යය නිසා සමාජ කටයුතුවලට දායකවීමේ ස්ත්‍රී හැකියාව සීමාවන බවට පළමු කණ්ඩායම විශ්වාස කරයි. ස්ත්‍රීන්ගේ ලිංගිකත්වය, ඔවුන්ම පාලනය කළයුතු බව අවධාරණය කරන මෙම කණ්ඩායම, උපත් පාලන ක්‍රම, ගබ්සාව හා ප්‍රජනන කාර්යය සඳහා යොදා ගන්නා කෘත්‍රිම විධි සම්බන්ධයෙන්ද දැඩිව එකඟ වෙයි. රැඩිකල් - සංස්කෘතික ස්ත්‍රීවාදයෙන්, ස්ත්‍රී බව හා පුරුෂ බව අතර වෙනස අවධාරණය කෙරේ. මේරි ඩේලි



(Mary Daly: 1978) වැනි ස්ත්‍රීවාදීහු, පුරුෂ බවට වඩා ස්ත්‍රීබව අගය කරන අතර, ප්‍රජනන කාර්ය තුළින් ස්ත්‍රීන්ට විශේෂ බලයක් හිමිවන බවට තර්ක කරති. එයට ඊර්ෂ්‍යා කරන පුරුෂයින් ස්ත්‍රීන්ගේ ප්‍රජනන කාර්යය පාලනය කරන බව ඔවුන්ගේ මතයයි. නමුත් ස්ත්‍රී ලිංගිකත්වය නිසා පුරුෂයින් ස්ත්‍රීන්ව පාලනය කරන බවත්, ස්ත්‍රී දූෂණ, ලිංගික අතවර සිදුවන්නේද ඒනිසා බවත් ඔවුහු විශ්වාස කරති.

රැඩිකල් ස්ත්‍රීවාදයට එරෙහිවද විවිධ විවේචන ඉදිරිපත් වී ඇත. ප්‍රතිවිරුද්ධ ලිංගික විවාහය ප්‍රතික්ෂේප කිරීමෙන්, සමාජයේ පැවැත්ම ආරක්ෂා කර ගන්නේ කෙසේද යන්න මේ අතරින් මූලික වේ. නූතන සමාජයේ ස්ත්‍රීන් මත වන පීඩනයට ප්‍රධානම හේතු සම්ප්‍රදායික විවාහය හා පවුල් දිවිය නම්, සියලුම පුරුෂයින් ස්වභාවයෙන්ම ස්ත්‍රීන්ව මර්දනය කිරීමේ ගති ලක්ෂණය සහිත නම්, පුරුෂයින්ගෙන් තොරව අනාගත මිනිස් පරපුර පවත්වා ගන්නේ කෙසේද යන්න රැඩිකල් ස්ත්‍රීවාදීන්ට එරෙහිව එල්ලවුනු බරපතලම විවේචනයයි. 1970 ගණන්වලදී, රැඩිකල් ස්ත්‍රීවාදීන් විසින් ප්‍රතිවිරුද්ධ ලිංගික විවාහය, "සතුරා සමඟ නිදාගැනීම" (Sleeping With the Enemy) යන සටන් පාඨය හරහා විවේචනයට ලක්කරනු ලැබූ අතර, එයට විසඳුම ලෙස ඉදිරිපත් කරනු ලැබුවේ සම ලිංගික සේවනයයි. ස්ත්‍රියට විමුක්තිය ලබා ගත හැක්කේ, සමලිංගික සේවනය තුළින් නම් සම්පූර්ණ නිදහස් ස්ත්‍රියක් හා ස්ත්‍රීවාදිනියක් විය හැක්කේ එබඳු ස්ත්‍රියකට පමණක්ද යන ප්‍රශ්නයද මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කෙරිණි.

සමාජය සංයුක්ත වී ඇත්තේ, ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයේම එකතුවෙන් බව රැඩිකල් ස්ත්‍රීවාදීන් විසින් අමතක කරනු ලැබ ඇති අතර, ස්ත්‍රීන්ව සමාජයේ වෙනස් වූ කණ්ඩායමක් ලෙස ස්ථාපිත කර ස්ත්‍රී-පුරුෂ සමාජභාවය වැනි සමාජ ගැටළුවක් විසඳිය හැකිද යන චෝදනාවද ඔවුන්ට එරෙහිව නැගුණි. තවද, එබඳු සිතා ගැනීම් නිසා රැඩිකල් ස්ත්‍රීවාදය මායාවක් බවට පත්වී ඇති අතර, ප්‍රායෝගික වශයෙන් ඔවුන්ගේ අදහස් ක්‍රියාත්මක කළ නොහැකි බවද සමහරු පෙන්වා දුන්හ. බලය, ආධිපත්‍යය, තරගය හා ධූරාවලියෙන් තොර, ස්ත්‍රීන්ගෙන් පමණක් පිරි ලෝකයක, ස්ත්‍රීන්ට නිදහසේ කටයුතු කිරීමට හැකි බව රැඩිකල් ස්ත්‍රීවාදී මතය විය. එහිදී සියලුම ස්ත්‍රීන් ඉතාම හොඳ, තරගය හා ආධිපත්‍යය රහිතව කටයුතු කළ හැකි අයවලුන් ලෙස රැඩිකල් ස්ත්‍රීවාදීහු උපකල්පනය කරති. නමුත් සත්‍ය ලෝකයේදී සමහර පුරුෂයින් මෙන්ම ස්ත්‍රීන් අතරත්, වෙනස්කම්, තරඟකාරීත්වය, බලය යෙදීම, මත ගැටුම්, අරගල හා ධූරාවලින් ඕනෑතරම් දක්නට ලැබේ. එහෙයින් එක කණ්ඩායමකට සියලුම ස්ත්‍රීන් ඇතුළත් කොට, පොදු

විමුක්තියක් ඔවුන් සැමට ලබාදීමට යෝජනා කරන රැඩිකල් ස්ත්‍රීවාදී ක්‍රමවේදය ප්‍රායෝගික නොවන, සිහිනයක් ලෙසටද සමහරු පෙන්වා දුන්හ.

මෙබඳු දුර්වලතා සහිත වුවත්, ස්ත්‍රීවාදයේ වර්ධනයට රැඩිකල් ස්ත්‍රීවාදීන් විසින් කරන ලද දායකත්වය සුළුකොට තැකිය නොහැකිය. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, පීතෘ මූලිකත්වය සහ "පෞද්ගලිකත්වය යනු දේශපාලනයයි" බඳු සංකල්ප පිළිබඳ විස්තරාත්මක ස්ත්‍රීවාදී අර්ථකථන සැපයීමේ ගෞරවය අනිවාර්යයෙන්ම ඔවුන්ට හිමිවේ. එසේම ස්ත්‍රීන්ගේ ලිංගික බව, ප්‍රජනන කාර්යය, ලිංගික අතවර, ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය, ස්ත්‍රී දූෂණය, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, අසභ්‍ය පත්‍රිකා, නිරුවත් රූප, වෛශ්‍යා වෘත්තිය වැනි එතෙක් ස්ත්‍රීවාදී විමසුමට ලක් නොවී තිබූ ක්ෂේත්‍ර පිළිබඳ අවධානය යොමු කිරීමේ ගෞරවයද ඔවුන්ට හිමිවේ. පවුල් සැලසුම් ක්‍රම හා ගබ්සා කිරීමේ අයිතිය සම්බන්ධයෙන් ස්ත්‍රීන් දැනුවත් කිරීමේ කාර්යයේ මූලිකත්වය ගත්තේද රැඩිකල් ස්ත්‍රීවාදීන්ය. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, සමාජය විසින් නිර්මාණය කරන ලද්දක් බව හා එහි වෙනස්වන සුළුබව අවධාරණය කරමින් ස්ත්‍රීන් පමණක් නොව, විවිධ සමාජ ක්‍රියාකාරීන්, පරිපාලකයින්, නීති හා ප්‍රතිපත්ති සම්පාදකයින් ආදීන් පවා ඒ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු ආරම්භ කිරීමේදීත් ප්‍රමුඛත්වය ගත්තේ රැඩිකල් ස්ත්‍රීවාදීන්ය.

පෞද්ගලික හා පොදු යන දැඩි සමාජ බෙදුමෙහි හිඩැස අවම කරමින්, ස්ත්‍රීන්ට පොදු කටයුතුවල නියැලීමේ හැකියාව ඇති බවට අවධාරණය කිරීමත්, ඔවුන්ගේ දායකත්වයෙන් සිදුවූවකි. ස්ත්‍රීන්ද, පුරුෂයින් මෙන් පොදු ක්ෂේත්‍රයේදී කටයුතු කළ යුතු බවට ලිබරල් ස්ත්‍රීවාදීන් අවධාරණය කළත්, ස්ත්‍රීන් පුරුෂයින්ට වඩා වෙනස් මානව ජීවීන් කොටසක් නිසා ස්ත්‍රී බවට අනුව ඔවුන් කටයුතු කළ යුතුය, සහ එය නිවැරැදිය යන මතය රැඩිකල් ස්ත්‍රීවාදීහු අවධාරණය කළහ. ඒ මගින් ස්ත්‍රී බව, ස්ත්‍රීන්ගේ සුවිශේෂ හැකියාවන් හා ගති ලක්ෂණ පිළිබඳ ධනාත්මක හැඟීම් ව්‍යාප්ත කිරීමට ඔවුන්ට හැකිවිය. එසේම එමගින් ස්ත්‍රීන්ට යම් තරමක හෝ ආත්ම විශ්වාසයක් ලබා දීමටත්, සමාජ ආකල්ප වෙනස් කිරීමටත් ඔවුන් සමත් වී ඇත. ස්ත්‍රීන්ගේ සුවිශේෂී වූ අවශ්‍යතා, ඔවුන්ට බලපාන ගැටළු ආදිය සම්බන්ධයෙන් සමාජයේ සෑම ආයතනයකම තීරණ ගන්නා මට්ටම්වලදී, ස්ත්‍රීන්ගේ අදහස් නියෝජනය වීමේ අවශ්‍යතාව පිළිබඳවද සෙසු ස්ත්‍රීවාදීන්ට වඩා රැඩිකල් ස්ත්‍රීවාදීහු අවධාරණය කරති. සම්ප්‍රදායික බල දේශපාලනය හා එදිනෙදා ස්ත්‍රී ජීවිතවලට සම්බන්ධ දේශපාලනය යා කරමින් "දේශපාලනය" යන පදයට ස්ත්‍රීවාදී අර්ථකථනයක් ඉදිරිපත් කිරීමේ කීර්තිය හිමිවන්නේද රැඩිකල් ස්ත්‍රීවාදීන්ටය. 1960 ගණන්වල ඇමරිකානු සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරය වැනි සමාජ



ව්‍යාපාරවලද ආභාසය ලබා, සම්ප්‍රදායික ස්ත්‍රීවාදී න්‍යායයන් හා අර්ථ-කථනවලින් ඔබ්බට ගොස් ස්ත්‍රීවාදයට නව අදහස් එක් කිරීමට, රැඩිකල් ස්ත්‍රීවාදීන්ගෙන් ඉටුවූ සේවය ඉතා වැදගත් වේ.

## සමාජවාදී ස්ත්‍රීවාදය (Socialist Feminism)

ස්ත්‍රී-පුරුෂ සමාජ අසමානත්වය හා එයට බලපාන මූලික හේතු පිළිබඳ රැඩිකල් ස්ත්‍රීවාදීන් හා මාක්ස්වාදී ස්ත්‍රීවාදීන් විසින් 1960 හා 1970 ගණන්වලදී කරන ලද විවාද සමාජවාදී ස්ත්‍රීවාදයේ පෝෂණයට බලපෑවේය. එසේම 1960 ගණන්වල සිවිල් අයිතිවාසිකම් හා ශිෂ්‍ය ව්‍යාපාරවල අදහස් හා ක්‍රියාකාරකම්ද සමාජවාදී ස්ත්‍රීවාදයේ ආරම්භයට බලපෑම් කළේය. මාක්ස්වාදීන් අනුව යමින්, සමාජවාදී ස්ත්‍රීවාදීනුද ධනවාදය හා පංති අසමානත්වය ස්ත්‍රීන් මත වන පීඩනයට මූලික හේතුවක් ලෙස අවධාරණය කළහ. එසේම රැඩිකල් ස්ත්‍රීවාදී මතයද පිළිගනිමින්, පීතෘ මූලිකත්වයද එයට හේතුවක් ලෙස ඔවුහු පෙන්වා දුන්හ. මෙම ප්‍රවේශ දෙකේම මිශ්‍රණයෙන්, සමාජවාදී ස්ත්‍රීවාදීහු එකිනෙකට පරස්පර වූ කණ්ඩායම් තුනක් යටතේ අදහස් දැක්වූහ. එයින් ප්‍රථම කණ්ඩායමට සිග්මන් ෆ්‍රොයිඩ්ගේ මනෝ විශ්ලේෂණීය අදහස්වල බලපෑම ලැබුණි. ඔවුන්ට අනුව ස්ත්‍රීන් මත වන පීඩනයට මූලික හේතුව වන්නේ, ආර්ථික හා සමාජීය කරුණු පමණක් නොවේ. එයට මනෝභාවාත්මක හේතුද බලපායි. එසේම මාක්ස්වාදී පංති අරගලයේ වැදගත්කමද මෙම කණ්ඩායම විසින් අවධාරණය කරන ලදී. පීතෘමූලිකත්වය හා ධනවාදය යන ද්විත්ව ක්‍රමයම ස්ත්‍රී-පුරුෂ අසමානත්වයට හේතු ලෙස දක්වමින් ජුලියට් මිචෙල් (Julite Mitchell) සිය මුල්කාලීන අධ්‍යයනවලින් සමාජවාදී ස්ත්‍රීවාදී ප්‍රවේශය අවධාරණය කර තිබේ.

දෙවැනි කණ්ඩායම ධනවාදය හා පීතෘමූලිකත්වය ඒකාබද්ධ කරමින්, ධනවාදී පීතෘමූලිකත්වය (Capitalist Patriarchy) යන එක් සංකල්පයක් යටතේ, ස්ත්‍රී-පුරුෂ අසමානත්වය විස්තර කර තිබේ. ඇලිසන් ජගර් (Alison Jaggar: 1983) හා අයිරිෂ් යන්ග් (Iris Young) විසින් මෙම සංකල්පය ව්‍යාප්ත කරන ලදී. තෙවැනි කණ්ඩායමද ධනවාදය හා පීතෘමූලිකත්වය ස්ත්‍රීන් මත වන පීඩනයට මූලික හේතු ලෙස දැක්විය. නමුත් ඔවුහු මනෝ විශ්ලේෂණීය කරුණුවලට වැදගත්කමක් නොදුන් අතර, භෞතික හේතු මූලික වන බැව් පෙන්වා දුන්හ.

මේ අනුව සමාජවාදී ස්ත්‍රීවාදී කණ්ඩායම් තුනම, පංති සබඳතා හා පීතෘමූලික සමාජයේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සබඳතා අතර න්‍යායාත්මක

සම්බන්ධයක් ගොඩනැගීමට උත්සාහ කර තිබේ. වර්ණය, වර්ගය, පංතිය හා ආගම් ආදී දෑ මත ස්ත්‍රීන් බෙදී සිටියත්, එම සෑම සමාජ ස්ථරයකම ස්ත්‍රීන්, පොදුවේ පීඩනයට ලක්වන බැව් සමාජවාදී ස්ත්‍රීවාදීහුද අවධාරණය කරති. එම තත්ත්වය ඉතා හොඳින් අවබෝධ කරගැනීමට නම්, ස්ත්‍රී-පුරුෂ අසමාන බල සබඳතා පමණක් නොව, ධනවාදී අවශ්‍යතා සහ ධනවාදී සමාජයේත්, රාජ්‍ය ආයතනවලත් ක්‍රියාකලාපය පිළිබඳ මනාව අවබෝධ කරගතයුතු බව ඔවුහු පෙන්වා දුන්හ. වෙනත් ස්ත්‍රීවාදී කණ්ඩායම්වලට වඩා ප්‍රජනන කාර්යයට සම්බන්ධ ශ්‍රමය හා ගෘහස්ථ ශ්‍රමයේ ආර්ථික වටිනාකම පිළිබඳ ඔවුහු කරුණු දක්වති. ස්ත්‍රීන්ගෙන් ඉටුවන දරුවන් බිහිකිරීම, පෝෂණය, ගෙදරදොර කටයුතු, දරුවන්ට අධ්‍යාපනය ලබාදීම යන දෑ ධනවාදී අර්ථක්‍රමය පවත්වාගෙන යාමට අත්‍යවශ්‍ය ඒ ලෙස ඔවුහු පෙන්වා දෙති. එහෙත් ස්ත්‍රී භූමිකා ස්ථිතික දෑ නොව, අනිවාර්යයෙන් වෙනසකට ලක්කළ හැකි දෑ බැව් ඔවුන්ගේ මතයයි. 1970 හා 1980 ගණන්වලදී, ස්ත්‍රීන්ගේ රැකියා අයිතිය සඳහා වන රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ සමාජවාදී ස්ත්‍රීවාදීහු වැඩි අවධානයක් යොමුකළහ. එහෙත් 1990 ගණන්වල සිදුවූ සමාජවාදී පිලේ රාජ්‍යයන්ගේ පරිහානියත් සමඟ සමාජවාදී ස්ත්‍රීවාදය දෘෂ්ටිවාදීමය වශයෙන් අක්‍රිය තත්ත්වයට පත්වී ඇත.

ස්ත්‍රී විමුක්තිය සඳහා, පීතෘමූලිකත්වය හා ධනවාදය යන ක්‍රම දෙකම විනාශ කොට, සමස්ත සමාජයේම වෙනසක් කළයුතු බව මොවුන්ගේ විශ්වාසයයි. පෞද්ගලික දේපළ ක්‍රමය අවලංගුකොට, පොදු දේපළ හා පොදු නිෂ්පාදන ක්‍රමයක් ස්ථාපිත කිරීමෙන්, සියලුම මානව ජීවීන්ට ශාරීරික, මානසික හා භෞතික වර්ධනයක් ලබාගත හැකි තත්ත්වයක් උදාකර ගත හැකි බව ඔවුහු පෙන්වා දෙති. පීතෘමූලික සමාජ ව්‍යුහය වෙනස්කොට, පෞද්ගලික හා පොදු වශයෙන් බෙදා ඇති භූමිකා අවයත් කළ යුතු බවද ඔවුන්ගේ මතයයි. ජනගහනයෙන් අඩක් වූ ස්ත්‍රීන්ට දරුවන් හා නිවසට සම්බන්ධ කටයුතු පමණක් පවරා ඇතිතාක් කල් පරිපූර්ණ වූ මානව සමාජයක් ගොඩනගා ගැනීමේ අරමුණ සාක්ෂාත් කරගත නොහැකි බවට ඔවුහු තර්ක කරති.

මෙම අරමුණ දිනා ගැනීමට නම්, පුරුෂයින්ට සමාන අයුරින් ස්ත්‍රීන්ද පොදු ක්ෂේත්‍රයේ කටයුතුවල නිරත විය යුතු බව සමාජවාදී ස්ත්‍රීවාදී මතයයි. සමාජයේ සෑම අංශයකදීම ස්ත්‍රීන් හා පුරුෂයින් සමානය යන අදහස මත දෙපක්ෂය අතර සමගියක් ගොඩනගා ගත යුතු බවත්, සමාජවාදී පක්ෂය තුළ හා වෘත්තීය සමිති තුළ වන ස්ත්‍රී පීඩනයට අභියෝග කළ යුතු බවත් ඔවුහු විශ්වාස කරති. මාක්ස්වාදී ස්ත්‍රීවාදීන්ට එරෙහිව යමින්, වෙනම ස්වාධීන



ස්ත්‍රීවාදී ව්‍යාපාරයක් ස්ත්‍රීන් විසින් ගොඩනගා ගතයුතු බවට මොවුහු අවධාරණය කරති. නමුත්, සමාජවාදී විප්ලවීය ව්‍යාපාරය තුළම, ස්ත්‍රීවාදී අදහස් අන්තර්ගත කරමින් එය පුළුල් ව්‍යාපාරයක් ලෙස ව්‍යාප්ත කළ යුතු බව ඔවුන්ගේ ද මතයයි.

ලිබරල් ස්ත්‍රීවාදී මතය ප්‍රතික්ෂේප කරන සමාජවාදී ස්ත්‍රීවාදීහු, ධනවාදී ආර්ථික ක්‍රමය සහමුලින්ම වෙනසකට ලක් නොකර ස්ත්‍රීන්ට නීතිමය අයිතිවාසිකම් හා ඉඩ ප්‍රස්ථා ලබා දීමෙන් පමණක් ස්ත්‍රීන්ගේ සමාජ තත්ත්වය විශාල වෙනසකට ලක්කළ නොහැකි බව පෙන්වා දෙති. ස්ත්‍රීන්ට දේපළ හා නිෂ්පාදන අයිතිය හිමි, ආර්ථික ක්‍රමයක් යටතේ පමණක්, ඔවුන්ට ගෞරවණීය ලෙස ජීවත්වීමට හැකි, සූරා කෑමෙන් තොර සම-සාධාරණ සමාජයක් බිහිකර ගත හැකි බව සමාජවාදී ස්ත්‍රීවාදීන්ගේ විශ්වාසයයි. ස්ත්‍රියකගේ පෞද්ගලික වර්ධනය නොව, කණ්ඩායමක් ලෙස ඔවුන්ගේ තත්ත්වයේ සම්පූර්ණ වෙනසක් මෙයින් සිදුවන බවද ඔවුහු අවධාරණය කරති. නමුත් එය පමණක් ප්‍රයෝජනවත් නොවන බව පවසන ඔවුහු, පොදු ක්ෂේත්‍රයේදී මෙන්ම පවුල තුළත් සමාන තත්ත්වයක් ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයට හිමිකළ යුතු බවත් පෙන්වා දෙති. පවුල තුළ අසමාන හෝ අප්‍රධාන තත්ත්වයක් ස්ත්‍රීන්ට හිමිවී පවතිනතාක් කල්, ආර්ථික හා දේශපාලන ක්ෂේත්‍රවලදී ඇයට සමාන තත්ත්වයක් දිනාගත නොහැකිය. පවුලටම සිය ශ්‍රමය හා කාලය කැප කළහොත් පුරුෂයාට සාපේක්ෂව ඇය පොදු ක්ෂේත්‍රයේදී අවාසි සහගත තත්ත්වයකට පත්වේ. එනිසා ඒක-පාර්ශවීය මානව සංවර්ධනයක් සිදුවේ. ආර්ථික හා දේශපාලන අංශවල පමණක් නොව පවුල තුළත්, මෙම තත්ත්වය යටතේ පුරුෂාධිපත්‍යයක් ගොඩනැගේ. පවුල තුළ මෙන්ම සමාජය තුළත් ස්ත්‍රී-පුරුෂ තත්ත්වය හා භූමිකා සම්බන්ධයෙන් සමබර තත්ත්වයක් ඇති කිරීමෙන් ස්ත්‍රී විමුක්තිය දිනාගත හැකිවාක් මෙන්ම, පරිපූර්ණ මානව සමාජයක් බිහිකිරීමද කළ හැකි බව සමාජවාදී ස්ත්‍රීවාදීන්ගේ විශ්වාසයයි.

සමාජවාදී ස්ත්‍රීවාදීන්ට අනුව පොදු දේපළ හා පොදු නිෂ්පාදන ක්‍රමයක් ඇති කිරීමෙන් පමණක් සමාජයේ විප්ලවීය වෙනසක් ඇති කළ හැකි නොවේ. ආර්ථික ක්‍රමයේ වෙනස තුළින් මිනිස් ජීවිතවල සෑම අංශයකම වෙනසක් විය යුතුය. සමාජ සබඳතා, බල සබඳතා, පවුල හා අනෙක් සමාජ සංවිධානවල ව්‍යුහය මෙන්ම ලිංගික සබඳතාවලද වෙනසක් ඒ තුළින් සිදුවිය යුතුය. විප්ලවයෙන් පසු, එහි එක් අංශයක් වන මිනිස් ජීවිත්, ඔවුන් විසින්ම ඔවුන්ගේ ධනවාදී, වාර්ගික හා ලිංගික වෙනස්කම් මත වන බෙදුනු හැගීම් හා ආකල්ප වෙනස් කරගතයුතු බවද මෙම කණ්ඩායම අවධාරණය කරයි. සම්භාව්‍ය මාක්ස්වාදී අර්ථකථනයට ස්ත්‍රී-පුරුෂ සමාජභාවිය සංකල්පය

අන්තර්ගත කොට, ස්ත්‍රීන් මත වන පීඩනය පිළිබඳව පුළුල් සමාජවාදී විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීම මෙම ප්‍රවේශයෙන් ස්ත්‍රීවාදයට සිදුවූ වැදගත්ම දායකත්වයයි. සංවර්ධනයේදී ස්ත්‍රීන් සහභාගී කර ගැනීම පිළිබඳව සමාජවාදී ස්ත්‍රීන් දක්වූ අදහස්ද වැදගත් වේ. නිෂ්පාදනය හා ප්‍රජනනය, වෙන්කළ නොහැකි ප්‍රවේශ දෙකක් බවත්, එම අංශ දෙක සංවර්ධන න්‍යායයේදී එක සමානව වැදගත් වන බවත් ඔවුහු පෙන්වා දුන්හ. සමාජවාදී ස්ත්‍රීවාදීන්, මූලික වශයෙන් ස්ත්‍රී-පුරුෂ සමාජීය සබඳතා, පෞද්ගලික හා පොදු ක්ෂේත්‍ර දෙකෙහිදීම භාවිත වන ස්ත්‍රී ශ්‍රමය, දරුවන් පෝෂණය, සමාජානුයෝජනය සහ ප්‍රජනන කාර්යයේ ප්‍රධාන කේන්ද්‍රය වන පවුල යන දෑ පිළිබඳ මාක්ස්වාදී ස්ත්‍රීවාදීන්ට වඩා පැහැදිලි හා පුළුල් විශ්ලේෂණයක් සපයා ඇත.

සමාජවාදී මෙන්ම ලිබරල් හා රැඩිකල් ස්ත්‍රීවාදී අදහස්වල මිශ්‍රණයක් සමාජවාදී ස්ත්‍රීවාදී ප්‍රවේශයෙන් ප්‍රකට වන අතර, ඒ හේතුව නිසා මෙම කණ්ඩායම විවේචනයටද ලක්වේ. අනෙක් ස්ත්‍රීවාදී ප්‍රවේශයන්ට සාපේක්ෂව කිසිදු නව දැක්මක් හෝ විශ්ලේෂණයක් ඔවුන් අතින් ඉදිරිපත් නොවුන බවටද චෝදනා එල්ල වේ. ධනවාදය හා පීතෘමූලිකත්වය යන කරුණු දෙකටම, සම බරක් දීමට ඔවුන්ගේ විශ්ලේෂණවලදී උත්සාහ දරා ඇතත්, සමහර අවස්ථාවල නොදැනුවත්වම "සමාජවාදයෙන් තොර ස්ත්‍රී විමුක්තියක් තිබිය නොහැකි අතර, ස්ත්‍රී විමුක්තියෙන් තොර සමාජවාදයක්ද තිබිය නොහැකිය" යන සටන් පාඨය ඔවුහු භාවිත කර ඇත. එහෙයින් මෙම සංකල්පය තුළ න්‍යායාත්මකව අතරමංවූ තත්ත්වයක් සමාජවාදී ස්ත්‍රීවාදී ප්‍රවේශයෙන් විද්‍යමාන වේ.

## වෙනත් ස්ත්‍රීවාදී ප්‍රවේශයන්

1980 ගණන් වන විට ඉහත දැක්වූ මූලික ප්‍රවාහයන්ට අමතරව, විවිධ දේශපාලන හා සමාජ න්‍යායයන් පදනම් කරගත්, එකිනෙකට පරස්පරවූ ප්‍රවේශ ගණනාවක් ස්ත්‍රීවාදයට එක්වීමට පටන් ගැණුනි. මෙය ස්ත්‍රීවාදී අධ්‍යයන ඉතිහාසයේ විශේෂ වර්ධනයකි. මෙම ප්‍රවේශ අතරින් **මනෝ විශ්ලේෂණීය ස්ත්‍රීවාදය (Psychoanalytic Feminism)** බටහිර මෙන්ම පෙරදිග රටවල ස්ත්‍රීවාදී අදහස්වලටත් විශේෂ බලපෑමක් කළේය. මනෝ විශ්ලේෂණීය න්‍යායයන්හි ආභාෂය ලබා මෙම ප්‍රවේශය වර්ධනය වුන අතර, සිග්මන් ෆ්‍රොයිඩ්ගේ (Sigmand Freud) අදහස් අනුව යමින් ෆ්‍රොයිඩ්වාදී ස්ත්‍රීවාදයක් (Freudian Feminism) ශැක් ලැකාන් (Jacques Lacan) අනුව යමින් ලැකානියානු ස්ත්‍රීවාදයක් (Lacanian Faminism) බිහිවිය. 1960 හා 1970 ගණන්වල ස්ත්‍රීවාදීන්, සමාජ හා ආර්ථික කරුණු පිළිබඳ වූවමනාවටත්



වඩා අවධානය යොමු කර ඇති අතර, මනෝ විශ්ලේෂණීය කරුණු අමතක කරදමා ඇතැයි මෙම කණ්ඩායම පෙන්වා දුණි. එම හිඩැස පිරවීම සඳහා ස්ත්‍රීබව හා ස්ත්‍රී භූමිකා සම්බන්ධයෙන් මනෝභාවාත්මක විශ්ලේෂණාත්මක අර්ථකථනයක් කළයුතුය යන අදහස ඔවුන් තුළ විය.

ෆ්‍රොයිඩ්වාදී ස්ත්‍රීවාදීන්ට අනුව ස්ත්‍රිය බිරිඳක්, ගෘහණියක් හා මවක් වශයෙන්, සමාජානුයෝජනය වීම සිදුවන අතර එදිනෙදා ක්‍රියාකාරකම් තුළින්, තම මනස තුළ තමා විසින්ම ස්ත්‍රීත්වය ගොඩනගා ගනී. පුරුෂයා, පුරුෂලිංගික හා පුරුෂාධිපත්‍යයේ සංස්කෘතික සංකේත යන දෑ මත පුරුෂ බව සිය මනස තුළ ස්ථාපිත කර ගනී. මෙම පුරුෂ බව, ස්ත්‍රීන් මත බලය පතුරුවන නිසා ස්ත්‍රිය නිරායාසයෙන්ම පීඩනයට පත් වේ.

සෑම පුද්ගලයෙක්ම ළදරු අවධියේ සිට "ස්ත්‍රී බව" හා "පුරුෂ බව" සිය මනස තුළ ස්ථාපිත කර ගැනීමට පටන් ගනී. ගැහැණු, පිරිමි දෙපාර්ශවයේම දරුවන් සිය මව වෙත මුලින්ම වඩාත් ආකර්ෂණය වේ. එහෙත් ක්‍රමයෙන් ඔවුන් දෙආකාරයක සමාජානුයෝජනයකට හා පරිසරයකට යොමුවන නිසා, එම තත්ත්වයන්ට අනුව දෙවිදියක මානසිකත්වයන් ගොඩනගා ගනී. පිරිමි දරුවා සිය ප්‍රථම ලිංගික වස්තුව ලෙස මව සලකයි. එහෙත් පසුව ඔහුගේ වර්ධනයේදී සමාජ පරිසරය හා මුහුවත්ම සිය පියා මෙන් බලය හා ආධිපත්‍යය පිළිබඳ හැඟීම් මනසේ ස්ථාපිත කරගනී. අනතුරුව පුරුෂාධිපත්‍යය මත හැසිරීමට පුරුදු වෙයි. ස්ත්‍රීන් පාලනය කිරීමට පටන් ගනී. එයට වෙනස්ව ගැහැණු දරුවා, ගෘහාශ්‍රිත පරිසරය තුළින් එම කටයුතුවලට මූලිකත්වය දෙන අතර පිටස්තර සමාජයෙන් ඈත්ව, පුරුෂයින් මත යැපෙන ආකාරයේ මානසිකත්වයක් ගොඩනගා ගනී. ඇය තමා සතු බලය හෝ ශක්තිය පවා විශ්වාස නොකරන තත්ත්වයකට මෙහිදී පත්වේ. තමුන් ලිංගය පිළිබඳ ඇය ඊර්ෂ්‍යා කරයි. මෙම අසමාන මානසිකත්වය නිසා ස්ත්‍රී-පුරුෂ සමාජ තත්ත්වය හා භූමිකා සමාන නොවන බවත්, ස්ත්‍රිය පුරුෂාධිපත්‍යයට නතුවන බවත් ෆ්‍රොයිඩ්වාදී ස්ත්‍රීවාදීන්ගේ මතයයි.

මෙම ප්‍රවේශයේ වර්ධනයට දායකත්වයක් දක්වූ නැන්සි කෝඩරෝව් (Nancy Chodorow: 1978) අනුව, දරුවන් හා ගෘහයට සම්බන්ධ කටයුතු පුරුෂයින් හා ස්ත්‍රීන් අතර බෙදී යන තත්ත්වයක් ඇති කළොත්, ස්ත්‍රී හා පුරුෂ මානසිකත්වයද වෙනසකට ලක්වේ. ෆ්‍රොයිඩ්වාදී ස්ත්‍රීවාදයෙන්, ස්ත්‍රී බව හා පුරුෂ බඳුවහි අසමානත්වයට බලපාන මනෝ මූලික කරුණු පිළිබඳ විශ්ලේෂණය කිරීම, අගය කළ යුත්තකි. මන්ද, සමහර අවස්ථාවලදී ස්ත්‍රී හා පුරුෂ මනස් තුළ ස්ථාපිත වී ඇති අදහස්, අන් කවර කරුණකටත් වඩා,

ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අසමානත්වයට හා ස්ත්‍රී පීඩනයට හේතු කාරක වන බැවිනි. එහෙත් මෙම මානසිකත්වයන් ගොඩනැගීමට බලපාන ආර්ථික, සමාජීය, සංස්කෘතික හා දේශපාලන සාධක නොසලකා හැරීම පිළිබඳව ඔවුන්ට නිරන්තරයෙන් විවේචන එල්ල වේ.

ලැකානියන් ස්ත්‍රීවාදීන්ට අනුව, දරුවෙක් මව හා පවතින මූලික ආකර්ෂණීය සබඳතාව වෙනස් වන්නේ සංස්කෘතියේ බලපෑමෙනි. දරුවා පුරුෂ බව හෝ ස්ත්‍රී බව සහ ඒ අතර ඇති වෙනස, සමාජයට අවතීර්ණ වීම තුළින් හඳුනා ගනී. ඒ අවබෝධය මත ගැහැණු හා පිරිමි දරුවන්, ඔවුන්ගේ මානසිකත්වය හැඩගසා ගනී. ලැකානියන් ස්ත්‍රීවාදීන්, සංස්කෘතිය යන්න දාර්ශනික ප්‍රවේශයකින් විශ්ලේෂණය කරන අතර, භාෂාව සංස්කෘතියේ පදනම ලෙස හඳුන්වයි. භාෂාව හුරුවීමට පෙර මිනිස් ජීවීන්ගේ මනස තුළ ස්ත්‍රී හෝ පුරුෂ මානසිකත්වයන් තිබිය නොහැකි බවටද ඔවුහු තර්ක කරති.

## පශ්චාත්-නූතනවාදී ස්ත්‍රීවාදය (Post-Modernist Feminism)

පශ්චාත් - නූතනවාදී ස්ත්‍රීවාදය මූලික වශයෙන් පශ්චාත් නූතනවාදී න්‍යායයන්ගෙන් බලපෑම් ලැබීය. ෆ්‍රන්සුවා ලියෝතාද් (Jean Francois Lyotard) විසින් රචනා කොට, 1984 දී ඉංග්‍රීසියට පරිවර්තනය කරන ලද "The Post - Modern Condition" නැමති අධ්‍යයනය, මෙම ස්ත්‍රීවාදී ප්‍රවේශයේ පදනම විය. පශ්චාත් නූතන වාදය හා පශ්චාත් ව්‍යුහවාදය (Post Structuralism) සමාන අරුත් ඇති පද ලෙස භාවිත කොට පශ්චාත් නූතනවාදී හා පශ්චාත් ව්‍යුහවාදී ස්ත්‍රීවාදී ප්‍රවේශ එකක් ලෙස සමහරු විස්තර කළත්, මෙම ප්‍රවේශ දෙක අතර සමාන මෙන්ම අසමානකම්ද ඇත.

පශ්චාත් නූතනවාදී ස්ත්‍රීවාදය රැඩිකල් අදහස් ප්‍රතික්ෂේප කරයි. ස්ත්‍රීන් සම්බන්ධයෙන් විශ්වීය තත්ත්වයක් පැවතිය නොහැකි බවට තර්ක කරයි. විවිධත්වය සැලකිල්ලට ගැනීම මෙම ප්‍රවේශයේ විශේෂ ලක්ෂණයකි. බටහිර, සුදු ජාතික, මධ්‍යම පාංතික ස්ත්‍රීන්ගේ අත්දැකීම් මත සම්ප්‍රදායික ස්ත්‍රීවාදී න්‍යායයන් පදනම් වී ඇති බවත්, ඒවා ලොව සියලු ප්‍රදේශවල, සියලුම වර්ණ, මානව වර්ග හා පංතිවල ස්ත්‍රීන්ට පොදු න්‍යායයන් ලෙස අර්ථකථනය කර ඇති බවටත් පශ්චාත් නූතනවාදී ස්ත්‍රීවාදීහු චෝදනා කරති. නමුත් ස්ත්‍රීන් සමස්තයක් ලෙස ගත්කළ එබඳු පොදු තත්ත්වයක් දැකිය නොහැකි බවත්, වර්ණය, වර්ගය, පංතිය හා සංස්කෘතිය ආදිය සැලකිල්ලට ගෙන, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය විශ්ලේෂණය කළයුතු බවත් පශ්චාත් නූතනවාදී ස්ත්‍රීවාදීන්ගේ මතයයි. පශ්චාත් නූතනවාදී අදහස් දැරූ මිචෙල් ෆූකෝ



(Michel Foucalt:1980) පවසන ආකාරයට, බලය රාජ්‍යයෙහි ස්ථාපිත වී තිබෙනවාට වඩා සමාජය පුරා පැතිර පවතින්නකි. එහෙයින් බලය පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීමට නම්, එය සම්බන්ධව පුළුල් විස්තරාත්මක පරීක්ෂණයක් කිරීම හා දැනුම සමඟ බලයේ ඇති සබඳතාව පරීක්‍ෂා කිරීම අත්‍යවශ්‍යය. බලය නිසා පීඩාවට පත්වන ස්ත්‍රීන්ගේ තත්ත්වය, ඔවුන්ගේ අත්දැකීම් හා ස්ත්‍රීන් බලය හසුරුවන ආකාරයේ විශේෂත්වය හා බහුවිධ ස්වරූපය හොඳින් අවබෝධ කර ගැනීමට ෆූකෝගේ අර්ථකථනය ඉතා ප්‍රයෝජනවත් බව ස්කොට් ජෝන් (Scott Joan:1988) හා මෝයා ලියොයිඩ් (Moya Lloyd:1971) පෙන්වා දෙති.

ආසියාව, අප්‍රිකාව හා ලතින් ඇමරිකාවේ සමහර ස්ත්‍රීවාදීහු මෙම පශ්චාත් නූතනවාදී අදහස් භාවිත කොට වාර්ගිකත්වය, සංස්කෘතිය, හා පංතිය වැනි සාධක මත ස්ත්‍රීන්ගේ තත්ත්වය හා අත්දැකීම් විවිධ වන බව පෙන්වා දෙති. ඉන්දියානු ස්ත්‍රීවාදිනියක වූ චන්ද්‍රා මොහාන්ති (Chandra Mohanty:1988 සහ 1991) බටහිර ස්ත්‍රීවාදීන් කිපදෙනකු විසින් රචනා කරන ලද අධ්‍යයන කිපයක් විමසුමට ලක්කොට, සුදු ජාතික ස්ත්‍රීන් සමඟ වැඩ කරන පන්තියේ ස්ත්‍රීන්ට හෝ සුදු නොවන ස්ත්‍රීන්ට සහභාගයක් ගොඩනගා ගැනීමට අපහසු බව පැහැදිලි කරයි. එයට හේතුව ලෙස මොහාන්ති පෙන්වා දෙන්නේ, බටහිර ස්ත්‍රීවාදීන්, සුදු ජාතික ස්ත්‍රීන් නවීන, උගත්, ලිංගික වශයෙන් නිදහස් කණ්ඩායමක් ලෙස හා තුන්වන ලෝකයේ ස්ත්‍රීන් දිළිඳු, බලය රහිත, පහසුවෙන් පීඩාවට පත්වන කණ්ඩායමක් ලෙස පැහැදිලි බෙදුමකට ලක්කොට, සත්‍ය තත්ත්වය විරූපී කොට ඇති බවයි.

මෙබඳු අදහස් හා චෝදනාවල බලපෑම මත, සමහර බටහිර ස්ත්‍රීවාදීන්, "එකම රට තුළ වුවත් ස්ත්‍රීන්ගේ තත්ත්වය වෙනස් විය හැකිය, එසේම සුදු ජාතික බටහිර ස්ත්‍රීන්ගේ තත්ත්වය විශ්වීය නොවේය." යන මතය පිළිගෙන ඇත. ඒ අනුව ඔවුහු ස්ත්‍රීන්ගේ තත්ත්වයට, විවිධ සමාජ, සංස්කෘතික හා ඓතිහාසික සාධක බලපෑම් කරයි යන්න පිළිබඳ පෙරට වඩා වැඩි සංවේදීතාවක් දක්වති. එම වෙනසට මූලිකව බලපෑම් කළේ පශ්චාත් නූතනවාදී ස්ත්‍රීවාදයයි.

පශ්චාත් නූතනවාදී ස්ත්‍රීවාදයට අනුව ආසියාවේ හෝ අප්‍රිකාවේ ස්ත්‍රීන් මුහුණදෙන තත්ත්වය ඇමරිකාවේ හෝ බටහිර යුරෝපයේ ස්ත්‍රීන්ගේ තත්ත්වයට වඩා වෙනස් වේ. උතුරු ඇමරිකාව තුළම වෙසෙන සුදු ජාතික මධ්‍යම පන්තික ස්ත්‍රියකගේ අත්දැකීම්, කළු ජාතික ස්ත්‍රියකගේ අත්දැකීම්වලට වඩා වෙනස් විය හැකිය. එහෙයින් පශ්චාත් නූතනවාදී ස්ත්‍රීවාදයට අනුව,

ස්ත්‍රීන් මත වන පීඩනය හා ඇගේ අත්දැකීම් විමසුමට ලක් කළ යුත්තේ, ඒ ඒ පසුබිම තුළ ඇති විවිධ සාධක සැලකිල්ලට ගනිමිනි. ස්ත්‍රී විමුක්තිය සඳහා, පීතෘමූලිකත්වය හා ධනවාදයට එරෙහිව සියලුම ස්ත්‍රීන් එක් අරගලයක් කරනවාට වඩා ඒ පසුබිමට මුල්වූ කරුණුවලට එරෙහිව සටන් කිරීම අත්‍යවශ්‍ය බව ඔවුන්ගේ මතයයි.

මෙම නවීන ප්‍රවේශයන් මගින්, සම්ප්‍රදායික ස්ත්‍රීවාදීන් විසින් ස්ථාපිත කරන ලද ස්ත්‍රීවාදී පොදු න්‍යායයන්, යම් අභියෝගයකට ලක් කෙරිණි. නමුත්, පශ්චාත් නූතනවාදී ස්ත්‍රීවාදය, මගින් ස්ත්‍රීවාදී ව්‍යාපාරය බෙදුමකට ලක් කළේය යන චෝදනාවද එයට එරෙහිව නැගේ. එසේම ඔවුන් පීතෘමූලිකත්වය හා ධනවාදය වැනි සංකල්ප නොසලකා හැර ඇති බවට ද විවේචන එල්ල වේ. එබඳු න්‍යායාත්මක හා ප්‍රායෝගික දුර්වලතා ඇතත්, ස්ත්‍රීන් අතරම පවතින විවිධත්වය කෙරේ සැලකිල්ල යොමු කිරීමෙන්, පශ්චාත් නූතනවාදී ස්ත්‍රීවාදීන්, බුද්ධිමය සංවාදයක් ගොඩනගා ඇත.

පශ්චාත් - ව්‍යුහවාදී ස්ත්‍රීවාදය **(Post - Structuralist Feminism)** ස්ත්‍රී බව හා පුරුෂ බව ස්වභාව ධර්මයෙන් ලද ජීව විද්‍යාත්මක බෙදුමක් ලෙස නොසලකයි. එයට අනුව පීතෘමූලික භාෂා නියමයන් හරහා, ස්ත්‍රී-පුරුෂ සමාජබව නිර්මාණය කෙරේ. මිනිස් ජීවීන් සමානව උපදින අතර, ඔවුන් භාෂා හැසිරවීමට පටන්ගත් තැන සිට, අදාළ සමාජයේ සංස්කෘතිය පිළිගැනීමට ඉගෙන ගනී. සත්‍යය අර්ථකථනය කරන්නේ භාෂාව මගිනි. මෙම භාෂාව පීතෘමූලික නිසා "සත්‍යය" ලෙස විස්තර කෙරෙන දෑ ද පීතෘමූලිකයි. මිනිසා අදහස්, තොරතුරු ප්‍රකාශ කිරීමෙන්, සංවාද හා කථිකා මගින් දැනුම ලබා ගනී. සමාජයේ මේ දෑ පාලනය කරන්නේ, පුරුෂයින් වන අතර "සත්‍යය" අර්ථකථනය කරන්නේද ඔවුන්ය. නිදසුන් ලෙස සමහර සමාජවල, මව්පියන් දරුවන්ට කියා දෙන හොඳ, නරක සම්බන්ධයෙන්, දරුවන් ප්‍රශ්න නොකළ යුතු යැයි ඉගැන්වේ. තවත් සමාජවල, පවුලක ස්ත්‍රීන් පුරුෂයින්ගේ තීරණවලට අවනත වියයුතු යයි ඉගැන්වේ. සමාජීය, සංස්කෘතික හා ඓතිහාසික සාධක අනුව මානව සමාජ එකිනෙකට වෙනස් වේ. ඒ ඒ සමාජවල "සත්‍යය" අර්ථකථනය කරන්නන් විවිධය. ඒ නිසා සංස්කෘතියෙන් සංස්කෘතියට, යුගයෙන් යුගයට මෙම "සත්‍යය" ද වෙනස් වේ. සංස්කෘතිය ගතික නිසා මෙම "සත්‍යය" ද ඉතිහාසය පුරා වෙනස් වෙමින් පවතී. මේ වෙනස මත ස්ත්‍රීන්ගේ තත්ත්වයද වෙනස්වන බව, පශ්චාත් ව්‍යුහවාදී ස්ත්‍රීවාදීන්ගේ මතයයි.



පශ්චාත් නූතනවාදී ස්ත්‍රීවාදීන්ට සමව යමින් ස්ත්‍රීන් අතර වන විවිධත්වය මෙම කණ්ඩායම විසින් ද අවධාරණය කරන අතර, සංස්කෘතික සාධක කෙරේ විශේෂ සැලකිල්ලක් දක්වයි. එහෙත් ස්ත්‍රී විමුක්තිය සඳහා එක්සත් ස්ත්‍රීවාදී ව්‍යාපාරයක් ක්‍රියාත්මක කිරීමේ අරමුණට මෙම න්‍යායයෙන් බාධාවක් එල්ල කළ බවටද චෝදනා නැගේ.

## අනධිකාරීවාදී ස්ත්‍රීවාදය (Anarcha Feminism)

අනධිකාරීවාදී ස්ත්‍රීවාදීන් ඕනෑම ආකාරයක බලය හෝ ආධිපත්‍යයකට එරෙහි වන අතර සමාජ ධුරාවලිය හා ආධිපත්‍යය මත වන සමාජ සබඳතාවලට අභියෝග කරයි. ලිබරල් ස්ත්‍රීවාදය විවේචනයට ලක්කරන මෙම කණ්ඩායම, රාජ්‍ය හා රාජ්‍ය ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන නීති හා සමාන අයිතිවාසිකම් මගින් ස්ත්‍රීන්ට විමුක්තිය නොලැබෙන බවට තර්ක කරයි. ස්ත්‍රීන්ගේ ස්වයං නිර්ණය මගින් පමණක් ඔවුන්ට විමුක්තිය ළඟා වන බව ඔවුහු පෙන්වා දෙති. සියලුම ආකාරයේ බලයන්ට ස්ත්‍රීන් එරෙහි විය යුතු බව මෙම කණ්ඩායම පැවසුවත්, එය කළයුතු ආකාරය පිළිබඳව විධිමත් ලෙස විස්තර නොකරයි. කුඩා ප්‍රමාණයේ දේශීය හා ප්‍රාදේශීය මට්ටමේ, ධුරාවලී රහිත, විමධ්‍යගත සංවිධාන මගින්, බලයට එරෙහි ආකල්ප හා සාරධර්ම ව්‍යාප්ත කළ හැකි බව ඔවුන්ගේ අදහසයි. "අපගේ දේහය පිළිබඳව රාජ්‍යය හෝ පල්ලිය නොව අපම තීරණය කළ යුතුයි" යන සටන් පාඨය යටතේ, ස්ත්‍රී විමුක්තිය, ස්ත්‍රියටම පැවරීමක් අනධිකාරීවාදී ස්ත්‍රීවාදයෙන් සිදුකෙරේ. පුද්ගලික නිදහස, විශේෂයෙන්ම, ලිංගික ක්‍රියාකාරකම් හා උපත් පාලනයට ඇති නිදහස පිළිබඳවද මෙම කණ්ඩායම වැඩි අවධානයක් යොමු කරයි.

මෙම කණ්ඩායමේ පුරෝගාමියෙකු වූ එමා ගෝල්ඩ්මන් (Ema Goldmann) "Dancing in the Revolution: Selected Writings and Speeches" (1983) අධ්‍යයනයෙන් ලිංගික නිදහස හා ලිංගිකත්වය වෙනස් කිරීම තුළින් ස්ත්‍රී විමුක්තිය ලැබෙන බවට තර්ක කරයි. පුරුෂයින්ට හා සමාන අයිතිවාසිකම් ඉල්ලීමේ ව්‍යාපාරය නොසලකා හරින මෙම කණ්ඩායම "පුරුෂයින්ට ඡන්ද බල අයිතිය හිමිකර දීමෙන් ඔවුන් ලද විමුක්තියක් නැත, ස්ත්‍රීන්ටද එය එසේමය" යනුවෙන් ප්‍රකාශ කරයි. සම අයිතීන් ඉල්ලීම වෙනුවට, ස්ත්‍රීන්ගේ තත්ත්වය නගා සිටුවීම සඳහා සෞඛ්‍ය පහසුකම් සැලසීම, දරුවන් රැක බලා ගන්නා මධ්‍යස්ථාන පිහිටුවීම හා ලිංගික අධ්‍යාපනය ලබාදීම වැනි දෑ වඩාත් ප්‍රයෝජනවත් වන බව ඔවුන්ගේ අදහසයි. ස්ත්‍රීන් ස්වභාවයෙන් ම

හෝ ඔවුන්ගේ ජීවිත අත්දැකීම් නිසා, ආධිපත්‍යය පැතිරවීමට වඩා සහයෝගයෙන් කටයුතු කිරීමටත්, තරඟකාරීත්වයට වඩා අන්තර් රැඳියාවකින් කටයුතු කිරීමටත් නැඹියාවක් දක්වන බවද මෙම කණ්ඩායම පෙන්වා දෙයි. නූතන භාෂණ විධිවල පවතින පුරුෂාධිපත්‍යය නිසා, සමාජ අසමානතා තවදුරටත් වර්ධනය වන්නේ යයි පවසන ඔවුන් නූතන භාෂණයටද විරුද්ධ වේ.

1960 ගණන්වල ව්‍යාප්ත වූ ලිබරල් ස්ත්‍රීවාදී ව්‍යාපාරයට එරෙහිව, මෙම කණ්ඩායම, උතුරු ඇමෙරිකාව හා බටහිර යුරෝපා රටවල ක්‍රියාත්මක වීමේදී රාජ්‍ය බලය හා වෙනත් ආධිපත්‍යයන්ට දැඩිව විරුද්ධ විය. නමුත් පසු කාලයකදී, මෙම ව්‍යාපාරයෙන් බිඳුණු මූලික කණ්ඩායමක්, සිය ස්ථාවරය වෙනස් කොට, ස්ත්‍රීන්ගේ තත්ත්වය වෙනස් කිරීම සඳහා ස්ත්‍රීන්ට බලය අවශ්‍ය බවට අවධාරණය කළේය.

ස්ත්‍රීවාදී මූලික ප්‍රවේශයන්ට අයත් නොවූවත්, සාධාරණීකවාදී ස්ත්‍රීවාදය **(Existentialist Feminism)** මගින් ද, නව අදහස් කීපයක් මෙම න්‍යායයට එකතු කරනු ලැබ ඇත. සිමෝන් ඩි බෝවාගේ (Simone De Beauvoir) ගේ "Second Sex" (1942) යන අධ්‍යයනය පදනම් කරගෙන, ස්ත්‍රීන්ට හිමි දෙවැනි ස්ථානය හා එයට බලපාන සමාජීය හා මනෝභාවාත්මක කරුණු පිළිබඳ ඔවුහු අදහස් දක්වති. ඔවුන්ට අනුව මානව ජීවීන්ගේ ශරීරය භෞතිකය. සිරුරෙන් මනස වෙනස්වේ. සෑම පුද්ගලයෙකුටම තම ජීවිතය ගැන තීරණ ගැනීමේ ස්වාධීන හැකියාව ඇත. නමුත් ස්ත්‍රීන්ව මානව සමාජයේ "වෙනත් අය" ලෙස සැලකීම නිසා ඇයට හිමි වී ඇත්තේ පුරුෂයාට වඩා අඩු නිදහසකි. එහෙයින් ඇගේ කැමැත්ත මත කටයුතු කිරීමට ඇයට ඉඩක් නැත. මෙයට මූලික බාධකය වන්නේ සමාජීය හා මනෝභාවාත්මක සාධකයි. එහෙත් මෙම තත්ත්වය හොඳින් අවබෝධ කරගෙන, "ස්ත්‍රීන්ටද හැකියාවක් ඇත" යන ආත්ම විශ්වාසය මත, නිදහස දිනා ගැනීමට කටයුතු කළ යුතු බවට මෙම කණ්ඩායම තර්ක කරයි. යම් ස්ත්‍රියක් එසේ ස්වාධීනව තීරණය කොට, නිදහස දිනා ගැනීමට කටයුතු නොකළහොත්, එය සමාජයේ නොව ඇගේ වරද බවද ඔවුහු අවධාරණය කරති. ස්ත්‍රියගේ තත්ත්වය, දාර්ශනික ප්‍රවේශයක් මගින් විස්තර කිරීමට මෙම ප්‍රවේශය මගින් උත්සාහ ගත්තද, එය ඉතා ව්‍යාකූල හා ප්‍රායෝගික වශයෙන් නොවැදගත් න්‍යායයක් බවට විවේචන එල්ල වී ඇත.

කැරොල් ගිලිගන් (Carol Gilligan: 1982) ප්‍රමුඛ කණ්ඩායමක්, සංස්කෘතික ස්ත්‍රීවාදී ප්‍රවේශයක් **(Cultural Feminism)** පිළිබඳ අදහස් දක්වයි. ජීව



විද්‍යාත්මක වශයෙන්, ස්ත්‍රීන් හා පුරුෂයින් අතර මූලික වෙනසක් ඇති බව මෙම ප්‍රවේශයෙන් පිළිගන්නා අතර, ස්ත්‍රිය එම "ස්වාභාවික වෙනස" අගය කළ යුතු බවට අවධාරණය කෙරේ. උපතින්ම ස්ත්‍රීන්, පුරුෂයින්ට වඩා නම්‍යශීලීය, කාරුණිකය. එහෙයින් ස්ත්‍රීන් ලොව පාලනය කිරීම ආරම්භ කළහොත්, යුද්ධවලින් තොර සාමකාමී ලොවක් බිහිවේ යැයි මෙම කණ්ඩායම විස්තර කරයි. ස්ත්‍රීන් ගමන් කරන මඟ අනිවාර්යයෙන්ම හොඳම හා නිවැරදිම මඟ වන බවටත්, ඔවුහු තර්ක කරති. පුරුෂයා විසින් නිදහස, ධූරාවලිය, තරඟය හා ආධිපත්‍යය වැනි දෑ වැදගත්කොට සලකනු ලබයි. එහෙත් ස්ත්‍රීන් අගය කරන්නේ මෙම අදහස් නොව අන්තර් රැඳියාව, සහයෝගීත්වය, අන්‍යෝන්‍ය සබඳතාව, සමාජීය නුවමාරුව, සතුට, විශ්වාසය හා සාමය වැනි අදහස්ය.

පවතින පුරුෂ මූලික සංස්කෘතියට වෙනස් ස්ත්‍රිය කේන්ද්‍ර කරගත් සංස්කෘතියක්, නිර්මාණය කිරීම මෙම කණ්ඩායමේ අරමුණයි. ස්ත්‍රීන් පෞද්ගලික වශයෙන් වෙනස්වී, ඒ මගින් බලපෑම්කොට, සමාජ වෙනසක් ඇතිකළ යුතු බවට ඔවුහු අවධාරණය කරති.

කළු ජාතික ස්ත්‍රීන්, වර්ණය (Colour) පදනම්කොටගෙන ස්ත්‍රීවාදී ප්‍රවේශයක් ව්‍යාප්ත කර ඇති අතර, එය කළු ජාතික ස්ත්‍රීවාදය **(Black Feminism)** ලෙස හැඳින්වේ. පැට්‍රිෂියා හිල් කොලින්ස් (Patricia Hill Collins:1989), "The Social Construction of Black Feminist Thought" යන අධ්‍යයනයෙන් විස්තර කරන ආකාරයට, අප්‍රිකානු හා ඇමෙරිකානු ස්ත්‍රීන්ගේ පීඩනයට හේතු වන මූලික කරුණු තුනක් වේ. ඒවා නම්, ආර්ථික සාධකය (දිළිඳුකම හා ආර්ථික ඉඩ ප්‍රස්ථා අඩුවෙන් හිමිවීම), දේශපාලන සාධකය (ඡන්ද බලය හා වෙනත් දේශපාලන අයිතීන් අහිමි වීම) හා විඥානාත්මක සාධකයයි (කළු ජාතික ස්ත්‍රීන් සම්බන්ධයෙන් පවතින සෘණාත්මක ප්‍රතිරූපය හා විශ්වාසය). කළුජාතික ස්ත්‍රීවාදී අදහස්වල ආරම්භය 19 වැනි සියවසේ මුල භාගයේදී සිදුවිය. ඔවුන් මත වන පීඩනයට, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සහ මානව වර්ණය යන සාධක දෙකම හේතු වන බව පෙන්වා දුන් කළු ජාතික ස්ත්‍රීවාදීහු, සුදු ජාතික ස්ත්‍රීවාදීන් විසින් ඔවුන්ව නොවැදගත් කොට සලකනු ලැබ ඇතැයි හෝ නොසලකා හැර ඇතැයි චෝදනා කරති. ස්ත්‍රීන් අතර පවත්නා විවිධත්වයන් හා අසමානකම්වලට අවධානය යොමු කරන ලෙසත්, වර්ගවාදය නිසා කළු ජාතික ස්ත්‍රීන් පීඩාවට පත්වීම අවබෝධ කරගන්නා ලෙසත් කළු ජාතික ස්ත්‍රීවාදීහු, සුදු ජාතික ස්ත්‍රීන්ගෙන් ඉල්ලා සිටිති. එසේම සුදු ජාතික ස්ත්‍රීවාදී ව්‍යාපාරය තුළම පවත්නා වර්ගවාදයට අභියෝග කරන ලෙසත් ඔවුහු ඉල්ලා සිටිති.

මෙම ප්‍රවේශය, කළු ජාතික ස්ත්‍රීන්ට විශේෂ වූ තත්ත්වයන් හා අත්දැකීම් මත පදනම් වී ඇත. සම්ප්‍රදායික ස්ත්‍රීවාදීන් උපකල්පනය කරන අයුරින් පොදු ස්ත්‍රී තත්ත්වයක් පැවතිය නොහැකි බව පවසන කළු ජාතික ස්ත්‍රීවාදීහු, පුරුෂයින්, ස්ත්‍රීන්ව පීඩාවට පත් කරන්නන් ලෙස අවධාරණය නොකරති. වර්ගවාදයට එරෙහි දේශපාලන ක්‍රියාකාරකම් සඳහා කළු ජාතික පුරුෂයින් හා ස්ත්‍රීන් එක්ව කටයුතු කිරීමේ අවශ්‍යතාවය ඔවුහු පෙන්වා දෙති.

1980 හා 1990 දශකවලදී පරිසරවාදී ස්ත්‍රීවාදී **(Eco-Feminism)** අදහස්වල ව්‍යාප්තිය ඇරඹුණි. පීතෘමූලිකත්වය ස්ත්‍රියට අහිතකර වන්නා සේම, කෲර අයුරින්, පුරුෂයින් සිය ආශාවන් මත පරිසරය විනාශ කිරීමත්, ස්ත්‍රී ජීවිතවලට අහිතකර ලෙස බලපාන බව මෙම කණ්ඩායමේ විශ්වාසයයි. සම්පූර්ණ බලය ලබා ගැනීම සඳහා, ස්ත්‍රීන් මෙන්ම පරිසරයද ජයගත යුතු බව පුරුෂයින්ගේ විශ්වාසය වන බව මොවුන් පවසයි. මේ අයුරින් පුරුෂයින්, ස්ත්‍රීන්ව පීඩාවට පත්කිරීම හා ස්වභාවික පරිසරය සූරා කෑමට ලක්කිරීම අතර සම්බන්ධයක් ගොඩ නගන පරිසරවාදී ස්ත්‍රීවාදීහු, පරිසරය සුරැකීමේ ව්‍යාපාරය තුළ ස්ත්‍රීන්ට ස්වභාවයෙන්ම, විශේෂ ක්‍රියාකලාපයක් හිමි වී ඇති බවට තර්ක කරති. සම්ප්‍රදායිකව ස්ත්‍රිය හැඟීම්වලට, පරිසරයට හා ශරීරයට සම්බන්ධ වූවෙකු ලෙස සලකන අතර, ඇයට ස්වභාවධර්මය අවබෝධකර ගැනීමේ හැකියාවක් ඇත. එයට පරස්පරව, පුරුෂයා, හේතුව, තර්කය හා මනසට සම්බන්ධ වූවෙකු ලෙස සලකන අතර, සාමාන්‍යයෙන් සමාජය අගය කරන්නේ එබඳු දෑ යැයි පරිසරවාදී ස්ත්‍රීවාදීහු චෝදනා කරති. ස්ත්‍රියට හිමි ප්‍රජනන කාර්ය හා දරුවන් පෝෂණය කිරීමේ හැකියාව නිසා, ස්වභාව ධර්මය හා සහයෝගයෙන් ජීවත්විය යුතු ආකාරය පිළිබඳ ඇයට විශේෂ දැනුමක් ඇති බවටද ඔවුහු තර්ක කරති. තවද, "මව් බිම" හා "මව් ගස" වැනි ස්ත්‍රීවාචක පද, ස්වභාව ධර්මය විස්තර කිරීමට භාවිත කිරීම ද, ස්ත්‍රිය පරිසරයට සම්බන්ධ කිරීමක් ලෙසට ඔවුහු අවධාරණය කරති.

කාර්මීකරණය හා නවීකරණය හමුවේ විනාශ වන පරිසරය පිළිබඳව ඉන්දියානු ස්ත්‍රීවාදිනියක වූ වන්දනා ශිවා (Vandana Shiva:1989) හා තවත්, තෙවැනි ලොව ස්ත්‍රීවාදීන් විශේෂ අවධානයක් යොමු කර ඇත. ස්ත්‍රියට හිමි අප්‍රධාන තත්ත්වය, ගෘහස්ත භූමිකාව, ජලය, දර, කොළ හා අල වර්ග ආදිය ලබා ගැනීමේදී ඇය පරිසරයට දක්වන දැඩි බැඳීම යන හේතු නිසා, ස්ත්‍රිය පරිසරය සුරැකීමේදී වඩාත් ක්‍රියාශීලී වන බව මෙම ස්ත්‍රීවාදීන්ගේ මතයයි. වසර 300 කටත් පෙර, හිමාලය කඳු වැටියේ වනාන්තර ආරක්ෂා කිරීමේ අරමුණින්, ස්ත්‍රීන්ගේ නායකත්වයෙන් ආරම්භ කරන ලද චිප්කෝ ව්‍යාපාරය (Chipko Movement) පිළිබඳව නිදසුන් දක්වන වන්දනා ශිවා,



ජාත්‍යන්තර කාන්තා දශකය ප්‍රකාශයට පත් කිරීමට බොහෝ කලකට පෙරත්, තුන්වෙනි ලෝකයේ ස්ත්‍රීන් ක්‍රියාශීලී ලෙස එබඳු සාමූහික විරෝධතා ව්‍යාපාරවල නායකත්වය ගත් බව පෙන්වා දෙයි. ස්ත්‍රීන් පරිසරය සුරැකීමේ ව්‍යාපාරවලට ක්‍රියාශීලීව සහභාගීවීම වසර ගණනාවකට පෙරදීත් මේ අයුරින් සිදුවූවත්, පරිසරවාදී ස්ත්‍රීවාදය න්‍යායයක් ලෙස වර්ධනය වූයේ 1970 ගණන්වලදීය. එම න්‍යායයට අනුව මිනිස් ජීවීන් සූරාකෑම අවසන් නොකර, පරිසරය සූරාකෑම අවසන් කළ නොහැකිය. ඒ සඳහා මූලික සමාජ වෙනසක් කළයුතු බවත්, පවතින සාරධර්ම හා සංස්කෘතික, ව්‍යුහාත්මක සබඳතා නැවත සැකසිය යුතු බවත් ඔවුන්ගේ විශ්වාසයයි. සමානාත්මතාව ප්‍රවර්ධනය කිරීම, අවිහිංසාව, බහුවිධ සංස්කෘතිය, සහභාගීත්වය හා තීරණ ගැනීමේදී ධූරාවලියෙන් තොර බව යන සාධක මෙම නව සමාජය මනින මාපක ලෙස සැලකිල්ලට ගත යුතුය. පරිසරවාදී ස්ත්‍රීවාදීන්ට අනුව එම නව සමාජය තුළ මිනිස් ජීවීන් ස්වභාව ධර්මය පාලනය කිරීමට උත්සාහ නොගත යුතුය. බල සබඳතා නැවත සැකසීම වෙනුවට, එකිනෙකාට ගෞරව කරන, ආචාරධර්මවලින් පිරි සමාජයක් බිහිකළ යුතුය. පීතෘමූලික සමාජය තුළ ස්ත්‍රීන් හා පුරුෂයින් එකිනෙකාට වෙනස් අයුරින් බෙදා ඇති තත්ත්වය වෙනස් කොට, ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂය පෞද්ගලික හා පොදු ක්ෂේත්‍ර දෙකේදීම සමබරතාවකින් කටයුතු කළ යුතුය.

මෙම උප කණ්ඩායම්වලට අමතරව නවත් ස්ත්‍රීවාදී ප්‍රවේශ ගණනාවක් නූතන ස්ත්‍රීවාදී අධ්‍යයන ක්ෂේත්‍රයට එක්වී ඇත. තෙවෙනි ලොව ස්ත්‍රීවාදය (Third World Feminism) නැතිනම් පශ්චාත් යටත් විජිතවාදී ස්ත්‍රීවාදය (Post - Colonial Feminism) එබඳු මෑත කාලීන ප්‍රවේශයක් වේ. ධනවාදයේ හා අධිරාජ්‍යවාදයේ ප්‍රතිඵලයක් ලෙස තුන්වන ලෝකයේ ස්ත්‍රීන්, පීතෘ-මූලිකත්වය නිසා පමණක් නොව එයට අමතර වෙනත් හේතු නිසාද පීඩාවට පත්වන බැව් මෙම කණ්ඩායමේ අදහසයි.

මෙබඳු ප්‍රවේශ ගණනාවක් විද්‍යමාන වුවත් ස්ත්‍රීවාදී න්‍යායේ මූලික කරුණු සම්බන්ධයෙන් ඒවා අතර පොදු බවක් තිබීම විශේෂ ලක්ෂණයකි. ඉහතින් සඳහන් කළ ආකාරයට, සෑම ප්‍රවේශයකින්ම ස්ත්‍රියගේ අප්‍රධාන තත්ත්වය හා ඇය පීතෘමූලික සමාජය තුළ පීඩනයට පත්ව ඇති ආකාරය විස්තර කෙරේ. එහෙත් එයට බලපාන සාධක විස්තර කිරීමේදී එක් න්‍යායයක් මූලික කොට සලකන සාධකය, තවත් න්‍යායයක් අඩු වැදගත්කමකින් සලකා ඇත. එසේම ස්ත්‍රී විමුක්තිය සඳහා ඉදිරිපත් කරන ක්‍රමවේද අතරද සමාන අසමානකම් ඇත. පීතෘමූලික සමාජය හා ධනවාදී අර්ථ ක්‍රමය වෙනස් කිරීමෙන් හෝ රාජ්‍ය ප්‍රතිපත්ති මගින් සමාන අයිතිවාසිකම් සහ

ආර්ථික ඉඩප්‍රස්ථා ලබාගැනීමෙන් හෝ පවසින පීඩිත තත්ත්වයෙන් මිදී, ස්ත්‍රිය නිදහස් මිනිස් ජීවියෙකු බවට පත්විය යුතුය. යන අරමුණ සියලුම ස්ත්‍රීවාදී ප්‍රවේශවල අවසාන අරමුණයි. එහෙයින් ප්‍රවේශ ගණනාවකින් යුක්ත වුවද, ස්ත්‍රීවාදය, එක් දෘෂ්ටිවාදයක් ලෙස සැලකීම සාවද්‍ය නොවේ. මෙම සෑම ප්‍රවේශයකින්ම ඉදිරිපත් කරන අවසාන ඉලක්කය එකකි. එහෙත් ප්‍රායෝගික ලෝකයේ ස්ත්‍රීවාදී ව්‍යාපාරය ක්‍රියාත්මක වීමේදී, වෙනත් සමාජ හා දේශපාලන ව්‍යාපාර මෙන්ම උප කණ්ඩායම් ගණනාවකට කැඩී ඇත. ඓතිහාසික පූර්වාදර්ශයන් හේතුකොට ගෙන, අද සමහරක් රටවල, ස්ත්‍රීන්ගේ නීතිමය තත්ත්වය තවත් රටවලට වඩා වෙනස්ය. ආර්ථික හා දේශපාලන සාධකවල බලපෑමෙන් ස්ත්‍රියගේ සමාජ ආර්ථික තත්ත්වයේද වෙනස්කම් සිදු වී ඇත. එහෙයින් ස්ත්‍රීන්ගේ අත්දැකීම්, මෙන්ම අභිප්‍රායයන් හා දිනාගත යුතු දෑ ද වෙනස් වී තිබේ. එම විවිධත්වය නිසා ප්‍රවේශ කීපයකින් එකම අරමුණ දිනා ගැනීමට විවිධ කණ්ඩායම් කීපයක් කටයුතු කරන තත්ත්වයක් උදා වී ඇත.

# 12

## ස්ත්‍රීවාදය බටහිර සංකල්පයක්ද? එය ශ්‍රී ලංකාව වැනි ආසියාතික රටකට ගැලපෙන්නේද?

බොහෝ පෙරදිග සමාජ, ස්ත්‍රීවාදය බටහිර සංකල්පයක් ලෙස සලකා බැහැර කිරීමට උත්සාහ ගනී. එහෙත් ඕනෑම රටක හෝ මානව වර්ගයක ඉතිහාසය දෙස බැලුවහොත්, ස්ත්‍රී විමුක්තිය සඳහා වූ අරගල දක්නට ලැබේ. එක්කෝ ස්වාධීනතා අරගලවලට ස්ත්‍රීන් විවිධ අයුරින් සහභාගී වූ අයුරු දක්නට ලැබේ. ස්ත්‍රීන් මත වන පීඩනය විවිධ හැඩයන් ගත්තද, එය සමස්ත ලෝකයටම පොදුය. එම පීඩනයෙන් මිදීමට, බටහිර මෙන්ම පෙරදිග ස්ත්‍රීනුත්, උතුරේ මෙන්ම දකුණේ ස්ත්‍රීනුත් විවිධ අයුරින් ක්‍රියාත්මක වූ අයුරු සාක්ෂි සහිතව ඉතිහාසයෙන් ඕනෑතරම් සොයාගත හැකිය. ස්ත්‍රීන්ගේ අප්‍රධාන තත්ත්වය පිළිබඳ සැලකිලිමත්වීම, ඒ තත්ත්වය නොසලකා ස්ත්‍රීන් සම්ප්‍රදායයෙන් බැහැරව පොදු හෝ දේශපාලන කටයුතුවලට සහභාගීවීම් හා නායකත්වය ගැනීම් වැනි දෑ බටහිර මෙන්ම පෙරදිග සමාජවල ඉතිහාසයෙන්ද දැකගත හැකිය. ඉතිහාසයේ අඳුරු යුගවලදී, පුරුෂයින් අභිබවා ස්ත්‍රීන් කටයුතු කළ අවස්ථා පිළිබඳවද සාක්ෂි ඇත. එසේ ම ඉතිහාසය තුළ ලියැවී නොමැති වුවද පුරුෂයින්, නිදහස, අයිතිවාසිකම් හා සමානාත්මතාව සඳහා අරගල කළ සෑම අවස්ථාවකදීම කවර හෝ ආකාරයකින් ස්ත්‍රීන්ද ඒවාට දායක වී ඇත. එහෙයින් "ස්ත්‍රිය නිදහස් මානව ජීවියෙකි" යන සිතුවිලි හෝ චින්තනය සහ ඒ හා බැඳි ක්‍රියාකාරකම් බටහිර මෙන්ම පෙරදිග සමාජවලද යම් යම් අස්ථාවලදී මතුවූ බවට සැකයක් නැත.

එහෙත් නූතන සමාජ හා දේශපාලන දෘෂ්ටිවාදයක් ලෙස හා විධිමත්ව සංවිධානය වූ ව්‍යාපාරයක් ලෙස ස්ත්‍රීවාදය උපත ලැබුවේ බටහිර යුරෝපය තුළ බව පිළිගත යුතු වේ. 19 වැනි සියවසේ දී ස්ත්‍රීවාදයේ ව්‍යාප්තිය ඇරඹුනත්, ස්ත්‍රී අයිතිවාසිකම් පිළිබඳ අදහස් හා අධ්‍යයන එයට පෙරත් බටහිර යුරෝපයේ සහ උතුරු ඇමෙරිකාව තුළ ප්‍රකාශයට පත්වී තිබිණි. එසේම මුල් කාලවලදී ස්ත්‍රීවාදය සම්බන්ධ වූයේත් බටහිර මධ්‍යම පංතික ස්ත්‍රීන් හා විශේෂයෙන්ම ශාස්ත්‍රීය අධ්‍යයනවල නිරත වූ ස්ත්‍රීන් සමඟය. එහෙයින් ස්ත්‍රීවාදයට පදනම් වූ සමාජ පසුබිම් සාධක හා ස්ත්‍රීන්ගේ අත්දැකීම් ද බෙහෙවින් බටහිරට සම්බන්ධ ඒවා විය. නමුත් සියවස් තුනක් පමණ

කාලය තුළදී, ස්ත්‍රීවාදී දෘෂ්ටිය මෙම බටහිර සමාජයෙන් ඈත් වූ සමාජ පසුබිම් පදනම් කර ගන්නා තත්ත්වයකටද වර්ධනය වී ඇත. එසේම බටහිර වුවත්, පෙරදිග වුවත්, සමාන අයුරින් ස්ත්‍රීන්ට බලපාන පීඩනය, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, ස්ත්‍රී දූෂණ, ලිංගික අතවර, ප්‍රසූත නිවාඩු හා සම වේතන වැනි කරුණු වෙනුවෙන් එක් කටහඬක් නැඟිය හැකි ජාත්‍යන්තර මට්ටමේ ව්‍යාපාරයක් බවට ස්ත්‍රීවාදය පත්වී ඇත.

සමාජ හා සංස්කෘතික විවිධත්වය සැලකිල්ලට ගනිමින් ස්ත්‍රීන්ගේ තත්ත්වය අර්ථකථනය කිරීමට හා එයට විසඳුම් සෙවීමට හැකි මට්ටමේ ප්‍රවේශ ගණනාවක් සහිත පුළුල් දෘෂ්ටිවාදයක් බවට ස්ත්‍රීවාදය පරිවර්තනයවී ඇත. ස්ත්‍රීවාදී න්‍යායාත්මක අදහස්වල උපත බටහිර රටවලදී සිදු වුවත්, අද තුන්වැනි ලෝකයේ ස්ත්‍රීවාදී ව්‍යාපාර ක්‍රියාත්මක වන්නේ, බටහිර රටවල් ඉදිරිපත් කරන වැඩ පිළිවෙලට අනුව නොවේ. එසේම ස්ත්‍රියගේ අප්‍රධාන තත්ත්වය හා පීඩනය පිළිබඳ තුන්වන ලෝකයේ ස්ත්‍රීවාදීන් විස්තර කරන්නෙත්, බටහිර ඇසින් බලා නොවේ. උදාහරණ ලෙස ඉන්දියාවට සුවිශේෂී වූ සති පූජාව, දෑවැදි මරණ, ළදරු විවාහ හා ස්ත්‍රියට එරෙහි සමහර ආගමික සම්ප්‍රදායයන් පිළිබඳ විස්තර කෙරෙන්නේ ඉන්දීය සමාජ පසුබිම් පදනම් කරගෙන මිස බටහිර සමාජ පසුබිම් කරගෙන නොවේ. බටහිර සමාජවල ස්ත්‍රීන්ගේ අප්‍රධාන තත්ත්වයට බලපාන සාධකවලට සමාන මෙන්ම අසමාන සාධකද මෙහිදී විශ්ලේෂණය කළ යුතු වේ. ඉන්දියානු නීති-රීති, සම්ප්‍රදායයන්, විවාහ ක්‍රම, ආගමික විශ්වාස හා පුද පූජා පිළිබඳ අනිවාර්යයෙන් විශේෂ සැලකිල්ලක් යොමුකළ යුතු වේ. ඒවා බටහිර ස්ත්‍රීවාදී ඇසින් විමසිය නොහැකිවන අතර, විසඳුම් සෙවීමේදී ද බටහිර ස්ත්‍රීන්ගේ ප්‍රශ්නවලට වෙනස් වූ අයුරින් විසඳුම් සෙවිය යුතු වේ. මෙම පීඩිත තත්ත්වයන්ට එරෙහිව බටහිර රටක ස්ත්‍රීවාදය අධ්‍යයනය නොකළ ස්ත්‍රීන්ට වුවද අධ්‍යයන කටයුතු කිරීමට හැකියාවක් හා පෙළඹවීමක් ලැබේ. එසේම ස්ත්‍රීන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, ස්ත්‍රී දූෂණ හා ලිංගික අතවර වැනි පොදු පීඩාවලට එරෙහිව, බටහිර මෙන්ම පෙරදිග රටවලත්, උගත් මෙන්ම නූගත් ස්ත්‍රීනුත් කටයුතු කරනු දක්නට ලැබේ. එහෙයින් ස්ත්‍රීවාදී න්‍යායයේ උපත බටහිර යුරෝපය තුළ සිදුවූ පමණින් එය වෙනත් සමාජවලට නොගැළපේ යැයි බැහැර කිරීම බුද්ධිමය වශයෙන් මුලාවකි.

ස්ත්‍රීවාදයේ පමණක් නොව වෙනත් බොහෝ සමාජ, දේශපාලන න්‍යායයන්හි උපතද බටහිර රටවලදී සිදුවී තිබේ. ලිබරල්වාදය, සමාජවාදය හා ප්‍රජාතන්ත්‍රවාදය වැනි බොහෝ දෘෂ්ටිවාද උදාහරණ වන්නේය. කලක් පසුගාමීව තිබූ බොහෝ ආසියානු, අප්‍රිකානු හා ලතින් ඇමරිකානු රටවල්



අද මෙම බටහිර සමාජ, දේශපාලන සංකල්ප අනුගමනය කරමින්, බටහිර සංවර්ධිත රටවල් ගමන් කළ මග යමින් තිබේ. නව රාජ්‍යවල දේශපාලන ක්‍රම බටහිර ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී සංකල්ප මත පදනම් වී තිබේ. බටහිර උපත ලද පාර්ලිමේන්තු කැබිනට් ආණ්ඩුක්‍රමය, ජනාධිපති ආණ්ඩුක්‍රමය, ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වැනි දෑ මෙම රටවල් විසින් සිය දේශපාලන ආකෘති බවට පත්කරගනු ලැබ තිබේ. ව්‍යවස්ථාදායකය, අධිකරණය, විධායකය හා දේශපාලන පක්ෂ වැනි ආයතනද, බටහිරට අනුව යමින්, සෑම බටහිර නොවන රටකම පාහේ ස්ථාපිත කරගෙන තිබේ. එපමණක් නොව, බටහිර සම්භවයක් සහිත සර්වජන ඡන්ද ක්‍රමය, නියෝජනය, සමානාත්මතාව, මානව අයිතිවාසිකම් හා නීතියේ ආධිපත්‍යය වැනි සංකල්පද, මෙම නව ආණ්ඩුක්‍රම ක්‍රියාත්මක කිරීමේදී මනාව භාවිත කෙරේ. බටහිර රටවල බලපෑම මත විවෘත ආර්ථික ක්‍රමය, පෞද්ගලීකරණය, හා ගෝලීයකරණය වැනි ප්‍රවේශ වෙතද බටහිර නොවන රටවල් විවිධ ගැටළු හා දුෂ්කරතා හමුවේ වුවත් පැමිණ තිබේ.

දේශපාලන හා ආර්ථික වශයෙන් පමණක් නොව සමාජීය හා සංස්කෘතික වශයෙන් වැදගත් වන බටහිර දෑ ද පසුගිය සියවස් තුනක පමණ කාලය තුළදී දකුණේ රටවල ඉතා ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් පවතී. බටහිර ආකෘතියේ අධ්‍යාපන ක්‍රම, පාඨමාලා, පෙළපොත්, භාෂා, සාහිත්‍යය, බටහිර සම්භවය ලත් ආගමික දර්ශන, විශ්වාස හා ඉගැන්වීම්, බටහිර ආරේ ඇඳුම්, පැළඳුම්, කෑම-බීම, ගෘහභාණ්ඩ, මෙවලම්, ආභරණ හා බටහිර විධියේ සිරිත් විරිත් පවා බොහොමයක් බටහිර නොවන රටවල වඩාත් හොඳ දෑ ලෙස පිළිගෙන තිබේ. මේ සියල්ලේම එකතු ප්‍රතිඵලයක් ලෙස, බටහිර නොවන සමාජ ජීවිතවල විශේෂ වෙනසක් සිදුවෙමින් පවතී. සම්ප්‍රදායික ජීවන වෘත්තීන්, ජීවන රටා, විවාහ ක්‍රම, පවුල් සංස්ථාව, පවුලේ සාමාජිකයන්ගේ අයිතිවාසිකම් යනාදී අංශ මෙන්ම, මානව සාරධර්ම හා ආකල්ප පවා මේ අනුව වෙනසකට ලක්වෙමින් පවතී. බටහිර සංකල්ප හා ප්‍රවේශයන් හොඳ හෝ නරක වුවත්, එකී සංකල්ප වෙත ගමන් කිරීමේ දී පැකිලීමක් දක්නට නැත. අනෙක නිවැරදි සංකල්පයක උපත බටහිර හෝ පෙරදිග හෝ බෙදීමක් නොමැතිව පිළිගැනීමෙහි වරදක් ද දැකිය නොහැකිය.

බටහිර සම්භවයක් සහිත තාක්ෂණය, මේ සෑම අංශයක්ම අභිබවා, බටහිර නොවන රටවල් තුළ ව්‍යාප්ත වෙමින් තිබේ. නවීන වාහන, පණිවිඩ හුවමාරු ක්‍රම හා ගමනාගමනය වැනි දෑ පසුගිය පනස් වසරක පමණ කාලය තුළ මේ රටවල ඉතා ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් තිබේ. රූපවාහිනී, පරිගණක හා අන්තර්ජාලය වැනි විද්‍යුත් තාක්ෂණය මේ අතුරින් ප්‍රමුඛ වේ.

මෙබඳු වෙනස්කම් බටහිර නොවන සමාජවල සිදුවෙද්දී යම් යම් දුර්වලතා මතුවූවත් සමස්තයක් ලෙස ඒවා බටහිර උපත ලද නිසා "භරත" දැ ලෙස ප්‍රතික්ෂේප කෙරෙන්නේ නැත. අන්ත ජාතිකවාදීන් හෝ ආගමික මූලධර්මවාදීන් වැනි විශේෂ කණ්ඩායම් කිපයක් හැරුණු විට අනෙක් බොහෝ දෙනා ආර්ථික, දේශපාලන, සමාජ සංවර්ධනය හා නවීකරණය යන අරමුණු හමුවේ මෙම බටහිර දෑ පිළිගෙන තිබේ. එහි ප්‍රතිඵල විවිධ වූ බවද කිව යුතුය. ඉහත සඳහන් කරන ලද ආර්ථික, දේශපාලන, සමාජ සංකල්ප මෙන්ම බටහිර තාක්ෂණයත් බොහොමයක් බටහිර නොවන රටවල, කාලානුරූපීව ස්ථාපිත වී තිබේ. බටහිරකරණය තුළින් පළමු ලොව රටවල මට්ටමට සංවර්ධනය වූ පෙරදිග රටවල්ද අප අතර වේ. ජපානය හා මෑතදී කාර්මීකරණයට ලක්වූ රටවල් ලෙස සැලකෙන සිංගප්පූරුව, තායිවානය, මැලේසියාව, හා ඉන්දුනීසියාව වැනි ආසියාතික රටවල් තම ශක්තීන් නව තත්ත්වයන් සමඟ මුසුකොට, සංවර්ධනය වෙත ළඟා වී තිබේ. මෙම රටවල මට්ටමට සංවර්ධනය වී නොමැති සමහර රටවල් අද ඒවා අනුගමනය කිරීමේ වැඩ පිළිවෙලවල් ක්‍රියාත්මක කරමින් සිටියි. ඉහත සඳහන් සියලු දේ බටහිර සම්භවයක් සහිත වූවද, බටහිර නොවන රටවලදී ඒවා ප්‍රතික්ෂේප වී නොමැති බව මෙම සාක්ෂි සනාථ කරයි.

මෙවැනි පරිසරයකදී, ස්ත්‍රීවාදය වැනි සංකල්පයක් බටහිර උපත ලද නිසා බටහිර නොවන රටකට නොගැළපේ යයි සිතීම සැබැවින්ම පදනම් විරහිතය. පවතින තත්ත්වය ප්‍රශ්න කිරීමකින් තොරව, එම තත්ත්වය වෙනස් කිරීමේ අරමුණක් නොමැතිව, කිසිදු සමාජ, දේශපාලන දෘෂ්ටිවාදයක් නිර්මාණය කෙරේ යයි අපේක්ෂා කළ නොහැකිය. එබඳු ඕනෑම දෘෂ්ටිවාදයකින් පවතින තත්ත්වයට අභියෝග එල්ලවීම ස්වභාවිකය. ලිබරල් වාදය හෝ සමාජවාදය වැනි සංකල්පද එබඳුය. ඒවා මගින් පැවති සම්ප්‍රදායික පාලන ක්‍රම විවේචනයට ලක්වූ අතර, වඩා යහපත් යැයි විශ්වාස කරන නව සමාජ හා දේශපාලන ක්‍රම බිහිකිරීම ඒවායේ මූලික අරමුණ විය. මෙබඳු සංකල්ප ව්‍යාප්ත වීමේදීත්, විශේෂයෙන්ම මුල් කාලවලදී, ඒවාට එරෙහි විවේචන හා ප්‍රතිවිරෝධතා පැන නැගුණි. එහෙත් කාලයාගේ ඇවෑමෙන් එම සමාජ තුළ බහුතරයේ පිළිගැනීම, ස්ථාපිත වී තිබේ. එහෙයින් මෙම ගැටළුව ස්ත්‍රීවාදයට පමණක් නොව වෙනත් දෘෂ්ටිවාදීන්හි ප්‍රායෝගිකත්වයටද සම්බන්ධ ගැටළුවකි. දිගු කලක් ස්ථාපිත වී තිබූ සමාජ, දේශපාලන හෝ ආර්ථික ක්‍රමයක් තුළ නවීන අදහස් හා සංකල්ප ඉතා පහසුවෙන් හෝ කෙටි කලකින් ආයතනගත කිරීම කළ හැක්කක් නොවන බව වෙනත් දෘෂ්ටිවාදයන්ගේ ප්‍රායෝගික අත්දැකීම්වලින් මනාව පැහැදිලි වේ. බ්‍රිතාන්‍යයේ



හෝ ප්‍රංශයේ ස්ථාපිත වී තිබූ, රාජාණ්ඩු ක්‍රම හා වැඩවසම් සමාජ හා සංස්ථා ක්‍රමික වෙනසකට ලක්වී, නූතන ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ස්වරූපයන් අනුව හැඩ ගැසුණේ වසර සියගණනක ප්‍රජාතන්ත්‍රවාදී අත්දැකීම් තුළදීය. එහෙත් වෙනත් සංකල්ප හා සසඳද්දී මෙම ගැටළුව, ස්ත්‍රීවාදයට වඩාත් බැරෑරුම් ලෙස බලපාන බවක් පෙනේ. මන්ද, වසර දහස් ගණනක් තුළදී සමාජගතවූ විශ්වාස පද්ධතියක් ස්ත්‍රීවාදය විසින් විචාරයට ලක්කරන බැවිනි. එසේම පුරුෂමූලික සමාජය තුළ, පුරුෂයින් කේන්ද්‍රගත කරගත්, පුරුෂයින් විසින්ම නිර්මාණය කරන ලද දෘෂ්ටිවාද, පුරුෂයින් විසින් ව්‍යාප්ත කිරීමේදී, බහුතර පුරුෂයින්ගේ අභියෝගයට ලක් නොවේ. එහෙත් ස්ත්‍රීවාදයෙන් මෙම පුරුෂ මූලික සමාජය අභියෝගයට ලක්වීම කාලාන්තරයක් තිස්සේ ඔවුන්ට විශේෂයෙන් උරුම වූ තත්ත්වයන් වෙනස් කිරීමට දරන උත්සාහයක් ලෙස සැලකීම ඒ හමුවේ ඇති බැරෑරුම්ම ගැටළුවයි. එසේම, බටහිර නොවන රටවල වඩාත් තදින් මුල්බැසගෙන ඇති පවුල් සංස්ථාවේ ඒකීය භාවයට හා පැවැත්මට මෙන්ම මව හෝ බිරිඳගේ භූමිකාවට ස්ත්‍රීවාදී අදහස් නිසා හානියක් සිදුවී, එය ඉදදරා යන්නේය යන මතයද ඉස්මතුවී ඇති තවත් ගැටළුවකි.

මෙබඳු අදහස් හා සැකයන් නිසා ස්ත්‍රීවාදය ප්‍රතික්ෂේප කරන සමහර කණ්ඩායම් "එය බටහිර සංකල්පයක් නිසා පෙරදිගට නොගැළපේය" යන මතය දරති. නමුත් මෙය සාවද්‍යය. මන්ද, ස්ත්‍රීවාදයෙන් පවුල තුළ හා ඉන් පිටත ස්ත්‍රීන්ගේ තත්ත්වය හා භූමිකාව විමසුමට ලක්වූවත්, එයින් පුරුෂ විරෝධී තත්ත්වයක් නිර්මාණය කිරීමට උත්සාහ නොගන්නා බැවිනි. එයින් අවධාරණය කෙරෙන්නේ පුරුෂයාට සමාන අයුරින් පවුල තුළ මෙන්ම පොදු කටයුතුවලදීත්, ස්ත්‍රීන්ටත් අයිතිවාසිකම් හා ඉඩප්‍රස්ථා හිමිවිය යුතුය යන අවධාරණය සහිත එම අරමුණ දිනාගැනීමේ ක්‍රියාකාරකමින් පිළිබඳවය. සම්ප්‍රදායිකව, ස්ත්‍රියට වෙන් කර තිබූ ගෘහාශ්‍රිත කටයුතුත් පුරුෂයාට වෙන්කර තිබූ පොදු කටයුතුත් පිළිබඳ දැඩි බෙදුම වෙනසකට ලක්වන අයුරින් මෙම ක්ෂේත්‍ර දෙකේම කටයුතු ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයම සහයෝගයෙන් හා සහජීවනයෙන් ඉටුකිරීමේ අවශ්‍යතාව ස්ත්‍රීවාදයෙන් මතුකෙරේ. එවැනි තත්ත්වයකදී වඩාත් සාමකාමී, එක් කණ්ඩායමක් පීඩනයට ලක් නොවන ආකාරයේ සාපේක්ෂිමත් සමාජයක් බිහිකළ හැකි බව ස්ත්‍රීවාදයේ විශ්වාසයයි. එහෙයින් එය බටහිර මෙන්ම බටහිර නොවන සමාජවලටද එකසේ වැදගත්ය.

දකුණු ආසියාවේ පමණක් නොව, තුන්වැනි ලෝකයේ බොහෝ රටවල් යටත් විජිත අත්දැකීම් ලද රටවල් වේ. යටත්විජිත පාලන සමයන් හිදී, අධිරාජ්‍යවාදීන් විසින්, මේ රටවල සංස්කෘතිය, ආගම හා දේශපාලන **ක්‍රම**

ආදිය ශිෂ්ට ඒවා නොවන බවට අවධාරණය කරන ලදී. බටහිර අධිරාජ්‍යවාදීන්ට මෙම රටවල් ශිෂ්ටාචාරවත් කිරීමේ යුතුකම පැවරී ඇති බවටද ඔවුහු උදම් ඇනූහ. එම තත්ත්වය තුළ, බටහිර නොවන රටවලට බටහිර දැ බලයෙන් පැටවීමක් සිදුවිය. මෙයට එරෙහිව බොහෝ රටවල අධිරාජ්‍ය විරෝධී, නිදහස් අරගල ව්‍යාප්ත වූ අතර, ඒවා විසින් බටහිර දැ ප්‍රතික්ෂේප කොට, දේශීය දේ අගය කිරීමට පටන් ගැනුණි. නිදහස ලබා අඩ සියවසක් පමණ ගතවූවත් තවමත් නව රාජ්‍යවල මෙබඳු අදහස් ඉහිරී වී පැවතීමත් ස්ත්‍රීවාදය වැනි සංකල්පවල ව්‍යාප්තියට සෘණාත්මකව බලපායි.

ශ්‍රී ලංකාවටද ඉහත සඳහන් කරුණු පොදුය. එහෙයින් ස්ත්‍රීවාදය පිළිබඳ මිශ්‍ර අදහස් හා මතිමතාන්තර පැවතීම ස්වාභාවිකය. ප්‍රායෝගික වශයෙන් ගත්විට, ශ්‍රී ලංකාවෙහිද, බටහිර බලපෑම් එල්ලවීමට පෙර පවා, ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම්, පොදු කටයුතුවලට සහභාගී වීම, සහ සමහර අවස්ථාවල පුරුෂයින් අභිබවා ස්ත්‍රීන් කටයුතු කිරීම පිළිබඳ දක්නට ලැබුණි. බ්‍රිතාන්‍ය විජිත පාලන සමයේදී, ප්‍රජාතන්ත්‍රවාදී අදහස් ව්‍යාප්ත වීමත් සමග ස්ත්‍රීවාදී අදහස්වල ව්‍යාප්තියක් ශ්‍රී ලංකාවේද සිදුවිය. නමුත් පුළුල් හා විධිමත් සමාජ ව්‍යාපාරයක් ලෙස, ස්ත්‍රීවාදය වර්ධනය වූ බවක් මින් අදහස් නොකෙරේ. 1920 ගණන්වල, ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය ශ්‍රී ලාංකික පුරුෂයින්ට පූර්ණ ඡන්ද බලය ඉල්ලා සිටීමේ දී, ස්ත්‍රීන්ද වෙනමම ඡන්ද බලය සඳහා වූ සංගමයක් පිහිටුවා, ඡන්ද අයිතිය ඉල්ලා සිටීම තුළ වූ එක්විම සංවිධානාත්මක ස්ත්‍රීවාදී ව්‍යාපාරයක ආරම්භය ලෙස සැලකිය හැකිය. මේ යුගයේදී ලංකා සම සමාජ පක්ෂයට සම්බන්ධ ස්ත්‍රීහු ද, සංවිධානාත්මකව සමාජ සුභසාධන හා දේශපාලන කටයුතුවල නිරත වූහ. එහෙත් ඉන්දියානු ස්ත්‍රීවාදී ව්‍යාපාරය හා සසඳද්දී ශ්‍රී ලංකාවේ ශක්තිමත් සමාජ ව්‍යාපාරයක් ලෙස තවමත් ස්ත්‍රීවාදය ව්‍යාප්ත වී නැත. නමුත් 1970 ගණන්වල ජාත්‍යන්තර අවදිවීම් හමුවේ බලපෑම් කණ්ඩායමක් ලෙස ඉදිරියට විත් ස්ත්‍රීන්ගේ තත්ත්වය නගා සිටුවීමේලා, යම් යම් අංශවල නීති හා ප්‍රතිපත්ති සම්පාදනයට සැහෙන බලපෑමක් කිරීමට එය සමත් වී ඇත. සර්වජන ඡන්ද අයිතිය, වෙනත් දේශපාලන අයිතිවාසිකම්, සමාන අධ්‍යාපනයක් ලැබීමේ අයිතිය, සම වේතන, විධායක හා තාක්ෂණ මට්ටමේ රැකියා අයිතිය, ප්‍රසූත නිවාඩු හා පවුලේ දේපළ සම්බන්ධ අයිතිවාසිකම් ආදිය සම්බන්ධයෙන් ඉන්දියානු ස්ත්‍රීවාදී ව්‍යාපාරය තරමටම ක්‍රියාශීලීව කටයුතු කර නැතත් එය යම් මෙහෙයක් ඉටුකර ඇත. අධ්‍යයන සමීක්ෂණ හා වැඩමුළු මගින් සමාජය දැනුවත් කිරීම, ස්ත්‍රීන්ට අදාළ විවිධ ප්‍රතිපත්ති සම්පාදනයේදී ආණ්ඩුවට බලපෑම් කිරීම, දේශපාලන පක්ෂවල ප්‍රතිපත්ති ප්‍රකාශනවලට ස්ත්‍රීන් හා සම්බන්ධ කරුණු ඇතුළත්



කිරීම, පෙළපාලි, උද්ඝෝෂණ, වෘත්තීය හා වෙනත් වැඩසටහන් මගින් අදාළ අංශවලට බලපෑම් කිරීම හා අධ්‍යයන ක්ෂේත්‍රවලට ස්ත්‍රී අධ්‍යයනය හඳුන්වා දීම වැනි දෑ ඒ අතරින් ප්‍රමුඛ වේ.

මෑතකාලීනව ස්ත්‍රී ලිංගික අතවරවලට එරෙහිව ක්‍රියාත්මක වූ නීති ප්‍රතිසංස්කරණය කිරීමට, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට එරෙහි නීති සම්පාදනයට නිදහස් වෙළඳ කලාප හා ඇඟළුම් කර්මාන්ත ශාලාවල සේවයේ නියුක්ත ස්ත්‍රීන් හා සංක්‍රමණික සේවක ස්ත්‍රීන්ගේ තත්ත්වය නගා සිටුවීම සඳහා අදාළ ප්‍රතිපත්ති සම්පාදනයටද ශ්‍රී ලාංකික ස්ත්‍රීවාදී සංවිධාන කීපයක් බලපෑම් කර ඇත. විශේෂයෙන් පළාත් පාලන ආයතනවල ස්ත්‍රී නියෝජනය වැඩිකිරීම සඳහා පංගු ක්‍රමයක (quota system) අවශ්‍යතාව ආණ්ඩුවට අවධාරණය කිරීම මගින් තීරණ ගැනීමේ ව්‍යුහය තුළ ස්ත්‍රී නියෝජනය වැඩි කිරීමට ද මෙම සංවිධාන බලපෑම් කරමින් සිටියි.

දකුණු ආසියාවේ අනෙක් රටවල් හා සසඳද්දී, ශ්‍රී ලාංකික ස්ත්‍රීන්ගේ සමාජ, ආර්ථික, අධ්‍යාපන තත්ත්වයන් ඉහළ මට්ටමක පවතී. එයට මූලික හේතුව නීතිමය වශයෙන් ශ්‍රී ලාංකික ස්ත්‍රියට සමාජ, දේශපාලන හා ආර්ථික අයිතිවාසිකම්, පුරුෂයාට සමාන අයුරින් හිමිවීමයි. නමුත් ස්ත්‍රීන් හා පුරුෂයින්ගේ තත්ත්වය හා එකිනෙකාට හිමි ඉඩ ප්‍රස්ථා අතර පරතරයක් නැතැයි එයින් අදහස් නොකෙරේ. එබඳු පරතරයක්, වෙනත් දකුණු ආසියාතික රටවලට වඩා අඩුවෙන් ශ්‍රී ලංකාව තුළ දක්නට ඇත. මෙම පරතරය පිරවීමට නම් පුළුල්, ශක්තිමත්, එක්සත්, බිම් මට්ටම දක්වා ව්‍යාප්ත වූ ස්ත්‍රීවාදී ව්‍යාපාරයක් නිසැකවම අවශ්‍ය වේ. ශ්‍රී ලාංකික ස්ත්‍රියට නීතිමය අයිතිවාසිකම් හිමි වුවත්, ප්‍රායෝගික වශයෙන් ඇයට පුරුෂයාට සමාන අයුරින් කටයුතු කිරීමට ඉඩ නොලැබෙන්නේ මූලික හේතු කීපයක බලපෑම නිසයි. ශ්‍රී ලාංකික සමාජයේ පවතින සම්ප්‍රදායික ආකල්ප ඒ අතුරින් ප්‍රමුඛ වේ. "ස්වාභාවික ස්ත්‍රී-පුරුෂ ශ්‍රම විභජනය" පිළිබඳ පුරුෂයින් මෙන්ම බොහෝ ස්ත්‍රීන්ද සැලකිලිමත් වේ. පවුල හා වෙනත් සමාජ ආයතන තුළ සමාජානුයෝජන ක්‍රියාවලිය සිදුවන්නේද ඒ ආකල්ප හා විශ්වාස පදනම් කරගෙනය. ස්ත්‍රීන් අධ්‍යාපන හා ආර්ථික ක්ෂේත්‍රවල පුරුෂයන් හා සමව නියෝජනය වුවත්, තීරණ ගන්නා මට්ටම්වලදී ඔවුන් ප්‍රමාණවත් අයුරින් නියෝජනය නොවේ. එසේම ඡන්දයෙන් තෝරාගන්නා නියෝජිත ආයතනවලද ස්ත්‍රී නියෝජනය, දකුණු ආසියාවේ අනෙක් සෑම රටකටම වඩා අඩු මට්ටමක පවතී. මෙම බාධක කීපය මැඩලීමේදී ශක්තිමත් ස්ත්‍රීවාදී ව්‍යාපාරයක අවශ්‍යතාව වැදගත් ලෙස දැනෙනු ඇත.

අනෙකුත් නව රාජ්‍යයන්ට සමානව ශ්‍රී ලංකාවේද බොහෝ දේශපාලන, ආර්ථික හා සමාජ වෙනස්කම් සිදුවී ඇත්තේත්, දැනට සිදුවෙමින් පවතින්නේත්, බටහිර සංකල්ප හා ක්‍රමවේදයන් පදනම් කරගෙනය. යටත්විජිත පාලන කාලයට පෙර හා ඒ කාලය තුළදීත් ශ්‍රී ලංකාවේ පැවති වැඩවසම් දේශපාලන ක්‍රම වෙනුවට අද ඇත්තේ බටහිර ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයකි. පාර්ලිමේන්තු කැබිනට් ක්‍රමයේ මෙන්ම ජනාධිපති ආණ්ඩු ක්‍රමයේ අත්දැකීම්ද ශ්‍රී ලංකාව ලබා ඇත. බටහිර දේශපාලන ආයතන, පරිපාලන ක්‍රම, අධ්‍යාපන ක්‍රම, තාක්ෂණය, ආර්ථික වැඩපිළිවෙලවල් මෙන්ම බටහිර සංස්කෘතිය, විදේශීය භාෂාවන්, සාහිත්‍යය, ඇඳුම්-පැළඳුම්, ආහාර-පාන, සිරිත්-විරිත් පවා ශ්‍රී ලාංකික සමාජය වෙත උරාගෙන තිබේ. එබඳු පරිසරයකදී ස්ත්‍රීවාදය පමණක් බටහිර සංකල්පයක් යැයි සිතා බැහැර කිරීම තර්කානුකූල නොවේ. ස්ත්‍රී-පුරුෂ සම සාධාරණත්වයෙන් යුත්, සමාජයේ සැම ජන කොටසකගේම අවශ්‍යතා හා අදහස් මැනවින් නියෝජනය වන ආකාරයේ, සැමටම සිය අයිතිවාසිකම් නිදහස්ව භුක්ති විඳිය හැකි විධියේ සමාජයක් ශ්‍රී ලංකාවට අවශ්‍යය. එම කාර්යය සඳහා සැලෙන මෙහෙයක් ඉටු කිරීමට අනිවාර්යයෙන්ම පුළුල් ස්ත්‍රීවාදී ව්‍යාපාරයකට හැකියාවක් ඇත. සමාජයේ එක් කණ්ඩායමකට නිසිමය අයිතිවාසිකම් පමණක් හිමිවේ නම්, එම කොටස පවතින තත්ත්වය පිළිබඳ තෘප්තිමත් නොවේ. එසේම සැම සංවර්ධන ක්‍රියාදාමයකදීත් ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයම සහභාගී කර නොගන්නේ නම් එය ශ්‍රී ලංකාව වැනි රටක මූලික සංවර්ධන අරමුණ වූ තිරසාර සංවර්ධනයට ප්‍රබල බාධාවකි. තීරණගන්නා මට්ටම්වලදීත් ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයේම සක්‍රිය සහභාගීත්වය අවශ්‍යය. සත්‍ය සහභාගී ප්‍රජාතන්ත්‍රවාදයක් මෙන්ම මුල්බැස ඇති මානව වාර්ගික අර්බුදය විසඳා තිරසාර සාමයක් උදාකර ගැනීම සඳහාත් අනිවාර්යයෙන්ම, සමාජයේ සැම කොටසකගේම දායකත්වය අවශ්‍යය.

මෙම අරමුණු ඉටුකරගැනීමේලා, මූලික අංග දෙකකින් බලපෑම් කළ හැකිය. පළමුව, ස්ත්‍රීන්ගේ තත්ත්වය නගා සිටුවීමට අදාළ රාජ්‍ය ප්‍රතිපත්ති සඳහා, ශක්තිමත් ස්ත්‍රීවාදී ව්‍යාපාරයක් විසින් අදට වඩා වැඩි බලපෑමක් කළයුතු වේ. දෙවනුව පීතෘමූලික ආකල්ප හා විශ්වාස වෙනස්කොට, ස්ත්‍රී-පුරුෂ සම සාධාරණත්වය පිළිබඳ දැනුවත් කිරීම තුළින්, දැනට වඩා ස්ත්‍රීන් පිළිබඳ ධනාත්මක සිතුවිලි ව්‍යාප්ත කළ යුතු වේ. අධ්‍යාපන ආයතන, මාධ්‍ය, සමාජ හා දේශපාලන සංවිධාන ආදිය මගින් මෙම ආකල්පමය වෙනස සඳහා මූලිකත්වය ගත හැකිය. ආර්ථික දේශපාලන හා සමාජීය



ප්‍රශ්න ගණනාවකට දැනට මුහුණ දී තිබෙන ශ්‍රී ලංකාව, එම තත්ත්වයෙන් මුදවා ගැනීමට නම් ශක්තිමත් සිවිල් සමාජයක් අවශ්‍යය. ජනගහණයෙන් අඩක් වන ශ්‍රී ලාංකික ස්ත්‍රීන්ට, පුළුල් හා ශක්තිමත් ස්ත්‍රීවාදී ව්‍යාපාරයක් ගොඩනැගිය හැකිනම්, ස්ත්‍රීන්ගේ තත්ත්වය නගා සිටුවීමට පමණක් නොව, ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික හා දේශපාලන ප්‍රශ්න රාශියකට විසඳුම් සොයා ගැනීමටත් එය රුකුලක් වනු ඇත.

# 13

## සියලුම ස්ත්‍රීන් ස්ත්‍රීවාදීන්ද?

ස්ත්‍රීවාදියෙකු සතු විශේෂ ලක්ෂණ කිපයක් වේ. ස්ත්‍රී-පුරුෂ සමාජ අසමානත්වය නැතිනම්, ස්ත්‍රියට හිමි අප්‍රධාන තත්ත්වය පිළිබඳව විග්‍රහය සහ නිවැරදි අවබෝධය ඉන් ප්‍රමුඛ වේ. එම අසමානත්වය දුරුකර, ස්ත්‍රී නිදහස දිනාගැනීම පිළිබඳ විශ්වාසය ස්ත්‍රීවාදියකුගේ අරමුණ විය යුතු අතර, මේ සඳහා විධිමත් වැඩ පිළිවෙලක් අනුගමනය කළ යුතුය. ස්ත්‍රීවාදය ශක්තිමත් ව්‍යාපාරයක් බවට පරිවර්තනය කිරීම සඳහා මෙම දැනුවත් භාවය සහිත අනුගාමිකයින්, සංවිධානාත්මකව එක්රැස් කිරීමද කළ යුතු වේ. එහිදී ක්‍රියාශීලී නායකත්වයක්, පැහැදිලි අරමුණු හා ප්‍රතිපත්ති මත කටයුතු කළ යුතු වේ. මේ අනුව ස්ත්‍රියක් ලෙස ඉපදීම නිසාම යමෙකු ස්ත්‍රීවාදියෙකු වේ යැයි තර්ක කළ නොහැකිය. එසේම ස්ත්‍රීන්ට හිමි අප්‍රධාන තත්ත්වය පිළිබඳ දැනුවත් භාවය තිබූ පමණින් ස්ත්‍රියක්, ස්ත්‍රීවාදියෙකු ලෙස සැලකෙන්නේද නැත. පවතින ජීවිත තත්ත්වය පිළිබඳ සමාජය දැනුවත් කොට, මෙම අවබෝධය ඇතියවුන් ඒකරාශී කොට, ස්ත්‍රීන්ගේ විමුක්තිය ළඟා කර ගැනීමේ අරමුණින් ක්‍රියාත්මක වන ස්ත්‍රීන්, ස්ත්‍රීවාදීන් ලෙස සැලකිය හැකිය.

පුරුෂයින් ස්ත්‍රීවාදීන් ලෙස සැලකිය හැකිද යන ප්‍රශ්නය නිරන්තරයෙන් නැගෙන්නකි. ස්ත්‍රීවාදීහු මේ පිළිබඳව දෙආකාරයක අදහස් දක්වති. එක් කොටසකට අනුව, ස්ත්‍රීවාදය පදනම් වී ඇත්තේ ස්ත්‍රීන්ගේ තත්ත්වය හා ඔවුන් මත වන පීඩනය සම්බන්ධයෙන් ලබන අත්දැකීම් මතය. පුරුෂයින්ගේ අත්දැකීම් ස්ත්‍රීන්ගේ අත්දැකීම්වලට වඩා බෙහෙවින් වෙනස්ය. එහෙයින් එම පදනමෙන් තොරව පුරුෂයෙකුට ස්ත්‍රීවාදියෙකු විය නොහැකිය. එහෙත් ස්ත්‍රීවාදී ව්‍යාපාරයට සහයෝගය දැක්වීමට ඕනෑම පුරුෂයෙකුට හැකිය. අනෙක් මතය අනුව ස්ත්‍රීන්ට හිමි අප්‍රධාන තත්ත්වයට වගකිව යුත්තේ පීතෘමූලික සමාජයයි. එය වෙනස් කිරීමේ වගකීම ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයටම පැවරේ. එහෙයින්, ස්ත්‍රීන්ට ලැබෙන අත්දැකීම් නොමැති වුවද, පුරුෂයින්ටත් ස්ත්‍රීවාදී අදහස් දැරීමට හා ස්ත්‍රී විමුක්තිය වෙනුවෙන් ක්‍රියා කිරීමට හැකිය. සමස්ත සමාජයේ වෙනසක් නොකර, ස්ත්‍රීන්ගේ තත්ත්වයේ පමණක් වෙනසක් සිදු නොවේ. එම සමාජ වෙනස සඳහා, ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයම එකමුතුව, සංවිධානාත්මකව කටයුතු කළ යුතුය.

# 14

## ස්ත්‍රීවාදී අදහස් ව්‍යාප්ත කළ යුත්තේ ඇයි?

නූතන සමාජ, දේශපාලන න්‍යායයන් අතර ස්ත්‍රීවාදය නවක සංකල්පයකි. එය සමාජයේ සැමදෙනාම එකම ආකාරයකින් පිළිනොගන්නක් වන්මුත් සමාජ දේශපාලන කතිකාවෙහි බහුලව සාකච්ඡාවට බඳුන් වන, පිළිගැනෙන සංකල්පයක් බවට පත්වෙමින් තිබේ. විවිධ ප්‍රවේශ ගණනාවක් සහිත, සංකීර්ණ සංකල්පයක් වුවත්, එදිනෙදා පරිපාලනයේදී, රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේදී, මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමේදී, සංවර්ධන සැලසුම් සැකසීමේදී මෙන්ම පංති කාමරයේදීත් එය භාවිත වන තත්ත්වයකට පත්ව ඇත. සමාජයෙන් සමාජයට මෙම භාවිතයේ ප්‍රමාණය මෙන්ම, ස්ත්‍රීවාදයෙන් සිදුවූ බලපෑමද අනිවාර්යයෙන්ම වෙනස්ය. මෙම සංකල්පය මුලින්ම ව්‍යාප්ත වූ බටහිර යුරෝපය හා උතුරු ඇමෙරිකාවේ ස්ත්‍රීන්ගේ තත්ත්වය, වසර සියයකට පෙර තිබූ තත්ත්වයට වඩා අද විශාල වශයෙන් වෙනස් වී ඇත. එයට සාපේක්ෂව, දියුණු වෙමින් පවත්නා රටවල ස්ත්‍රීවාදයේ භාවිතය අවම වේ. එමෙන්ම ස්ත්‍රීවාදයේ බලපෑමෙන්, ස්ත්‍රී ජීවිතවල සිදුවී ඇති වෙනසද සාපේක්ෂව අඩු මට්ටමක පවතියි. එහෙත් පොදුවේ මෙම සංකල්පයෙන් විවිධ ක්ෂේත්‍රවලට සිදුවූ මෙහෙය සලකා බැලීමෙන්, එය ව්‍යාප්ත කළ යුත්තේ ඇයි යන පැණයට සරල පිළිතුරක් සැපයිය හැකිය.

ස්ත්‍රීවාදයෙන් සිදුවූ ප්‍රධාන බලපෑමක් නම්, සම්ප්‍රදායික සමාජ, දේශපාලන න්‍යායයන්හි පැවති පුරුෂ කේන්ද්‍රීය ස්වභාවයට අභියෝගයක් එල්ල කිරීමය. ස්ත්‍රීවාදයේ සම්භවයට පෙර, ලොව පැවති සැම සමාජ දේශපාලන න්‍යායයක්ම පුරුෂ කේන්ද්‍රීයව ඉදිරිපත් කර ඇති අතර, එක්කෝ ස්ත්‍රීන් එමගින් අවතක්සේරු කර ඇත. නැතිනම් සිතාමතාම ඉවත්කර ඇත. එම න්‍යායයන් පුරුෂයින්ගේ අත්දැකීම් මත, පුරුෂයින් සම්බන්ධයෙන්, පුරුෂයින් විසින්ම නිර්මාණය කරන ලද දෑ වුවත් ඒවා පොදු න්‍යායයන් ලෙස ඔවුන් විසින්ම සාධාරණීකරණය කරනු ලැබිණි. පීතෘමූලික සමාජය ස්ත්‍රීන් ගෘහස්ථ ක්ෂේත්‍රයට සීමාකොට තබා, පුරුෂයින් වරප්‍රසාද සහිත කණ්ඩායමක් ලෙස ආරක්ෂා කරගැනීමට, මෙම න්‍යායයන් මැනවින් භාවිත කළේය. බොහෝ සම්ප්‍රදායික සමාජ, දේශපාලනික න්‍යායයන්, ස්ත්‍රිය අර්ථකථනය කළේ පුරුෂයාට උදව් හා සේවා සපයන, සතුට සලසන, දරුවන් රැකබලා ගන්නා නෑනෑත්තියක ලෙසය. ග්‍රීක- දේශපාලන න්‍යායයන් තුළ ප්ලේටෝ සහ

ඇරිස්ටෝටල් පවා මේ මතය අවධාරණය කළේය. ඇරිස්ටෝටල්ට අනුව තාර්කික බව වනාහි ලොකු තුළ ජීවමාන නොවේ. ස්ත්‍රිය තුළ එය ක්‍රියාත්මක විය නොහැක. දරුවකු තුළ එය සංවර්ධනය වී නොමැත. මේ නිසා ස්ත්‍රීන් රැක බලා ගත යුතු හා පාලනය කළ යුතු කොටසක් ලෙසට ඔහු අවධාරණය කළේය. ශාන්ත ඔගස්තීන් ද මීට සමාන අයුරින් ස්ත්‍රිය දෙවැනි ගණයේ මිනිස් ජීවියෙකු බව පෙන්වා දුනි. ඔහුට අනුව, ස්ත්‍රිය මානසික වශයෙන් ස්ථාවර නැත. ඇගේ අඩු මානසික හැකියාව හා ශාරීරික සුවයට ඇති වැඩි කැමැත්ත සොබා දහමට සම්බන්ධ දෙයකි. ඔහුට අනුව පුරුෂයා දෙවියන් වහන්සේගේ ප්‍රතිරූපයකි.

ජීන් ජැක්විස් රූසෝ, ස්ත්‍රිය ගැන මීට වඩා තරමක් වෙනස් අදහස් අවධාරණය කළ අතර එමගින් ස්ත්‍රිය එතරම් පහත් තත්ත්වයකට ඇද දැමීමේ නැත. එම අදහස් තුළින් ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයම අගය කළත් ස්ත්‍රිය, පුරුෂයාට වඩා වෙනස්ය යන්න අවධාරණය කෙරිණි. ඔහුට අනුව පුරුෂයා පරිපූර්ණ මිනිස් ජීවියෙකි. එහෙත් ස්ත්‍රිය ඔවුන්ගෙන් වෙනස් අයෙකි. ස්ත්‍රීන්ට අධ්‍යාපනයක් ලබාදිය යුත්තේ පුරුෂයින් සතුටු කිරීම සඳහාය යන්න රූසෝ අවධාරණය කළේය.

බොහෝ සමාජ දේශපාලන න්‍යායයන්ගෙන්, ස්ත්‍රිය පොදු ක්ෂේත්‍රයට පිටතින් තැබීමට උත්සාහ ගන්නා පමණක් නොව, ඇය අතාර්කික, හැකියාවන්ගෙන් හීන, පොදු ක්ෂේත්‍රයට විෂයීගත නොවන තැනැත්තියක ලෙසද අවධාරණය කෙරිණි. මෙම පුරුෂ කේන්ද්‍රීය ස්වභාවයට අභියෝගයක් එල්ල කිරීම ස්ත්‍රීවාදයෙන් සිදුවූ විශාලම සේවයයි. දිගු කලක් එම න්‍යාය-යන්ගෙන් අර්ථකථනය වූ දෑ "සත්‍යය" ලෙස පිළිගත් සමාජයට ඒවායේ ඇති ඒක පාර්ශ්වීය ස්වභාවය වටහා දෙන ලද්දේ ස්ත්‍රීවාදය විසිනි. ස්ත්‍රියද පුරුෂයාට සමාන ජීවියෙකු බවත්, කවර ශාරීරික වෙනස්කම් සහිතව ඇය ඉපදුනත් ඒවා මත ස්ත්‍රිය වෙනස් කොට සැලකීම සාධාරණ නොවන බවත්, එබඳු ශාරීරික වෙනස්කම් තිබුණද, ඇය තාර්කික, පොදු කටයුතුවලට සහභාගි වීමේ හැකියාව ඇති තැනැත්තියක බවත් ස්ත්‍රීවාදයෙන් අවධාරණය කෙරිණි. එනිසා බොහෝ කලක් විකාශනය වූ සමාජ දේශපාලන න්‍යායයන්ගේ ස්වරූපය අභියෝගයට ලක් වූවා පමණක් නොව, ස්ත්‍රියගේ අත්දැකීම් මත, ඇය සම්බන්ධව, ඇය විසින්, ඇයගේ විමුක්තිය අරමුණු කරගත් න්‍යායයන් නිර්මාණය වීමද සිදුවිය. එහෙයින් ලොව ජනගහණයෙන් අඩක් පමණක් පිළිබඳව මෙතෙක් පැවති සමාජ, දේශපාලන න්‍යායයන්ට ස්ත්‍රීවාදය එක් කිරීමෙන් එහි පැවති විශාල අඩුවක් පිරිමැසිනි.



ස්ත්‍රීවාදය ශාස්ත්‍රීය හා අධ්‍යයන ක්ෂේත්‍රවලටද බලපෑමක් ඇති කළේය. ස්ත්‍රීවාදී අධ්‍යයන, මුල් කාලයේදී බටහිර රටවලට සීමා වුවත්, අද බටහිර නොවන සෑම රටකම පාහේ එය ව්‍යාප්ත වී ඇත. පාසැල්, විශ්ව විද්‍යාල වෙනත් උසස් අධ්‍යාපන ආයතනවල පංති කාමර තුළ ඉගැන්වෙන විෂයයක් බවට එය පත්වී ඇත. ස්ත්‍රීවාදී අධ්‍යයන සාහිත්‍යය එම ව්‍යාපාරයේ මූලික හස්තය බවට පත්වී ඇත. ඉතිහාසය, සාහිත්‍යය, සමාජ විද්‍යාව, දේශපාලන විද්‍යාව, මානව විද්‍යාව වැනි විෂයයන් තුළට පමණක් නොව කළමනාකරණය හා ඉංජිනේරු තාක්ෂණය වැනි විෂයයන්ටත් ස්ත්‍රීවාදී ප්‍රවේශ අන්තර්ගත වෙමින් පවතී. ස්ත්‍රීවාදී සමීක්ෂණ හා වාර්තා ආදිය මගින් ලොව පුරා සිටින ස්ත්‍රීන්ගේ අත්දැකීම්, ඔවුන් මත වන පීඩනය පිළිබඳ විවිධ දෘෂ්ටීන්ගෙන් ලියැවුණු තොරතුරු ප්‍රකාශයට පත්වී ඇත. මෙම තොරතුරු හා ඒ ඒ සමාජවල ස්ත්‍රී විමුක්තිය සඳහා භාවිත කෙරුණු විවිධ උපක්‍රම, ස්ත්‍රීන්ට හුවමාරු කරගත හැකි තත්ත්වයක් උදාවී ඇත. මේ නිසා එක් අංශයකින් ස්ත්‍රියගේ තත්ත්වය පිළිබඳ, පෙරට වඩා යම් දැනුමක් සමාජයට ලබා ගැනීමේ හැකියාව වැඩි වී ඇත. අනෙක් අතට මෙතෙක් පැවති පුරුෂ කේන්ද්‍රවාදී අධ්‍යයන ප්‍රවේශ සහ විෂය මාලාවන් ද සැලෙන වෙනසකට බඳුන් වී ඇත.

ස්ත්‍රීවාදයෙන් සිදුවූ ප්‍රායෝගික බලපෑම් අතර වඩාත් වැදගත් වන්නේ, එය දේශපාලන ලෝකයට, තීරණ ගන්නා ක්ෂේත්‍රවලට හා පරිපාලන අංශවලට කර ඇති බලපෑමයි. මෙම බලපෑම් නිසා බොහෝ සංවර්ධිත බටහිර රටවල ස්ත්‍රී හිතකාමී පරිසරයක් දේශපාලන හා පරිපාලන ක්ෂේත්‍රය තුළ බිහිවිය. ස්ත්‍රීන්ගේ තත්ත්වය නගා සිටුවීමට අදාළ නීති හා ප්‍රතිපත්තිවලට මූලිකත්වයක් හිමිවිය. දේශපාලන නියෝජන ආයතන හා වෙනත් තීරණ ගන්නා මට්ටම්වලට පෙරට වඩා වැඩි ස්ත්‍රීන් සංඛ්‍යාවක් අන්තර්ගත කෙරිණි. සංවර්ධිත ක්‍රියාදාමයට ස්ත්‍රීන් සම්බන්ධ කර ගැණිනි. පුරුෂයින් හා සමාන තත්ත්වයට, මේ රටවල ස්ත්‍රීන් පැමිණ නැතත්, අඩු දියුණු රටවල ස්ත්‍රීන්ගේ තත්ත්වයට සාපේක්ෂව ඔවුන් ඉදිරියෙන් සිටි. ස්වීඩනය, නෝර්වේ, නෙදර්ලන්තය හා ෆින්ලන්තය වැනි ස්කැන්ඩිනේවියානු රටවල ස්ත්‍රීන්ගේ තත්ත්වය ප්‍රමාණාත්මක හා ගුණාත්මක වශයෙන් බොහෝ ක්ෂේත්‍ර තුළ ඉහළ මට්ටමක පවතින අතර, ජාතික පාර්ලිමේන්තුවල ඔවුන්ගේ නියෝජනය 33%-45% අතර ප්‍රමාණයක් ගනී. සම වේතන, ප්‍රසූත නිවාඩු, දරුවන් වෙනුවෙන් ලබා ගන්නා මව්-පිය නිවාඩු, දාරකාගාර, දරුවන්ගේ අධ්‍යාපනය වැනි දෑ සම්බන්ධයෙන් පහසුකම්, ආදිය මේ රටවල් විසින් හඳුන්වා දෙනු ලැබ ඇත. එම වෙනස ඇති කිරීමට ස්ත්‍රීවාදය විශාල බලපෑමක් කර තිබේ.

ස්ත්‍රීවාදී ව්‍යාපාරයේ විකාශනය දෙස බැලූ විට එයින් සිදු වූ බලපෑම වඩාත් පුළුල් ලෙස අවබෝධ කරගත හැකිය. ලිබරල්වාදී, මාක්ස්වාදී, සමාජවාදී, රැඩිකල්, පශ්චාත්-නූතනවාදී, පශ්චාත්-ව්‍යුහවාදී හා තුන්වෙනි ලෝකයේ ස්ත්‍රීවාදයන් යන සියල්ලෙන්ම පොදුවේ අවධාරණය කළේ, ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව හෝ සම-සාධාරණත්වය, ස්ත්‍රී අයිතිවාසිකම්, ස්ත්‍රීන්ගේ ප්‍රගතිය, නවීකරණය, සංවර්ධනය හා ඔවුන් බලගැන්වීම ආදී සංකල්ප පිළිබඳවය. මෙම අදහස් බටහිර රටවල පමණක් නොව, මුළු ලෝකයේම ස්ත්‍රී ජීවිත වෙනස් කිරීමට විශාල බලපෑමක් කර ඇත. අඩ සියවසකට පෙර ජීවත් වූ මට්ටමට වඩා සැහෙන මට්ටමකින් වෙනස් තත්ත්වයක, අද ස්ත්‍රීහු ජීවත් වෙති. පළමු රැල්ලේ ස්ත්‍රීවාදී ව්‍යාපාරය නිසා ඡන්ද බලය ඇතුළු දේශපාලන අයිතිවාසිකම්, අධ්‍යාපනය ලැබීමේ අයිතිය සහ රැකියාවක නිරතවීමේ අයිතිය හා සම්බන්ධ බොහෝ වරප්‍රසාද ස්ත්‍රීන්ට හිමිවිය. බටහිර රටවල ස්ත්‍රීවාදී ව්‍යාපාර, එම අයිතීන් සඳහා සටන් නොකළේ නම් අද ස්ත්‍රියගේ තත්ත්වය මීට වඩා වෙනස් වීමට ඉඩ තිබිණි. දහනව වන සියවසේ දෙවැනි භාගයේ ඇරඹුන මෙම ව්‍යාපාරයේ බලපෑම නිසා නව රාජ්‍යවල ස්වාධීනත්වයත් සමඟ, ස්ත්‍රීන්ටද දේශපාලන අයිතීන් ලබා ගැනීමේ වරම හිමි විය. 1960 ගණන්වල ව්‍යාප්ත වූ දෙවැනි රැල්ලේ ස්ත්‍රීවාදී ව්‍යාපාරයෙන්, පීතෘමූලිකත්වය හා ධනේශ්වර සමාජය නිසා පීඩිත තත්ත්වයට පත්වන ස්ත්‍රීන්ගේ ප්‍රශ්න පිළිබඳ ආමන්ත්‍රණය කෙරිණි. පීතෘමූලික සමාජ සංස්ථා, ආකල්ප සහ ධනේශ්වර අර්ථ ක්‍රමය මුළුමනින්ම වෙනස් කිරීමට ඔවුන් අසමත් වූවත් ඒවාට යම් මානුෂික මුහුණුවරක් දී, ස්ත්‍රී-හිතකාමී පරිසර බිහිකිරීමට එම ව්‍යාපාරය බලපෑම් කළේය. විශේෂයෙන්ම රැකියා ස්ථානවලදී ස්ත්‍රියට සම වේතන, වෙනත් පහසුකම්, ලිංගික අතවර හා වෙනස්කම්වලින් තොර තත්ත්වයක් ලබාගැනීමට අවශ්‍ය නීතිමය පදනම මේ නිසා සැකසිණි. ස්ත්‍රී අවශ්‍යතා, පොදු ක්ෂේත්‍රයේදී සැලකිල්ලට ගැනීමෙහි පටන් ප්‍රසූත නිවාඩු, දාරකාගාර පහසුකම්, සෞඛ්‍ය හා සුභසාධන සේවා සහ දිළිඳු ස්ත්‍රීන්ගේ තත්ත්වය නගා සිටුවීම ආදිය දක්වා ප්‍රතිපත්ති තීරණ ගන්නන්ගේ අවධානය යොමු කෙරුණේ මූලික වශයෙන් මෙම බලපෑම් නිසයි.

එසේම ස්ත්‍රීන්ගේ ප්‍රජනන කාර්යය පාලනය කිරීම සම්බන්ධයෙන් මෙම ව්‍යාපාරය විශාල බලපෑමක් කළේය. උපත් පාලන ක්‍රම භාවිතය, ඒවා පිළිබඳ සමාජය දැනුවත් කිරීම, බටහිර රටවල පමණක් නොව ලොව පුරාම සිදුවිය. විශේෂයෙන්ම දිළිඳු රටවල සංවර්ධනය හමුවේ වූ විශාල ගැටළුවකට මේ නිසා යම් තරමක විසඳුමක්ද ලැබුණි. පවුලේ දේපළ පිළිබඳ අයිතිය, විවාහය හා දික්කසාද සම්බන්ධ අයිතීන් හා ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට එරෙහි



නීති වැනි දෑ රාජ්‍යයන් විසින් පිළිගනු ලැබුවේද ස්ත්‍රීවාදීන්ගේ බලපෑම මත වේ. බටහිර රටවල ප්‍රමාණයටම, ස්ත්‍රීන් හා පුරුෂයින් අතර සම සාධාරණත්වය ස්ථාපිත කිරීමට බටහිර නොවන රටවල් සමත් නොවූවත්, යම් තරමකට එම රටවල ස්ත්‍රීන්ගේ තත්ත්වය නගා සිටුවීමට එය හේතුවිය. 1990 ගණන්වල තුන්වැනි රැල්ලේ ස්ත්‍රීවාදී ව්‍යාපාරය, පශ්චාත් නූතනවාදී, පශ්චාත් ව්‍යුහවාදී, පශ්චාත් යටත්විජිතවාදී අදහස් සමඟ බද්ධ වන අතර, එයින් පෙරට වඩා නව රාජ්‍යවල ස්ත්‍රීන්ගේ තත්ත්වය පිළිබඳ සැලකිල්ල යොමුවිය. බටහිරට වෙනස්ව, විවිධ සමාජ, ආර්ථික, සංස්කෘතික හා දේශපාලනික හේතු නිසා වැඩි පීඩනයකට ලක්වන ස්ත්‍රීන් ගැන වෙනස් වූ දෘෂ්ටිකෝණවලින් විස්තර කිරීමට මේ නිසා හැකිවිය. එසේම ඒ ඒ වෙනස් පරිසර තුළදී වෙනස් ක්‍රමවේද භාවිත කරමින් ස්ත්‍රීන්ට බලපාන ගැටළු විසඳීමේ ප්‍රයත්නයක්ද තුන්වැනි රැල්ලේ ස්ත්‍රීවාදී ව්‍යාපාරයෙන් ප්‍රකාශ වේ. නව රාජ්‍යවල ස්ත්‍රීන්ගේ තත්ත්වය නගා සිටුවීමට, ඔවුන් සංවර්ධනය කිරීමට හා දේශපාලන ප්‍රවාහයන්ට සම්බන්ධ කර ගැනීමට දරන අන්තර්ජාතික හා ජාතික ප්‍රයත්නවලට මෙම බලපෑම් විශාල අනුබලයක් වී ඇත.

සංවර්ධන ක්‍රියාදාමයට ස්ත්‍රීන් අන්තර්ගත කිරීම සම්බන්ධයෙන්ද ස්ත්‍රීවාදය සැහෙන මෙහෙවරක් ඉටුකර ඇත. ස්ත්‍රීන් සම්ප්‍රදායික වශයෙන් ආර්ථික කටයුතුවල නියැලුනත්, ඒවාට ආර්ථික වශයෙන් වටිනාකමක් ලබා දුන්නේ නැත. එසේම සංවර්ධන ප්‍රවාහයට ඔවුන් අන්තර්ගත කිරීම සම්බන්ධයෙන් පැහැදිලි වැඩ පිළිවෙලක් ද නොවුණි. එස්තර් බොසේරප් (Esther Boserup) "Women's Role in Economic Development" ( 1970 ) රචනා කිරීමත් සමඟ, ආර්ථික සංවර්ධනයේදී, ස්ත්‍රී-පුරුෂ ශ්‍රම විභජනය පිළිබඳ වැදගත් විශ්ලේෂණාත්මක කරුණු ප්‍රකාශයට පත්විය. විශේෂයෙන් මේ බලපෑමත් සමඟ, බටහිර රටවල්, ජාත්‍යන්තර සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන හා ආධාර ලබාදෙන ආයතන ආදිය, සංවර්ධන ක්‍රියාදාමයට ස්ත්‍රීන් සම්බන්ධ කර ගැනීම සඳහාත් ඔවුන්ගේ දායකත්වයට සමාන ආර්ථික වටිනාකමක් ලබා ගැනීම සඳහාත් අවශ්‍ය විවිධ උපක්‍රම හඳුන්වා දුනි. එහෙයින් සංවර්ධිත රටවල පමණක් නොව සංවර්ධනය වන්නා වූ රටවලත් සංවර්ධනයේදී ස්ත්‍රීන් කෙරේ අවධානය යොමු කිරීමට පටන් ගැණුනි.

සංවර්ධන අංශයේදීත් විවිධ ස්ත්‍රීවාදී ප්‍රවේශ විවිධ අයුරින් දායක වී ඇත. ලිබරල් ස්ත්‍රීවාදීහු, ලිබරල් ආර්ථික න්‍යායයන් මත එතෙක් පැවති සංවර්ධන ක්‍රියාදාමයන් ප්‍රතිව්‍යුහගත කිරීමට බලපෑම් කළහ. සංවර්ධනය තුළ ස්ත්‍රිය (Women in Development - WID) යන න්‍යායයට අනුව ආර්ථික සංවර්ධනයත් සමඟ ස්ත්‍රියගේ තත්ත්වය, නව නීති-රීති හා අයිතිවාසිකම්

මඟින් නඟාසිටුවීමටත්, ඇයට හා දරුවන්ට අදාළ ශුභ සාධනය සැපයීමටත්, පොදු ක්ෂේත්‍රයේදී සම සාධාරණත්වය ස්ථාපිත කිරීමටත් බලපෑම් කළහ. සමාජවාදී ස්ත්‍රීවාදීහු සංවර්ධනය හා ස්ත්‍රිය (Women and Development - WAD) න්‍යායය මඟින්, ධනවාදයට හා පීතෘමූලිකත්වයට අභියෝග කිරීමටත්, ස්ත්‍රීන් පුරුෂයින් මත ආර්ථික වශයෙන් යැපීමේ තත්ත්වය තුරන් කිරීමටත්, පුරුෂයින් මෙන්ම ස්ත්‍රීන්ද සංවර්ධනයට දායක කර ගැනීමටත් බලපෑම් කළහ. රැඩිකල් ස්ත්‍රීවාදීහු, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා සංවර්ධනය (Gender & Development - GAD) න්‍යායය මඟින්, සංවර්ධන ප්‍රයත්නයේදී ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයම සැලකිල්ලට ගත යුතු බවටත්, මූල්‍ය ප්‍රතිපාදන හා අයවැය සැකසීමේදී පවා මේ දෙපක්ෂයේම අවශ්‍යතා කෙරේ අවධානය යොමුකළ යුතු බවටත් ප්‍රකාශ කළහ. පරිසරවාදී-ස්ත්‍රීවාදීහු, ස්ත්‍රීන්, පරිසරය හා සංවර්ධනය ( Women, Enviorement and Development - WED) න්‍යායය මගින් පුරුෂයින්, ස්ත්‍රීන් හා පරිසරය ඔවුන්ගේ හිතුමතයට අනුව පාලනය කිරීමට, එරෙහි වෙති. එසේම පරිසරය ආරක්ෂා කිරීමට ස්ත්‍රීන්ට ඇති සුවිශේෂී හැකියාව හා අයිතියද ඔවුහු අවධාරණය කරති. ස්ත්‍රීන් කණ්ඩායමක් වශයෙන් පරිසරය හා ස්වාභාවික සම්පත් රැක බලා ගැනීමට ගෙනයන අරගලය තුන්වන ලෝකයේ ස්ත්‍රීවාදී ව්‍යාපාරය විසින්ද අගය කරනු ලබයි. ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයම, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ දැනුවත් කිරීම හා දෙපක්ෂයටම විද්‍යා හා තාක්ෂණ දැනුම ලබා දීමද අත්‍යවශ්‍ය බව ඔවුහු අවධාරණය කරති.

පශ්චාත් නූතනවාදය හා සංවර්ධනය (Post-Modernism and Development-PAD) යන න්‍යායය මගින්, පශ්චාත් නූතනවාදීහු, තුන්වෙනි ලෝකයේ ස්ත්‍රීන් මුහුණ දෙන විශේෂ ප්‍රශ්න සැලකිල්ලට ගතයුතු බව පෙන්වා දෙති. බටහිර රටවල ස්ත්‍රීන් විසින් "අනෙක් කණ්ඩායමක් හෝ අනෙක් අය" ලෙස සලකනු ලබන දිළිඳු රටවල ස්ත්‍රීන් හමුවේ ඇති සමාන මෙන්ම අසමාන ගැටළුවලට, සංවර්ධනය තුළින් විසඳුම් සෙවීමට ඔවුහු බලපෑම් කරති. බටහිර යුරෝපය කේන්ද්‍රගතව සැකසුන, සංවර්ධන සැලසුම් විවේචනයට බඳුන් කරන මොවුහු තෙවැනි ලොව ස්ත්‍රීන් සතු දැනුම හා දේශීය සම්පත් අදාල කරගෙන ස්වීරසාර සංවර්ධනයක් කරා පියමං කළහැකි බවට තර්ක කරති. සම්ප්‍රදායික සංවර්ධන ක්‍රියාදාමය විසින් දිළිඳු රටවල ස්ත්‍රීන්, තව දුරටත් බල විරහිත කරවන බවටද මොවුහු චෝදනා කරති. දිළිඳු රටවල ස්ත්‍රීන්ගේ අනන්‍යතාව, බටහිරට වඩා වෙනස් වුවත්, ඔවුන්ගේ දැනුම, දේශීය ගැටළු හා ඔවුන්ගේ ප්‍රශ්න පිළිබඳ ඇති අවබෝධය, ඒ හරහා ඉදිරිපත් වන ඔවුන්ගේ කටහඬ ඉතා වැදගත් බව මොවුන්ගේ අදහසයි. මෙම ස්ත්‍රීන් වෙනුවෙන්, බාහිර පුද්ගලයින් සංවර්ධන සැලසුම් සකසා



ක්‍රියාත්මක කිරීම අසාර්ථක ප්‍රයත්නයක් බවත්, ඔවුන්ගේ අවශ්‍යතා මත ඔවුන්ටම සැලසුම් ඉදිරිපත් කිරීමට ඉඩප්‍රස්ථා ලබා දීම අත්‍යවශ්‍ය බවත්, පශ්චාත් නූතනවාදී ස්ත්‍රීවාදීන්ගේ මතයයි. තිරසාර සංවර්ධනයක් තුළින්, ස්ත්‍රිය බල ගැන්විය හැක්කේ, ඔවුන්ගේ ම සහභාගීත්වය තුළින් යැයිද ඔවුහු පෙන්වා දෙති. මෙම න්‍යායයන්, විශේෂයෙන් ඉන්දියාව, බංගලාදේශය, සමහර අප්‍රිකානු හා ලතින් අමරිකානු රටවල භාවිත කරන අතර, එම ක්‍රමවේදයට අදාළ සංවර්ධන ව්‍යාපෘති මගින් දිළිඳු ස්ත්‍රීන් විශාල සංඛ්‍යාවකගේ තත්ත්වය නගා සිටුවීමට හැකිවී ඇත.

මේ අයුරින් ස්ත්‍රීවාදයෙන් මෙතෙක් න්‍යායාත්මක හා ප්‍රායෝගික ක්ෂේත්‍රවලට විවිධ බලපෑම් සිදුවී ඇති අතර එය ශ්‍රී ලාංකික ස්ත්‍රියගේ තත්ත්වයේ වෙනසකටද අනිවාර්යයෙන්ම හේතු වී ඇත. ශක්තිමත් හා පුළුල් ස්ත්‍රීවාදී ව්‍යාපාරයක් ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත වී නැතත්, විදේශීය රටවල්, අන්තර්ජාතික සංවිධාන, ආධාර ලබාදෙන ජාත්‍යන්තර ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන ආදියේ බලපෑමෙන්, නීතිමය අයිතිවාසිකම් ගණනාවක් ඇයට හිමි වී ඇත. එහෙත් පුරුෂයින්ට සමාන අයුරින්, අයිතිවාසිකම් භුක්ති විඳිය හැකි පරිසරයක් සියලුම ක්ෂේත්‍රවල දී බිහිවී ඇතැයි මින් අදහස් නොකෙරේ. නමුත් එවැනි ස්ත්‍රී හිතකාමී පරිසරයක් උදාකිරීමට ස්ත්‍රීවාදී ව්‍යාපාරයකට බලපෑම් කළ හැකිය. ඕනෑම දෘෂ්ටිවාදයක්, එය ආරම්භයේදී ව්‍යාප්ත කිරීම හා සමාජ පිළිගැනීමක් ලබා ගැනීම ඉතා දුෂ්කර කාර්යයකි. නමුත් ස්ත්‍රීවාදය සඳහා අවශ්‍ය මග බටහිර මෙන්ම බටහිර නොවන සමහර රටවල් විසින්ද සකසනු ලැබ ඇත. පැහැදිලි අරමුණක් හා ප්‍රතිපත්ති සහිතව, ශක්තිමත් නායකත්වයක් සමග, දකුණු ආසියාවේ ඉන්දියාව වැනි රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාව වැනි රටක ස්ත්‍රීවාදය පුළුල් ව්‍යාපාරයක් ලෙස ව්‍යාප්ත කිරීම පහසුය. සමාජ බහුවිධතාව, භූගෝලීය වශයෙන් සුවිශාලත්වය, දිළිඳුකම, අඩු සාක්ෂරතාව හා සාම්ප්‍රදායික සමාජය වැනි කරුණු සලකා බලද්දී, ඉන්දියානු ස්ත්‍රීවාදී ව්‍යාපාරය හමුවේ ඇති බාධක බොහෝය. එහෙත් තුන්වෙනි ලෝකයේ ස්ත්‍රීවාදී ව්‍යාපාර අතරින් නූතන ඉන්දියානු ස්ත්‍රීවාදී ව්‍යාපාරය ප්‍රමුඛ තැනක් ගනී. ඉන්දියානු ස්ත්‍රියගේ ප්‍රශ්න දෙස දේශීය දෘෂ්ටිකෝණයකින් බලා ඒවාට විසඳුම් සෙවීම, පැහැදිලි අරමුණු සහිතවීම, පුළුල් සමාජ ව්‍යාපාරයක් ලෙස ග්‍රාමීය මට්ටම් දක්වා ව්‍යාප්තවීම, මූලික කරුණු සම්බන්ධයෙන් යම් එකඟත්වයක් තිබීම හා විවිධ ජනවර්ග, ආගමික කණ්ඩායම්, පංති හා ප්‍රදේශ විනිවිදමින් ස්ත්‍රීවාදී අදහස් ගලායාම හා නායකත්වයේ තැපවීම, එරට ස්ත්‍රීවාදී ව්‍යාපාරයේ ශක්තිමත් බවට බලපා ඇති මූලික කරුණු වේ. ශ්‍රී ලාංකික ස්ත්‍රීන්ගේ

තත්ත්වය තවදුරටත් නඟාසිටුවීමට නම්, එබඳු පුළුල්, ජනතාවාදී, ශක්තිමත් ස්ත්‍රීවාදී ව්‍යාපාරයක් අත්‍යවශ්‍යය. එම දේශපාලන බලවේගය නිර්මාණය කිරීමට මානව වර්ග, ආගමික භේද, උගත් නූගත්, ගැමි නාගරික හෝ පංති භේද නොසලකා නිවැරදි අවබෝධයකින්, පැහැදිලි අරමුණක් මත ශ්‍රී ලාංකික ස්ත්‍රීන් සංවිධානය වීම අනිවාර්යයෙන්ම අවශ්‍ය වේ. ඒ සඳහා ශක්තිමත් පදනමක් සකසා ගතහැක්කේ ස්ත්‍රීවාදය පිළිබඳ පැහැදිලි හා නිවැරදි අවබෝධයක් සහිත තත්ත්වයක් තුළ පමණි.

## Bibliography

Acker Joan, (1988) Class, Gender and the Relations of Distribution, Signs, 13:473-497.

Acker Joan, (1990) "Hierarchies, Jobs and Bodies: A Theory of Gendered Organisations", Gender and Society, 4:139-158.

Almquist Elizabeth, M. (1987) "Labour Market Gendered Inequality in Minority Groups", Gender and Society, 1:400-414.

Boserup Esther, (1970) Women's Role in Economic Development, New York: St Martins.

Broverman, I.K. et.al. (1972) "Sex - Role Stereotypes: A Current Appraisal" Journal of Social Issues, 28: 59-78.

Brown Robert, (1991) Human Universals, Philadelphia: Temple University Press.

Chodorow Nancy, (1978) The Reproduction of Mothering: Psychoanalysis and the Sociology of Gender, Berkeley: University of California Press.

Collins Patricia Hill, (1989) The Social Construction of Black Feminist Thought, Signs, 14(4) 745-773.

Connell Robert, W. (1987) Gender and Power, California: Stanford University Press.

Daily Mary, (1978) Gyn/Ecology: The Metaethics of Radical Feminism, Boston: Beacon Press.

De Beauvoir Simone (1988) The Second Sex, (first published in French in 1942 in English in 1953), Harmondsworth: Penguin.

Devor Holly, (1990) Gender Blending, Bloomington: Indiana University Press.

Encyclopedia of Sociology, (1992) Vol. 2, (ed) Edgar F. Borgatta et.al. New York: Macmillan Publishing Company.

Encyclopedia of Women in American Politics, (199) (ed.) Jeffrey D. Schultz and Laura Van Assendelft, Arizona: Oryx Press.

Engles Fredrich, (1948) The Origin of the Family, Private Property and the State, Moscow: Foreign Language Publishing House.

Epstein Cynthia, (1988) Deceptive Distinctions: Sex, Gender and the Social Order, New Haven: Yale University Press.

Foucault Michel, (1980) On Knowledge and Power, New York: Basic Books.

Freud Sigmund, (1975) Three Essays on the Theory of Sexuality, in The Complete Psychological Works of Sigmund Freud - 24 Volumes, Vol. 7, London: Hogarth.

Gilligan Carol, (1982) In a Different Voice: Psychological Theory and Women's Development, Cambridge, MA: Harvard University Press.

Hartmann Heidi, (1981) "The Unhappy Marriage of Marxism and Feminism: Towards a More Progressive Union, in Sargent Lydia (ed.) Women and Revolution, London: Pluto Press.

Hess Beth, (1990) "Beyond Dichotomies: Drawing Distinctions and Embracing Differences, Sociological Forum, 5: 75-94.

Jagger Alison, (1993) Feminist Politics and Human Nature, Totowa: N. J. : Rowman and Allenheld.

Kagan Jerome, (1964) "Acquisition and Significance of Sex Typing and Sex Role Identity" in Martin L. Hoffman and Louis W. Hoffman (eds.)





Review of Child Development Research, Vol. 1, New York: Russel Sage Foundation.

Lindsey Linda, (1990) Gender Roles: A Sociological Perspectives, Englewood Cliff, NJ: Prentice Hall.

Lloyd Moya, (1971) 15-17th April, "Feminism and Power: Towards a Politics of Resistance?" Paper presented at the Political Studies Conference, United Kingdom: University of Lancaster.

Maccoby Eleanor, E. and Jacklin Carol, (1974) The Psychology of Sex Differences, California: Stanford University of Press.

Mackinnon Catharine, A. (1989) Toward a Ferminist Theory of the State, Cambridge, Massachusetts: Harvard University Press.

Mead Margaret, (1935) Sex and Temperament in Three Primitive Societies, New York: Dell Publishing Company.

Mill John Stuart, (1963) "The Subjection of Women", in J.M. Robson (ed.) The Collected Works of John Stuart Mill, Vol. 21:261-340, Toronto: University of Toronto Press.

Mitchell Juliet, (1971) Psychoanalysis and Ferminism, New York: Pantheon Books.

Mohanty Chandra, (1988) "Under Western Eyes: Feminist Scholarships and Colonial Discourses" Ferminist Review, Autumn, No. 30: 51-79.

Mohanty Chandra; Russo Ann and Torres Lourdes (eds.) (1991) Third World Women and the Politics of Ferminism, Bloomington IN: Indiana University Press.

Money John and Ehrhardt A.E. (1972) Man and Woman, Boy and Girl Baltimore: Johns Hopkins University Press.

Reskin Barbara, (1998) "Bringing the Men Back in: Sex Differentiation and the Devaluation of Women's Work" Gender and Society, 2:58-81.

Rowbotham Sheila, (1972) Women, Resistance and Revolution, New York: Vintage Books.

Scott Joan Wallach, (1988) Gender and the Politic of History, New York: Columbia University Press.

Shiva Vandana, (1989) Staying Alive: Women, Ecology and Development, London: Zed Books.

Smith Carolino and Lloyd Barbara, (1978) "Maternal Behaviour and Perceived Sex of Infant: Revisited", Child Development. 49:1263-65.

Spence Janet T. and Helmreich Robert L., (1978) Masculinity and Femininity: Their Psychological Dimensions, Correlates and Antecedents, Texas: Austin University of Texas Press.

Taylor Harriet, (1853) Enfranchisement of Women, New York: Rochester.

The Penguin Dictionary of Sociology, (1984) (eds.) Nicholar Abercrombie; Stephen Hill and Bryan S. Turner, London: Allen Lane; Penguin Books.

Walby Sylvia, (1990) Theorizing Patriarchy, Oxford: Blackwell.

West Candace and Zimmerman Don, (1987) "Doing Gender", Gender and Society, 1: 125-151.

Wollestoncraft, Mary, (1975) A Vindication of the Rights of Women, (first published in 1792) Harmondsworth: Penguin.